
# දිවයින
## ඉරිද සංග්‍රහය

www.divaina.lk 2022 ජුනි මස 12 වැනිදා ඉරිදා කාණ්ඩය 41 - 37 වැනි පත්‍රය මිල රු.150යි

## පොසොන් පෝදා සිතුල්පව්ව ආලෝක පූජාව මෙවරත් උපාලි සමූහ ව්‍යාපාරයේ අනුග්‍රහයෙන්

ප්‍රදීප් ප්‍රසන්න සමරකෝන්

රුහුණු පළාතේ යාල වනෝද්‍යානය මැද පිහිටි ඓතිහාසික සිතුල්පව්ව රජමහා විහාරයේ වාර්ෂික පොසොන් උත්සවය ජුනි 13, 14 සහ 15 තෙදින තුළ පැවැත්වේ. 10 - පිටුවට



# විදුලි මහපුටු දැල්වෙයි ජනතාව අඳුරේ දැවෙයි

ශිරාන් රණසිංහ

ඉකුත් වසර හතක කාලයේදී ලංකා විදුලිබල මණ්ඩලය රුපියල් කෝටි හතළිස් දහසක පමණ පාඩුවක් ලැබීමට හේතුව ආයතනයේ වංචා, දූෂණ, එසේත් නැතිනම් සේවක වැටුප් දීමනා හා... 10 - පිටුවට

## ධම්මික පෙරේරා



## නම මැකොට

චමින්ද සිල්වා, අනුර බාලසූරිය 10 - පිටුවට

## පොහොට්ටුව නෙළාගනී

ශ්‍යාම් නුවන් ගනේවත්ත,චමින්ද සිල්වා 10 - පිටුවට

## තාක්ෂණ හා ආයෝජන ප්‍රවර්ධන ඇමැති ධුරය?

චමින්ද සිල්වා 10 - පිටුවට

## සමාගම්වල තනතුරුවලින් අස්වෙයි

ශ්‍යාම් නුවන් ගනේවත්ත 10 - පිටුවට

## ඔය කියන වැටුප් දීමනා අපි ගන්නේ නැහැ

ලංවිම ඉංජිනේරු සංගමයේ සභාපති අනිල් රංජිත්

මේ කියන තරම් වැටුප් හා දීමනා තමන්ට ලැබෙන්නේ නැතැයි ලංවිම ඉංජිනේරු සංගමයේ සභාපති අනිල් රංජිත් ඉඳුවර මහතා පැවසීය.

10 - පිටුවට



## සුදුහාමිනේට 95 යි

කර්තිනා රේඛාවේ කර ජීවත්
සිනමා තිරේ එසවුවාය සේසත්
රංගන කුසලතාවෙන් සදා පෝසත්
සුදු හාමිනේ අපි ආදරෙයි තාමත්

\- අනුරාධ හිරිපිටිය

සිංහල සිනමාවේ සුදු හාමිනේ ලෙස ආදරය දිනූ අයිරංගනී සේරසිංහ මහා රංග වේදිනියගේ 95 වැනි ජන්ම දිනය බ්‍රහස්පතින්දා (9) යෙදී තිබිණ. මේ ඊට එක්වුවන් ඇය සමග සතුට බෙදාගත් අන්දමයි. අයිරංගනි ගේ නැඟණියක වූ කාමිනි මීදෙණිය සමග විවාහ වූ මහාචාර්ය තිස්ස විතාරණ ද සෙසු පිරිස සමග මෙලෙස ඊට එක්ව සිටියහ.



## මෙගාවොට් 2700ක පුනර්ජනනීය ව්‍යාපෘති ඇරඹීමට හැකි වෙයි

ශිරාන් රණසිංහ 10 - පිටුවට

## ජිනීවා සමුළුව සඳහා ඇරැඹෙයි රුසියාව එනවාද යන්න තවම රහසක්

ඩයස්පෝරා කණ්ඩායම් 10ක් ගිහිල්ලා

කීර්ති වර්ණකුලසූරිය 10 - පිටුවට

## අයි. එම්. එෆ්. නියෝජිතයෝ 20 වැනිදා දිවයිනට

ශ්‍යාම් නුවන් ගනේවත්ත 10 - පිටුවට

## පාසල් වෑන් - පෞද්ගලික බස් ධාවනය වන්නේ 20% යි

පාසල් ළමුන් ප්‍රවාහන සේවා සංගමය

ප්‍රදීප් ප්‍රසන්න සමරකෝන් 10 - පිටුවට

## සඳුදා රජයේ විශේෂ නිවාඩු දිනයක්

චමින්ද සිල්වා 10 - පිටුවට

## රන්ජන් නිදහස් කරන්න

මැති ඇමැතිවරු ජනපතිට කියයි

නෝමන් පලිහවඩන 10 - පිටුවට

## මාස්ක් අනිවාර්යය නැතත් සෞඛ්‍ය පුරුදු පිළිපදින්න

විශේෂඥ වෛද්‍ය හේමන්ත හේරත්

ප්‍රදීප් ප්‍රසන්න සමරකෝන් සහ චමින්ද සිල්වා

10 - පිටුවට



## ඩෙංගු රෝගීහු ශීඝ්‍රයෙන් වැඩිවෙති

ප්‍රදීප් ප්‍රසන්න සමරකෝන්

පවතින කඩින්කඩ වැසි තත්ත්වය හමුවේ ඩෙංගු රෝගීන්ගේ... 10 - පිටුවට



## කොච්චිකඩේ දේව්මැඳුරේ මංගල්‍යය හෙට

නෝමන් පලිහවඩන 10 - පිටුවට



## ඉන්දියානු යූරියා මෙට්‍රික් ටොන් 50,000ක් යල කන්නයට

සහල් අර්බුදයක් ලොකුවට එන්නේ නෑ

අරුණ බෝගහවත්ත

10 - පිටුවට



## රාජ්‍ය අනුග්‍රහය දෙනවා නම් රටටම පොහොර දෙනවා

පරිසර හිතකාමී පොහොර නිෂ්පාදකයන්ගේ සංගමය

අනුර බාලසූරිය, ජගත් කණහැරආරච්චි

රාජ්‍ය අනුග්‍රහය වහා ලබා දෙන්නේ නම් මෙවර යල කන්නය සාර්ථක කර ගැනීමට සම්පූර්ණ පොහොර අවශ්‍යතාව.. 10 - පිටුවට



## ‘ජීවන බර අඩුකරනු’ විරෝධතා මාලාවක්

චමින්ද සිල්වා

ජීවන බර අඩුකර ජනතාවට සහන ලබාදෙන ලෙසට බලකරමින්.. 10 - පිටුවට



## ඩීසල් - පෙට්‍රල් සපයන තුරු ලීසිං සහනයක් දෙන්න

ලීසිං හා ණය වාරික ගෙවන්නන්ගේ ඒකාබද්ධ සංගමය

චමින්ද සිල්වා 10 - පිටුවට



## උසාවි නියෝගයටත් උඩින් සීසර්ලා වැඩ

නීතිඥ සඳරුවන් සේනානායක

චමින්ද සිල්වා 10 - පිටුවට




# ● මාළු නහුතෙට නගිනකොට අපිට කුණු මාළු කවන්න සූදානම්!



වරායේ හිරවී ඇති මාළු කන්ටේනර් 98ක් ගැන පසුගිය බදාදා දිවයින මගින් හෙළිදරව්වත් සමඟ මෙරට අත්‍යවශ්‍ය භාණ්ඩයක් වූ ටින්මාළු පාරිභෝගිකයන් විමතියට පත් විය. ඒ, ඒ සමඟම කියවූ ප්‍රවෘත්තියක් නිසා ය. ප්‍රවෘත්තිය වන්නේ මේ කුණු මාළු 'ටින්මාළු' ලෙස වෙළෙඳපොළට එවන්නට ඇති සූදානමක් නිසාය.

මේ කන්ටේනර් 98 අප සාමාන්‍යයෙන් පාරේ දකින අඩි 20 ඒවා නොවේ. මේවා අඩි 40 දැවැන්ත හයි කන්ටේනර් ය. මේ නෞකාව සීසෙල්ස් සිට මැලේසියා බලා මසුන් ප්‍රවාහනයේ නියුතු නෞකාවකි. එම නෞකාවේ කාර්මික දෝෂයක් හටගෙන ඇත්තේ ලංකා මුහුදු සීමාවේදී ය.

දැන් මේ මාළු තොගය ඇත්තේ මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු තත්ත්වයේය. ඒත් ඉතිං මේ මාළු කොටාබාන්න හොඳද නැත්දැයි කියන්නට පුළුවන් අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු සියල්ල දැන් දිවංගත වී ඇත.

වතුර බෝතලේ මිලවත් පාලනය කරගත නොහැකි වත්මන් ෆේල් ආණ්ඩුව මේ වරායේ ඇති මාළු ටික ටින් නොකරම පෑලියගොඩ මාළු මාකට් එකට ආවත් පුදුම විය යුතු නැත. පෑලියගොඩ කුණු මාළු වික්කාට වටලන්නට පුළුවන් රාජ්‍ය යාන්ත්‍රණයත් දැන් අකර්මණ්‍ය වී හමාරය.

දැන් ප්‍රශ්නය ඇත්තේ අයිතිකාරයෙක්වත්, ගෙනියන්නේ නැති මේ මාළු තොගය පුත්තලම පැත්තේ ටින්මාළු ෆැක්ටරියකට විකිණීමට ඇති සූදානමයි. එම කුණු මාළු ටින් කොට මෙරට වෙළඳපොළට ආවත් එය පුදුමයට පත් විය යුතු නැත. ටින් කළේ කුණු මාළු ද නැත්නම් පණපිටින් මාළු දැයි 'සැමන් ෆැක්ටරියට කඩා පැන දඩ ගහන්නට නඩු දාන්නට දැන් පාරිභෝගික අධිකාරියට හෝ සාධාරණ වෙළෙඳ කොමිසමට ඇති කැසිල්ලක් නැත. එකම කැහිල්ල නම් සමහරුන්ට සැමන් කා අසාත්මිකතාවය නිසා ඇතිවන 'කැහිල්ල' විය යුතුය. ඔය කුණු මාළු ටින්මාළු ලෙස වෙළෙඳපොළට ආවොත් කළ යුත්තේ ටිකක් අඩුවෙන් දුන්නොත් ඕනම කුණුගොඩක් බෙදන සතොසට කදිම ඉල්ලමකි. ටූනා මාළු TUNA FISH මෙන් කුණුමාළුවලට KUNU FISH නමින් මනරම් ලේබලයක් සැමන් බෙලෙක්කයේ ඇලවීම හොඳටම ප්‍රමාණවත් ය. කාලය ඉකුත් වන දිනය නොහොත් EXPIRE DATE එක 2052 දිනයක් දැම්මත් ඒවා පරීක්ෂා කරන්නට ලංකාවේ රාජ්‍ය ආයතනයක් නැත.

මුල් කොරෝනා රැල්ලේ ආරම්භයේදීම ෆේල් ජනාධිපති නන්දසේන අත්‍යවශ්‍ය භාණ්ඩ කිහිපයක් මිල පාලනයට ලක් කරන ලද බව අද බොහෝ දෙනාගේ 'ටිකිරි මොළවල' මතකයෙන් ගිලිහී ඇති බව සාතිශය සංවේගයෙන් දැනුම් දිය යුතුය. නන්දසේන ජනාධිපතිතුමා ග්‍රෑම් 425 ලොකු සැමන් ටින් එකක් දුන්නේ රු. 100 කටය. පරිප්පු කිලෝවක උපරිම සිල්ලර මිල රු. 60ක් විය. දැන් බොහෝ ප්‍රදේශවල සිල්ලර කඩවල පරිප්පු කිලෝවක මිල රු. 600/=කි. ඒ අනුව දෙවසරක් තුළ පරිප්පු මිල ඉහළ යෑමේ ප්‍රතිශතය සියයට 600කි. එදා රු. 100ට දුන් සැමන් ටින් එක දැන් 680කි. එතකොට සැමන්වල මිල වැඩිවීමේ ප්‍රතිශතයක් ලෙස සියයට හත්සියයකට ආසන්නය. රු. 680කට වික්කත් මේ සැමන් ටින්එකක් විකිණීමෙන් සිල්ලර කඩේට ඇති ලාභය රු. 20/= කි. කොටින්ම කිව්වොත් රු. 660ක් ආයෝජනය කොට මිලදී ගන්නා සැමන් ටින්එක විකුණා ගන්නා සොච්චම් රු. 20/= ක ලාභය බස් රථයකට නැග බසින්ටත් මදිය. දැන් බස් එකකට නැග බසින්නටත් රු. 32/=ක් නැතුව බැරිය. ඒ කියන්නේ බස් එකක පළමු සෙක්ෂන් එකේ අවම මිලත් රු. 32/=කි.

ටින් මාළු ටින්එකක ග්‍රෑම් 425 ක් ඇති බව කිව්වත් එහි ග්‍රෑම් 140ක්ම ඇත්තේ කල්තබා ගැනීමේ රසායන දියර හා ලුණුය. දැන් වරායේ හිර වී ඇති මාළු කන්ටේනර් 98 ටින් මාළු ලෙස වෙළෙඳපොළට ආවත් ටින් කළේ කුණු මාළුදැයි ජනතාවට දැන ගන්නට ක්‍රමයක් නැත. විවෘත නොකළ සැමන් ටින් එකක් ගෙන එහි අන්තර්ගතය ශරීරයට අහිතකර දැයි සොයන්නට අපේ පාරිභෝගිකයන් ඊට අදාළ රාජ්‍ය ආයතන පසුපස යන්නේ නැති නිසාය.

මුළු ලංකාවටම සැමන් තොග බෙදන්නේ පිටකොටුවේ බසාර් එක නොහොත් පස්වැනි හරස් වීදියයි. කල් ඉකුත් වන දින ළංවන විට ඒවා තොග පිටින් අඩු මිලකට විකුණා අත පිසදා ගැනීම සැමන් ආනයනකරුවන්ගේ සිරිතය. ඉන්පසු ඒවා ගෙන යන ගැනුම්කරු බොහෝ විට කරන්නේ එහි ලේබලය තවත් ඉදිරියට වසර 2ක් පමණ දින ඇති කල් ඉකුත්වන දිනයක් දමා මනරම් ලේබලයක් ඇලවීමය. කල් ඉකුත් වූ දින ඇති ලේබල් තොගය ගලවා ගිනිකූරක් ගසා ආදාහනය කොට අවසන් කටයුතු සිදුකරනු ලැබේ. දැන් වෙළෙඳපොළට ආයිත් එන්නේ අලුත්ම අලුත් සැමන් ටින්එකකි. කල් ඉකුත්වීදැයි මේ සැමන් ටින්එකේ ලේබලයේ එය චිලී රටේ හෝ චීනයේ ෂැංහයි ජන්ෂන් හංදියේම වූ පැක්ටරියේ ඊයේ පෙරේදා හදා උණු උණුවේම ලංකාවට ගෙනා බව සඳහන් ය.

ලංකාවේ දැන් දේශීය ටිං මාළු පැක්ටරි ගාන 5කි. ඔවුන්ගේ සමිතියක් ද ලංකාවේ ඇති බව අපට දැක ගත හැකි වූයේ රවී කරුණානායක මුදල් ඇමැති කාලයේය. රාජපක්ෂ යුගයේ ටින් මාළු කිලෝවකට පනවා තිබූ රු. 102 බද්ද රවී මුදල් ඇමැතිතුමා ආනයනික සැමන් කිලෝවක බද්ද රු. 50/= දක්වා අඩු කරන ලදී.

නන්දසේන ජනාධිපතිතුමා රු. 100/=ට සතොසේ ටින් මාළු දුන් වෙලේ පිටකොටුවේ එම සැමන් ටින්එකක මිල 295 ක්ය. එයින් පෙනෙන්නේ රු. 195ක්ම බරපැන දැරුවේ මහා භාණ්ඩාගාරයයි. ඒත් නන්දසේන ආණ්ඩුවට ලංකාවේ ටින් මාළු නිෂ්පාදකයෙකුට එම මුදල ලබා දෙන්නට සිහිකල්පනාවක් නොවීය.

දිවයින කුණුමාළු පුවත පළ වූ දින පිටකොටුවේ සැමන් තොග වෙළෙඳපොළේ දක්නට ලැබුණේ සැමන් සාගතයකි. චිලී රටෙන් අල්ලපු ගමන්, අපේ යාළු මාළු ආදී වෙළඳ පාඨ ඇති සැමන් තොග වෙළෙන්දන්ගේ වෛර්ණ බෝඩ්වල සැමන් ටින් පෙනෙන්නට ඇතත් විකුණන්නට සැමන් තොග නැත. තොග කඩවල ඇතත් සැමන් 1 - 2 දෙන්නෙත් හොර රහසේ 'ප්‍රීති' පැකට් එකක් දෙනවා වගේ රේස්කොළ කැල්ලක ඔතලාය. මේ බොහෝ සැමන් ප්‍රචාරක පුවරුවල ඇත්තේ In Natural Juice salt Added යනුවෙනි.

● ප්‍රවීන් දේවීන්ද්‍ර



# මේ අය පාරට වැටුණොත් ලැබෙන ඩොලර් ටිකත් ඉවරයි!



අසංක



ශෂිකලා



අනෝමා හර්ෂණී



ඉරේෂා පතිරණ



චම්පිකා



සුරංජි නිරෝෂණී



චලනි මධුෂිකාය



ඉනෝකා උදයාංගනී

ආර්ථික අර්බුදය නමැති ගින්න මේ රට දවාලමින් තිබේ. මොහොතින්, මොහොත එම ගින්න බිහිසුණු අතට හැරෙමින් පවතින බවද සැබෑය. මේ වන විටත් මෙරට කර්මාන්ත බොහොමයක් එම ගින්නෙන් දැවී අළු වී හමාරය. බේකරි, මස් බිත්තර ඇතුළු සුළු, මධ්‍ය පරිමාණ දේශීය කර්මාන්ත 70% ට වැඩි සංඛ්‍යාවක් වැසී ගොස් අවසානය. තවත් කර්මාන්ත පණ යදිමින් තිබේ. එම කර්මාන්තවලින් යැපුණ පවුල් ලක්ෂ ගණනකට ආදායම් මාර්ග අහිමි වී ඇත. එවැනි ඛේදජනක පසුබිමක මෙරට වැඩ කරන ජනතාවගෙන් 15% ක් පමණ රැකියා කරන ඇඟලුම් කර්මාන්තයටත් රතු එළි දැල්වෙමින් තිබෙන බව වාර්තා වේ.

භාණ්ඩ හා සේවා මිල අධික ලෙස ඉහළ යෑමත් සමඟ නිෂ්පාදන වියදම වැඩිවීම නිසා මෙරට ඇඟලුම් කර්මාන්ත පවත්වාගෙන යෑමට නොහැකි තත්ත්වයක් උදා වී ඇති බව වාර්තා වේ. එහෙයින් මෙරට ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ 30% ට වැඩි ප්‍රමාණයක් බංගලාදේශය, ඉන්දියාව ඇතුළු විදේශීය රටවලට රැගෙන යෑමේ සූදානමක් පවතින බව ද වාර්තා වේ. පවතින ආර්ථික අර්බුදය තව, තවත් උත්සන්න වී ඇඟලුම් කර්මාන්තයත් මෙරටට අහිමි වී ගියොත් කුමක් වේද? ඒ ගැන විමසා බැලීමට ඇඟලුම් කර්මාන්තශාලාවල රැකියා කරන සේවක, සේවිකාවන් අතරට අපි ගියෙමු. මේ ඔවුන් කියන කතාය.

''පවතින අර්බුදය තුළ හෙට ගැන කිසිම විශ්වාසයක් නෑ. අපේ ජීවිත ගැන හරිම දුකයි. මට තවම අවුරුදු විසිහතරයි. මේ තමයි අපේ හොඳම කාලය. ඒත් මේ ආර්ථික ක්‍රමය තුළ අපේ සිහින සැබෑ කරගන්න හරිම අසීරුයි. මේ සිහින දකින්නවත් හොඳ කාලයක් නෙමෙයි. අපිට තියෙන එකම පිහිට මේ රස්සාව විතරයි. ඒ නිසා රක්ෂාව ආරක්ෂා කරගෙන ජීවත් වෙනවා හැර වෙන දේවල් ගැන හිතන්නෙ නෑ. ඒ වගේම ඇඟලුම් ආයතනවලට හිඟයකින් තොරව ඉන්ධන ටික ලැබෙනවා. රජයෙන් උපරිම සහයෝගය ලබාදෙනවා. මොන විදිහේ කටකතා පැතිරුණත් අපේ රටේ ඇඟලුම් කර්මාන්තය සුරක්ෂිතයි. ඒක අපිට විශ්වාසයි...'' ඒ වචනවල තිබෙන විශ්වාසනීයත්වය සිනහවෙන් විකසිත වූ ඇයගේ මුහුණෙන් ද අපි දුටිමු. ඇය චලනි මධුෂිකාය. උසස් පෙළ විභාගයෙන් ඒ 1 යි. බී දෙකක් ලබාගෙන සමත් වී සිටින ඇය දක්ෂ තරුණියකි. නුපුහුණු සේවිකාවක් ලෙස වතුපිටිවල බැන්ඩික්ස් ආයතනයට සම්බන්ධ වී වසර එකහමාරක් වැනි කෙටි කාලයක් තුළ වැඩ පරීක්ෂකවරියක් බවට පත් වී සිටින්නීය. එමෙන්ම රෝගී මව සහ වියපත් ආච්චි අම්මාව සහ එකම සහෝදරයාව ජීවත් කරනුයේ ද චලනිය.

''අභියෝගවලට මුහුණදීමට මම කැමැතියි. මම මෙතැනින් නතර වෙන්නෙත් නෑ. මේ ආයතනය තුළ යන්න පුළුවන් ඉහළටම යනවා. දක්ෂ ළමයින්ට ගාමන්ට් පීල්ඩ් එක ඉනිමඟක්...'' ඒ එඩිබල හඬ මගේ සිතේ දෑනුදු දෝංකාර දෙන්නේය. අපේ රටට ඇවැසි එවැනි දිරිය දියණියන්ය. වතුපිටිවල බැන්ඩික්ස් ඇඟලුම් ආයතනයේදී අප සමඟ කතාබහ කළ ඉනෝකා උදයාංගනී ද දිරිය මවකි. සැමියාගේ රැකවරණය නොමැතිව දියණියන් තිදෙනෙක් සහ මවක් ජීවත් කරවන දිරිය කාන්තාවකි. වයස අවුරුදු හතළිස් හතරක් වන ඇය බැන්ඩික්ස් ආයතනයේ රැකියාවට සම්බන්ධ වී මේ වන විට වසර පහකි.

''අපේ ගම අයි.ඩී.එච්. මේ ආයතනයේ රැකියාවට ආවට පස්සෙ මෙහෙන් කුලියට ගෙයක් අරගෙන ජීවත් වෙනවා. කොළඹට වඩා ගමේ වියදම අඩුයි. ඒත් දැන් නම් වියදම එකට එකක් වැඩි වෙලා. ගෙදරට අවශ්‍ය බඩු ටික අරගෙන දරුවන්ගේ පන්තිවලට ගෙව්වම පඩිය ඉවරයි. ඒ නිසා දැන් අපි ගමන් බිමන් විශේෂ වැඩ කිසිම දෙයක් පටලවා ගන්නේ නැතිව පිරිස්සමට ජීවත් වෙනවා. එහෙම හරි ජීවත් වෙන්නේ අපේ ආයතනයට පින්සිද්ධ වෙන්න. පැතිරෙන කටකතාවල හැටියට ඇඟලුම් කර්මාන්තයත් වැහිලා ගියොත් රටට වෙන දේ හිතා ගන්නවත් බෑ. ඒත් මේ රටේ ගාමන්ට් වැහෙන්නේ නෑ කියලා අපිට දැඩි විශ්වාසයක් තියෙනවා. අපේ රැකියා සුරක්ෂිතයි. කාලා බීලා ජීවත් වෙන්න ලැබෙයි කියන විශ්වාසය තියෙනවා...'' දිරිය කාන්තාවක් වන ඉනෝකා තම රැකියාවේ සුරක්ෂිතතාවය ගැන එසේ විශ්වාසයෙන් යුක්තව කතා කරන විට අගලවත්ත, පිඹුර බොඩිලයින් ඇඟලුම් ආයතනයේ තරුණ සේවකයෙක් ද පෙළගැසෙන කතාවට මෙසේ ප්‍රවිෂ්ට විය.

''ගාමන්ට් වැහුණොත් අපට වෙන්නේ සාගින්නෙන් මැරෙන්න. ජොබ් එකක් කරලත් කාලා ඇඳලා ජීවත් වෙන්න ලැබෙන පඩිය ප්‍රමාණවත් නෑ. ඒ තරමට ජීවන වියදම වැඩියි. රුපියල් පන්දාහකින් සතියකට කන්න බඩු ටිකක් ගන්න බෑ. ඉස්සර අපි මාසෙ පඩියෙන් කාලා, ඇඳලා, දරුවන්ට උග න්වලා කීයක් හරි ඉතුරුත් කරගත්තා. දැන් නම් ඉතුරු කිරීම් ගැන හිතන්නවත් බෑ...'' හේ අසංකය. ගම පිඹුරය. වයස අවුරුදු තිස්අටකි. දෙදරු පියෙක් වන ඔහු පිඹුර බොඩිලයින් ආයතනයේ රැකියාව කරන්න පටන්ගෙන වසර එකොළහකි. අසංකගේ බිරිඳ ද එම ආයතනයේම රැකියාව කරන්නීය. සරල දිවි පෙවෙතක් ගත කරන අසංකගේ වැඩිමහල් දරුවා අගලවත්ත ප්‍රසිද්ධ පාසලක දෙවැනි වසර පන්තියේ ඉගෙනුම ලබන්නේය. දෙවැනි දරුවා පෙර පාසල් අධ්‍යාපනය ලබන්නේය.

''අපි දෙන්නම මාසෙකට හොඳ පඩියක් ගන්නවා. ඒ හැර අපිට වෙනත් ආදායම් මාර්ග නෑ. තේ ඉඩම්, වී කුඹුරු නෑ. ඒත් ලැබෙන පඩියෙන් අපි හත්දෙනෙක් ජීවත් වෙනවා. අම්මයි, තාත්තයි ඉන්නවා. නංගි තවම කසාද බැඳලා නෑ. අපි සියලු දෙනා හොඳට කාලා බීලා සතුටින් ජීවත් වුණා. ඒත් දැන් අමාරුයි. මේ අවුරුද්දට දෙපාරකට පඩි වැඩි කරලත් ජීවත් වෙන්න මදි. දැන් කාලෙකින් දරුවො දෙන්නට කිරි පිටි උගුරක් දුන්නේ නෑ. කොහොමහරි ගන්න පුළුවන්කම තිබුණත් වෙළෙඳපොළේ කිරි පිටි නෑ. දැන් නම් කිරි පිටි ඕනෙත් නෑ. දරුවො තේ කහටවලට හුරු වෙලා ඉන්නේ. ඒ වගේම අපි ගොඩක්ම වියදම් අඩු කරගෙන පරිස්සමට ජීවත් වෙනවා. රස්සාව ගැන අපිට බයක් නෑ. මේ වගේ ආයතනයක් කිසිම දවසක වැටෙන්නේ නෑ. රටට ඩොලර් උපයන මෙවැනි ආයතනයක රැකියාව කිරීමට ලැබීම ගැන දැන් අපි සතුටු වෙනවා...'' ආත්ම තෘප්තියෙන් යුක්තව තම රැකියාව ගැන අසංක වර්ණනා කරන විට තවත් සේවිකාවක් ඒ කතාවට මෙසේ අඩු, වැඩි එකතු කළාය. ඇය අනෝමා හර්ෂණීය. බදුරලිය මාරගහදෙණිය ප්‍රදේශයේ ජීවත්වන ඇය විවාහකය. එක්දරු මවකි. වයස අවුරුදු තිස්දෙකකි. තම සැමියා ද ඉංගිරිය ප්‍රදේශයේ ඇඟලුම් ආයතනයක සේවය කරන බව ඇය අපට කීවාය.

> **රජයේ රැකියාවලට වඩා අපේ රැකියාව සුරක්ෂිතයි, ඒත් ගාමන්ට් වැහෙන කතා ඇහෙනකොට බය හිතෙනවා...**

''මම මේ රැකියාවට ආවේ මෑතක. ආර්ථික ප්‍රශ්න වැඩි වෙනකොට වෙන කරන්න දෙයක් තිබුණේ නෑ. අපිට වෙන ආදායම් මාර්ගත් නෑ. ගෙයි වැඩ තවම ඉවර නෑ. මහත්තයට ලැබෙන පඩිය පවුල නඩත්තු කරන්නවත් ප්‍රමාණවත් නෑ. පවුලේ සියලුදෙනා රැකියා කළත් පවතින ජීවන වියදමත් එක්ක ඔට්ටු වෙන්න බෑ. දැන් මමත් හොඳ පඩියක් ගන්නවා. ඒත් ජීවත් වෙන්න මදි. ඒ තරම් ජීවන වියදම වැඩියි. ඒ වගේම පවතින ඉන්ධන හිඟය ඇඟලුම් ආයතනවලටත් විශාල ගැටලුවක් වෙලා තියෙනවා. නිෂ්පාදන, අමුද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේදී බරපතළ ප්‍රශ්නවලට මුහුණ දෙන්න වෙලා තියෙනවා. යටිතල පහසුකම් දුර්වල නොවෙන්න අපේ ආයතනවලට මාස ගාණකට ප්‍රමාණවත් ඕඩර් ලැබිලා තියෙනවා. රැකියාව ගැන අපිට කිසිම සැකයක් නෑ. ලංකාවේ ඇඟලුම් ආයතන වැහෙනවා කියන කතාව පිළිගන්න බෑ. මේ කාලෙ තමයි ඇඟලුම් ආයතනවලට හොඳටම ආදායම් තියෙන්නේ. අපිටත් හොඳට සලකනවා. මේ අවට ගම්මානවල දුප්පත් මිනිස්සුන්ටත් උදව් උපකාර කරනවා...'' චතුර ලෙස වචන හසුරුවන ඇය ආධුනික සේවිකාවක් වුවද ඇඟලුම් කර්මාන්තය ගැන හොඳ අවබෝධයෙන් සිටින බව පැහැදිලිය. එමෙන්ම රාජ්‍ය ආයතනවල පුටු රත් කර ලබා ගන්න 'පින්පඩියට' වඩා මහන්සි වී වැඩ කර ඔවුන් ලබා ගන්නා පඩිය ගැන ඇය ආඩම්බරයෙන් කතා කළාය. එම ආයතනයේ තවත් සේවක, සේවිකාවන් දෙතුන් දෙනෙක් කරුණු ඉදිරිපත් කළහ. ඒ සියලු දෙනා රැකියාවේ සුරක්ෂිතතාවය ගැන දැඩි විශ්වාසයෙන් යුක්තව කතා කළහ. අනතුරුව අපි හොරණ ප්‍රදේශයේ ඇඟලුම් ආයතනයක සේවක, සේවිකාවන් කිහිපදෙනෙක් සමඟ ද පවතින අර්බුදය ගැන සාකච්ඡා කළෙමු. ඔවුන් අතරින් එක් සේවිකාවකගේ හඬ මෙසේ ඉස්මතු කළෙමු.

''අපේ උපන්ගම මාතර. දැන් පදිංචි වෙලා ඉන්නේ හොරණ. ඉඩම් අරගෙන, ගෙවල් හදාගෙන දරුවොත් හදාගෙන සතුටින් ජීවත් වෙන්නේ බොඩිලයින් ආයතනයට පින්සිද්ධ වෙන්න තමයි. දැන් මට අවුරුදු තිහයි. මේ ආයතනයේ රස්සාව කරන්න පටන්ගෙන අවුරුදු එකොළහක් වෙනවා...'' ඇය ශෂිකලා ප්‍රියඋද්දීපනීය. උසස් පෙළ විභාගයෙන් පසු ජීවන වෘත්තීය හැටිය ඇඟලුම් ක්ෂේත්‍රය තෝරාගත් ඇය විවාහ වී සිටිනුයේ බන්ධනාගාර නිලධාරියෙක් සමඟය. දරුවන් තිදෙනකුගේ මවක් වන ඇය කාලය කළමනාකරණය කරගෙන ගෙවත්ත කොරටුවක් කරගත් ආදර්ශමත් කතාව අපට මෙසේ විස්තර කළාය.

''හැමදාම වසන්තය නෑ. මේ ලෝකයේ සෑම රටකටම සෞභාග්‍යමත් කාල වගේම නරක කාල එනවා. මේ ගෙවී යන්නෙ මෙරට නපුරු දසාවක්. දේශපාලනඥයන්ගේ වැරැදි ඇති. ඒත් මේ අර්බුදයෙන් ගොඩ එන්න සියලු පුරවැසියන් එකා මෙන්ම යුතුකම් ඉටු කරන්න ඕනෑ. ආහාර අර්බුදයක් ළඟ එනවා කියමින් බයේ තැති ගෙන ඵලක් නෑ. ඒ අර්බුදයට මුහුණ දෙන්න අපි සූදානම් වෙන්න ඕනෑ. තම, තමන්ගේ ගෙවත්තෙ එළවළු, පලා, අල, බතල ටිකක් වගා කරගන්න ඕනෑ. අපිට තියෙන්නෙ පර්චස් පහළොවයි. ගෙට ගිහාම ඉතිරි වෙලා තියෙන්නේ පුංචි ගෙවත්තක්. ඒත් මම ගෙදර කෑමට අවශ්‍ය ප්‍රමාණයට එළවළු, පලා, අල බතල වගා කරගෙන තියෙනවා. ඒ වගේම ගාමන්ට් වැහෙනවා... පිටරටවලට අරගෙන යනවා... විවිධ කට කතා පැතිරෙනවා. ඒවා අමූලික බොරු. රජයේ රැකියාවලට වඩා අපේ රැකියාව සුරක්ෂිතයි. දැනටත් මගේ මහත්තෙලාට ලැබෙන හටා, අතිකාල අදාළ මාසෙට ගෙවන්නේ නෑ. පරක්කු වෙනවා. අපිට එහෙම නෑ. අදාළ මාසෙ සම්පූර්ණ පඩිය නියමිත දිනයට ලබාදෙනවා. මහත්තයට වඩා මම පඩියක් ගන්නවා. මම මේ රස්සාව කරන්නෙ හරිම සතුටින්. ඒත් අපි ජීවත් වෙන රට ගැන තියෙන්නෙ දරාගන්න බැරි වේදනාවක්. දරුවන්ගේ අනාගතය ගැන බයක්...'' කලා අංශයෙන් උසස් පෙළ 'උසස්' ලෙස සමත් වී ඇඟලුම් ආයතනයක සේවය කරන ශෂිකලා සමාජයට පාඩමක් කියා දුන්නාය. ඒ පාඩමට එම ආයතනයේම තවත් සේවිකාවක් මෙසේ අඩු වැඩි එකතු කළාය.

> **මේ අර්බුදයෙන් ගොඩ එන්න සියලු පුරවැසියන් එකා වගේ යුතුකම් ඉටු කරන්නෙ නෑ...**

''ප්‍රශ්න, ප්‍රශ්න කියාගෙන ලතවෙලා ඵලක් නෑ. ප්‍රශ්නවලට විසඳුම් සොයන්න වීර්ය ගන්න ඕනෑ. ස්වාමිපුරුෂයො නැතිව දරු පවුල් රැක බලාගෙන සතුටින් ජීවත්වන කාන්තාවන් විශාල සංඛ්‍යාවක් මේ ආයතනයේ වැඩ කරනවා. සමස්ත ඇඟලුම් ක්ෂේත්‍රයේ එවැනි කාන්තාවන් අති විශාල සංඛ්‍යාවක් සේවය කරනවා. සමහර අය ආයතනයේ සේවය කරන අතරේ පුංචි ව්‍යාපාර කරගෙන ගිහින් හොඳට දියුණු වෙලා ඉන්නවා. රටේ දුප්පත් පවුල්වල තරුණ, තරුණියන් රටට බරක් නොවී ජීවත් වෙන්නේ ඇඟලුම් කර්මාන්තවලට පින් සිද්ධ වෙන්නයි. මේ කර්මාන්තයත් නැති වෙලා ගියොත් ඒ හෙණය පාත් වෙන්නෙත් රටේ දුප්පත් මිනිසුන්ගේ හිස මතට. අරගල කරන අයවත්, රටේ දේශපාලනඥයන්වත් ඒ ගැන හිතන්නෙ නෑ. මෙහෙම හරි අපේ හඬට කන් දෙන්න ඔයාලා කතා කරපු එක අගය කරන්න ඕනෑ. හෙට ගැන අපිට ලොකු බයක් නෑ. ආයතනය සුරක්ෂිතයි...''

ඇය සුරංජි නිරෝෂණීය. ගම අගුරුවාතොටය. වයස අවුරුදු තිස්නවයක් වන ඇය හොරණ බොඩිලයින් ආයතනයේ සේවයට එකතු වී වසර විස්සකි. දෙදරු මවක් වන ඇයගේ වැඩිමහල් පුතාට අවුරුදු දහඅටකි. දියණියට වයස අවුරුදු නවයකි. එකම බලාපොරොත්තුව දරුවන් දෙදෙනාට හොඳ අධ්‍යාපනයක් ලබාදී රටට වැඩදායී පුරවැසියන් කිරීම බව ඇය අපට කීවාය. මීරිගම වෙළෙඳ කලාපයේ බැන්ඩික්ස් ඇඟලුම් ආයතනයේ සේවයේ නියුතු චම්පිකා ද ඊට සමාන කතාවක් අපට කීවාය. ඇය නුවර හසලක පදිංචිකාරියකි. වයස අවුරුදු හතළිස් එකක් වන ඇය වසර හයකට වැඩි කාලයක සිට මීරිගම බැන්ඩික්ස් ආයතනයේ සේවය කරනුයේ කුලී කාමරයක ජීවත්වෙමිනි.

''ඉස්සර මම සතියකට සැරයක් පුතා බලන්න ගෙදර ගියා. බස් ගාස්තු වැඩිවීමත් එක්ක දැන් මාසෙකින් ගියේ නෑ. දැන් පඩිය ලක්ෂයක් ගත්තත් ජීවත් වෙන්න මදි. පහුගිය දවස්වල අපේ පඩිය රුපියල් දහදහකින් වැඩි කළා. ඒ දීමනාව නොලැබෙන්න බෝඩිං වෙලා ඉඳගෙන රස්සාව කරන්න බෑ. පුංචි කාමරවල දර ලිප්වල උයන්න බෑ. ගෑස් ඕනෑ. ඒත් එක වේලක් කෑම උයාගන්න පුංචි ගෑස් ටැංකියක් මිලට ගන්න නෑ. ගෑස් නැතිව අපිට කෑම දෙන එක ආයතනයටත් ලොකු ගැටලුවක් වෙලා. ඇඟලුම් කර්මාන්තයට තියෙන ප්‍රශ්න ඒවා. වෙන කිසිම ගැටලුවක් අපිට නෑ. ලක්ෂ තිස්පහක් සේවය කරන අපේ ආයතන කොහෙත්ම වැහෙන්නේ නෑ. ගෑස් ප්‍රශ්න තිබුණත් අදටත් වේල් දෙක කෑම දෙනවා. දෙවේලක් කිරි තේ දෙනවා. ආර්ථික අර්බුදය තව තවත් උත්සන්න වුණත් මේ රැකියාවේ පිහිටෙන් තුන්වේල කාලා ජීවත් වෙන්න ලැබෙයි කියලා අපිට දැඩි විශ්වාසයක් තියෙනවා...'' මවුපියන් දෙදෙනා සහ එකම පුතාට කිසිදු අඩුවක් නොකර ජීවත් කරවන බව ද ඇය අප සමඟ සතුටින් ප්‍රකාශ කළාය.

'මෙයා හරි උත්සාහවන්තයි... ඒ නිසා තමයි චම්පි අක්කා සතුටින් ඉන්නේ...' ඇය අසළ සිටි යෙහෙළියක් එසේ කියා චම්පිකාගේ කරවට අත දමා තුරුළු කර ගත්තාය. මොහොතකට අප අතර සතුට දොරේ ගලා ගියේය.

''අපේ ගම්වල ස්වයං රැකියා කරපු අයට යන එනමං නැති වෙලා. කුඩා කර්මාන්ත වැහිලා. වෙළෙඳසල් වේලෙනවා. කොස්, දෙල්, පොල්, එළවළු ටික හදාගෙන ඉන්න මිනිස්සු යන්තම් තුන්වේල කාලා ජීවත් වෙනවා. අපිට ලැබෙන වැටුපෙන් පවුලක් නඩත්තු කරන්න පුළුවන්. ආයතනයත් උපරිම උදව් උපකාර කරනවා. ජීවන වියදම තව ඉහළ ගියත් ලොකු හීන දකින්නෙ නැතිව සරළව ජීවත් වෙන්න පුළුවන් වෙයි කියලා අපිට ලොකු විශ්වාසයක් තියෙනවා. ආයතන ප්‍රධානීන් කියන විදිහට මොන අර්බුද ආවත් අපේ ආයතනය වැහෙන්නේ නෑ. ඉදිරි මාස හතරකට විතර අපිට ඇනවුම් ලැබිලා තියෙනවා. ඒ කාලය වෙනකොට මේ අර්බුදය යම් තත්ත්වයකට පාලනය වෙයි කියලා අපිට හිතෙනවා. ඒත් ගාමන්ට් වැහෙන කතා පැතිරෙනකොට අපිට බය හිතෙනවා...'' ඉරේෂා පතිරණට වයස අවුරුදු විසිඅටකි. නාරම්මල පදිංචිකාරිණියක් වන ඇය යුද හමුදා සෙබළෙකුගේ බිරිඳකි. තවමත් දරු සුරතල් නොවිඳින ඇය සිහින පොදි බැඳගෙන ජීවත්වන බව ඇයගේ කතාවෙන් අපට තේරිණි.

පෙළගැසෙන සටහනට අපේ කතා ඇවැසි නැත. ජීවිත අන්දරයන් ගැන මෙන්ම ඇඟලුම් කර්මාන්තයෙන් මෙරට ආර්ථිකයට, ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන් ලබාදී ඇති සුවිශේෂී දායකත්වය ගැන ඇඟලුම් සේවක, සේවිකාවන් අපූරුවට පැහැදිළි කළහ. එහෙයින් ඩොලර් ගේන ඇඟලුම් කර්මාන්තයත් ඇවර වුණොත් මෙරට වැඩ කරන ජනතාවගෙන් 15% කට වෙන දේ මෙන්ම රටේ ආර්ථිකයට සිදුවන විපත ගැන මන්දබුද්ධික නොවන බලධාරීන් සිහිබුද්ධියෙන් සිතා බැලිය යුතුය.

● තරංග රත්නවීර



# හෙළදිවට හෙළ බසට පණ දුන්
# ඒ පින්බර දින සමරමු



අනුරපුර ඇතුළු නුවර ලංකාරාම විහාරාධිකාරී, උතුරු මධ්‍යම දිශාවේ ප්‍රධාන අධිකරණ සංඝනායක
**රළපනාවේ ධම්මජෝති මාහිමි**

හෙළදිවට, හෙළ බසට, හෙළ දූයට ''සම්බුදු ලකුණ'' පැළඳවූ දවස පොසොන් පෝදා ය. එමතු නොව හෙළ බොදු සංස්කෘතිය ද ශිෂ්ටාචාරය ද හෙළදිව පුරා ව්‍යාප්ත වන්නට මුලපිරූ දවස පොසොන් පෝ දාය. සැටදහසක් වූ තීර්ථකයන් සරණ ගොස් අපචාරයට වැටී සිටි දඹදිව මහ රජුන් වූ චණ්ඩාශෝක, මහමග වැඩම කළ නීග්‍රෝධ සාමණේරයන් රජ
මාලිගාවට කැඳවා ආගිය තොරතුරු විමසූ විට උන්වහන්සේ බුදු හඬ කැටි කළ ධම්ම පදයක් මෙසේ පැවසූහ.

''අප්පමාදෝ අමතපදං
පමාදෝ මච්චුනෝ පදං

අප්ප මත්තා නමීයන්තී
යේප මත්තා යථා මතා''

''මහරජ...... පමා නොවූ අය අමෘත පදය ලබන්නේය. පමා වූ තැනැත්තා ඉක්මනින් මරු කරා යයි. නොමියන අය නම් අප්‍රමාදව පින්කම් කරන අයයි. පමා වූ අය ජීවත් වුවත් මැරුණාක් මෙනි''.

නීග්‍රෝධ සාමණේරයන්, චණ්ඩාශෝක රජුට කියා දුන් මේ බුදු වදන, ඔහුගේ චණ්ඩභාවය නැතිකොට ඔහු ''ධර්මාශෝක'' බවට පත් කරන්නට හේතු විය. එදා චණ්ඩාශෝකට නීග්‍රෝධ සාමණේර හිමි කියාදුන් මේ උතුම් ''බුදු පදය'' අද බොහෝ බෞද්ධයන්ට දවසේ දෙතුන් වරක්ම සිහිපත් කළ යුතුව තිබේ.

නීග්‍රෝධ හිමියන්ගේ බණ පදයෙන් අවදි වූ චණ්ඩාශෝක අපචාරී හැව ගලවා දමා සදාචාරී හැව පොරවා ගනිමින් ධර්මාශෝක බවට පත් විය. ඔහුගේ ප්‍රථම ආගමික මෙහෙවර වූයේ තෙවැනි ධර්ම සංගායනාව පැවැත්වීමය. දඹදිව ධර්ම සංගායනා තුනක් පවත්වා ඇත. පළමුවැන්න සම්බුදු හිමියන් පිරිනිවන් පෑමෙන් තෙමසකට පසු අජාසත් රාජ සමයෙහි අනුබුදු මහා කාශ්‍යප හිමියන් පන්සියයක් සංඝ රත්නය පිරිවරා රජගහ නුවර සප්තපර්ණී ගුහාවේ වැඩසිට සත්මසක් පුරාවට පැවැත්වූ ධර්ම සංගායනාව විය. දෙවැනි සංගායනාව සම්බුදු හිමියන් පිරිනිවන් පා වසර සීයකට පසුව කාලාශෝක රජුගේ දායකත්වයෙන් හත්සියයක් සංඝරත්නය පිරිවරාගෙන රේවත මාහිමියන්ගේ මෙහෙයවීමෙන් විශාලා නුවර වාලුකාරාමයේදී අටමසක් පුරා පැවැත්වූ ධර්ම සංගායනාව විය. මෙම දෙවැනි සංගායනාව පවත්වා වසර 135කට පසු ධර්මාශෝක රජුගේ අනුග්‍රහයෙන් මොග්ගලීපුත්ථ තිස්ස මහරහතන් වහන්සේගේ මෙහෙයවීමෙන් දහසක් සංඝරත්නයේ දායකත්වය ඇතිව පැලලුප් නුවර අශෝකාරාමයේදී නවමසක් පුරාවට තෙවැනි ධර්ම
සංගායනාව පවත්වා ඇත.

මෙම ශාසනික සේවයෙන් පිබිදුණු ධර්මාශෝක රජුගේ දෙවැනි ව්‍යායාමය වූයේ දඹදිව අවට රටවලට ධර්මදූත මෙහෙවරක් පැවැත්වීමය. මෙම වැඩපිළිවෙළට හෙළදිව ද ඇතුළත් විය. හෙළදිවට එවීමට සැලසුම් කළ ධර්මදූත මෙහෙවරේ ධර්මාශෝක රජුගේ පුත් මිහිඳු මහ රහතන් වහන්සේ පෙරමුණ ගත් අතර ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල යන රහතන් වහන්සේලා ද සුමන සාමණේරයන් වහන්සේ සහ භණ්ඩුක නම් වූ උපාසක රාළ ද ඊට දායක වූහ. මෙම පූජනීය දූත මණ්ඩලය හෙළදිවට වැඩම කළේ පොසොන් පෝදා උදාවත් සමඟය. එසේ වැඩම කිරීමෙන් පසු අඩසිය වසකට වැඩි කලක් උන්වහන්සේලා හෙළදිව අනුරාධපුරයේ වැඩවෙසෙමින්, ධර්මයෙන්, සදාචාරයෙන්, ශිෂ්ටාචාරයෙන්, ඉතිහාසයෙන්, භාෂාවෙන්, සාහිත්‍යයෙන්, කැටයම් ශිල්පයෙන්, සෞඛ්‍යයෙන්, ආත්මීය දමනයෙන් ආදී උසස් කාර්යශූර ජන ජීවිතයකට අත්‍යවශ්‍ය ගුණ දහම්, බණ දහම්, මානව දහම්, සාර දහම් ආදිය හෙළ ජනතාවට කියා දුන්හ. මේ සියලු හැඩගැස්වීම්වලට මුල්කර ගත්තේ සම්බුදු දහමයි. මේ නිසාම පොසොන් දවස, හෙළදිව, හෙළ බස, හෙළ දූය යන තෙවැදෑරුම් අංශවල ''යළි උපන්දා'' ලෙස සැලකීම නිවැරැදිය. ජාත්‍යන්තර දින පිහිටුවීම අතින් ගත් කල පොසොන් මාසය මුල්කොට ජාත්‍යන්තර දින 19 ක් පිහිටුවා ඇතත් මුළු මහත් රටක්, ජාතියක් යළි අවදි කළ පොසොන් දා ජාත්‍යන්තර දිනයක් ලෙස සම්මත කර ගැනීමට මෙතෙක් ඉඩකඩ ලැබී නැත. ජාත්‍යන්තර දිනය කෙසේ වුවත් පොසොන් දා ''ජාතික දිනය'' වශයෙන් වත් සම්මත කර ක්‍රියාත්මක කිරීම මිහිඳු මාහිමියන්ට හා සම්බුද්ධ ශාසනයට කෙරෙන පූජනීය උපහාරයකි.

දුරාතීතයේදී මිනිස් වාසය පැවතියේ වනයේය. එවකට කැලයේ ජීවත්වන සතුන් දුබලයන් මරාගෙන කා ජීවත් වූවාක් මෙන් මිනිසුන්ද සතුන් මරාගෙන කා ජීවත් වූහ. ඔවුන්ට ආගම දහමක් නොවීය. පසු කාලයේදී මිනිසා වනයෙන් එළියට බැස ගම්, දනව් හදාගෙන ගොවිතැන් බත් කිරීමෙන් ජීවත් වීමට පෙළගැසී තිබේ. ඉන්පසුව ඔවුන් වනය යොදා ගත්තේ දඩ කෙළියටය. ''දඩ කෙළිය'' යනු කැලයට ගොස් සතුන් මැරීම නොවේ. දුනුදිය පොළා සතුන් බියකර, ඔවුන්ට පැන යෑමට සලස්වා මිනිසාගේ ජව ශක්තියෙන් ඔවුන් ලුහුබැඳීම දඩ කෙළියේ ස්වභාවයයි. අදත් සමහර රටක
ගොනුන් සමඟ පොරබැදීමේ ක්‍රීඩා පවතී. මෙය ද මිනිසාගේ ජවය පෙන්වන එබඳු ක්‍රීඩාවකි. අද මෙන් විළිබිය සිඳ දමා ශරීරාවයව ප්‍රදර්ශනය කරමින් නැටුම් ගැයුම් කිරීමේ විළිබිය නැති ක්‍රීඩා එදා සමාජය පිළිකුල් කරන ලදී. සතුන් මරා කා ජීවත්වීම වනචාරීන්ගේ පැවැත්මයි. දඩ කෙළිය එවැන්නක් නොවේ. මිනිසාගේ ජවය පෙන්වන ක්‍රීඩාවක් පමණි.

''දේවානම් ප්‍රිය'' යන ධර්මාශෝක රජුන්ගෙන් ලත් සම්මානය මුල්කොට දෙවැනි වර පැවැත්වූ රාජාභිශේකයේදී දිය කෙළි, උයන් කෙළි, සැණකෙළි ආදී විවිධ ක්‍රියාවන්ට ජනතාව පෙලැඹී සිටියහ. එහිදී හතළිස් දහසක් රාජපුරුෂයන් පිරිවරාගත් දේවානම්පියතිස්ස රජු දඩ කෙළිය සඳහා මිහින්තලේ වනගත විය. සම්බුද්ධ ශාසනය හෙළදිවට ගලා ආ ස්වර්ණමය සංසිද්ධිය මෙහිදී සිදු විය.

මිහිඳු මාහිමියන් තමන් සතු ඍද්ධි බලය මතු කරගෙන මුවකු රජු ඉදිරියෙන් මවා පා, මුවා පසුපස රජුන්ට ලුහුබැඳීමට සලස්වා රජුන් මුණගැසීමට පරිසරය සකස් කරනු ලැබිණි. මුවා ලුහුබඳිද්දී මිස්සක පව්ව මත සිට තිස්ස... තිස්ස... යැයි ඇමතුම් හඬක් ගලා ආ පැත්තට රජු හිස ඔසවා බැලීය.

මෙහිදී ප්‍රශ්නකාරී ඉරියව්වෙන් සිටි දේවානම්පියතිස්ස රජු සන්සුන් කිරීම සඳහා ''සමනාමයං මහාරාජ.... ධම්ම රාජස්ස සාවකා'' යනුවෙන් තමන් කවුරුන් දැයි හඳුන්වා දී තවදුරටත් සන්සුන් කිරීම සඳහා මෙසේ පැවසූහ.

**''තේ විජ්ජා ඉද්ධි පත්තාච**

**චේතෝ පරිඤ්ඤ කෝවිධෝ**

**දිබ්බ සෝතා රහත් තාච**

**බහු බුද්ධස්ස සාවකා''**

''මහරජ දඹදිව කසාවතින් බබළයි. මහා ඍද්ධි ඇති, ත්‍රිවිද්‍යාවන්ට පැමිණි, දිවැස් ලැබූ, පරසිත් දකින රහතුන් වහන්සේලා දඹදිව බොහෝ වෙසෙති.'' ආදී වශයෙන් තමන් පිළිබඳ තොරතුරු කියාදී දේවානම්පියතිස්ස රජු දමනය කර ගත්හ. ඉන්පසු රජුගේ බුද්ධි ශක්තිය මැන බැලීමට මෙන් අඹ ගසේ ප්‍රශ්නය සහ ඥාති ප්‍රශ්නය යොමු කිරීමේදී තිස්ස රජු බුද්ධිමත්ව ඒ ප්‍රශ්නයන්ට පිළිතුරු දීම නිසා තමන් පැමිණි පරමාර්ථය ඉෂ්ට සිද්ධ කර ගැනීම පිණිස දේවානම්පියතිස්ස රජු මුල්කොට සම්බුද්ධ ශාසනය හෙළදිව පුරා වපුරන්නට මිහිඳු මාහිමියෝ අධිෂ්ඨාන කරගත්හ.

මීළඟට තිස්ස රජු ප්‍රධාන පිරිස බුදු දහමට නැඹුරු කරවීම සඳහා සියලුදෙනා තිසරණ පන්සිල්හි පිහිටුවා ඍද්ධි බලයෙන් ලබාගත් හෙළ බස හරහා ''චුල්ලහත්ථිපදෝපම'' සූත්‍රයෙන් මිහිඳු මහ රහතන් වහන්සේ ධර්ම දේශනා කළහ. මේ ධර්ම දේශනාවෙන් පසු සියලුදෙනා බුද්ධාලම්බන ප්‍රීතියෙන් යුතුව අනුරපුර අගනුවර බලා ගිය අතර තිස්ස රජු විසින් අනුරපුරට වඩින ලෙස මිහිඳු මාහිමියන් ඇතුළු පිරිසට ආරාධනා කරනු ලැබීය. එදින නොව පසුදින වඩින බව මිහිඳු මාහිමියන් දන්වූ පසු තිස්ස රජු භණ්ඩුක උපාසකට කතාකොට මිහිඳු මාහිමි ඇතුළු පිරිසගේ රාත්‍රී දානය ගැන විමසනු ලැබීය. ''ඉරු අවර වීමෙන් පසු ආර්යයෝ ආහාර නොගන්නා හු යැයි'' භණ්ඩුක උපාසක විසින් පැහැදිලි කර දෙනු ලැබීය. සංඝරත්නය අද දක්වා රාත්‍රියට ආහාර නොගන්නා පිළිවෙත රැකගෙන එන්නේ මෙම මිහිඳු මාහිමි ප්‍රතිපත්තිය අනුකරණය කිරීමෙනි.

පසුදින මිහිඳු මාහිමි ඇතුළු සංඝරත්නය වැඩමවාගෙන ඒමට තිස්ස රජතුමා විසින් සිය මංගල රථය ඇතුළු නුවර සිට මිහින්තලයට යවන ලද නමුත් රථය ආපසු එවා මිහිඳු මාහිමි ඇතුළු සංඝරත්නය ඍද්ධි බලයෙන් අනුරපුර ඇතුළු නුවරට වැඩම කළහ. මිහිඳු මාහිමියන් ඇතුළු නුවර පොළොවට පය තැබූ පූජනීය ස්ථානය සිහිවන්නට තිස්ස රජු විසින් එම ස්ථානයේ ''පඨමකචේතිය'' සෑය ඉදිකරනු ලැබීය. එදින රජවාසලේදී දානය වැළඳූ මිහිඳු මාහිමියෝ ''දේවදූත'' සූත්‍රයෙන් අනුලා දේවිය ඇතුළු පන්සියයක් පිරිසට ධර්ම දේශනා කොට ඔවුන් සෝවාන් ඵලයෙහි පිහිටුවනු ලැබීය. මිහිඳු මාහිමියන් ඇතුළු පිරිසට... තවදුරටත් සම්බුද්ධ ශාසනය හෙළදිව ව්‍යාප්ත කිරීම පිණිස දේවානම්පියතිස්ස රජු විසින් මහමෙවුනා උයන පූජා කරන ලදී. අනුරපුර මහමෙවුනා උයන සිවු බුදුවරයන්ගේ පාදස්පර්ශය ලත් අති පූජනීය භූමියකි.

කකුසඳ බුදුරදුන් රෝග බිය දුරුකිරීම සඳහා ද කෝණාගම බුදුරදුන් දුර්භික්ෂ බිය දුරුකිරීම සඳහා ද කාශ්‍යප බුදුරදුන් කෝලාහල බිය දුරුකිරීම සඳහා ද ගෞතම බුදුරදුන් අමනුස්ස බිය දුරුකිරීම සඳහා ද හෙළදිව මහමෙවුනා උයනට වැඩම කළ බව ශාසන ඉතිහාසයේ දක්වෙයි. මේ අනුව මහමෙවුනා උයන පින්බර කෙතක් තරමට අතිශය පුණ්‍ය භූමියක් වෙයි. මෙම මහමෙවුනා උයනට සිරිමා බෝ සමිඳු එක්වීමෙන් ද ස්වර්ණමාලි චෛත්‍යරාජයා ඇතුළු මිරිසවැටිය, ලංකාරාමය, අභයගිරිය, ජේතවනය, ථූපාරාමය ආදී අටමස්ථානය එක්වීමෙන් ද මේ පින්බිම සම්බුදු රදුන් ජීවමානව වැඩසිටි කලෙක මෙන් බුදු දහමෙන් ඒකාලෝකව පවතී.

මේ පින්බිම තුළ බෞද්ධයන් ඉරියව්වෙන්, හැසිරීමෙන් කතාබහෙන්, පැවැත්මෙන් අතිශය සිල්වත් විය යුත්තේ මේ නිසාය. වසර දෙදහස් පන්සියයකට වැඩි කලක් තිස්සේ ජීවමානව පවතින සම්බුද්ධ ශාසනය හෙළදිව මිහින්තලේ මුල්කොට පැලපදියන් වූයේ අනුරපුර ඇතුළු නුවර අති පූජනීය මහමෙවුනා උයනේය. එසේ පැලපදියන් කළේ පොසොන් පෝ දිනෙක මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රමුඛ සංඝරත්නය විසිනි. මේ නිසා තමන්ගේ ජාතික ආගමික දිනය වශයෙන් පොසොන් පෝදා සිංහල බෞද්ධ ජනතාවට අතිශයින්ම වැදගත් වේ. පොසොන් පෝදාට දිවයිනේ හතර දික්භාගයෙන් ලක්ෂ ගණන් සිංහල බෞද්ධ ජනතාව අනුරපුර මහමෙවුනා පින්බිමට සහ මිහින්තලේ පින්බිමට ඇදී එන්නේ ඒ නිසාය. පොසොන් පෝදාට මෙසේ ගලා එන ලක්ෂ සංඛ්‍යාත ජනතාව සාක්ෂ්‍ය කොට අනුරපුර මහමෙවුනා පින්බිම ඇතුළු ''ඇතුළු නුවර'' ශුද්ධ වස්තුවක් ලෙස සැබෑ පුණ්‍ය භූමියක් ලෙස ප්‍රතිසංවර්ධනය කිරීමටත්, පොසොන් පෝදා ''ජාතික දිනය'' ලෙස ප්‍රකාශයට පත් කිරීමටත් අද රටේ පවතින බෞද්ධ රාජ්‍යය සැලකිලිමත් වන්නේ නම් එය සම්බුද්ධ ශාසනයටත්, බෞද්ධ ජනතාවටත් කෙරෙන ගෞරවයක් හා සැලකිල්ලක් වේ.




අපේ ස්ථාවරත්වය සමග ඔබේ ආයෝජනයට ඉහළම ප්‍රතිලාභ

ස්ථාවර තැන්පතු පොලී අනුපාත

| කාලය | මාස 03 | මාස 06 | අවුරුදු 01 | අවුරුදු 05 |
|---|---|---|---|---|
| වා.පො.අ | 13.50% (වා.ස.පො 14.20%) | 14.50% (වා.ස.පො 15.03%) | 15.00% (වා.ස.පො 15.00%) | 18.50% (වා.ස.පො 14.00%) |

ඔබේ ස්ථාවර තැන්පතු වලින් 90% දක්වා මුදල් අත්තිකාරම් ලෙස ලබා ගැනීමේ අවස්ථාව

COMMERCIAL BANK

*කොන්දේසි සහිතයි | Fitch Rating AA- (lka) | +94 112 353 353 | www.combank.lk

ඔබේ ජය අපේ පැතුමයි




# ගිරුවායේ පවුල් දේශපාලනය

## ලෙනාඩ් වුල්ෆ් එදා කළ හෙළිදරව්වේ රහස්...

ලෙනාඩ් සිඩ්නි වුල්ෆ් යටත් විජිත සමය තුළ ශ්‍රී ලංකාවේ සේවය කළ කීර්තිමත් සිවිල් සේවකයෙකු ලෙස ප්‍රකටය. එංගලන්තයේ සුප්‍රකට ක්‍රේම්බිජ් විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථියකු වූ ඔහු 1904 වර්ෂයේ දී බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ යටත් විජිතයක්ව පැවති ලංකාවේ සිවිල් සේවයට සම්බන්ධ වීමට වරම් ලැබීය. 1904 සිට 1906 දක්වා යාපනයේ ප්‍රාදේශීය ආදායම් පාලක (DRO) ලෙස සිය මුල් පත්වීම ලද ඔහු යාපනය වසර දෙකක සේවයෙන් පසුව මහනුවර කච්චේරියේ උප දිසාපති වරයෙකු ලෙස වර්ෂයක් සේවය කිරීමෙන් පසු 1907 වර්ෂයේ හම්බන්තොට උප දිසාපතිවරයා ලෙස පත්වීමක් ලබා එකල දරිද්‍රතාවයෙන් පූර්ණ ශුෂ්ක දේශගුණයකින් යුත් අති දුෂ්කර ප්‍රදේශයක්ව පැවති හම්බන්තොටට යෑම සිදු කරන ලද්දේ කුඩා කල පටන් ඔහුගේ සිත තුළ සැඟව තිබූ ''නැති බැරි එකාට ප්‍රමුඛව සේවය කිරීමේ" ගුණාංගය මුල් කොටගෙනය.

1907 සිට 1911 දක්වා පුරා වසර හතරක් ඔහු හම්බන්තොට උප දිසාපතිවරයා ලෙස සේවය කළ අතර මේ කාල සීමාව තුළ සිය වෘත්තීය ජීවිතය කාර්යාලයට පමණක් සීමා නොකොට මාගම්පත්තුවේ අසරණ ගැමියන්ගේ දුක සැප සොයා බැලීමට කරත්තවල නැගී, අශ්වයා පිටින්, මෙන්ම පාද චාරිකාවන්හිද යෙදෙමින් ගම් නියම්ගම්වල සැරිසැරීම විනෝදාංශයක් කර ගත්තේය. එකල යාල වනෝද්‍යානයේ මුල්ම පාලකයා ලෙස කටයුතු කළ දකුණු අප්‍රිකානු බෝයර් ජාතිකයෙකු වූ ''Engel Bred" වුල්ෆ්ගේ කුළුපග මිතුරෙකු වූ නමුත් බ්‍රිතාන්‍ය රජයට විරෝධය පෑම සඳහා එංගල් බෙර්ට් හම්බන්තොට නගරයේ නිරුවතින් ඇවිද යෑමේ චෝදනාව මත ඔහුට සිලින් 5 ක දඩයකට යටත් කිරීම පවා ලෙනාඩ් වුල්ෆ් විසින් සිදුකර ඇත්තේ මිතුරුකම අභිබවා ගිය නීතියේ ආධිපත්‍යය තහවුරු කරමිනි.

ලෙනාඩ් වුල්ෆ් ඒජන්තවරයා ජනහිතකාමී රාජ්‍ය නිලධාරියකු වුවත් තම ආධිපත්‍ය තුළ අහිංසක ගැමියන් තලා පෙළීමට ලක් කරන ගං ආරච්චිල, නිලමේවරු, විදානේවරු සහ කෝරලේ මහත්තුරු සමග වෘත්තිමය කරුණු අලළා නිරතුරුවම ගැටුම් ඇති කරගත් අයෙක් විය. විවිධ ප්‍රශ්නයන් හමුවේ ස්වදේශීය පාලකයන් විසින් ඒජන්තවරයා වෙත එවනු ලබන වාර්තා එක එල්ලේම විශ්වාස නොකළ ඔහු සැමදා ඔහු සමග මිතුරු සමාජයට එක්ව සිටි සාමාන්‍ය ගැමියන්, ගම්භාරයන් වැනි පහළ පැළැන්තියේ අයගෙන් එවැනි සිද්ධීන්වල යථාර්ථය දැනගෙන ඒ අනුව අවසන් තීන්දුවට එළඹීම සිදු කළේය. මේ හේතුවෙන් ''වුල්ෆ්" ස්වදේශීය රාජ්‍ය නිලධාරීන් අතර එතරම් ජනප්‍රිය පුද්ගලයෙකු නොවූ අතර ගිරුවායේ රාජපක්ෂ පරපුරට ළඟ ඥාති සම්බන්ධතාවක් පැවති බුද්ධියගම විජේසිංහ නිලමේ (පාර්ලිමේන්තුවේ හිටපු මහලේකම් සෑම් විජේසිංහ මහතාගේ මුත්තණුවන්) නමැති ස්වදේශීය නිලධාරියාගේ වැඩ තහනම් කිරීමේ සිද්ධියක් සම්බන්ධව ඔහුට බ්‍රිතාන්‍ය ආණ්ඩුව සමඟද ගැටීමට අවසානයේදී සිදු විය. එංගලන්තයට යෑමෙන් පසුව ඔහු කවදත් ඇලුම් කළ සාහිත්‍යකරණයට නැවත පිවිසි අතර ශ්‍රී ලංකාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගත කළ සමය තුළ ග්‍රහණය කරන ලද කටුක වූත් සුන්දර වූත් අතීත සිදුවීම් අළලා ඔහු සාහිත්‍ය කෘතීන් ගණනාවක් රචනා කළ අතර මෙම කෘතීන් අතර මාගම්පත්තුවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉතාමත්ම දුෂ්කර ගම්මානයක්ව පැවති උඩමත්තල ග්‍රාමයේ 1910 වකවානුවේ සිදු වූ දිවිත්ව මිනීමැරුමකට සම්බන්ධ සත්‍ය සිද්ධියක් පසුබිම් කොට ඔහු විසින් රචිත ''The Village in the Jungle" කෘතිය ඉංග්‍රීසි සාහිත්‍යය තුළ මෙම ගණයට අයත් වන කෘතීන් කාණ්ඩය අතර සුවිශේෂ කෘතියක් ලෙස විචාරකයන්ගෙන් නිබඳ ප්‍රශංසාවට ලක්වීම සිදුවිය. මෙම කෘතිය ''බැද්දේගම" නමින් ඒ. පී. ගුණරත්න ශූරීන් විසින් සිංහලට පරිවර්තනය කර ඇති අතර සිංහල කෘතිය අළලා මහාචාර්ය ඒ. ජේ. ගුණවර්ධන ශූරීන්ගේ තිර රචනයෙන් කෘතහස්ත ජාත්‍යන්තර සිනමාවේදී ලෙස්ටර් ජේම්ස් පීරිස් විසින් නිර්මාණය කරන ලද ''බැද්දේගම" සිනමා කෘතියද ශ්‍රී ලංකාවේ නිර්මාණය වූ විශිෂ්ටතම සිනමා කෘති අතරට ගැනෙන සුවිශේෂ සිනමා කෘතියක් ලෙස ද හැඳින්වූ වුවහොත් නිවැරැදිය.

1911 දී ලංකාවෙන් එංගලන්තයට සංක්‍රමණය වූ ලෙනාඩ් වුල්ෆ් එයින් හරියටම වසර පනහකට පසු 1961 වර්ෂයේදී සිය යොවුන් දිවිය තුළ අමරණීය මතකයන් රැසක් එක්කළ මෙම සොඳුරු දිවයින නැවත දැක ගැනීමේ රිසියෙන් වයස අවුරුදු 80 ක් වූ වයෝවෘද්ධකයකු ලෙස නැවත ශ්‍රී ලංකාවට පැමිණියේය. මෙම සංචාරයේදී ලෙනාඩ් වුල්ෆ්ගේ සහායකයා ලෙස කටයුතු කරනු ලැබුවේ එවකට හම්බන්තොට ප්‍රදේශයේ පුවත්පත්වල සමූහ වාර්තාකරු ලෙස කටයුතු කළ විජේසිංහ බෙලිගල්ල මහතා විසිනි. ගිරුවාය අරක්ගෙන සිටින ''රාජපක්ෂ දේශපාලන පිළිලය" ගැනද කරුණු කාරණා රාශියක් අන්තර්ගතව තිබීම හේතුවෙන් එවකට කම්කරු අමාත්‍යවරයාව සිටි මහින්ද රාජපක්ෂ මහතා විසින් මෙම කෘතිය දකුණු පළාත තුළ බෙදා හැරීම සම්බන්ධව නිල නො වන වාරණයක් පැනවීම සිදුකළ බව ප්‍රසිද්ධ රහසකි. 2001 වර්ෂයේදී ලියුම්කරු මෙම කෘතියේ රචකයා වන බෙලිගල්ලේ විජේසිංහ සාහිත්‍යධරයා ඔහුගේ නිවසේදී හමු වූ අවස්ථාවේ දී එතුමා විසින් මෙම තත්ත්වය සනාථ කරන ලද බව සඳහන් කරමි.

එදා ගිරුවායේ පැවති සමාජ තත්ත්වය සහ විශේෂයෙන්ම ගිරුවාය අරක්ගෙන සිටි රාජපක්ෂවරුන්ගේ දේශපාලනය ගැන 1961 වර්ෂයේදී ලෙනාඩ් වුල්ෆ් විසින් සඳහන් කරන ලද කරුණු කීපයක් මෙසේ ඔබ වෙත ඉදිරිපත් කරනු ලබන්නේ අතීත සිදුවීම් වර්තමානයට ගළපා ගැනීමේ අවශ්‍යතාව මුල්කරගෙනය.

අසරණ ගැමියන්ට බොරු නඩු ගොතා ඔවුන් අමාරුවේ දැමීම එකල මාගම්පත්තුවේ මෙන්ම ගිරිවායේ ද නිල උරුමක්කාරයන් විසින් සිදුකරන ලද දෙයකි. ඒ ගැන වුල්ෆ් සිය සංචාරයේදී මෙසේ සඳහන් කළේය.

''රාජකාරි වලව් ගැන මං දන්නවා වලව්වලින් වන කරදර ගැන ගොවියන් මට නිතර පැමිණිලි කළා. රාජකාරියෙන් වලව්කාරයා වීම හොඳ දෙයක් නොවෙයි. දුප්පතුන්ට පිහිට වීමයි වැදගත්. විදානආරච්චි වලව්

> රාජපක්ෂවරු ගැන දිගු සටහන් තබලා...

කාරයන් වැනි අය සමඟ මිනිස්සු මනාපයක් නෑ. මා විභාග කළ නඩුවලින් පැහැදිලි වූ වැදගත් ම කාරණය තමයි නඩු බොහොමයක්ම බොරු නඩු බව දුප්පත් මිනිසුන්ට විරුද්ධව රාජකාරි කාරයෝ බොරු නඩු ගොතනවා"

මාගම්පත්තුවේ විසූ අදීන කවි කාරයෙකු වූ ''බැදිගම අප්පුහාමි" සිය කවියෙන් හැමවිටම පහර දුන්නේ ස්වදේශීය පාලක පැලැන්තියටය. එම තත්ත්වය ගැන වුල්ෆ් විසින් සිය සංචාරයේදී සඳහන් කළේ මෙසේය.

මගේ කාලේ බැදිගම අප්පුහාමි කියන ප්‍රසිද්ධ කවියෙක් මුදලි උත්තමයින්ව තුට්ටුවකටවත් කිසි තැකීමක් කළේ නෑ. එඩිතර මිනිහා අප්පුහාමිගේ මල්ලි තමයි බැදිගම රතනපාල" මහා ස්වාමීන් කියන්නේ

සල්ලි ගත් නමුත් නිල විකුණා
මෙහෙම බල්ලෙකුත් කරයි ගිරවා මුදලි කම

අල්ලස් අරන් මුලාදෑනි තනතුරු දුන්න මුදලියකුට බැදිගම අප්පුහාමි එහෙමයි කවියෙන් පහරදුන්නේ.

රාජකාරි කරන හොරකම් තිබුන වලව් පැලැන්තියේ හාමුලාගේ නොසන්ඩාලකම් ගැන බැදිගම අප්පුහාමි ප්‍රසිද්ධියේම කවියෙන් බැන වැදුනා. කවියෝ ලේඛකයෝ පුවත්පත් කාරයෝ එහෙම ඉන්න ඕනා අනික් කාරණය තමයි ලොක්කන්ට බය නැතිව ලියන කියන මිනිහට මිනිස්සු කැමතියි.

ගිරුවායේ දේශපාලනය මෙන්ම වුල්ෆ්ට ආපසු එංගලන්තයට යෑමට මුල් වූ කරුණු ගැනද ඔහු සිය සංචාරයේදී මෙසේ සඳහන් කළේය.

එක්දහස් නවසිය තිස් එකේ පටන් ලංකාවෙ මිනිස්සු සර්වජන ඡන්දයෙන් තමන්ගේ මන්ත්‍රීවරු තෝරා ගත්තේ. නමුත් හම්බන්තොට පළාත දියුණු වෙලා නෑ. නම්බුකාර හාමු මහත්තුරු නැත්නම් වලව් පැලැන්තියේ හාමුදුරුවරු මන්ත්‍රණ සභාවට ගියාම දුප්පත් ගම්මුන්ට සේවයක් කරල නැහැ. මේ පළාත් පිරිහෙන්න හේතුව ඒකයි.

උන් හිටි හැටියෙම සිවිල් සේවය අතහැරදමා එංගලන්තයට ගියේ මා මුහුණ දුන් අසාධාරණය නිසයි. හිතට එකඟව නීතියට අනුව සේවයක් කරන්නට ඉඩක් නැත්තං ඒ සිවිල් සේවයෙන් ඉවත්ව ගෙදර යෑම සුදුසු බව මම සර් හියු ක්ලිෆඩ් තුමාට ලියා යැව්වා සංවිධානය වුණු ලංකාවේ වලව් පැලැන්තිය මට විරුද්ධව එක පෙරමුණක් වුණා විජේසිංහ මුදලිගේ වැඩ තහනම් කිරීම නිසා මම කළ දේ නිවැරදියි. නිවැරදිව නීතියට එකඟව වැඩ කරන්නට ඉඩක් නැත්නම් මං ඉල්ලා අස්වෙනවා යැයි ආණ්ඩුකාරයාටත් මම ලියා යැව්වා.

රාජපක්ෂ පවුල්වාදය ගැන ලෙනාඩ් වුල්ෆ් සිය සංචාරයේදී සඳහන් කර ඇත්තේ මෙසේය

ශතවර්ෂ බාගයක්ම හම්බන්තොට පවතින්නේත් පවුල් දේශපාලනය. 1931 දී හම්බන්තොට දිසාවට එක මන්ත්‍රී කමයි දැන්නම් මන්ත්‍රී කොට්ඨාස තුනයි. මුලින්ම මන්ත්‍රීවරයා වුණේ තංගල්ලේ වික්‍රමනායක උන්නැහේ. 1936 බුද්ධියාගම ඩී. එම්. රාජපක්ෂ රාජ්‍ය මන්ත්‍රී වුණා. අපි ඡන්දෙ දුන්නේ දැන් වගේ පක්ෂ ලකුණුවලට නං නොවෙයි. පාටක් දීල තිබුණ ගිහින් නියමිත පාට පෙට්ටියට ඡන්දය දමනවා. ඩී. එම්. රාජපක්ෂ උන්නැහැට තිබුණෙ දුඹුරු පාට කුරක්කන් පාට. මං ඉල්ල ගත්තා කියලා රාජපක්ෂ උන්නැහේ රුහුණු පළාතේ හේන් කාරයන්ට කිව්වේ අපේ කුරහන් පාට ජය වේවා කියලා. ගමේ මිනිස්සු කෑ ගැහුවා ඩී. එම්. රාජපක්ෂ උන්නැහැට ගුරුපාට දීමත් රසවත් කතාවක්. රාජපක්ෂ උන්නැහේගේ අප්පොච්චි මුලින් ගම්මුලාදැනියා. පස්සේදී ඉංග්‍රීසි ආණ්ඩුවෙන් විදානාරච්චි තානාන්තරයක් ලැබුණා. විදානාරච්චි තානාන්තරය ලැබුණම ගරු නම්බු ලැබිල හාමුලා වෙනවා. නැවි පනා, කළු කෝට් කඩු කස්තාන රිදී බොත්තම් පාට සරුවාල ඇඳුම් ආයිත්තම් ලැබෙනවා. බුද්ධියගමත් වලව්වක් වුණේ එහෙමයි. ඩී. එම්. රාජපක්ෂ උන්නැහැ කියන්නේ බුද්ධියගම විද්‍යානාච්චි ගේ ලොකු පුතා සම්ප්‍රදායට අනුව එතුමාත් හාමු කෙනෙක්.

1936 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවට මන්ත්‍රී ඡන්දෙදි ඩී. එම්. රාජපක්ෂ හම්බන්තොටට නාමයෝජනා දෙන්න ගියේ හඩ්සන් ඒජන්ත ළඟට. දෙන්නට දෙන්නා නයි පොළොං අමනාපයෙන් හිටියේ. නීතිඥ ලූෂන් පෝලියර්, වික්‍රමසූරිය, පෙරේරා වගේ ප්‍රභූන් මැතිවරණයට නාමයෝජනා දුන්නා. අන්තිමට බුද්ධියගම ඩී. එම්. රාජපක්ෂ උන්නැහේ නාමයෝජනා කඩදාසිය දිසාපතිතුමාට ඉදිරිපත් කළා. ඉදිරිපත් කරන ගමන් මගේ පාට කුමක්දැයි දිසාපතිතුමා ගෙන් ඇහුවා. ආ .... ඩී. එම්. රාජපක්ෂද? උඹේ පාටද ඇසූ දිසාපති පී. ජේ. හඩ්සන් මහතා එක වරම තම කකුලක් ඔසවා මේසය උඩින් තියලා මෙන්න උඹේ පාට ගනින් කිව්වා. මෙන්න මේ අන්දමට තමයි ඩී. එම්. රාජපක්ෂට දුඹුරුපාට ලැබුනේ. ඒත් ඔහු ඒ පාට කුරහන් පාට කියල දුප්පත් හේන්කාරයන් රැවැට්ටුව.

හරියටම මැතිවරණ දවසෙ පී. ජේ. හඩ්සන් දිසාපතිතුමා රාජපක්ෂ උන්නැහේව වීරකැටියෙ මඩුව පාසලේ ඡන්ද පොළේදී මැතිවරණ චෝදනාවකටව අත්අඩංගුවට ගැනීමත් ඔහුට වාසියක් වුණා. වැලිකඩ බන්ධනාගාරයේ රඳවා සිටියදීම රාජපක්ෂ මහතා හම්බන්තොට මන්ත්‍රී වුණා. මෙතනින් ආරම්භ වූ දේශපාලන රටාව දිගින් දිගටම පැවතුනා. දැන් මේ පවුල් අත්තිවාරම ශතවර්ෂ භාගයක් තරම් පැරණියි. පවුල්වාදයෙන් යම් ප්‍රදේශයක් පිරිහීමේ විපාකයට ලංකාවේ ඇති හොඳම උදාහරණය අපේ මේ හම්බන්තොට දිස්ත්‍රික්කයයි.

පශ්චාත් නිදහස් සමය තුළ ශ්‍රී ලංකාවේ පාලනය සකස්ව ඇති ආකාරය සහ සකස් විය යුතු ආකාරය ගැන වුල්ෆ් මෙම සංචාරය දී පළ කළේ මෙවැනි අදහසකි.

බ්‍රිතාන්‍යයෙන් නිදහස ලැබුණු රාජ්‍යයන්හි නායකත්වය සාමාන්‍ය පන්තියේ පොදු ජන හිතකාමී මහජන සේවකයන්ට ලැබෙන්න ඕනා. නැත්තං ඒ රටවල් විනාශ වෙනවා. සාමාන්‍යයෙන් මිනිසුන්ගේ ඡන්දයෙන් මහේශාක්‍ය බල පුළුවන් කාරයෝ රටවල්වල පාලනයට පත් වීම ඉක්මනින් අවසාන වෙන්න ඕන.

පාලකයෝ යටත් විජිත කාලයේදී සමාජයෙන් නම්බුකාර නිලතල දේපළ උරුම වුණු ප්‍රබල පවුල්වල ඉංග්‍රීසි උගත් උදවිය ඒ අය හිතන්නේ තමන්ගෙන් පස්සේ රාජ්‍ය පාලනය ඊළඟ අයට දෙන්න අප්පොච්චිච්චිගෙන් දූ පුතුන්ට පවුලේ මහා බූදලය උරුම වෙනවා වගේම රාජ්‍ය නායකකමත් හත්මුතු පරම්පරාවේ උරුමයක් විදිහටයි. නිදහස ලැබුණු යටත් විජිතවල නායකයෝ කල්පනා කළේ ලංකාවෙත් මේ කිව්ව කාරණය සිද්ධ වුණා. සිද්ධ වේගෙන යන්නෙත් ඒකයි.

1936 රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සිට 1960 දක්වා හම්බන්තොට දිස්ත්‍රික්කයේ රාජපක්ෂ පරම්පරාවට අවශ්‍ය ආකාරයට මැතිවරණ කොට්ඨාස බෙදුනු අන්දම ගැන ලෙනාඩ් වුල්ෆ් සිය සංචාරයේදී උපහාසාත්මකව සඳහන් කළේ මෙසේය. ඒ වගේම පවුල් දේශපාලනයට නිර්දය ලෙස පහර ගැසීමටද වුල්ෆ් සිය කෘතහස්ත දේශපාලන දැනුම මේ අවස්ථාවේදී උපයෝගී කරගෙන ඇත.

> එදා කී කාරණා අදටත් වලංගුයි...

1936 රාජ්‍ය මන්ත්‍රණ සභාවට පත් වෙච්ච බුද්ධියාගම ඩී. එම්. රාජපක්ෂ 1945 මැයි මාසයේ 18 වෙනිදා හදිසියේම අභාවප්‍රාප්ත වුණා. ඔහුගේ ඇවෑමෙන් මන්ත්‍රීකමට පත් වුණේ ඔහුගේ බාල සොහොයුරා ඩී. ඒ. රාජපක්ෂ. එයාගේ මල්ලි අමාරුවෙන් පොළඹවාගෙන නාමයෝජනා දෙන්න එක්කන් ගියා වෙන කිසි කෙනෙක් ඉදිරිපත් වුණේ නෑ. දිසාපති හැටියට


ඩී. ඒ. රාජපක්ෂ සිය පුතුන් සමග

හිටියේ ඩී. ජේ. ඕවර්ලොෆ් හාමුදුරුවෝ. ඩී. ඒ. රාජපක්ෂ මහත්තයා එදා නිතරගයෙන්ම හම්බන්තොට රාජ්‍ය මන්ත්‍රීකමට පත්වුණා. ලංකාවට නිදහස ලැබුණේ හතළිස් අටේදී. සෝල්බරි සාමිගේ නිර්දේශය මං දන්නවා. 1947 මහ මැතිවරණයෙන් ඩී. ඒ. රාජපක්ෂ බෙලිඅත්ත මන්ත්‍රී වුණා. ලක්ෂ්මන් රාජපක්ෂ හම්බන්තොට මන්ත්‍රී වුණා. හැටේ මාර්තු මාසයේ ඒ කිව්වේ ලබන මාසේ මහමැතිවරණයෙන් ඒකටත් මුල්කිරිගල කියලා අලුත් ආසනයක් බෙදලා මුල්කිරිගල ආසනය බෙදලා දුන්නේ තවත් රාජපක්ෂ මහත්තයෙකුට පාර්ලිමේන්තු යන්න. ඩී. එම්. රාජපක්ෂ මැරුණා. රාජ්‍ය මන්ත්‍රීතුමාගේ දෙවැනි පුතා ජෝර්ජ් රාජපක්ෂ මහත්මයාට ඒ මහත්මයාත් මැතිවරණය දිනයි කිසිම සැකයක් නැහැ. අපේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඡන්ද කොට්ඨාස බෙදෙන්නේ රාජපක්ෂ පවුලෙන් උගත් උදවිය කලඑළි බහින අන්දමට නේ.

ගිරුවායේ රාජපක්ෂවරුන්ගේ දේශපාලනය ආරම්භ කරන්නේ බුද්ධියගම ඩී. එම්. රාජපක්ෂ විසින් කොන්දගල වලව්වේ පදිංචිව සිටි ඩී. එම්. ගේ ඇවෑමෙන් ඔහුගේ සොයුරු මැදමුලන පදිංචිව සිටි ඩී. ඒ. රාජපක්ෂ දේශපාලන කරළියට පිවිසියේය. එදා මෙදා තුර හම්බන්තොට දිස්ත්‍රික්කය රාජපක්ෂවරුන්ගේ ග්‍රහණයට හසුවී තිබීම වුල්ෆ් සිය සංචාරයේදී දුටුවේ මෙසේය.

මේ ප්‍රදේශය මුලින්ම හම්බන්තොට රාජ්‍ය මන්ත්‍රණ සභාවට අයත් වුණා. 1946 හිටපු ඩී. එම්. රාජපක්ෂ මහත්තයා හදිස්සියේ මළාම එතුමාගේ මල්ලි මැදමුලනේ ගොවිතැන් කරමින් උන්න ඩී. ඒ. රාජපක්ෂ මහත්තයා එදා නිතරගයෙන් අයියාගේ අඩුපාඩුව සම්පූර්ණ කළා. වැරදිලාවත් ඩී. එම්. රාජපක්ෂ මන්ත්‍රීතුමා මියයන වෙලාවේදී එතුමාගේ ලොකු පුතා ලක්ෂ්මන් රාජපක්ෂ වයස සම්පූර්ණ වෙලා උන්නා නම් ඩී. ඒ. රාජපක්ෂ බාප්පොච්චිට මන්ත්‍රීකම ලැබෙන්නෙ නෑ. කොන්දගල වලව්වෙන් මැදමුලන වලව්වට මන්ත්‍රීකම හුවමාරු වුණේ එදා ලක්ෂ්මන් රාජපක්ෂ නොමේරූ ළමයෙක්ව සිටි නිසයි. 47 මැතිවරණය වෙලාවෙදි ලක්ෂ්මන් රාජපක්ෂ වයස සම්පූර්ණයි. මියගිය පියාගේ මන්ත්‍රීකමට ඉදිරිපත් වෙන්න සූදානම් වුණා. ඩී. ඒ. රාජපක්ෂ මේකට හොඳටම බය වුණා. ලක්ෂ්මන් පුතා ඉදිරිපත් වුණොත් මට ආපහු මැදමුලනේ කුඹුරු කොටන්න වෙනවා. දැන් වහාම හම්බන්තොට දිස්ත්‍රික්කය දෙකට කඩලා ලක්ෂ්මන්ටත් ආසනයක් හදලා දෙන එකයි තියෙන්නේ. වහාම ඩී. ඒ. රාජපක්ෂ කොළඹ ගියා ඩී එස් සේනානායක, බණ්ඩාරනායක වැනි නායකයන් මුණගැහුණා. කරුණාකර හම්බන්තොට කොට්ඨාසය දෙකකට කඩන්න. නැත්තං මෙදා ලක්ෂ්මන් එනවා මට එන්න ලැබෙන්නෙ නෑ. ගෙදර ඉන්න වෙනවා. කරුණාකර හම්බන්තොට දෙකට කඩන්න. මට බෙලිඅත්තේ කියලා ආසනයක් බෙදලා දෙන්න. ඩී. ඒ. රාජපක්ෂ බැගෑපත්ව කන්නලව් කළා. ඔන්න ඉතින් රාජපක්ෂ පවුල්වාදයට අනුව හම්බන්තොට දිස්ත්‍රික්කය දෙකට බෙදුවා 1947 දි ලක්ෂ්මන් රාජපක්ෂ මුලින්ම හම්බන්තොටට තරග කෙරුවා. ඩී. ඒ. රාජපක්ෂ බෙලිඅත්තට තරග කළා. එදා ඉඳලා මේ බාප්පයි පුතයි හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගරු මන්ත්‍රීවරුන්. මේ අතරවාරයේදී මැරුණ ඩී. එම්. රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ දෙවැනි පුතා අධිනීතිඥ වෙලා දැන් ගමේ ඇවිත් දේශපාලනය ගැන කුසු කුසු ගාන්නට වුණා. පුංචි බග්ගියට් කාර් එකකින් ගම්මඩුවේ ඇවිදිමින් මන්ත්‍රීකම ගැන තැන තැන කන්කෙඳිරි ගෑවා. මේ වෙනකොට කොන්දගල වලව්වේ ලක්ෂ්මන් රාජපක්ෂගේ මල්ලි ජෝර්ජ් රාජපක්ෂ දේශපාලනයට ඉව අල්ලමින් හිටියේ. ජෝර්ජ් රාජපක්ෂටත් හම්බන්තොටින්ම කෑල්ලක් කඩලා නුදුන්නොත් ලබන සැරේ බෙලිඅත්තට ඉදිරිපත් වෙයි කියලා ඩී. ඒ. රාජපක්ෂ හිතුවා. මේ අතරවාරයේ අගමැති බණ්ඩාරනායක මැතිවරණ කොට්ඨාස බෙදීමේ කොමිසමත් දැම්මා. ඩී. ඒ. රාජපක්ෂ ගිහින් බණ්ඩාරනායකට කන් කෙඳිරි ගෑව ජෝර්ජ් රාජපක්ෂටත් හම්බන්තොටින් තවත් කෑල්ලක් කඩල නොදුන්නොත් ලබන ඡන්දෙදි මං පරදිනවා. ඒ අනුව තමයි හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආසන තුනකට කැඩුවේ. හම්බන්තොට ලක්ෂ්මන් රාජපක්ෂට, මුල්කිරිගල ජෝර්ජ් රාජපක්ෂට බෙලිඅත්ත ඩී. ඒ. රාජපක්ෂට ඔන්න ඔහොමයි කොන්දගලයි මැදමුලනෙයි වලව්වල ප්‍රශ්නය විසඳුනේ. රාජපක්ෂ පවුලෙන් කල එළි බහින අයට පාර්ලිමේන්තු යන්න ඕනේ ඕනා විදිහට හම්බන්තොට දිස්ත්‍රික්කය කෑලිවලට කැඩුණා.

''1945 මැයි 18 වෙනිදා මට මතකයි එදා තමයි මගේ පියා මියගිය දවස. මම ඇඳ ළඟ උන්නා. පියා මියයන්න විනාඩි කිහිපයකට කලින් ඔහු කොට්ටේ යට තිබුණු ලියුම් කවරයක් අරන් මගේ අතට දුන්න. ඒ ලියුම් කවරේ තිබුණේ පැනයි ශත 18ක මුදලකුයි පමණයි. මොහොතකින් මගේ පියා මිය ගියා. මම එක පිම්මටම දිව්වා බණ්ඩාරනායක මැතිතුමා මුණගැහෙන්න. මං දුවගෙන ගිහින් බණ්ඩාරනායක මැතිතුමාට අඬාගෙන කිව්වා දැන් මගේ පියා මිය ගියා ඔහු මිය යන්න කලියෙන් මට දුන්න ලියුම් කවරෙ බණ්ඩාරනායක මහතා අතට දුන්නා. ඒකෙ ශත දහඅටකුයි පැනකුයි තිබුණා. මං එනකං මේක දැන් ගෙනියන්න කියලා මුදලක් සඳහන් නොකරන ලද චෙක්පතක් බණ්ඩාරනායක මහතා මට අත්සන් කරලා දුන්නා. අපේ පදිංචි ඉඩමත් ඒ වනවිට උගසට බැඳිලයි තිබුණේ. මගේ පියාගේ මළ කඳ ගමට ගෙනාවේ එදා බණ්ඩාරනායක මහත්තයා අත්සන් කර දුන්න ගණනක් සඳහන් නොකළ චෙක්පත මාරු කරගෙනයි. ජෝර්ජ් රාජපක්ෂ මහතා එදා වලස්මුල්ලේදී කළ මේ කතාවට කන්දී සිටි ලෙනාඩ් වුල්ෆ් මහතා එහි අන්තර්ගතද සිය සංචාරක සටහන් අතරට එක්කරගෙන සිටින ලදී."

එදා මීට හරියටම වසර 62 කට ප්‍රථම කෘතහස්ත ඉංග්‍රීසි සිවිල් නිලධාරියෙකු විසින් පවසන ලද මෙම කරුණු කොතෙක් දුරට වර්තමානය සමඟ ගළපා ගැනීමට හැකි වේ දැයි අප හොඳින් සලකා බැලිය යුතුය.

● **ප්‍රියන්ත ජයකොඩි**
**ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (විශ්‍රාමික)**

# කතරගම කප් සිටුවීම 15 වැනිදා

**● කප් සිටුවීමේ චාරිත්‍රය**

ඓතිහාසික රුහුණු මහා කතරගම දේවාලයේ 2022 වර්ෂයේ ඇසළ මංගල්‍ය සඳහා කප් සිටුවීමේ මංගල්‍ය මෙම මස 15 වැනි දින සුබ මොහෙතින් සිදු කිරීමට නැකැත් වේලාවන් බලා සකස් කර පවතී.

කතරගම දේවාලයේ කප් සිටුවීමෙන් අනතුරුව දින 45 ක් ගිය පසුව එනම් ලබන ජුලි 29 වැනි දින කඳකුමරුවන්ගේ සහ වල්ලි දෙවඟනගේ විවාහ මංගල්‍යයේ ප්‍රථම පෙරහැර ආරම්භ වී අගෝස්තු 11 වැනි දින දක්වා පවත්වා පසු දින 12 වැනි දින මැණික් ගඟේ දිය කැපීමෙන් පසුව අවසන් වීමට නියමිතවේ.



රුහුණු මහා කතරගම දේවාලයේ ඇසළ මංගල්‍යය යනු කතරගම කඳකුමරුවන් සහ වල්ලි දෙවඟනගේ විවාහය සනිටුවහන් කරමින් වාර්ෂිකව සිදු කරනු ලබන චාරිත්‍ර පෙරහැරකි.

හෙළයේ අතීතයේ පැවති ගැමි ඇදහිලි සම්ප්‍රදායන් අකුරටම ඉටු කරමින් සිදු කරනු ලබන කතරගම ඇසළ මංගල්‍යය දුටුගැමුණු මහා රජතුමා විසින් ආරම්භ කළ දින සිට මේ දක්වා වසර 2249 ක් පුරා අඛණ්ඩව පැවැත්වෙන ලංකාවේ පැරණිම පෙරහැර මංගල්‍යයකි.

පෝය ගෙවුණු පැලවියට මෙම කප් කණු සිටුවීම සිදුකරනු ලබන අතර කප් සිටුවීමට ගන්නා ශාක රුක්ෂය කිසිදු අයකුට දැන ගැනීමට නොහැකි වන සේ මහා වනයට යන කපු මහතුන් අදාළ ගස් දෙක බලා ගෙන සුබ හොරාවකින් මෙම ගස් පුද පූජාවන් තබා කපා ගනු ලබයි.

මෙම කප් සිටුවීමට ගන්නා ගසේ අතු රිකිළි එක හා සමානව තිබීම විශේෂයකි. කණු කැපීමට පෙර ගස් දෙකට පුද පූජා තබන කපු මහතුන් අඳුර වැටීමට ආසන්න වන විටදී දේවාල භූමියට රැගෙන එනු ලබයි.

සුදු පැහැති රෙදිවලින් ඔතා ගන්නා මෙම කප් කණු දෙක රාත්‍රි මැණික් ගඟට රැගෙනවිත් නානමුරය සිදු කර පසු දින ඉරු එළිය පැමිණීමට පෙර ආලාත්ති අම්මලා හා කපු මහතුන් විසින් පෙරහැරකින් මෙම කප් කණු දේවාලයට ගෙනවිත් සුබ හෝරාවකින් දේවාලයේ ඇති විශේෂිත වූ ස්ථානයක කණු දෙකක සිටුවනු ලබයි. මෙම ගස් දෙකම එකම උසකින් හා එකම අයුරින් සමානව පවතී. ප්‍රථම කප් සිටුවීමේ මංගල්‍යය

කප් සිටුවා දින 15 ක් ගිය පසුව පුරා දින 15 ක් ඇසළ මංගල්‍යය ඉතාම ඉහළින් පවත්වයි. විවිධ වූ ප්‍රදේශ ඔස්සේ බැතිමතුන් පා ගමනින් කුමන, යාල වන උද්‍යාන ඔස්සේ පැමිණීම සිදුවේ. මෙයට අමතරව බස් රථවලින්ද බැතිමතුන් දහස් සංඛ්‍යාත පිරිසක් පැමිණීම සිදුවේ.

අතීතයේ දෙවියන්ගේ වෙලේ වී සහල් රැගෙන පැමිණියේ තවලම් බැඳි ගවයන් පිට පටවා ගෙන පැමිණීම සිදුවිය.

ඒ අයුරින් අද වාර්තමානයේ මං මාවත් දියුණු වී කාපට් මාර්ග ඉදිව තිබුණ මුත් අදත් රජ නියෝගයන් ක්‍රියාවට නංවමින් බුත්තල පැල්වත්තේ කුඹුරුවල වී සහල් තවලමින් රැගෙන එති.

**● ඇසළ මංගල්‍යය**

ඇසළ මංගල්‍යය පැවැත්වෙන දින 15 පුරා පූජා භූමිය සැබෑ මඟුල් ගෙදරක සිරිය ගන්වමින් නොමිලේ ආහාර ලබාදීමේ දන්සල් රස කැවිලි බිම දන්සල් පැවැත්වේ. උතුරු නැගෙනහිර සිට පැමිණි බැතිමතුන් ඇතුළු පැමිණෙන බැතිමතුන් පූජා භූමියේ ලැගුම් ගෙන දෙවි ආශිර්වාදය ලබා ගෙන මැණික් ගඟේ දිය කැපීමෙන් පසුව දිය කැපූ ජලයද රැගෙන සිය ගම් බිම් බලා පිය නගති.

**● ඉල්මහා පෙරහැර**

මෙම මංගල්‍යය වර්ෂ අවසානයේ ඉල් මාසයේදී පැවැත්වේ. රටේ ගොවි ජනයාගේ කෘෂිකර්මාන්තයට අවශ්‍ය වැසි ජලය ලබා ගැනීම පිණිස දෙවියන්ගේ ආශිර්වාදය ප්‍රර්ථනා කර මෙම මංගල්‍යය එක් දිනක් පැවැත්වේ.

**● අවුරුදු මංගල්‍යය**

රටේ ගොවි ජනයාගේත් දෙවියන්ට අයත් කුඹුරුවල අලුත් වී සහල් එළවළු එක් කර දෙවියන්ට කැප කිරීම පිණිස මෙම මංගල්‍යය සිදු කරති.

● **කතරගම කේ. ඩී. දේවප්‍රිය**

# උම්බෑ ජාතකය

# කෝප සබ වැනුම

පොරණ දඹදිව්හි මියුළු නම් නුවර වේදේහ නම් රජුන් සමයෙහි එතුමනට රාජ පාලනය පිණිසැ අර්ථයෙන් හා ධර්මයෙන් අනුශාසනා කළා වූ මහෞෂධයන් නම් මහා ප්‍රඥාසම්පන්න පණ්ඩිතයන්ගෙන් පසු මඤ්ඤංලන්ත රජුන් අනුශාසනා පිණිසැ නොව හුදී ජනයින් බුද්ධියෙන් හා ප්‍රඥාවෙන් සන්නද්ධ කෙරුම් පිණිසැ උත්පාදව ඇතැයි යනුවෙන් එකී මඤ්ඤං ජනයින්ගේ මහත් වූ ගෞරව බුහුමනට ප්‍රාප්තව හිඳිනා වූ චූලෞෂධ නම් පණ්ඩිතයෝ එක් සමයක්හි දිනෙක පූර්වාහ්නයෙහි මාංසයෙන් තොර ශාකසාරමය පාතරාසය වැළැඳීමෙන් අනතුරුව කරදමුගු, කරහබු නටු, පියලි හිඟුරු, පුන්නපූගාදී නේක මුඛාසුව ඖෂධාදීන්ගෙන් සපිරුණු නාගවල්ලි දැහැත් විටක් සපමින් ආලින්දයෙහි වූ සුව අසුනෙහි පාසුයෙන් දිගාව, එකී සුව අසුනෙහි අපර පාදයන් ද්වය සමීපයෙහි වූ ස්වේත අයෝමය පඩික්කම් බඳුනට වරින්වර මුඛයෙහි පිරෙනා රක්ත වර්ණ වූ කේඨය පදාසව හෙළැමින්, විසල් අංගනයෙහි වූ උයන්පල්ලාගේ අනේක සාත්තුවට බඳුන්වැ සාර ලෙස වැඩී අලංකෘත පුෂ්පයන්ගෙන් ගහන වූ නේක පුෂ්පාශාක ගොමුවෙන් හා මායිම් පවුරෙන් ඉහළ වූ ද ඉන් එපිට ඇස්මානයේ පෙනෙනා වූ වන වියනෙහි උස් වූ නේක තුරු මුදුන් දෙස බලාගෙනැ කල්පනාවෙක යෙදෙනුයේ විසඳුම් පිණිස අතොරක් නොවූ පැනයෙන් බර වූ හිසින් යුතුවැ තුමූ හමුවට පැමිණෙනා මඤ්ඤං ජනයා පෙරකල්හි මෙන් නොව සාධනීය වූ වැහැර දැනුමෙන් හා සමාජාවබෝධයෙන් සන්නද්ධව ඇති සේ පෙනෙනා බැව්ද එමතුද නොව මඤ්ඤංලන්තයෙහි තත්කාල දෙස්පළු හා ආරතික අවුල්, ගැටලු, පැටළිලි පිළිබඳව මනාවබෝධයක් ඇති සේ පෙනෙනා බැව් හැඟෙනාතරමැ මහා පණ්ඩිත වූ තුමුනට වඩා හුදී ජන උන් එකී දැනුමෙන් ඉහළ බැව් බෝ වේලාවල දක්නට ලැබෙනා බැව් ද සිතෙනුයේ මඳ විළියක් සිතට නැගී අවට බලනා කල කිසිවකු නොමැති බැව් දැන මඳක් සැනසුම් ඉසිඹවක් ගෙන සන්සුන්වැ යළි අසුනෙහි දිගාව එකී ජනයින් පැන විසැඳුම් කතිකා පිණිසැ මෙතෙක් නොපැමිණි නියා සිහි නැගී ඒ කිමෙක් නිසාවදැයි සිතිවිල්ලක් නැගි වේළායෙහිමැ ඉදිරි ප්‍රාකාර මහ දොරටුව දෙසින් නැගුනා වූ කතාබහ කුමක්දැයි එදෙස බැලූ කල්හි සුපුරුදු මඤ්ඤං ශ්‍රාවකයින් කැලත සිරිත් පරිදි මග සිටම කෙරෙනා වූ කචෝබචෝවෙන් යුක්තව පැමිණෙනා බැව් දැකැ කවර දැනුමක් ලැබුවද මුන්ගේ කච කචය නම් නොඅඩු බැව් සිතෙනුයේ එසේ වුවද මුන් මෙසේ වාද විවාදයෙන් පැමිණෙනුයේ කිසියම් වූ වෙසෙස් කරුණක් ගැන විය හැක්කේ යැයි යළි සිතිවිල්ලක් පහළ වනුයේ මින් පෙරත් මුන් මෙසේ කචබචයෙන් විවාද කළ වැදගත් වූ කාරණා ගැන සිහිව ගිය හෙයින් යැ.

ඉදින් ජන කැලත එකිනෙකා උරෙනුර ගැටෙමින් එක පොදියට කතාබතාවෙන්මැ අංගන පෙත් මග ඔස්සේ කෙලින්මැ රැස්වුම් කුටිය තෙක් ගමන් කරනා බැව් දැකැ මුන් අද පාතරාස කටයුතු අරහයා වගේවගක් නොමැත්තේ පැමිණුමට මඳ පමාවක් වූ හෙයින් ඉන්තේරුවෙන්මැ මුන් තුමූ තුමූ නිවස්නයන්ගෙන්මැ එකී කටයුතු අහවර කොට පැමිණ ඇති නිසාවෙන් හෝ නොමැත්තේ නම් වාද විවාද කෙරෙමින් පැවැත්වෙනා වූ කාරණය මහත් වූ වෙසෙස් එකක් වන්නා වූ නිසාවෙන් කැම්පීමාදී කටයුතු එකී වාදය නිමා කොට දෙවනු ලෙස කෙරෙමැයි මගදීමැ උන් සැම ගිවිස ගත් නිසාවෙන්දෝයි සැකැවැ මඳක් තාවර වූ චූලෞෂධයෝ උන් පසුපසැමැ රැස්වුම් ගෘහය වෙත ඇදෙනාහ. "සකියනි, තෙපි කුමක් කියුවද මෙවර නම් උන් රොත්ත නොසෑහෙන කලක් මහ සිපිරි ගෙයි තැපුමට වේයැයි මෙන්න කැට යැ.''යි එකකු ගමන්ගනිමින්මැ තුමූ සුරතෙහි මහපටැඟිල්ල හා මැදැඟිල්ල එක්කොට අසුරක් ගසා පසුපස හැරී අනෙකුන් සිසාරා ගැම්මෙන් බලනුයේ පසුපසින් පැමිණෙනා වූ ජන පෙළෙහි කෙළවර මඳක් ඇතින් උන් අනුවමැ චූලෞෂධයන්ද සපැමිණෙනා බැව් අහම්බෙන් දැකැ තුමූ හැසිරුම් ගැන චකිතයෙන් හා ලජ්ජායෙන් යුතුවැ, "කමා කල මැනව ස්වාමීනී, අප වාද කතායෙන් පසු වූයේ කෝප නම් කම්ටුවෙක් පිළිබඳවයැ.''යි පවසනායැ. අනෙකුන්දැ එකී වදන "එසේයැ ස්වාමීනී'' යැයි අනුමත කරනුයේ චූලෞෂධයෝ,"ඉදින්, එකී සබය අරහයා කවර වූ වාදයෙක්දැ?''යි ඇසූ කල්හි පළමු පුඟුලා කියනුයේ, "ස්වාමීනී, කෝප සබයෙහි ඇත්තන් රාජායතනයන්හි උන් ගෙන්වා උන් කරන ලද්දා වූ අකටයුතු හෝ චෝරකම් පිළිබඳ පැන කොට උන් නිරුත්තර කොට හෝ උන් පිළිවදන් මුසා කොට හැඳි වස්ත්‍රයන් ගලවනායැ.''යි පවසනුයේ එකෙණෙහිමැ තවකෙකු පැනැ,"බම්බුවයැ. උන් හැඳි වස්ත්‍ර ගැලැවුමෙහි කවර ඵලයෙක්දැ? කවදත් උන් සිටිනුයේ වස්ත්‍ර නොමැති සේයැ.''යි මහ හඬින් කියනායැ. එබසට පළමුවැන්නා,"එසේ නොව සකිය. බලව, අප දැහිත ධනය විනාශ කෙරෙමින් උන් කෙළනා උමතුවන් අප දැනැගනුයේ කෝප සබය නිසාවෙන් නොවේදැ?''යි ජයග්‍රාහී ලීලායෙන් ඇසූ කල්හි අනෙකා,"ඉදින් අප දැනගැනුමෙන් උනට පඤ්ඤංදැ? මෙකී කෝප සබයෙන් චෝදනා ලැබ සිපිරි ගෙට ගිය එකෙකු මට කියව.''යි පවසා, "බලව, කලෙකට පෙර සංතෝසයේ ස්වේත සිහිනි මගඩිය කෝප සබයේ හෙළි වූ කල නුසාදයාට වූයේ කිමෙක්දැ? ඒ සා ධනයක් කාබාසිනියා කළ උහු යවන ලද්දේ සිපිරිගෙට නොව පරිභෝජ භාණ්ඩයන්හි පරමිතිය මැනුම් පිණිසයැ' පුහු උපදෙස දෙනු පිණිසැ කහවනු මිලියන ගණනින් වේතන ලැබූ ආයෝජන මණ්ඩල හිටපු අදියුරු ජනරාල ලියට කිමෙක් වූයේදැ? කහවනු කෙළ ගණනින් ගිලැ කෝප සබයෙහිදී පිළිවදන් නොමැතිවී නස්පුක් වූ පන්දු කෙළි නිලදරුවනට සිදුවූයේ කිමෙක්දැ? රක්ෂණය ගිල දැමූවනට, ගිලනුනට කුණු ඖෂධ ගිල්ල වූවනට, මඤ්ඤංලන්තය බංකොළොත් කළ භාණ්ඩාගාරයනට කිමෙක් සිදුවේදැයි තොප සිතනේදැ? කිසිත් නැත්තේයැ. කලෙක එකී කෝප සබයේ හිඳ දූෂණ වංචා හෙළි කළ රනජනයා නම් අන්න සිපිරි ගෙයිහියැ,'' යි මහත් ආවේගවැ කියවාගෙන ගොස් හති අරිනට වන්නායැ.

එකී වදන් වැල ඇසූ චූලෞෂධයන්ද අන්ද මන්දවැ, මුහු කියූ දැ සත්තක් නොවේදැයි සිහිවැ පළමු පුඟුලා ඊට කුමක් කියත්දැයි උහු දෙස බැලූ කල උහු මුඛයෙහි පිට්ටු නම් සිලින්දරාකාර අහර වෙසෙස සිර වූ කල්හි මෙන් පිළිවදන් නොමැතිවැ සිටිනු දක්නා ලද්දේයැ. සෙසු ජනයෝද තුෂ්ණිම්භූතයාගේ සුළු පියාගේ පුත්‍රයා සේ මවිතවැ සිටිනුයේ හති හෙළැමින් සිටි දෙවැන්නා,"නොදනී නම් අසව, කෝප සබය වනාහී තෝ සොරයැ, අරූ සොරයැ, මුහු සොරයැ ආදී ලෙසින් පවසා හුදී ජනයාගේ කෝප අවුලනු විනා වෙන කරනා වූ මගුලෙක් නොමැත්තේයැ. එකී සබය කෝප සබය යැයි නම් කොට ඇත්තේ එනිසායැ.''යි කියූ කල්හි මුන් දැන් දැන් නිර්භය ලෙසැ තුමූ අදහස් පවසනායැයි චූලෞෂධයනට සිතෙනුයේ එකවරමැ මහ දොරටුවෙන් ප්‍රාදුර්භූත වූ පමා වී පැමිණි ශ්‍රාවක පුඟුලෙකු "ස්වාමීනී, අභිනව තතුව දන්නේදැ? රුසියන්ගේ දේශයේ වා රියට නිදොස කොට නිදහස දී ඇත්තේයැ.''යි එතැන සිටමැ හඬ නගා කියනායැ. එකී වදන් ඇසූ පළමු පුඟුලා කෝප සබ කතිකාව මඳකට නවතා,"ස්වාමීනී, පුටිනයා වනාහී නාහෙට නාහනා එකායැ. නොබෝ දිනෙකින් අපට කවර වූ පරිපුවක් අනුභව කෙරුමට වේදැයි සැකැයැ.''යි කියූ කල්හි දෙවැන්නා,"ඒ කෙසේ වුවද ස්වාමීනී අපට යම් අභිමානයෙක්දැ නැත්තේමැ නොමැත්තේයැ.''යි කියූ කල්හි මවිතප්‍රාප්ත වූ චූලෞෂධයෝ,"ඒ කෙසේදැ? මේ සා මරිමෝඩ දැයක් කොට කවර නම් අභිමානයෙක්දැ?''යි ඇසූ කල්හි උහු ඊට පිළිවදන් ලෙසැ,"ඇයි ස්වාමීනී, සොට බිම ඇනුනද සොම්බෙන් ගියද අප වනාහී එසේ මෙසේ පොරවල් නොවන්නේයැ. බංගලින්ගෙන් සිඟා කා පුටිනයාගෙන් ගේම ඉල්වනා පට්ට පොරවල් වම්හ''යි කෝචොක මුවින් කියනායැ.

● නිමල් ෆ්‍රැන්සිස්





## අමතර ඉගැන්වීම්

IELTS/ Spoken English Australia Qualified well - experienced lady teacher. Best results guranteed. 0716656325, 0703885435, 0768632275.

12/5998

## ගේ.දො.ඉ. විකිණීමට

හෝමාගම මාගම්මන දොලේකඩේ හන්දියේ කාර්ගිල්ස් ෆුඩ්සිටි ළඟ පර්චස් 18, ප්‍රධාන බස් පාරට 20m, හෝමාගම ටවුමට 2 1/2Km, බ්‍රෝකර්වරු අනවශ්‍යයි. 0770469912, 0742890672.

12/5997

## මනාලියෝ

25 හැවිරිදි සිංහල බොදු දියණියට ජපානයේ පදිංචියට කැමති කඩවසම් තරුණයකු දෙමාපියන් සොයයි.

ම/12/1138

"අර්ශස්ද?" ඔපරේෂන් අනවශ්‍යයි

ලේ - සීදම්යාම - මලබද්ධය - බඩපිපුම - රිදුම අප්‍රියාව - දැවිල්ල - කැසිල්ල - ගෙඩි (ගැස්ට්‍රයිටීස්) පැවති දහස් ගණන් දෙපක්ෂයට දවසින් දෙකෙන් ගුණදී නිට්ඨාවට සුවය සලසා ඇත. පුරාණ රාජ වෛද්‍ය පුස්කොල රහස් වට්ටෝරු විශ්මිත ප්‍රතිකාර තැපැලෙන්ද සැපයේ

(නීතිගත) "සුව සහණ සේවය"
තල්ගස්යාය. ගා/අක්මීමන
077 4904622

24K පවුමට රු.155,000/- දක්වා (22K,21K,20K,19K/18K.......9K)

උකස්

රිදී ආභරණ
ජංගම දුරකථන
ටැබ්, ලැප්ටොප්,ටීවී
සෙටප්, ඩීවීඩී ප්ලේයර්ස්
ශීතකරණ
රෙදි සෝදන යන්ත්‍ර
මහන මැෂින්, වතුර මෝටර්
DSLR කැමරා
ඇතුළු අනෙකුත් විදුලි උපකරණ
මෝටර් සයිකල්, ත්‍රීවීල්
හිස් ඉඩම්
උකස් ගනු ලැබේ

W.S.L. රූපසිංහ (පුද්) සමාගම
316, මාතර පාර, මාගාල්ල, ගාල්ල.
0767 907 744 / 0912 242 186

NiSACO නිසාකෝ Since 1997 நிசாகோ
Special discounts. Every day. On everything.




Modern Office & Household Furniture
NISACO MALL
ATHURUGIRIYA
Tel : 011-2744444 / Fax: 011-2560535
www.nisaco.lk info@nisacomall.com
Athurugiriya Embuldeniya Narahenpita Pannipitiya




ජය මංගලම්
පිළිතුරු ලිපි එවන විට
පිළිතුරු බහා එවන කවරයේ ලිපිනය පහත ආදර්ශය පරිදි සටහන් කළ යුතුය.

අංකය...............
මුද්දරය
ඉරුපිට ජය මංගලම්
උපාලි පුවත්පත් සමාගම
223, බ්ලූමැන්ඩල් පාර
කොළඹ 13.

කවරයේ වම් පස ඉහළ කෙළවර මංගල යෝජනාවේ අංකය සඳහන් කිරීමට මතක තබාගන්න.






Hand Foot Mouth Disease
ආයෙමත් පැතිරෙන්න පටන් අරගෙන

මේ අහේනි කාලයේ
පස් නැතිව වුණත්
වගා කරන්න පුළුවන්

මොකක්ද මේ
COMMUNITY KITCHEN

දෙයක් තමන්ගේ කරගත්
මොහොතේ පටන්ම
අපි ලබන්නේ වේදනාවක්

එක දිගට උළුවහු තියෙන එක
හොඳ ද නරක ද?

තාත්තා වෙනුවෙන් තමන් දන්න
නීතියෙන්ම යුක්තිය සොයන
යකාටවත් බය නැති දුව
හිරුණිකා ප්‍රේමචන්ද්‍ර

පොත් ටික
පැත්තකින් තියලා
කුලී වැඩ කරන පුතෙක්...

සොයා බැලිම්, විශ්වාසය, අවංකකම
නැති වූ පසු කෙතරම් ශක්තිමත් බැඳීමක් වුවත් බිඳී යයි

අලුත් විශේෂාංග රැසක් සමඟ නවලිය
සෑම සිකුරාදාවකම නිකුත් වේ...

UPALI උපාලි ප්‍රකාශනයක්...


## එළවළු මෙට්‍රික්ටොන් 697,144 ක් ගිය අවුරුද්දේ පිටරටින් ගෙන්වලා

ලලිත් චාමින්ද

ඩොලර් මිලියන 384.3 ක වටිනාකමින් යුතු එළවළු මෙට්‍රික්ටොන් හයලක්ෂ අනුහත්දහස් එකසිය හතළිස් පහක් 2021 වසරේදී ආනයනය කර ඇතැයි ශ්‍රී ලංකා මහබැංකුව පවසයි.

2021 වසරේදී මෙරට එළවළු නිෂ්පාදනය මෙට්‍රික්ටොන් දාසය ලක්ෂ හැටනවදහස් පන්සිය පහළොවක් දක්වා සියයට 1.4 කින් පහළ ගොස් ඇති බවද ශ්‍රී ලංකා මහ බැංකුව පෙන්වා දෙයි. එමෙන්ම පසුගිය මහ කන්නයට සාපේක්ෂව 2020/2021 මහ කන්නයේ එළවළු නිෂ්පාදනය මෙට්‍රික්ටොන් අටලක්ෂ හැත්තෑ එක්දහස් හත්සිය විසි නවය දක්වා සියයට 2.5 කින් පහත වැටී ඇත. 2021 වර්ෂයේ යල කන්නයේද මෙරට එළවළු නිෂ්පාදනය සියයට 0.2 කින් පහළ ගිය බවද මහ බැංකුව පවසයි.

රසායනික පොහොර හා කෘෂි රසායන ද්‍රව්‍යවල හිඟය, යන්ත්‍රෝපකරණ සහ ප්‍රවාහන වියදම්වල ඉහළ යෑම, පළිබෝධ හා රෝග පැතිරියැම, අයහපත් කාලගුණික තත්ත්වය යන හේතු නිසා එළවළු නිෂ්පාදනය අඩුවී ඇති බැව් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2021 වර්ෂයට අදාළව නිකුත් කර ඇති වාර්ෂික වාර්තාවේ සඳහන් වෙයි. මෙම තත්ත්වය නිසා එළවළු මිල ගණන් ශීඝ්‍ර ලෙස ඉහළ ගොස් ඇත.

මෙරට පෞද්ගලික අංශයේ සමාගම් සහ ආයතන කිහිපයක් එක්ව ක්‍රියාවට නංවන

## 'මනුදම් මෙහෙවර' හදිසි සහන සැපයීමේ වැඩසටහනට Citi බැංකුවත් එක්වෙයි

### දැඩි ලෙස පීඩාවට පත්වූ පවුල් 200,000ක් ඉක්මවා හදිසි සහන

Dialog Axiata PLC, MAS Holdings, Hemas Holdings PLC, CBL සමූහය, Sunshine Holdings PLC, සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය හා PwC Sri Lanka එක්ව රටේ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් දැඩි ලෙස පීඩාවට පත් පවුල් සහ ප්‍රජාවන් වෙත හදිසි සහන බෙදාදීමේ අරමුණින් යුතුව ආරම්භ කරන ලද 'මනුදම් මෙහෙවර' වැඩසටහන සමඟ Citi බැංකුව ද එක්විය.

මෙම වැඩසටහනේ බෙදාහැරීමේ සහකරු සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය හා විගණන සහකරු PwC Sri Lanka ඇතුළු මෙම ව්‍යාපෘතියෙන් සමාජීය යහපැවැත්ම අරමුණු කොට ගත් හවුල්කරුවන් සමඟ අත්වැල් බැඳගනිමින් Dialog, MAS, Hemas, CBL, Sunshineiy Citi බැංකුව අරමුදල් සපයන 'මනුදම් මෙහෙවර' වැඩසටහන මගින් දිවයින පුරා පීඩාව ට පත්ව සිටින ප්‍රජාවන් අතුරින් පවුල් 200,000ක් ඉක්මවා හදිසි සහන සැලසීම අරමුණු කර ඇත. මේ වනවිට දිස්ත්‍රික්ක 25 පුරාම හදිසි සහන බෙදාහැරෙමින් පවතින අතර, මේ දක්වා අවශ්‍යතා සහිත පවුල් 50,000 කට වැඩි සංඛ්‍යාවකට ආධාර ලබාදී තිබේ. එලදායී ආර්ථික ප්‍රතිසාධන සැලැස්මක් තුළින් තිරසාර ප්‍රතිලාභ හුවමාරු ක්‍රමයක් රට තුළ ස්ථාපිත වන තෙක් මනුදම් මෙහෙවර වැඩසටහන දින 60ත් 90ත් අතර කාලයක් ක්‍රියාත්මක වනු ඇත.

Citi බැංකුවේ කළමනාකාර අධ්‍යක්ෂ හා ශ්‍රී ලංකාවේ දේශීය ප්‍රධාන නිලධාරී, රවීන් බස්නායක මහතා අදහස් දක්වමින් "වර්තමානය තුළ පවතින, පෙර නොවූ විරූ මූල්‍ය අර්බුදයේ බලපෑම මුළු රටටම ඉතා දැඩි ලෙස එල්ල වී තිබෙන අතරම අන් කවරදාටත් වඩා දුෂ්කරතාවන් රාශියක් උද්ගත වී තිබෙනවා. ඉහළ යමින් පවතින ආහාර මිලත් සමඟ, දැඩි ලෙස පීඩාවට පත්වූවන් සඳහා ආහාර අධාර සැපයීම වෙනුවෙන් 'මනුදම් මෙහෙවර' මානුෂීය ප්‍රයත්නය සමඟ එක්වීමට Citi බැංකුව තීරණය කළේ ඒ නිසයි. ආයතනික පුරවැසියෙකු ලෙස අප අපගේ වගකීම හඳුනාගෙන තිබෙන අතර ජනතාවගේ ජීවන බර ලිහිල් කිරීම සඳහා සමාජීය යහපැවැත්ම අරමුණු කරගත් ආයතන සහයෝගයෙන් එකට එක්ව කටයුතු කලයුතු කාලය එළැඹ ඇති බවට විශ්වාස කරනවා. මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීම හා මෙම අත්‍යාවශ්‍ය මෙන්ම කාලෝචිත මූලාරම්භයේ කොටස්කරුවකු වීමට අපට ඉඩ ප්‍රස්ථාව ලබාදීම පිළිබඳ අපගේ ආයතනික හවුල්කරුවන්ට හා සර්වෝදය වෙත මා ස්තූතිය පුදකර සිටිනවා."යනුවෙන් ප්‍රකාශ කළේය.




වමේ සිට දකුණට: Citi බැංකුවේ ආයතනික සබඳතා අංශයේ ප්‍රධානී ශානකා වඩුගේ මහත්මිය, සිටි බැංකුව හි කළමනාකාර අධ්‍යක්ෂ හා ශ්‍රී ලංකාවේ දේශීය ප්‍රධාන නිලධාරී - රවීන් බස්නායක මහතා, ඩයලොග් ආසිආටා පීඑල්සී හි සමූහ ප්‍රධාන විධායක සුපුන් වීරසිංහ මහතා, ඩයලොග් ආසිආටා පීඑල්සී හි සමූහ ප්‍රධාන මූල්‍ය නිලධාරී හොන්ග් සුවොන්ග් මහතා සහ සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරයේ ව්‍යාපෘති කළමනාකාර අංශයේ අධ්‍යක්ෂ මොහොමඩ් නිස්වි මහතා.

නව හවුල්කාරිත්වය පිළිබඳ සිය අදහස් ප්‍රකාශ කළ, ඩයලොග් ආසිආටා පීඑල්සී හි සමූහ ප්‍රධාන මූල්‍ය නිලධාරී හොන්ග් සුවොන්ග් මහතා "මෙම මානුෂීය මෙහෙවර හා සම්බන්ධවීම පිළිබඳ සියලුම හවුල්කරුවන් වෙනුවෙන් මම Citi බැංකුවට ස්තුතිවන්ත වනවා. අදවන විට, වත්මන් අර්බුදයෙන් දැඩි ලෙස පීඩාවට පත්ව සිටින පවුල් 50,000කට අධික සංඛ්‍යාවකට අප හදිසි සහන බෙදාහැර තිබෙනවා. එම ක්‍රියාවලිය තවදුරටත් පවත්වා ගනිමින් පවුල් 200,000කට සහන සැලසීම අපේ ඉලක්කයයි. මෙම ප්‍රයත්නය ඉදිරියට ගෙනයෑම සඳහා අප හා එක්වන ලෙස සමාජීය යහපැවැත්ම අරමුණු කරගත් ආයතනික හවුල් කරුවන්ගෙන් අප ඉල්ලා සිටිනවා. අපගේ ජනතාවගේ පීඩාව අවම කිරීම සඳහා සහායවීමට අප සැම එක්ව ක්‍රියා කළයුතු අතර, මෙම අත්‍යවශයම මොහොතේදී දිවයින පුරා සිටින පවුල්වලට උපකාර කිරීමට අප වගකීමෙන් කටයුතු කළයුතු බව මිලියන 17කට අධික ග්‍රාහකයන් සංඛ්‍යාවකට හිමිකම් කියන ශ්‍රී ලංකාවේ පුළුල්තම සන්නිවේදන ජාලය ලෙස අපට අපට වැටහී ගොස් තිබෙනවා."පවසා සිටියේය.

මෙම ප්‍රයත්නයට එක්වන ලෙසත් හදිසි සහන බෙදාහැරීමේ මෙහෙයුම් පුළුල් කිරීමට සහායවන ලෙසත් 'මනුදම් මෙහෙවර' සියලු ආයතනයන්ට ආරාධනා කරයි.


බුදු මඟ
ධර්ම සංග්‍රහය
පොසොන් කලාපය

- පොසොන් පෝය නිමිත්තෙන් මෙවර සදහම් ප්‍රහේලිකාවට දෙගුණයක තෑගි
- සැලසුම්සහගත දූත මෙහෙවරක් වූ මහින්දාගමනය
- අශෝක අධිරාජයාගේ ධර්මවිජය ප්‍රතිපත්තිය
- සකසුරුවම අපේ චර්යාව කරගනිමු
- සම්මා වායාමයෙන් සම්මා සතියට
- තමා තුළට එබී බැලීම
- දහම් මඟ පියවරෙන් පියවර

අජාන් චා හිමියන් වදාළ
උපමා බණ

ඇතුළු තවත් ලිපි සමග
දැන් වෙළෙඳපොළේ

උපාලි ප්‍රකාශනයක්





# අනූපස් වැනි විය සැපිරූ කලා ලොවේ සුදු මිත්තණිය

මීට අවුරුදු 95 කට පෙර එනම් හරියටම 1927 ජුනි 09 වැනිදා රුවන්වැල්ල මුදුගමුව නම් සුන්දර ග්‍රාමයේ පිහිටි ඓතිහාසික මීදෙණිය වලව්වේ එක්තරා සුවිශේෂී සිදුවීමක් සිදුවිය. එනම් මේ වලව්වේ හිමිකාර යුවළට දාව පින්වත් දියණියක් මෙලොව එළිය දැකීමයි. ඒ වාසනාවන්ත කුමාරිය අයිරාංගනී රොක්සානායි. අද අපේ කතානායිකාව වන ඇය මේ වන විට ජීවන ගමන් මගේ 95 වන සැතපුම් කණුව පසුකරමින් සිටී.



ශාන්ත බ්ජට් කන්‍යාරාමයෙන්, බිෂොප් විද්‍යාලයෙන් සහ මහනුවර උසස් බාලිකා විද්‍යාලවලින් මූලික අධ්‍යාපනය ලබා වයස අවුරුදු විස්ස සපුරන විට කොළඹ විශ්ව විද්‍යාලයට ඇතුළත්ව එහි ඉංග්‍රීසි නාට්‍ය කණ්ඩායමේ සාමාජිකාවක් බවට පත්වූ අයිරාංගනී රොක්සානා විශ්වවිද්‍යාල අවධියේදී පටන්ම කලාවට සම්බන්ධ වූයේ ඈන්ටිගනී වේදිකා නාට්‍යයේ ඈන්ටිගනීගේ චරිතයට පණ පොවමිනි. අපට පුතේ මඟක් නැතේ" වේදිකා නාට්‍යයෙන් සිංහල වේදිකාවට ද ඇය ගොඩ වූවාය.

එංගලන්තයේ බ්‍රිස්ටල් ඕල්ඩ්වික් තියෙටර් හා රෝයල් ඇකඩමි ඔෆ් ඩ්‍රැමටික් ආර්ට් වැනි ආයතනවලින් රංගනය පිළිබඳ හැදෑරූ ඇය ලංකාවට පැමිණි පසුව කොළඹ මියුසියස් විද්‍යාලයේ ගුරුවරියක් ලෙස වෘත්තිය ආරම්භ ආචාර්ය කළාය. අයිරාංගනී රොක්සානා වින්ස්ටන් සේරසිංහ සමග විවාහ වූ අතර ඉන් පසු අයිරාංගනී සේරසිංහ නම් වූවාය. ඔවුන්ට රවී සහ රංජිත් වූ පුතුණුවන් දෙදෙනකු විය. ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ රේඛාව චිත්‍රපටය සඳහා රංගනයෙන් දායක වූ ඇය එහි රංගනය වෙනුවෙන් 1956 දීපශිඛා සම්මාන උලෙළේ හොඳම නිළිය ලෙස සම්මාන ලැබූ ඇය සන්දේශය, දෙලොවක් අතර, රන්සළු, බක්මහ දීගේ, සාගරයක් මැද, දඩයම, දෙවැනි ගමන, පවන රළු විය, ලොකු දුව, කිණිහිරියා මල්, සුදු සෙවණැලි, ආදර කතාවක්, ආදී චිත්‍රපට රැසකට සිය රංග ප්‍රතිභාව මුසු කළා මෙන්ම හොඳම සහාය නිළිය සම්මාන රැසක් දිනා ගැනීමට ද සමත් වූවාය. ඒ අතර (1981) සාගරයක් මැද (1981) ලොකුදුව (1996) සුදු සෙවණැලි (2003) ආදිය සඳහා වූ සරසවිය සම්මාන කැපී පෙනේ. ඔබදුටු දා (1967), පවන රළු විය (1991) අවරගිර (1996) සඳහා ඇය සම්මානනීය වූයේ හොඳම නිළිය සඳහා වූ සරසවිය සම්මානයෙනි.

සරසවිය සම්මාන උලෙළේ දී ඇය ජීවිතයේ එක් වරක් පමණක් පිදෙන යාවජීව සම්මානයෙන් ද පිදුම් ලැබුවාය.

පුංචි තිරයේ සුදු ආච්චි නම් අන්වර්ථ නාමයෙන් හැඳින් වූ ඇය දූ දරුවෝ, යශෝරාවය, ගම්පෙරළිය, නෑදෑයෝ, සත්පුර වැසියෝ වැනි ජනප්‍රිය ටෙලි නාට්‍ය රැසකට සිය රංගන දායකත්වය දුන්නාය. අප ඇයට සුබම සුබ උපන් දිනයක් වේවායි ප්‍රාර්ථනා කරමු.

• සමීර කන්නන්ගර

# පොහොට්ටු දෙකඩ කරන අනෙක් පක්ෂ කඹ අදින

# මොකක්ද මේ 21



**ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් වූ කලී රටක උත්තරීතර නීතියයි. එහිදී රටක ඕනෑම නීතියක් අභිබවා මෙම උත්තරීතර නීතිය ක්‍රියාවට නැංවේ. එනම් රාජ්‍යයක පුරවැසියන් පාලනය කරන දිශානතිය එමගින් පෙන්නුම් කෙරේ. අප රටේ වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1978 දී පනවා ගනු ලැබූවකි. ඕනෑම රටක යාවත්කාලීන වන සමාජ, ආර්ථික සහ දේශපාලන සන්දර්භයන් හමුවේ ව්‍යවස්ථාව සංශෝධනයන්ට ලක්වෙයි. එය නිතැතින්ම සිදුවන ක්‍රියාවලියකි. ඒ ආකාරයෙන් අපේ රටේ ව්‍යවස්ථාව ද එතැන් පටන් මේ තාක් විසි වතාවක් සංශෝධනයට ලක්ව ඇත. ඉතා කෙටි කාලයක් තුළ බොහෝ වාර ගණනක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනයන්ට යටත් වුවද තවමත් අප රටේ පවතින ගැටලු නිරාකරණය කර ගැනීමට අප සමත් වී නැත. එබැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නැවතත් 21 වන වතාවටත් සංශෝධනය කිරීම සඳහා මේ වනවිට සමාජය තුළ පුළුල් කතිකාවතක් නිර්මාණය වී ඇත.**

ආචාර්ය විජයදාස රාජපක්ෂ විසින් ගෙන එනු ලැබූ 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉදිරියට ආවේ ඇයි?

ආචාර්ය ජනාධිපති නීතිඥ විජයදාස රාජපක්ෂ දැනටමත් 21වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතක් කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කොට ඇත. තවද සමගි ජනබලවේගය ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය සඳහා පනත් කෙටුම්පතක් ඉදිරිපත් කර තිබිණි. ඔවුන් ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පත පිළිබඳව නීතිපතිවරයාගේ මතය වූයේ එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් 2/3ක යෝජනා සම්මතයකින් පමණක් සම්මත කර ගැනීමට නොහැකි බවත් ඒ සඳහා ජනමත විචාරණයක් ද පැවැත්වීමට සිදුවන බවය. අප රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දෙයාකාරයකට සංශෝධනය කළ හැකිය. ඉන් පළමුවැන්න නම් පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් 2/3ක බහුතර ඡන්දයකින් සම්මත කර ගැනීමය. නමුත් සෑම වගන්තියක් මෙයාකාරයෙන් සම්මත කරගැනීමට නොහැකිය. එනම් ඇතැම් වගන්ති සංශෝධනය කර ගැනීම සඳහා පාර්ලිමේන්තුවේ 2/3ක බහුතර ඡන්දයට අමතරව ජනමත විචාරණයක දී ජනතාවගේ අනුමැතිය ද ලබා ගැනීම අනිවාර්ය වේ. මෙහිදී රටේ පවතින දැඩි ආර්ථික අර්බුදය හමුවේ මේ මොහොතේදී ජනමත විචාරණයක් පැවැත්වීමට අවකාශයක් නැත. එය ඕනෑම පොඩි දරුවකුට වුවද තේරෙන තත්ත්වයකි. එබැවින් සමගි ජන බලවේගය විසින් ඉදිරිපත් කරන්නට යෙදුණු පනත් කෙටුම්පත යම් පසුගාමී තත්ත්වයකට පත්විය. එබැවින් ආචාර්ය විජයදාස රාජපක්ෂ විසින් ඉදිරිපත් කරන්නට යෙදුණු 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය තුළ සාකච්ඡා කොට තීරණයකට එළැඹීමට තීරණය කෙරුණි.

## • වැරදි පූර්වාදර්ශ...

මෙම 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පනත් කෙටුම්පත සම්බන්ධයෙන් දේශපාලන පක්ෂ, සිවිල් සංවිධාන, පූජ්‍ය පක්ෂය සහ පුරවැසියන් වෙතින්ද විවිධ කරුණු ඉදිරිපත් වෙමින් පවතී. එකී ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව ඇතැම් විට එකම පක්ෂය තුළ වුවද මතවාද කිහිපයක් ඉදිරිපත් වෙමින් පැවැතිම සුවිශේෂී තත්ත්වයකි. එය කොතරම් දුරට දේශපාලන පක්ෂ වෙත බලපා ඇත්ද යන්න පිළිබඳව සලකා බැලීමේදී අද වන විට එම දේශපාලන පක්ෂ දෙකඩ වීම සඳහා පවා තීරණාත්මක සාධකයක් බවට මෙම කරුණ බලපා ඇත. එය හුදු දේශපාලන බල පොරයේ බෙදුම් රේඛාව බවට පත්ව ඇත. එයට මූලිකම හේතුව මේ තාක් කල් අප රටේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධන ඉතිහාසය දෙස බැලීමේදී අවබෝධ කර ගත හැකිය. එනම් සරලව කිවහොත් අප රටේ බොහෝ අවස්ථාවලදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයන් සිදු කරන්නේ රටේ අවශ්‍යතාව සඳහා නොවේ. දේශපාලනඥයන්ගේ හුදු පටු බලලෝභී දේශපාලන අරමුණු වෙනුවෙනි. ඔවුන්ගේ හැසිරීම ද මෙවරද ඒ ආකාරයෙන්ම පෙන්නුම් කෙරේ.

## • 19න් අපට ලැබුණ දේ...

අපගේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට ගෙන එනු ලැබූ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කවර අඩුපාඩු පැවතියද මෙරට ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සඳහා යම් පිටුබලයක් ලැබුණි. එමගින් විධායක, ව්‍යවස්ථාදායක සහ අධිකරණ යන බල ව්‍යුහයන් අතර යම් සංවරණ සහ තුලන (Check & Balances) ක්‍රියාදාමයක් නිර්මාණය කෙරුණි. එනම් විධායක ජනාධිපති ධුරයේ නිල කාලය වසර 5කට සීමා කෙරිණි. එමෙන්ම යම් තැනැත්තෙකුට ජනාධිපති ධුරය දැරිය හැකි වාර ගණන දෙවතාවක් දක්වා පමණක් බවට සීමා පැනවිය. මෙම තත්ත්වය මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා විසින් 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පෙර පැවති තත්ත්වයයි. එනම් මහින්ද රාජපක්ෂ 18 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් ජනාධිපතිවරයකුට ජනාධිපතිවරණයක් සඳහා ඉදිරිපත් වීමට හැකි වාර ගණන වෙනස් කෙරිණි. එනම් 19 වන ආණ්ඩු ව්‍යවස්ථා සංශෝධනය මගින් නැවතත් එය යථාවත් කෙරිණි. එනම් ප්‍රජාතන්ත්‍රීකරණයේ අතින් ඉතා දියුණු රාජ්‍යයක් වශයෙන් සම්මත ඇමරිකා එක්සත් ජනපදය තුළ පවා යම් තැනැත්තෙකුට ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් විය හැකි වාර ගණන උපරිමයෙන් වාර 2කට සීමා කොට ඇත. එමෙන්ම 19 න් ස්වාධීන කොමිෂන් සභා ස්ථාපනය කෙරිණි. ඒ අනුව එකී කොමිෂන් සභාවල නිලධාරීන්ගේ පත්කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම් සහ විනය සම්බන්ධයෙන් කරුණු ස්වාධීන විය. එමෙන්ම ජනාධිපතිවරයාට අමාත්‍ය ධුර දැරිය නොහැකි බවට වන විධිවිධානයක් සැලැස්විය. එනම් එවකට ජනාධිපති ධුරය දැරූ මෛත්‍රීපාල සිරිසේනට පමණක් පරිසරය සහ රාජ්‍ය ආරක්ෂක අමාත්‍ය ධුරයන් දැරීම සීමා කොට ඉන් ඉනික්බිතිව පත්වෙන ඕනෑම ජනාධිපතිවරයෙකුට එලෙස අමාත්‍යධුර දැරීමේ අවකාශ එමගින් අහිමි කොට තිබිණි. එමෙන්ම ජනාධිපතිවරයා විසින් අමාත්‍යවරු, නියෝජ්‍ය අමාත්‍ය සහ රාජ්‍ය අමාත්‍යවරු පත් කිරීමේදී අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත එකී පත්කිරීම් සිදු කළ යුතු බවට කොන්දේසියක් පැනවිණි. එමෙන්ම පොලිස්පතිවරයා, විගණකාධිපතිවරයා, උපරිමාධිකරණ විනිසුරුවන්, මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා ඇතුළු රජයේ ඇතැම් ඉහළ නිලධාරීන් පත් කරනු ලැබුවේ ව්‍යවස්ථාදායක සභාව විසිනි.

යහපාලන ආණ්ඩු කාලසීමාව තුළදී සම්මත කර ගන්නට යෙදුණ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බොහෝ ප්‍රජාතාන්ත්‍රික ලක්ෂණ 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පරිච්චින්න කෙරිණි. සැබැවින්ම 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වූ කලී බලලෝභී දේශපාලන බල පෙරලියේ තවත් එක් දේශපාලන ප්‍රෝඩාවකි. එහි ප්‍රතිවිපාක අදට ද අප මුහුණ දෙමින් සිටී. එනම් වර්තමානයේදී පවා වඩාත් ආන්දෝලනාත්මක ලෙස කතාබහට ලක් වන ද්විත්ව පුරවැසිභාවය පිළිබඳ කරුණ වඩාත් කැපී පෙනේ. එමගින් ද්විත්ව පුරවැසිභාවයක් සහිත පුද්ගලයෙකුට පවා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ දොර විවර වුණි. එහි පල නෙළා ගත්තේ බැසිල් රාජපක්ෂය. පාර්ලිමේන්තු මන්ත්‍රී තිස්ස කුට්ටිආරච්චිට අනුව නම් බැසිල් මොළ හතේ ආර්ථික න්‍යායචාර්යවරයෙකි. අවසානයේදි ආර්ථික වශයෙන් පමණක් නොව දේශපාලන වශයෙන්ද රට අස්ථාවරත්වයට පත් විය. මෙලෙස රට ආගාධයට පැමිණවීමේ වගකීම බැසිල් රාජපක්ෂට පමණක් ලසු කොට සැලකිය නොහැක. ඒ සඳහා බොහෝ වගඋත්තරකරුවන් ඇත. නමුදු ඒ අතරින් බැසිල් රාජපක්ෂ සුවිශේෂ වන්නේ ඒ වගඋත්තරකරුවන්ට නායකත්වය දෙන්නේ අදටත් බැසිල් රාජපක්ෂ වීම නිසාවෙන්මය.

## • කවුරු කවුරුත් ගොඩයන්න හදන 21

රට ආර්ථික සහ දේශපාලන වශයෙන් අස්ථාවර නොවන්නට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා 21 වන වතාවට සංශෝධනය කළ යුතුය යන කරුණ කරලියට පැමිණෙන්නේ ද නැත. මන්දයත් ඒ වන විටත් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට පාර්ලිමේන්තුවේ උපරිම බල අධිකාරියක් පැවැතුණි. එවැනි විටකදී අපේ රට දේශපාලන පක්ෂයක් ජනතාවට හිතකර ව්‍යවස්ථා සංශෝධනයක් ගෙන ඒමට කටයුතු කරන්නේ නම් නැත. එනම් ‘‘බලය තිබෙන විට මොළේ නැත. මොළේ තිබෙන විට බලය නැත යන සුප්‍රකට කියමනක් වේ. අපේ රටේ දේශපාලනඥයන් සම්බන්ධයෙන් නම් එකී කියමන සියයට සියයක්ම පාහේ නිවැරදිය. එබැවින් මෙම බල අස්ථාවරත්වය හමුවේ රටට යහපත් ව්‍යවස්ථා සංශෝධනයක් ගෙන ඒමට ජනතාව පාලකයන්ව පෙළඹ විය යුතුය. ඒ සඳහා ජනතාව උපායශීලී විය යුතුය. ලෝක දේශපාලන ඉතිහාසයේ පළමුවරට තනි මන්ත්‍රී ආසන ධුරයත් පවතින පක්ෂයක මන්ත්‍රීවරයෙක් අග්‍රාමාත්‍ය ධුරය දරන්නේ ය. ඔහුගේ සහයට සිටිනුයේ පැවති රජයේ මන්ත්‍රීවරුන් ය. එනම් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරුන්ය. එනම් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ දැනටමත් ආචාර්ය විජයදාස රාජපක්ෂ විසින් ගෙන එනු ලැබූ 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරවා ගැනීම සඳහා එකඟ වී ඇත. නමුදු ගැටලුව වී ඇත්තේ එය නොවේ. එනම් අග්‍රාමාත්‍යවරයාට ඔහුගේ සහයට සිටින ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මන්ත්‍රී කණ්ඩායමේ සහාය 21 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ලබාගත හැකිද යන වගයි.

> ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සිදු කළ යුත්තේ පොදු මහජන යහපත උදෙසාය. රටක අභිවෘද්ධිය සඳහා ය. 17 වන සහ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හැරුණු විට අනිකුත් බොහෝ සංශෝධනයන් සම්මත කරගෙන ඇත්තේ හුදු පෞද්ගලික පරමාර්ථයන් මුදුන් පමුණුවා ගැනීම උදෙසා ය. ඒ අනුව බලන කල නම් රටක් වළපල්ලට යැම අරුමයක් නොවේ.

අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහට පෞද්ගලිකව බැලුවද 21 වන ආණ්ඩු ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒම අවාසි සහගත තත්ත්වයක් උද්ගත නොවේ. මන්දයත් පාර්ලිමේන්තු බලය ශක්තිමත් වීම ඔහුට හිතකරය. එනම් ඔහු නියෝජනය කරන එක්සත් ජාතික පක්ෂය මේ වනවිට දේශපාලන වශයෙන් දියාරු වී ඇත. එබැවින් ඔහුට ඉදිරි 2025 දී පැවැත්වෙන ජනාධිපතිවරණය සම්බන්ධයෙන් අපේක්ෂා සහගතව සිටිය නොහැක. එමෙන්ම ඔහු දේශපාලන වශයෙන් ගත කරනුයේ ද සැඳෑ සමයේ ය. එබැවින් ඔහුට ඇති වන්නට හෝ නැති වන්නට කියා දෙයක් නැත. නමුදු යම් හෙයකින් 21 වන ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුව තුළ සම්මත කර ගැනීමට ලැබුණහොත් එමගින් අත්වන ලකුණු මුළුමනින්ම ඔහු සන්තක කර ගැනීමට ඔහුට හැකියාව ඇත. එමගින් ඇතිවන උද්දීපනය යම්තාක් දුරකට හෝ සතර සාතයෙන් ඇද වැටී ඇති එක්සත් ජාතික පක්ෂයට ඉදිරි මැතිවරණයකදී මීට වඩා වැඩි ආසන සංඛ්‍යාවක් දිනා ගැනීමට හැකියාව නිතැතින් උදාවේ. එබැවින් රනිල් වික්‍රමසිංහට 21 වන ව්‍යවස්ථා සංශෝධනයට අකැමැති වීමට දෙයක් නැත. යම් හෙයකින් වික්‍රමසිංහ විසින් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට ඔහුට සහාය වෙන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නියෝජනය කරන නේ මන්ත්‍රීවරු ඊට එරෙහිව වුවහොත් එහි අවාසි සහගත බැරපැන යන්නේද එකී විරුද්ධ වූ පිරිස් වෙත ය. එබැවින් මෙම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වුවද සම්මත නොවුවද රනිල් වික්‍රමසිංහ දැනටමත් ජයග්‍රහණය කර ඇත.

## • පොහොට්ටුවට බැරි ඇයි?

මෙම 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සඳහා සහාය දක්වනවා ද නැද්ද යන්න පිළිබඳව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ තුළ මේ වන විට පවතින්නේ බෙදුණු මතවාදයකි. එම පෙරමුණේ බැසිල් හිතවාදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දැනටමත් ඊට සිය විරෝධය දක්වා ඇත. ඊට මූලිකතම හේතු වී ඇත්තේ මෙම ආණ්ඩු ව්‍යවස්ථා සංශෝධනය මඟින් දක්වා ඇති ද්විත්ව පුරවැසිභාවය පිළිබඳ කාරණාවයි. යම් හෙයකින් මෙම පනත සම්මත වුවහොත් බැසිල්ට සිය පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය අහිමි වේ. එය එසේ සිදුවුවහොත් ඔහු වටා වසා ඇති දේශපාලන කිනිතුල්ලන් ගැලවී විසි වී යනු ඇත. එබැවින් බැසිලියානු කණ්ඩායමට අවශ්‍යව ඇත්තේ මෙම ව්‍යවස්ථා සංශෝධනය පරාජයට පත් කිරීමය. එම කණ්ඩායමේ දේශපාලන පැවැත්ම සඳහා එය එසේ විය යුතුමය. තවද එම කණ්ඩායමේ ඉදිරි ජනාධිපතිවරණ දේශපාලන අපේක්ෂක සිහින කුමරා වන්නේද බැසිල් රාජපක්ෂය. නමුදු බැසිල් රාජපක්ෂ පමණක් නොව සියලු රාජපක්ෂවරු දේශපාලනයෙන් සමු ගැනීමට කාලය එළඹ ඇති බව විශ්වාස කරන පිරිස් ද ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ තුළ දැන් දැන් දක්නට ඇත. එය රාජපක්ෂවරු සිටීම දේශපාලන වශයෙන් සුබ අනාගතයකට පෙර නිමිති දකින බොහෝ පිරිස් වෙත එකී අපේක්ෂාවන් ඉච්ඡාභංගත්වයට පමුණුවාලයි. එනම් කොතරම් දක්ෂයකු වුවද අමාත්‍ය ධුරයෙන් ඔබ්බට ගමන් කළ නොහැකිය. තවද අමාත්‍යධුරයට පත් වුවද ඔවුනට ලැබෙනුයේ තෙවන පන්තියේ අමාත්‍යධුරයන්ය. එනම් අමාත්‍යධුර කෙසේ වෙතත් මේ යන විදියට රාජපක්ෂවරු ඉදිරියේදීත් රට පාලනය කළේ නම් ඉදිරි පාර්ලිමේන්තු මැතිවරණයේදී සිය පාර්ලිමේන්තු අසුන පවා අහිමි වන බව ඔවුහු හොඳාකාරව තේරුම් ගෙන සිටිති. එමෙන්ම පසුගිය දින කීහිපය තුළ ඇතිවූ ආසන්නතම සිද්ධි සමුදාය ද ඔවුන්ව මෙම තීරණයට තල්ලු කිරීමට ප්‍රබල හේතුවක් වනු නොඅනුමානය. එනම් රට තුළ පවතින ආර්ථික, දේශපාලන අස්ථාවරත්වය හමුවේ ජනතාව නීතිය අතට ගත්තේය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නිවාස ගිනිබත් කළේය. පහර දුන්නේ ය. බැන අඬ ගැසුවේය. තර්ජන ගර්ජන කළේය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් මහමග අමු අමුවේ මරා දැමුවේය. මේ සියලු සිදුවීම් ඔවුන්ගේ අනාගත දේශපාලන ඉරණම සිදු කෙරෙන ආකාරය පිළිබඳව පූර්ව දැනුම් දීමක් බඳුය. එනම් මෙම සියලු සිදුවීම් ජනතාව දේශපාලනඥයන් කෙරෙහි තබා ඇති අවිශ්වාසනීයභාවයේ කැඩපතක් වේ.

සමගි ජන ජනබලවේගයේ මතය වන්නේ විධායක ජනාධිපති ධුරය මුළුමනින්ම අහෝසි විය යුතුය යන්නය. නමුදු විධායක ජනාධිපති ධුරය අහෝසි වන්නේ නම් දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ඊට බද්ධව හඳුන්වා දී ඇති පළාත් සභා සහ සමානුපාතික ඡන්ද ක්‍රමය යනාදිය පිළිබඳව ද පුළුල් සංවාදයක් ඇති විය යුතුය. එවන් වූ ආකාරයෙන් සංශෝධන සඳහා පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් 2/3ක බහුතර ඡන්දයකට අමතරව ජනමත විචාරණයකටද යා යුතුය. නමුදු අප රටේ පවතින සමාජ, දේශපාලන සහ ආර්ථික අර්බුද හමුවේ ජනමත විචාරණයකට යෑමේ වටපිටාවක් මේ මොහොතේ දී කිසිසේත්ම නොමැත. විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම අපේ රටේ පවතින ආරක්ෂාව සම්බන්ධයෙන්ද යම් කිසි ආකාරයක ගැටලුකාරී තත්ත්වයක් නිර්මාණය විය හැකිය. මන්දයත් යම් හෙයකින් පාර්ලිමේන්තුව තුළ බහුතර ආසන සංඛ්‍යාවක් හිමි ආණ්ඩුවක් තේරී පත් නොවුණහොත් එනම් විශේෂයෙන්ම ආරක්ෂාව සම්බන්ධයෙන් තීරණ ගැනීමේ කටයුතුවලදී මුළුමනින්ම එකී ක්‍රියාවලිය අඩාල වීමේ අවදානමක් පවතී. එවැනි විටකදී මුළු රාජ්‍ය යාන්ත්‍රණයම බිඳ වැටේ. මේ පිළිබඳව ජෙනරල් සරත් ෆොන්සේකා දක්වන්නේ වෙනස්ම මතයකි. ඔහු කියා සිටින්නේ අප රටට විධායක ජනාධිපති ධුරය අත්‍යවශ්‍ය අංගයක් බවයි. සමගි ජන බලවේගයේ හරීන් ප්‍රනාන්දු සහ මනූෂ නානායක්කාර දැනටමත් 21වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සඳහා සිය සහාය ලබාදෙන බවට දැනටමත් ප්‍රකාශයට පත් කොට ඇත. එමෙන්ම විධායක ජනාධිපති ධුරය අහෝසි වුවහොත් අප රටෙහි සම්පත් කෙරෙහි අවධානයෙන් සිටින ජාත්‍යන්තර බලවේගවලට අප විසින්ම ප්‍රවේශයන් සලසා දෙයි. විශේෂයෙන්ම රටක ආර්ථිකය බිඳ වැටුණු විට ඕනෑම රාජ්‍යයකට අප රටට අත පෙවිය හැකිය

## • වමේ පක්ෂ කර හරිති

රට තුළ පවතින දේශපාලන වාතාවරණය හමුවේ ජනතා විමුක්ති පෙරමුණෙන් බිඳී වෙනම සංවිධානයක් ලෙස කඳවුරු ගත වුණ පෙරටුගාමී සමාජවාදී පක්ෂය නැවත වතාවක් ජනතා විමුක්ති පෙරමුණ සමග එක්ව ක්‍රියා කිරීමට යම් යම් එකඟතාවන්ට පැමිණීම සුවිශේෂී ලක්ෂණයකි. එනම් 21 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය සම්මත කර ගැනීම සම්බන්ධයෙන්ද මෙම කණ්ඩායම් වෙතින් එතරම් සුබවාදී ප්‍රතිචාරයක් දක්නට ලැබෙන්නේ නැත. ඔවුන් ද ඊට යම් යම් කොන්දේසි එකතු කරමින් පවතී. ඔවුන් විසින් ගෙන එනු ලබන කොන්දේසි එකතු කරගැනීම ව්‍යවස්ථා සංශෝධනයේදී වඩා වැදගත් වනු ඇත. ඔවුන් දක්වා සිටින්නේ විවිධ අවස්ථාවල කැලි කඩා අමුණා තිබෙන මෙම ව්‍යවස්ථාව මුලින්ම වෙනස් කොට පූර්ණ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ආ යුතු බවය. මෙම පාලකයන්ගෙන් මෙම අවශ්‍යතාව සම්පූර්ණ නොවන බවත් එබැවින් ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වන දිසාවට සහයෝගය දෙන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයකට පක්ෂව ඡන්දය ලබා දෙන බවත් ඔවුහු වැඩිදුරටත් දක්වා සිටිති. ඒ සඳහා ඔවුන් ඉදිරිපත් කරනු ලබන ප්‍රමුඛතම කොන්දේසි අතර ජනාධිපතිවරයාට කිසිදු අමාත්‍ය ධුරයක් දැරීමට නොහැකි වීම, මන්ත්‍රීවරුන්ට විවිධ වරදාන, වරප්‍රසාද හමුවේ පක්ෂ මාරු කිරීමට පවතින ඉඩ ප්‍රස්ථාව සඳහා වැට බැඳීම, එමෙන්ම ජීවිතාන්තය දක්වා සිරදඬුවම් ලැබූවන්ට, මරණීය දණ්ඩනය නියම වූ අයට ජනාධිපතිවරයා වෙත පවතින ජනාධිපති සමාව දීමේ බලය සීමා කිරීම, තවද ද්විත්ව පුරවැසිභාවය කියන කාරණාව ජනාධිපතිවරයාට මැති ඇමැතිවරුන්ට පමණක් නොව රටේ වැදගත් ආයතනවලට පත් කිරීමේදී ද අදාළ විය යුතු බව, අමාත්‍යාංශ ලේකම්වරු පත්කිරීම ව්‍යවස්ථාදායක මණ්ඩලය මගින් සිදුකිරීම යනාදී වූ කරුණු ඇතුළත් කොට ඇත. එමෙන්ම 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පාර්ලිමේන්තුවට සහ අග්‍රාමාත්‍යවරයාට ලැබෙන අමතර බලය දැරීමට රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයාට කිසිදු අයිතිවාසිකමක් නොමැති බවට ඔවුහු තවදුරටත් දක්වා සිටිති. ඔවුන් තර්ක කර සිටිනුයේ ඔහු පාර්ලිමේන්තුවේ තනි මන්ත්‍රී ධුරයක් දරණ තැනැත්තෙක් පමණක් වන බවත් පාර්ලිමේන්තුවේ බහුතර ජන පදනමක් ඔහුට නොමැති බවත්ය. ජනාධිපතිවරයා විසින් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයාව පත්කළේ ඔවුන්ගේ පටු දේශපාලන අරමුණු උදෙසා බවය. ඔවුන්ගේ දේශපාලන ආරක්ෂාව සඳහා වන බවය. එබැවින් මෙම ආණ්ඩුක්‍රම සංශෝධනයේදී අන්තර්කාලීන විධිවිධානයක් ලෙස වර්තමාන පාර්ලිමේන්තුවේ කාලය සම්බන්ධයෙන් සීමාවක් ඇතුළත් කළ යුතු බවට ඔවුහු යෝජනා කරති.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සිදු කළ යුත්තේ පොදු මහජන යහපත උදෙසාය. රටක අභිවෘද්ධිය සඳහා ය. 17 වන සහ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හැරුණු විට අනිකුත් බොහෝ සංශෝධනයන් සම්මත කරගෙන ඇත්තේ හුදු පෞද්ගලික පරමාර්ථයන් මුදුන් පමුණුවා ගැනීම උදෙසා ය. ඒ අනුව බලන කල නම් රටක් වළපල්ලට යැම අරුමයක් නොවේ. ඒවායෙහි අනිසි ප්‍රතිවිපාක අද අප අත් විඳිමින් පවතී. ආර්ථික වශයෙන් බංකොලොත් රාජ්‍යයක් බවට අද ලෝකයා ඉදිරියේ අවමානයට පාත්‍ර වී ඇත. තවද අල්ල සහ දූෂණය පිරුණු රටක් බවට අද බොහෝ විදේශ මාධ්‍ය පවා ප්‍රචාරයට පත් කරමින් සිටී. මේ තත්ත්වයට මුළුමනින්ම වගකිව යුත්තේ නිදහසින් පසු අප පාලනය කළ පාලකයෝය. එමෙන්ම පාලන තන්ත්‍රයට පාලකයන් පත්කළ පුරවැසියන් ද ඊට වගකිව යුතු වේ. එබැවින් රටේ යහපත උදෙසා ගෙන එනු ලබන කුමන සංශෝධනයක් වුවද මග හැරීමට අපට කාලයක් නැත. දැන්වත් පාලකයෝ දේශපාලන ගේම් නවතාලිය යුතුය. රටේ ප්‍රගමනය සඳහා අත්වැල් බැඳගත යුතුය. එමෙන්ම පුරවැසියන්ටද පාලකයන් එම දිශානතියට තල්ලු කරවීමේ ප්‍රබල සමාජගත වගකීමක් පවතී. එබැවින් 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පවතින අඩුලුහුඬුකම් මඟහරවා ගනිමින් ඊට වඩාත් සාධනීය ඉදිරි පියවර එකතු කරමින් ඒ සඳහා සක්‍රීයව දායක වීමට සියලු පාලකයෝ මෙන්ම පුරවැසියෝ ද වගබලා ගත යුතු වේ.

# පනත ආවාට පස්සේ විදුලි මාෆියාව දාන අමුතු සෙල්ලම





විදුලිබල සහ බලශක්ති ඇමැති කංචන විජේසේකර

ලංකා විදුලිබල මණ්ඩලය වෙනම රාජ්‍යයක් බවට පත්කර ගත් විදුලි ඉංජිනේරු ත්‍රස්තවාදීහු පවතින රාජ්‍ය පාලනයන්ට පවා අභියෝග කරමින් කලක සිට සමස්තය වනසා දමමින් සිටියහ.

අප දන්නා මහා ත්‍රස්තවාදියා වූ වේලුපිල්ලේ ප්‍රභාකරන්ටත් එහා ගිය ත්‍රස්තවාදයක් එහිදී ඔවුහු රටේ ජනතාව වෙත මුදා හරින්නට වූහ. එසේ ජනතාව ප්‍රාණ ඇපයට ගෙන විදුලි ඉංජිනේරු ත්‍රස්තවාදීන් භීෂණය පතුරවන ආකාරය අපි අනේක වාරයක් මේ රටට පැහැදිලිවම අනාවරණය කළෙමු.

අප එය අරඹනු ලැබුවේ මහින්ද රාජපක්ෂයන් මේ රටේ ජනාධිපතිවරයාව සිටි කාලයේ පටන්ය. පැහැදිලිව කිවහොත් ඊට වසර දහයක පමණ අතීතයක් ඇත. එහෙත් මහින්ද රාජපක්ෂයන්ට මෙන්ම ඉන් පසුව බලයට පැමිණි කිසිවකුටත් මේ ත්‍රස්තවාදයට තිත තබන්නට කොන්දක් තිබුණේම නැත.

ත්‍රස්තවාදයට තේරෙන භාෂාවෙන් පිළිතුරු දීම වෙනුවට බලයට පැමිණි සියල්ලෝ කරනු ලැබුවේ බලය රැකගනු පිණිස පතෝල හැසිරීමක යෙදෙමින් විදුලි ඉංජිනේරු ත්‍රස්තවාදීන් නැලවීම වූහ.

අද දවසේ රට ඉදිරියේ ඇති විදුලි අර්බුදයට බලපෑ ප්‍රබලම හේතුව ලෙසද එය පෙන්වා දිය හැකිය. ගෙවී ගිය එම කාල සීමාව තුළ කලින් කලට විවිධ ඇමැතිවරු විදුලිබල මණ්ඩලය භාර ගත්හ. එසේ කිරීමෙන් පසු ජනතාව ඉදිරියට පැමිණි ඒ ඇමැත්තෝ කියන ලද සුරංගනා කතාද බොහෝය. එහෙත් විදුලිබල මණ්ඩලය තුළ ක්‍රියාත්මක විදුලි ඉංජිනේරු ත්‍රස්තවාදය ඉදිරියේ ඔවුහු සියලු දෙනා හැසිරුණේ වලිගය පශ්චාත් භාගයේ ඔබා ගත් බයාදු සුනඛ පෝතකයන් පරිදි වූහ. එහෙත් එකී තත්ත්වය උඩු යටිකුරු කරන්නට ඉකුත් බ්‍රහස්පතින්දා වත්මන් විදුලිබල සහ බලශක්ති ඇමැති කංචන විජේසේකර මහතා කටයුතු කළේය. එහිදී ඇමැතිවරයා කරනු ලැබුවේ කුමක්ද?

මෙතෙක් කලක් විදුලි ඉංජිනේරු ත්‍රස්තවාදීන් රටේ ජනතා මුදල් සූරා කෑම පිණිස යොදා ගනු ලැබූ එක් ප්‍රධාන මෙවලමක් තිබිණි. එය වූයේ 2009 අංක 20 දරන විදුලිබල මණ්ඩල පනතය. විදුලි ඉංජිනේරුවන් කාලයක සිට පුනර්ජනනීය විදුලි උත්පාදනයට වැට බඳින ප්‍රධාන මෙවලමක් කරගත් විදුලිබල මණ්ඩල පනත සංශෝධනයට ලක්කර එය පාර්ලිමේන්තුවේ ගෙනවිත් සම්මත කරගැනීම තුළින් කංචන විජේසේකර එකී පරිවර්ථනය සිදු කරන අතරේ රටම බලා සිටියදී විදුලි ඉංජිනේරු ත්‍රස්තවාදයටද අත දිගහැර දරුණු කනේ පහරක් එල්ල කළේය.

මෙහිදී සභාපතිවරයා ඉවත්කිරීම යන්න විදුලි ඉංජිනේරු ත්‍රස්තයන් සඳහන් කර තිබුණේ තම ඉල්ලීම අතර ඇති අවසාන ඉල්ලීම ලෙසය. එහෙත් සත්‍ය දන්නා විදුලිබල මණ්ඩලයේ ඇතැම් වෘත්තීය සමිති සඳහන් කරනු ලැබුවේ යෝජිත වැඩ වර්ජනයේදී විදුලි ඉංජිනේරුවන්ගේ ප්‍රධාන ඉලක්කය වී තිබෙන්නේ ලංවිම සභාපති එම්. සී. සී. ෆර්ඩිනැන්ඩු මහතා සභාපති ධුරයෙන් පන්නා දැමීම බවය.

ලංවිම සභාපති ෆර්ඩිනැන්ඩු මහතා විදුලි ඉංජිනේරු ත්‍රස්තවාදයට එරෙහිව ඍජුවම පෙනී සිටීම එසේ ඔහු ත්‍රස්තවාදයේ උදහසට ලක්වීමට ප්‍රබල හේතුවක් වී තිබිණි.

මේ අන්දමට සඳහන් කළ පරිදිම 08 වැනිදා මධ්‍යම රාත්‍රියේදී විදුලිබල මණ්ඩලය සිය උරුමයෙන් ලද බූදලයක් සේ පාලනය කරමින් සිටි ඉංජිනේරුවන් වර්ජනය අරඹනු ලැබූහ.

එහෙත් පසුදා එනම් 09 වැනිදා පෙරවරුව වන විට ඔවුන් සඳහන් කරනු ලැබුවේ ජනාධිපතිවරයා සමඟ පැවති දුරකථන සාකච්ඡාවකට අනුව වැඩවර්ජනය අත්හිටුවීමට තීරණය කළ බවය. එහෙත් ඔවුන් එසේ පැවසුවද වැඩවර්ජනය අවසන් කිරීමක් සිදු කෙරුණේද?

කිසිසේත්ම නැත. ඇතැම් විදුලි ඉංජිනේරුවන් මෙරට විදුලි පද්ධතියේ සමබරතාව බිඳදමද්දී 09 වැනිදා හිමිදිරියේ සිට රට පුරා තැන තැන විදුලිය ඇනහිටීම් සිදුවිය. ඒවා යථා තත්ත්වයට පත්වූයේ බොහෝ කාලයක් ගෙවී යෑමෙන් අනතුරුවය.

මෙසේ රටේ විදුලිය බෙදා හැරීමේ පද්ධතියේ සමබරතාව බිඳ වැට්ටවීම යනු මොවුන් කලක සිටම රට තුළ විදුලි අර්බුදයක් ඇති කිරීම සඳහා භාවිත කරන එක් නින්දිත උපක්‍රමයකි. එකී නින්දිත බව එදිනද ඔවුහු ප්‍රදර්ශනය කළහ. එය වැඩවර්ජනය අත්හැරීමක් යැයි කිව හැකිද?

මේ අතරේ කිසියම් තවත් කාලකණ්ණි ත්‍රස්තවාදියකු ප්‍රධාන ඉංජිනේරුවකු යටතේ පාලනය වන ලක්ෂපාන බලාගාරය අක්‍රීය කිරීමටද පියවර ගෙන තිබිණි. මෙගවොට් 340 කින් යුතු එම බලාගාරය යළි ක්‍රියාත්මක වූයේ 09 වැනිදා මධ්‍යහ්නය වන විටය. එසේම රන්ටැඹේ සහ රන්දෙණිගල ජලාශවල ජල විදුලිය උත්පාදය සඳහා තිබූ ජලය නිකරුණේ මුදා හැරීමට තවත් මුග්ධයකු ක්‍රියා කරනු ලැබීය.

මේ සියලු මුග්ධ ක්‍රියාකාරකම් පිළිබඳව පාර්ලිමේන්තුව හමුවේ පැහැදිලිව සඳහන් කිරීමට කංචන විජේසේකර ඇමැතිවරයා මොහොත වන විට කිසිදු සංශෝධනයකින් තොරව විදුලිබල මණ්ඩල පනත පාර්ලිමේන්තුවේදී සම්මත වී අවසන්ය. ඉතිහාසයේ පළමු වතාවට විදුලි ඉංජිනේරු ත්‍රස්තවාදය පරාජයට පත්ව දූන් සිටින්නේ වර්ජන තහනම් කෙරුණු අධිකරණ නියෝගයක්ද පැවතීම හේතුවෙන් කුඤ්ඤය ගැලවූ වඳුරාගේ තැනට ඇද වැටීය.

තත්ත්වය එසේ තිබියදී මේ මොහොතේ සම්මත වූ විදුලිබල මණ්ඩල පනත සම්බන්ධයෙන් කියැවෙන කතාද බොහොමයක් ඇත. ඒ සම්බන්ධයෙන් එක් තැනකදී හිටපු බලශක්ති ඇමැති උදය ගම්මන්පිල සඳහන් කර තිබුණේ එකී පනත සම්මත වීම යනු නංගි පෙන්වා අක්කා දීමක් වැනි යැයි කියාය. මේ හමුවේ ඇමැතිවරයා දෙස බලා අපට නම් කියන්නට ඇත්තේ විදුලිබල මණ්ඩලය තුළ පැවති ත්‍රස්තවාදයේ තරම අනුව නංගි පෙන්වා අක්කා නොව ආච්චිව දුන්නත් කමක් නැතැයි කියාය. මන්ද සිදු වෙමින් තිබුණු විනාශය සහ විදුලි ඉංජිනේරු ත්‍රස්තවාදය හමුවේ මේ රටේ සමස්ත ජනතාව සිදුවූ විනාශය නංගි පෙන්වා අක්කා දෙනවට වඩා අතිශය දරුණුය. පුනර්ජනනීය බලශක්තිය අද මේ රටට අත්‍යවශ්‍යය. අපේ විදුලි ඉල්ලුම අනුව ගැටලුවකින් තොරව ඉදිරියට යෑමට නම් එකී ව්‍යාපෘති නියත වශයෙන්ම ක්‍රියාත්මක විය යුතුව ඇත. විදුලි ඉංජිනේරු ත්‍රස්තවාදය පනතක් මුලට ගෙන හැමදාමත් වැට බැන්දේ එකී වැඩපිළිවෙළටය.

ඔවුන් එසේ කළේ කුමක් නිසාද? විදුලි අර්බුදයක් මතු වෙද්දී විදුලිබල මණ්ඩලයට හැමදාමත් සිදුවූයේ හදිසි විදුලිය මිලදී ගැනීම් වෙනුවෙන් පෞද්ගලික ඩීසල් බලාගාර වෙත යොමුවන්නටය.

මෙකී පෞද්ගලික ඩීසල් බලාගාරවල හිමිකරුවන් හෝ කොටස් හිමියන් වී සිටියෝ කවරහුද? පැන්ෂන් ගිය සහ අදටත් මණ්ඩලය තුළ සිටින ඇතැම් විදුලි ඉංජිනේරු ත්‍රස්තවාදීහුය. ඔවුන් පුනර්ජනනීය බලශක්තියට එරෙහිව සටන් කළේ රට වෙනුවෙන් නොව එකී පෞද්ගලික ඩීසල් බලාගාර නමැති තම වස්තුව රැකගෙන රට සූරා කෑම පිණිසය.

එනිසා මුලින්ම පවතින ප්‍රශ්නයට විසඳුමක් සොයාගෙන ඉදිරියට එන ගැටලුවට ඒ මොහොතේදී විසඳුමක් සෙවීම වඩාත් උචිත නොවන්නේද?

පාර්ලිමේන්තුවේදී සම්මත වූ මේ පනත සම්බන්ධයෙන් අදහස් දක්වන විදුලිබල මණ්ඩලයේ ඉංජිනේරු සංගමය අද කියන්නේ අදාළ පනත මඟින් තරග කාරී මිලට විදුලිය මිලදී ගැනීම අහෝසි කර තමන් කැමැති පුද්ගලයාට ලබාදී කැමැති ගණනකට විදුලිය මිලදී ගැනීමට ගන්නා උත්සාහයක් මේ තුළ පවතින බවකි. තරගකාරී මිල ගණන් යටතේ අඩුමිලට විදුලිය ලබාගෙන අඩුමිලට ජනතාවට ලබා දීමට මෙතෙක් කටයුතු කෙරුණු බවක්ද සංගමය පවසයි. ඉංජිනේරු සංගමය මෙසේ සඳහන් කරද්දී අපට මතුවන ගැටලුවක් ඇත. එය වනනේ ඔවුන් මෙතෙක් කලක් අඩු මිලට විදුලිය මිලට ගෙන අඩුවට දුන්නේ කාටදැයි යන්නය. ඇතැම්විට ඉන්දියාවට හෝ වෙනත් රටකට ඔවුන් එසේ අඩු මිලට විදුලිය දුන්නා විය හැකිය. මන්ද එසේ කර හෝ කීයක් හරි සාක්කුවට දාගත හැකි නම් විදුලිබල මණ්ඩලය පරම්පරා ගණනකට සරිලන සේ සූරා කෑ මේ පුත්තු එය කරන්නට කිසිසේත්ම පසුබට වනනේද නැත. මේ රටේ ජනතාවට නම් ඔවුන් කියන පරිදි අඩු මිලට ලැබුණු විදුලියක් නැත. හැමදාමත් රටේ ජනතාවගේ හිස මතට මාසිකව පහත් වූ දැවැන්ත බරක් වූයේ විදුලි බිලය. එය ගෙවා ගන්නට නොහැකිව ප්‍රමාද වී විදුලිය කපා දමන්නට මණ්ඩලය එද්දී පොලියට ගෙන විදුලි බිල ගෙවූ මිනිස්සු මේ රටේ අනන්තවත් ජීවත් වන්නාහ.

එසේම සියයට තුන්සියයකින් විදුලි බිල වැඩි කළ යුතු යැයි කංචන විජේසේකර ඇමැතිවරයාට ඉකුත් දිනවල යෝජනා කරනු ලැබුවේ මෙසේ රටට අඩුවට විදුලිය දුන්නේ යැයි කියන අයියලාමය. රටේ වාසනාවට ඒ ඉල්ලීම තවමත් කැබිනෙට්ටුවට ඉදිරිපත් නොකොට

Estimated salary scales of Engineers (Monthly salary)

| Engineer Salary Scale | Ininital Salary | Maximum salary | Alowances | vehicle | fuel | Total salary and benefits | Numbers | Estimated Total |
|---|---|---|---|---|---|---|---|---|
| E special | 327,485.00 | 533,895.00 | 266,947.50 | 250,000.00 | 75,000.00 | 919,432.50 | 10.00 | 9,194,325.00 |
| E1 | 262,285.00 | 363,910.00 | 181,955.00 | 175,000.00 | 75,000.00 | 694,240.00 | 100.00 | 69,424,000.00 |
| E2 | 218,565.00 | 284,140.00 | 109,282.50 | 150,000.00 | 75,000.00 | 552,847.50 | 150.00 | 82,927,125.00 |
| E3 | 185,785.00 | 237,185.00 | 92,892.50 | 125,000.00 | 75,000.00 | 478,677.50 | 400.00 | 191,471,000.00 |
| E4 | 153,000.00 | 194,725.00 | 76,500.00 | 100,000.00 | 75,000.00 | 404,500.00 | 500.00 | 202,250,000.00 |
| | | | | | | | 1,160.00 | 555,266,450.00 |

| | | |
|---|---|---|
| Total CEB salary bill (All Employees) | 3,000.00 | million per month |
| Engineers salary bill (20% of the total bill) | 600.00 | million per month |

විදුලි ඉංජිනේරුවරුන්ගේ වැටුප් පරිමාවන්

විදුලිබල ඇමැතිවරයා ලෙස කංචන විජේසේකර මහතා එකී සංශෝධන පනත පළමුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවේ ඉකුත් මැයි මස 17 වැනිදාය. එතැන් සිට එයට එරෙහිව මතුවූ හඬ ඉතා ප්‍රබල එකක්ම විය.

කෙසේ වෙතත් එකී පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසු ඒ පිළිබඳ විවාදය සහ අවසන් ඡන්ද විමසීම සිදු කෙරුණේ ඉකුත් නවය වැනිදාය. ඊට පෙරදින එනම් 08 වැනිදා පාර්ලිමේන්තුව ඇමතු කංචන විජේසේකර මහතා දැඩිව සඳහන් කරනු ලැබුවේ කෙසේ හෝ විදුලබල මණ්ඩල පනත රට ඉදිරියට රැගෙන එන බවය.

කංචන විජේසේකර ඇමැතිවරයා එසේ පවසද්දී භූමිතෙල් සහ ගැරඬි න්‍යායෙන් රඟන්නට වූයේ කවුරුන්ද? සියල්ලන්ට වඩා ඇමැතිවරයාට එහිදී ප්‍රතිචාර දක්වන්නට වූයේ විදුලි ඉංජිනේරු ත්‍රස්තවාදීන්ය. වහා මාධ්‍ය හමුවක් කැඳවූ ඔවුහු විදුලිබල මණ්ඩල පනතට එරෙහිව 08 වැනිදා මධ්‍යම රාත්‍රියේ සිට වැඩවර්ජනයක් අරඹන බව පවසමින් රජයට අභියෝග කළහ.

තමන් වැඩවර්ජනය කිරීමෙන් පසු 09 වැනිදා පෙරවරුවේ සිට මුළු රටේම විදුලිය බිඳ වැටෙනු ඇතැයිද ත්‍රස්තවාදීහු පැවසූහ. සිය වැඩවර්ජනයට අදාළ ඉල්ලීම් කිහිපයක්ද එහිදී ඔවුන් ඉදිරිපත් කර තිබිණි. එකී ඉල්ලීම් වූයේ මොනවාද?

තරගකාරී ලංසු ක්‍රමයකින් තොරව දේශීය අයෝජකයන්ට අවස්ථාවක් නොදී සුළං සහ සූර්ය විදුලි උත්පාදනය අදානි සමූහයට පැවරීම අත්හිටුවීම, තරගකාරී ලංසු ක්‍රමය අහෝසි කරමින් දූෂණයට මඟ පෑදීම නතර කිරීම, ලංවිම පුද්ගලීකරණය වෙත ඇද නොදැමීම සහ ලංවිම සභාපතිවරයා ඉවත් කිරීම ඔවුන්ගේ ඉල්ලීම් විය.

කටයුතු කළේය. මෙහිදී ඇමැතිවරයාට කිවයුතුව ඇත්තේ හෙළිකිරීමෙන් පමණක් නොනැවතී එසේ කඩාකප්පල්කාරී ලෙස ක්‍රියාකළ වුන්ට වහා නීතිය ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නැයි යන්නය.

මේ කඩාකප්පල් වැඩ සියල්ල සිදුවූයේ විදුලිබල මණ්ඩලයේ ඉංජිනේරු සංගමය වැඩවර්ජනය අත්හිටුවූවේ යැයි රටට කියද්දීය. මේ අන්දමට රටේ විදුලිය උත්පාදනයට ඇති ජලාශවල ජලය හිස් කරමින් විදුලි ඉංජිනේරු ත්‍රස්තවාදීහු සමස්ත ශ්‍රී ලාංකික රට වැසියන්ගෙන් පලි ගනිද්දී ඒවා දනගත් ඇතැමුන් මුහුණු පොතේ අපූරු සටහන් රැසක් තැබීමටද පියවර ගෙන තිබිණි. එහිදී ඇතැම්හු සමහර විදුලි ඉංජිනේරුවන්ගේ ඡායාරූප පවා යොදාගෙන ඔවුන්ගේ දුරකථන අංකද සමඟ ලක්ෂ ගණනින් ලබා ගන්නා වැටුප සඳහන් කරමින් විරෝධය පළ කරන්නට වූහ. මේ අතර මුහුණු පොතේ සටහනක තවත් අයකු විදුලි ඉංජිනේරු ත්‍රස්තවාදයට විරෝධය පළ කර තිබුණේ වවුලන් ලෙස විදුලි රැහැන්වල පැටලී අඟුරු වී මියැදෙන්නේ විදුලි ඉංජිනේරුවන් බව සඳහන් කරමිනි.

අත්හිටුවූ වර්ජනයක් තුළ රටේ ජලාශ සිඳී යද්දී ජනතා කෝපය ඇවිළී තිබුණේ එසේය. ඒ අනුව බලන කල විදුලි ඉංජිනේරුවන් යැයි කියා ගන්නා සියල්ලන් ලැජ්ජා විය යුතුය. නිදහස් අධ්‍යාපනයෙන් උගෙන එතරම් ජනතා උදහසකට සහ උපහාසයට ලක්වන තැනට කටයුතු සිදුවීම මොනතරම් නින්දාවක්ද?

එහෙත් මේසා කාලයක් විදුලිබල මණ්ඩලය තුළ සිටිමින් රටත් ජනතාවත් සූරා කෑ මොවුන්ට ලැජ්ජාවක් තිබේදැයි යන්න නම් සැක සහිතය. කෙසේ වෙතත් මොකා මොන දේ සිදු කළද විදුලිබල ඇමැතිවරයා ලෙස කංචන විජේසේකර මහතා සිය ඉලක්කයට ගමන් කරද්දී මේ සාක්කුවේ දමාගෙන සිටින්නට කංචන විජේසේකර ඇමැතිවරයා පියවර ගෙන ඇත.

විදුලි බිල වැඩි කිරීම පසෙක තබා උත්පාදන වියදම අවම කරනු පිණිස ඇමැතිවරයා ගමන් කළේ පුනර්ජනනීය බලශක්තිය වෙතට රට අරන් යෑමේ මාවතේය. එය දකින ඉංජිනේරු ත්‍රස්තයන් තවත් ආකාරයකට ඩොලර් ගණනක සඳහනක්ද කරමින් කියන්නේ මන්නාරමේ සුළං බලාගාර ඉන්දියාවේ අදානිට දෙන්න යන්නේ යැයි කියාය.

ඉංජිනේරු ත්‍රස්තවාදය විදුලිබල මණ්ඩලයට අත්කරන ලද ඉරණම දෙස බැලීමේදී අපට නම් මෙහිදී පැහැදිලිවම කියන්නට ඇත්තේ මන්නාරමේ සුළං ඉන්දියාවේ අදානිට නොව මොකාට දුන්නත් ගැටලුවක් නැතැයි කියාය.

වසර ගණනාවක සිට විදුලිබල මණ්ඩලය සිය ග්‍රහණයට ගනිමින් විදුලි ඉංජිනේරු ත්‍රස්තවාදය රටත් ජනතාවත් හිරි වට්ටවමින් ඇති කරන ලද පීඩනය තරම් අවැඩක් ආණ්ඩුව එසේ කිරීම තුළින් ඇති නොවනු ඇතැයි අද මේ රටේ මිනිසුන්ගේ සිතුවිල්ල වී අවසන්ය.

විදුලි ඉංජිනේරු ත්‍රස්තවාදියනි, නුඹලා විදුලිබල මණ්ඩලයට සහ රටටත් ජනතාවටත් අත්කර දුන් විනාශය ඒ තරමටම අප්‍රසන්නය, පිළිකුල්ය, නින්දිතය, මුග්ධය. අතිශය කාලකණ්ණිය.

ඒ තත්ත්වය තුළ නුඹලාට ශාප වේවා කියනු හැර මේ රටත් ජනතාවත් වෙනුවෙන් වෙන කියන්නට දෙයක් අපට නැත. යම් ආකාරයකට අනාගතයේදී ගැටලුවක් නිර්මාණය වුවහොත් එයටද ඍජුවම වගකිව යුත්තේ මෙතුවක් කල් විදුලිබල මණ්ඩලය සූරා කෑ නුඹලාමය.

● සමන් ගමගේ

---



සමගි ජන බලවේගය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට තේරී පත්වූ පාඨලී චම්පික රණවක මහතා විපක්ෂයේ ස්වාධීන මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කරන බව පසුගිය දා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයට පත් කළේය. එවැනි තීරණයක් ගැනීමට හේතු කවරෙක් ද යන්න ඇතුළු කරුණු කාරණා කිහිපයක් පිළිබඳව විමසීම සඳහා දිවයින ඉරිදා සංග්‍රහය ඒ මහතාව සම්මුඛ සාකච්ඡාවක් සඳහා සම්බන්ධ කර ගත්තෙමු. පහතින් පෙළ ගැසෙන්නේ 43 වන සේනාංකයේ නායක පාර්ලිමේන්තු මන්ත්‍රී පාඨලී චම්පික රණවක මහතා සමග සිදු කළ එම සාකච්ඡාවයි.

# ආණ්ඩුව සර්වපාක්ෂික නෑ! විපක්ෂයත් හරි පාරක යන්නේ නෑ!

## පාර්ලිමේන්තු මන්ත්‍රී පාඨලී චම්පික රණවක

**ප්‍රශ්නය - ඔබ බලාපොරොත්තු වූ දේශපාලන වෙනස සමගි ජන බලවේගය තුළින් සිදු වුණේ නැද්ද.?**

**පිළිතුර** - අපට එහෙම එකක් දකින්න ලැබුණේ නැහැ. ඒ ගැන විවේචනයක් අපට තිබෙනවා.

**ප්‍රශ්නය - එම විවේචනය තිබෙන්නේ එහි නායක සජිත් ප්‍රේමදාස මහතා සමගද? එසේ නොමැති නම් මුළු පක්ෂය සමග ද?**

**පිළිතුර** - අපගේ විවේචනය කුමක්ද යන්න අප සජිත් ප්‍රේමදාස මහතාට සහ පක්ෂයට ඉදිරිපත් කර තිබෙනවා. එය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීම අනවශ්‍යයි. ඔවුන් අප මිත්‍ර පක්ෂයක්.

**ප්‍රශ්නය - ඔබතුමා විපක්ෂයේ ස්වාධීන මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කිරීමට තීරණය කරන්නේ ආණ්ඩුවේ අමාත්‍ය ධුරයක් ලබා ගැනීමට යැයි චෝදනා එල්ල වෙනවා.**

**පිළිතුර** - මතක තියාගන්න අපි පදවි තානාන්තර වලට අපේ ප්‍රතිපත්ති පාවා දෙන අය නෙමෙයි. අපි පදවි තානාන්තර අත ඇරලා රාජපක්ෂලා පරාජය කර හිර ගෙවල්වල ලැගපු අය. ඔය චෝදනා කරන කිසිවෙක් එහෙම දේවල් කරලා නැහැ. අපි තීරණ ගන්න බය මිනිස්සු නෙවෙයි. අපි කිසිසේත් මේ රජයට එකතුවෙන්නේ නැහැ. නමුත් මෙම ආණ්ඩුවට අප ගල් ගහන්නේ නැහැ. අගමැති රනිල් වික්‍රමසිංහ මහතා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ඉදිරියට යන්න මාර්ග සිතියමක් ඉදිරිපත් කර තිබෙනවා. ඉදිරි මාස හයක කාලයක් සඳහා රට ගෙනයන්න ඩොලර් බිලියන හයක් සහ රුපියල් ට්‍රිලියනයක් අවශ්‍ය බව ඔහු සඳහන් කර තිබෙනවා. රුපියල් ට්‍රිලියනය මුද්‍රණය කර ලබාගත හැකියි. නමුත් ඩොලර් බිලියන හය ලබාගන්න වෙන්නේ මිත්‍ර රටවල් සමග සාකච්ඡා කරලා. ඊට අපේ මිත්‍ර රටවලුත් ඇතුළත්. අපි ඔය කතා කරන ජපානයත් ඊට අයත්. අපි ණය බලාපොරොත්තුවන ඉන්දියාව, චීනයත් ඒකට අයත්. ඔවුන්ට සහ අන්තර් ජාතික මූල්‍ය වෙළෙඳපොළට අයත් ඩොලර් බිලියන 26ක ණය අපි ගෙවන්නෙ නෑ කියල අපි අප්‍රේල් 12දා ප්‍රකාශ කළා. එසේ තිබියදී ඒ අය අපට උදව් කරන්නෙ කොහොමද.

මතක තියාගන්න අපි පදවි තානාන්තර වලට අපේ ප්‍රතිපත්ති පාවා දෙන අය නෙමෙයි. අපි පදවි තානාන්තර අත ඇරලා රාජපක්ෂලා පරාජය කර හිර ගෙවල්වල ලැගපු අය. ඔය චෝදනා කරන කිසිවෙක් එහෙම දේවල් කරලා නැහැ. අපි තීරණ ගන්න බය මිනිස්සු නෙවෙයි. අපි කිසිසේත් මේ රජයට එකතුවෙන්නේ නැහැ. නමුත් මෙම ආණ්ඩුවට අප ගල් ගහන්නේ නැහැ. අගමැති රනිල් වික්‍රමසිංහ මහතා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ඉදිරියට යන්න මාර්ග සිතියමක් ඉදිරිපත් කර තිබෙනවා.

සමහරු උදව් දෙන්න ඉන්නවා නම් අපේ දේශපාලන ස්වෛරීත්වය විනාශ කරන්න ඒ උදව්ව අපට පිළිගන්න අමාරුයි. ඒ නිසා මම හිතනවා මේ අවස්ථාවෙදි විකල්ප මාර්ගයක් තෝරගන්න ඕන. අපි විසින්ම අපේ ඩොලර් ඉපයීම ධනාත්මක එකක් කරගන්න ඕන.

රුපියල් ඉපයීම ධනාත්මක එකක් කරගන්න ඕන. ඒ වගේම දැනට අයාලේ යන ආර්ථිකය සෘණ වෙනව. දැනට වාර්තාගත වන විදිහට මේ වසරේ ආර්ථික වර්ධන වේගය සෘණ 7යි. මේ විදිහට සෘණ වන ආර්ථිකය ඇතුළෙ අපි ඒක සැලසුම්සහගත විදිහට අත්‍යවශ්‍ය දේවල් තබාගනිමින් ඒ කටයුත්ත කරන්න ඕන. උදාහරණයක් හැටියට මේ රටට අත්‍යවශ්‍යයෙන්ම ඩොලර් උපයන කර්මාන්ත ශාලාවකට ඩීසල් නැත්නම්, දේශපාලන හයිය තියෙන දේශපාලනඥයන්ගෙ හෝටල්වලට ඩීසල් ගස්සනව නම් ඒක වැරදියි. අප ආණ්ඩුවට එක් නොවන්නේ ප්‍රතිපත්තිමය ප්‍රශ්නයක් නිසා.

**ප්‍රශ්නය - එම ප්‍රතිපත්තිමය ගැටලුව කුමක්ද ?**

**පිළිතුර** - මෙම ආණ්ඩුව සර්ව පාක්ෂික ආණ්ඩුවක් නෙවෙයි. පාර්ලිමේන්තුවේ විපක්ෂය වන සමගි ජන බලවේගය, ආණ්ඩුවෙන් කැඩී වෙන්ව ගිය ස්වාධීන කණ්ඩායම්, ජනතා විමුක්ති පෙරමුණ, දෙමළ ජාතික සංධානය ඇතුළු පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු පක්ෂ සමග පොදු ප්‍රතිපත්තියක් පිළිබඳ එකඟතාවකට පැමිණිය යුතුයි. ඒ වගේම පාර්ලිමේන්තු කටයුතු ඉදිරියට ගෙන යෑමට නායකත්ව මණ්ඩලයක් පත්කළ යුතුව තිබුණා. එසේම ප්‍රජාතන්ත්‍රවාදී හා ආර්ථික ක්‍රියාමාර්ග පිළිබඳ කාලවකවානු සහිත න්‍යාය පත්‍රයක් සකස් කළ යුතුව තිබුණා. අර දින සීයේ වැඩසටහන වගේ. එසේම බැසිල් රාජපක්ෂ, මහින්ද රාජපක්ෂගේ හිතවතුන්, අතිශය දූෂිත නිලධාරීන් වෙනුවට, වෘත්තීය මට්ටමේ නිලධාරී පිරිසක් ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුළු රාජ්‍ය ආයතනවලට පත් කොට, ඔවුනට යම් ඉලක්කගත වැඩපිළිවෙළක් ලබා දිය යුතුව තිබුණා. කිසිවක් සිදු වෙලා නැහැ. අපට තවම පෙනෙන්න තිබෙන්නේ සැලුන් දොර ඇරුනා වගේ තත්ත්වයක්. පොදුජන පෙරමුණ කතා පවත්වන්නෙ රනිල් වික්‍රමසිංහ මහත්මයාටත් කුලියට මන්ත්‍රී දුන්නා වගේ තත්ත්වයක සිට. ඔහු ආවේ ඩොලර් හොයන්න. ඩොලර් හොයන්න බැරිනම් යන්න වගේ කතා තමයි දැන් කියන්නේ. විසිඑක් වන ව්‍යවස්ථා සංශෝධනය ගෙන එන දින පිළිබඳව හෝ තවම එකඟතාවක් නැහැ.

**ප්‍රශ්නය - ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය නොලැබුණහොත් කුමක්ද වෙන්නේ යන්න ප්‍රශ්නයක්. ඒ සඳහා ඇති වැඩපිළිවෙළ කුමක්ද?**

**පිළිතුර** - අපි පුළුල් සාකච්ඡා මණ්ඩපයක් ඇති කර වෘත්තීය මට්ටමේ පිරිස් එකතු කර ගනිමින් ඒ සඳහා විසඳුම් සෙවීමට අප උත්සාහ ගන්නවා. ශ්‍රී ලංකාවේ ආර්ථික පදනම ශක්තිමත් කරගැනීමට, දේශීය වශයෙන් ආර්ථික බලයක් නැවත ගොඩනඟා ගැනීමට හැම ක්ෂේත්‍රයක්ම ගොඩනගා ගැනීමට මේ අර්බුදය අපි අවස්ථාවක් කරගත යුතුයි. ඒ මතයේ ඉඳගෙන ඒ හා සමානව හිතන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් වගේම පිටතින් ඉන්න අරගලයට සම්බන්ධ වී ඉන්න පිරිස්, වෘත්තීයවේදීන් සමග සංවාදයක් ගොඩනගා ගනිමින් රටෙන් පලා නොගොස් මේ රට ගොඩනගා ගැනීම සඳහා කැප වෙන්න කැමති සෑම කෙනෙක් එක්කම පුළුල් වේදිකාවක් තනා ගැනීම තමයි අපි අරමුණු කරගෙන තියෙන්නේ. ඒක පටු අරමුණක් නෙවෙයි. සමගි ජන බලවේගය අපි මිතුරු බලවේගයක් කොටයි සලකන්නේ. එහි අනාගත පියවර මත, අපේ අනාගතය තීරණය වෙනවා. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ඉන්න රාජපක්ෂ විරෝධී අවංක පිරිස් සියල්ලටම අපි ආරාධනා කරනවා. දැන් ඇති ඔය බලවේගෙන් අත් මිදිලා මේ රට නව මාවතකට ගෙනියන්න අපි එකට අත්වැල් බැඳගමු. අපි එක ගමනක් යමු. පවුල්වාදයටත්, පාදඩ වාදයටත් එරෙහිව අපේ මව්බිම ගලවා ගැනීම සඳහා මෙහෙයුමක් කරන්න අවශයි.

**ප්‍රශ්නය - බැසිල් රාජපක්ෂ මහතා මහතා මන්ත්‍රී ධුරයෙන් ඉවත් වුණා. ඒ වෙනුවට ප්‍රකට ව්‍යාපාරික ධම්මික පෙරේරා පාර්ලිමේන්තුවට එන බව සඳහන් වෙනවා. ඒ පිළිබඳ ඔබගේ අදහස කුමක්ද ?**

**පිළිතුර** - ධම්මික පෙරේරා මහත්මයත් ආණ්ඩුවේ වගකීම් දැරුවා. ආයෝජන මණ්ඩලයේ සභාපති හැටියට කටයුතු කළා. ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම් හැටියට කටයුතු කළා. ඔහුත් විටින් විට නොයෙක් දේවල් ඉදිරිපත් කරලා තියෙනවා. රට ගොඩනැගීමේ වැඩපිළිවෙළට. ඉතින් ඔහු මොකක්ද කරන්නේ කියලා අපි බලමු. මම හිතන්නෑ ඔහුගේ පුද්ගලික ධනයට හෝ ඔහුගේ පුද්ගලික හැකියාවට මේ බංකොලොත් රට ගොඩනගා ගැනීමට තියෙන වැඩසටහනට ඔහුට හැකිවෙයි කියලා දායකත්වයක් ලබා දෙන්න. හැබැයි ඒක ඔහුගේ පුද්ගලික තීරණයක්. ඔහුව දැන්ම විවේචනය කරන්න අපි ඉදිරිපත් විය යුතු නෑ.

බැසිල් රාජපක්ෂ මහත්තයා තවත් රඟපෑමක්ද දන්නෑ කරන්නේ. මේ අවස්ථාවේ ඇතිවෙලා තියෙන ප්‍රශ්නෙන් ගැලවෙන්න. බැසිල් මහත්තයා විතරක් නෙමෙයි, මහින්ද රාජපක්ෂ, නාමල් රාජපක්ෂ, චමල් රාජපක්ෂ, ශෂේන්ද්‍ර රාජපක්ෂ, නිපුණ රණවක, මේ සියලු දෙනා පාර්ලිමේන්තුවෙන් ඉවත් වෙලා දේශපාලනයෙන් ඉවත් වීම තමයි ලංකාවේ මේ මොහොතේ මේ පවතින තත්ත්වයට තියෙන යුක්ති සහගත විසඳුම්. මොකද යුක්ති සහගත විසඳුම කියන්නේ මේ පවුල තමයි මේ රට මෙතෙන්ට වැට්ටුවේ. අපේ දරුවොත් අපිවත් 1960 ට අරන් ගියේ. නැවත වතාවක් අපේ මිනිස්සුන්ට පයින් යන්න, බයිසිකලෙන් යන්න, හරක්ගෙන් කුඹුරු හාන්න, වෙලෙන් වතුර ටික බීලා, ඇළෙන් නාන්න සකස් කළේ. විදුලිය නැති රටක් හැදුවේ මේ පවුල. මේ පවුල තමන්ගේ ධනය උපයාගෙන තියෙනවා 2300 දක්වා. ඒ නිසා යුක්ති සහගත විසඳුම තමයි මොවුන් ඉවත් වීම. ඉතින් ඔහු සද්භාවයෙන් ඉවත් වෙලා, ඔහුගේ මව් රටට යනවා නම්, රටට ලොකු උදව්වක්.

**ප්‍රශ්නය - මේ වෙද්දි රටේ බරපතළ ආර්ථික අර්බුදයක් තියෙනව. මිනිස්සුන්ට කන්න බොන්න නෑ, විදුලි නෑ, ගෑස් නෑ.. කොයි අතකින්වත් සහනයක් නෑ. මේකට ආණ්ඩුවට දෙන්න පුළුවන් විසඳුමක් තියෙනවද ඔබ දකින විදිහට.**

**පිළිතුර** - කවුරු හරි කියනව අපි ආවම ඩොලර් වැහි වහිනව, අපි ආවම මිත්‍ර රටවල් උදව් කරනව කියන පුරාජේරු කතා අපට ඇහෙනව. මේවා පට්ටපල් බොරු. අපි කරන්න ඕන දැනට අපි විඳින මේ ආර්ථික පීඩාව කිසියම් ආකාරයකට අඩුවන ආකාරයකට අවම කරගැනීමට කටයුතු කිරීම. ප්‍රමුඛතාව හඳුනාගන්න ඕන. උදාහරණයක් විදිහට ඩීසල්වලට අපි ප්‍රමුඛතාව දෙන්න ඕන. ඩීසල්වල මිල පෙට්‍රල් මිලට වඩා රුපියල් 150 කින් අඩුකරන්න ඕන. බස් එකට දුම්රියට, පාසල් ප්‍රවාහන රථවලට, කාර්යාල ප්‍රවාහන වාහනවටල ඩීසල් ටික දෙන්න ඕන. ඊට පස්සෙ තමයි පුද්ගලික ප්‍රවාහනයට තෙල් දෙන්න ඕන.

**ප්‍රශ්නය - මේ වෙද්දි ගෝල්ෆේස් අරගලයට දින 50ක් ගතවෙලා තියෙනව. තාම අරගලකරුවන් කියන දේ ගැන පාර්ලිමේන්තුව සංවේදී නැහැ. ඇයි මේ එහෙම වෙන්නෙ?**

**පිළිතුර** - මෙහෙමයි... නායකයොනෙ මේ පාලනය කරන්නෙ. අද දේශපාලනය පක්ෂ නෑ. අද තියෙන්නෙ නායකයො විසින් හසුරුවන දේවල්. දේශපාලන පක්ෂයක් නම් යම් වැඩපිළිවෙළක්, ප්‍රතිපත්තියක් මත ගොඩනැගෙන්න ඕනනෙ. එහෙම යම් ප්‍රමාණයකට විතර තියෙන්නෙ මාක්ස්වාදී දේශපාලන පක්ෂ කීපයකට විතරයිනෙ. අනෙක් පක්ෂ නායකයො හසුරුවන දේවල්. නායකයො අත උස්සන්න කිව්වාම අත උස්සනව. 17ටත් අත උත්සනව, 18ටත් අත උත්සනව, 20ටත් අත උස්සනව, 21ටත් අත උස්සනව. මේක තමයි පාර්ලිමේන්තුවෙ ක්‍රමය. මේක අපි වෙනස් කරන්න ඕන. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විතරක් නෙමෙයි වෙනස් කරන්න ඕන, පක්ෂවල ව්‍යවස්ථාවක් වෙනස් කරන්න ඕන. එහෙම වෙනස් කරල ප්‍රජාතාන්ත්‍රික සම්ප්‍රදායයක් රටේ ඇතිකරන්න ඕන නායකයන් ඉවත් කරන්න.

**ප්‍රශ්නය - ඔබගේ ස්වාධීන වීම මහපොළොවෙන් හටගෙන තියෙන අරගලයට නායකත්වය දීම සඳහාද?**

**පිළිතුර** - නෑ... මම නායකත්වයක් බලාපොරොත්තු වෙන්නෙ නෑ. අලුත් නායකයන් බිහිවිය යුතුයි. තරුණ පෙළක් නැගිටලා තියෙනව. ඔවුන්ට මේ රටේ දේශපාලන නායකත්වය ලැබිය යුතුයි. ඒ සඳහා කරන්න ඕන කැපවීම කරන්න මම ලෑස්තියි.

සාකච්ඡා කළේ -
● සිරිමන්ත රත්නසේකර

දිවයින
ඉරිද සංග්‍රහය
2022 ජුනි මස 12 වැනිදා ඉරිදා

# අපට නොවැටහෙන කාරණය

මේ වෙලාවේ මේ ආණ්ඩුව මේ රටේ ජනතාවගෙන් කරන ප්‍රමුඛ ඉල්ලීම වූ කලී ගෙවතු වගාවය. සියලු ආහාර අනුභව කොට අවසානයේදී කුස්සියේ තිබෙන එළවළු දමන හිස් වට්ටියත් කුස්සියේ තවත් මුල්ලක තිබෙන හාල් දමන හිස් භාජනය සහ හිස් හුණ්ඩුවත් දුටු සැණින් ආණ්ඩුවට ගෙවතු වගාව සිහිවිය. ගෙවතු වගාව වූ කලී ඉතා හොඳ සංකල්පයකි. මේ ඉල්ලීම ආණ්ඩුව විසින් කළ යුතුව තිබුණේ මෙයට මාස තුනකට පමණ පෙරය. සාමාන්‍යයෙන් මිරිස් ගහක කරල් එන්නේ මාස තුනකට පසුය. වම්බටු, තක්කාලි ඇතුළු එළවළු වර්ග වැඩි හරියක් මාස තුනෙන් ඵල දරයි. මේ රටේ සියලු ආහාර මිල හත්අට ගුණයකින් වැඩිවී ආහාර පිළිබඳ උද්ධමනය 50% ද ඉක්මවා ගොස් තිබෙන මේ වෙලාවේදී ගෙවතු වගාව කරන්නට ගියොත් ඉදිරි තුන් මාසය බඩගින්නේ සිටීමට සිදුවන අතර එයට හේතු වන්නේ පෙරකී මාස තුනේ ඵල දරීමේ කාලසීමාවය. කෙසේ වුවද ගෙවතු වගාව යනු ඉතා වටිනා අදහසකි. සිංගප්පූරුව ඉතා කුඩා රටක් වන අතර ඒ රටේ හැම ෆ්ලැට් එකකම ජීවත්වන පවුල් ඔවුන්ගේ එදිනෙදා උදේ වේලට ගන්නා සැන්ඩ්විච් එකට අදාළ පිපිඤ්ඤා, තක්කාලි, සලාද කොළ යනාදිය ගෙදර වවති. මේ වගා සියල්ලම සම්පූර්ණයෙන් පස්වලින් තොර ජලය මත පදනම් වූ වගාවන්ය. සිංගප්පූරුවේ ගෙවල්වල වීදුරුවලින් කළ කුඩා ටැංකි තිබේ. ඒවාට වතුර පුරවා රසායනික පොහොර අඩි සාන්ද්‍රණයක් මිශ්‍ර කර ඇති අතර ටැංකිය මත ඇති කුඩා දැලක් මත තක්කාලි හෝ සලාද කොළ පැළ තබනු ලැබේ. ඊළඟ දවස් දෙකේදී මේ පැළවල මුල් දල අස්සෙන් කෙලින්ම ටැංකියේ ඇති රසායනික පොහොර මිශ්‍රණයට කඩා වදී. එතැන් සිට තවත් සති දෙකක් ගිය තැන තක්කාලි ගහෙන් ගෙඩිත්, සලාද ගහෙන් කොළත් කඩා උදේ කෑම වේලට යොදාගත හැකිය. සිංගප්පූරුව යනු ලෝකයේ වැඩිම රසායනික පොහොර ප්‍රමාණයක් පාවිච්චි කරන රටය. ඉතා පුදුමයකට මෙන් ඒ රටේ මිනිස්සුන්ට වකුගඩු අමාරුව නැත. දැන් අප සලකා බලිය යුත්තේ ලංකාවේ ජනතාවට මේ ආකාරයෙන් ගෙවතු වගාව කළ හැකිද යන්නයි. සාමාන්‍ය මිනිස්සුන්ට තබා අක්කර තිහ හතළිහ වගා කරන ගොවීන්ට පවා මේ මොහොතේ රසායනික පොහොර නැත. ආණ්ඩුව කියන්නේ ගොම සහ කොම්පෝස්ට් පොහොරවලින් ගෙවතු වගාව කළ හැකි බවයි. මේ රටේ දනට ඇති සහ ඉදිරියේදී ඇතිවීමට යන ආහාර ප්‍රශ්නයට පොහොර වශයෙන් ගොම සැපයිය හැකි සුවිශාල පශ්චාත් භාගයන් සහිත ගව ප්‍රජාවක් අපට නැත. ඒ නිසා ආණ්ඩුව ගෙවතු වගාව සම්බන්ධයෙන් කිසියම් සාම්ප්‍රදායික නොවන ඉක්මන් ක්‍රමවේදයක් අපට හඳුන්වා දිය යුතුය. ඒ ඉක්මන් ක්‍රමවේදය ඒරෝප්ලේන යානය නැවැත්වීම සඳහා වාරණ නියෝගය සහිතව කටුනායකට පිස්කල් දුව ගිය දිවිල්ල තරම් ඉක්මන් එකක් වුවහොත් ඉතා හොඳ ප්‍රතිඵල ලබාගත හැකිය.

මිනිසාට ඇති ප්‍රමුඛ ප්‍රශ්නය ඇඳුම් ප්‍රශ්නය හෝ වාසස්ථාන ප්‍රශ්නය හෝ සෙක්ස් ප්‍රශ්නය නොවේ. මිනිසාට ඇති ප්‍රමුඛ ප්‍රශ්නය වූ කලී ආහාර ප්‍රශ්නය වේ. ශිෂ්ටාචාරයේ මුල සිටම මිනිසා සෙව්වේ ආහාරය. ශිෂ්ටාචාරයට පෙරත් මිනිසා විසින් සොයන ලද්දේ ආහාරමය. මේ නිසා මිනිසාගේ ආහාර ප්‍රශ්නයට උත්තර නොබඳින හැම ආණ්ඩුවකටම කෙළ වේ. ඩඩ්ලි සේනානායකට ආණ්ඩු බලය නැති වුණේ හාල් මිල ඉහළ ගිය බැවිනි. සිරිමා බණ්ඩාරනායක මැතිනියගේ 1970-1977 ආණ්ඩුවට කෙළ වුණේ මිනිස්සුන්ට අවශ්‍ය ආහාර ලබාදීමට හැකි නොවූ බැවිනි. 70-77 කාලයේදී ශ්‍රී ලංකාව ආහාර වලින් ස්වයංපෝෂිත කිරීමට බණ්ඩාරනායක මැතිනියට අවශ්‍ය විය. මේ සඳහා වගා සංග්‍රාමය නමැති සමස්ත ලංකා මට්ටමේ වගා ව්‍යාපාරයක් ආරම්භ කළ ඇය කොස්, දෙල්, අල, බතල, මඤ්ඤොක්කා සඳහා ජනතාව පුරුදු කිරීමටත් සහල් පිටරටින් ගෙන්වීම සීමා කොට ඒ සඳහා වැයවන විදේශ විනිමය මෙරටම රඳවා ගැනීමටත් කටයුතු කළාය. ඇගේ කාලයේදී පාන් හිඟ විය. ශ්‍රී ලංකාව එකල ගැමි රාජ්‍යයක්ව තිබූ නමුදු මිනිස්සු පාන් කෑමට හෝල්සේල් පුරුදුවී සිටියහ. මේ නිසා තිරිඟු පිටි මිලදී ගැනීම සඳහා විශාල වශයෙන් විදේශ විනිමය පිටරට ඇදී ගියේය. බණ්ඩාරනායක මැතිනිය මේ රට ස්වයංපෝෂිත කිරීමට පටන් ගත්තේ ඉතා සද්භාවයෙනි. එහෙත් ජීවත් වීමට ආහාර ගන්නා නොව, ආහාර ගැනීමට ජීවත් වන මේ රටේ ජනතාව ඇගේ ක්‍රියා කලාපය ඉවසුවේ නැත. මේ නිසා ඊළඟ ඡන්දයේදී මැතිනියට කෙළවීමට ජනතාව වගබලා ගත්හ. වගා සංග්‍රාමය පැවති කාලයේදී මැතිනියගේ ආණ්ඩුවට මිනිසුන් ශාප කරන අයුරු ඉතා ප්‍රවේශමෙන් නිරීක්ෂණය කළ කෙනෙක් විය. ඒ වූ කලී ජේ. ආර්. ජයවර්ධනය. මැතිනියට සිදුවූ වැරදි මගහැරීමට කල්පනා කළ ඔහු ඕනෑම දෙයක් පිටරටින් ගෙන්වා කෑම පිණිස අවශ්‍ය විදේශ විනිමය නිකුත් කරන විවෘත ආර්ථිකයක් රටට හඳුන්වා දුන්නේය. ඒ අනුව මේ රටේ මිනිස්සු අන්තිමේදී එළවළුත්, බිත්තරත් පිටරටින් ගෙන්වන තැනකට පත්වූහ. සියලු වගා ඉඩම්වලින් වැඩි හරියක් බ්ලොකවුට් කර ගෙවල් සෑදීම සඳහා ඉඩම් වෙන්දේසිකාරයන්ට විකුණන ලදී. කැලෑ ඉඩම්වලින් සෑහෙන කොටසක් ලී කපා ගැනීමට බදුදෙන ලදි. අන්තිමේදී ප්‍රමාණවත් කැලෑ නොමැති නිසා මේ රටේ වර්ෂාපතනයට ලොකු හානියක් සිදුවිය. කැලෑ තිබෙන විට සංවහන වර්ෂා හට ගනී. ඒවා අවුරුද්දේ දවස් තුන්සිය හැටපහ තුළම තිබේ. මෝසම් වැසි හට ගන්නේ අවුරුද්දට දෙපාරකි. එබැවින් දැන් අපට සිදුවී තිබෙන්නේ මෝසං වැසි මත විශ්වාසය තබමින් කන්න දෙකක් සහ අතුරු කන්නයක් වගා කරමින් පනම් අටක් සොයා ගැනීමය.

ආණ්ඩුව නිසි ක්‍රමවේදයක් හඳුන්වා දී ගෙවතු වගාව සහ මුඩු ඉඩම් වගා කිරීම ප්‍රවර්ධනය කළොත් එය විශාල පිංකමක් බවට පත් වන්නේය. එහෙත් රසායනික පොහොර නැතිව එය කරන්නේ කොහොමදැයි අපට නම් කිසිසේත්ම වැටහෙන්නේ නැත.

අංකඃ 223, බ්ලූමැන්ඩල් පාර, කොළඹ 13.
කර්තෘ මණ්ඩලය - 2448402, 2497500
ෆැක්ස් - 2344253, 2438750
වෙබ් අඩවිය - www.divaina.com
ඊමේල් - divaina@unl.upali.lk
divainapro@unl.upali.lk
www.facebook.com/divainanewspaper
දැන්වීම් අංශය - 2434190 (ප්‍රධාන කාර්යාලය)
ෆැක්ස් - 2344252, 2330024
බෙදාහැරීම් අංශය - 2497568, 2497519, 2497580
ෆැක්ස් - 2334564
කොටුව කාර්යාලය - 011 2334565

## හිට්වානය

කංචන විදුලි පනතේ ගැම්ම උඩ — අරී
අම්මෝ බැසිල් මන්ත්‍රී ධුරය — අතහරී
චම්පික ස්වාධීනව සිටියි හැරී — හැරී
මහජනතාව පෝලිම්වලය — 'වෙරි සොරී'

- අනුරාධ හිරිපිටියගේ



හූරා කමින් රට වැනසූ අයට — නිතින්
ජනතා විරෝධය නැඟ එයි හතර — අතින්
දහසක් කඳුළු ගිලිහී බිම වැටෙයි — නෙතින්
සාගතයකට දොර හැරියේ අපද — ඉතින්

එක පවුලකට දෙන්නට රජ — සැනසිල්ල
ගෙන ආ විසි එකයි ඇතිකළෙ — කැළඹිල්ල
දෙමුහුන් අයට නෑ රට ගැන — සැලකිල්ල
මෙහෙ නිදියතත් වෙන රටකයි — ගෙරවිල්ල

- ගාමිණී

# සාගතේ සමග ජීවිතේ!

ශ්‍රී ලංකාව මුහුණදී තිබෙන බරපතළ සමාජ ආර්ථික හා දේශපාලන අර්බුදවලට කිසියම් සහනයක් සැලසිය හැකි ශක්තියක් ආණ්ඩුවට තිබේද යන ප්‍රශ්නයට සාධනීය පිළිතුරක් ලබාදීමට මෙතෙක් ජනාධිපති ගෝඨාභයට හෝ අගමැති රනිල්ට නොහැකිවී තිබෙන බව රහසක් නොවේ. ජනාධිපතිවරයා සිය අගමැතිවරයාගෙන් ඉතා ක්ෂණිකව අපේක්ෂා කළේ රටේ උග්‍රවන ආර්ථික අර්බුදයට විසඳුමකි. වර්තමාන පාර්ලිමේන්තුවේ සිටින දේශපාලන වශයෙන් වඩාත් ම පරිණත පුද්ගලයා මෙන්ම ජාත්‍යන්තරය සමග සමීපව කටයුතු කළ හැකි දේශපාලන චරිතය ද රනිල් බවට බොහෝ දෙනෙක් විශ්වාසය පළ කරති. එහෙත් අගමැති රනිල්ට මෙතෙක් රටට හා ජනතාවට යාන්තමින් දැනෙන කිසිවක් කිරීමට ද නොහැකිවී තිබේ. එහෙත් ඒ යථාර්ථය වටහා ගැනීමට මෙන්ම හෙට රටේත් ජනතාවගේත් හෙට දවස යහපත් එකක් නොවන බව පෙන්වා දීමට ද ඔහුට හැකි විය.

බිලියන 695ක පරිපූර්ණ ඇස්තමේන්තුවක් අනුමත කරගත් අගමැති එහිදී රටේ ආර්ථික අර්බුදය එහි පසුබිම් තොරතුරු ද පාර්ලිමේන්තුව ඉදිරිපිට (08) විස්තර කළේය. එහෙත් ඒවායේ සංඛ්‍යා ලේඛන හා දත්ත හැරුණුවිට අනෙක් බොහෝ තොරතුරු අපට අලුත් දේවල් ද නොවේ. තව සති තුනකින් උදාවන දුෂ්කරතා පිළිබඳව ද අගමැති අනතුරු අඟවා තිබුණි. කුමක් වුවත් දැන් මාස දෙකකටත් අධික කාලයක් මුළුල්ලේ මේ රට මුහුණ දී සිටින සමාජ ආර්ථික අර්බුදවලින් ඉතා කුඩා සහනයක් හෝ ලබාදීමට අගමැති රනිල්ට හැකි නොවීම ද ඔහු කෙරෙහි අසීමිත බලාපොරොත්තු තැබූ අය දුර්මුඛ කරවන්නක් වී තිබේ.

මේ රට සමාජ - ආර්ථික - දේශපාලන වශයෙන් කඩා වැටුණු දේශපාලන ක්‍රියාකාරකම් පිළිබඳව හයවරක්ම අගමැතිවූ රනිල් ද වගකිව යුතුය. මේ රටේ බරපතළ ව්‍යසනයකට තුඩු දුන් 1978 ජයවර්ධන යුගය අතැඹුලක් සේ දන්නා රනිල්ට අද රටට අවශ්‍ය දේ නිවැරදිව තෝරාබේරා ගතහැකි බවට ද විවාදයක් නැත. ජනාධිපති ගෝඨාභය මෙන්ම ඔහුගේ ප්‍රබල විවේචකයන්වූ සමහරු ද අද ඔහු සමග කටයුතු කිරීමට සූදානම්ව සිටිති. ස.ජ.බ පාඨලී චම්පික ස්වාධීන වූයේ ද විපක්ෂයේ ඇතැම් ප්‍රතිචාර ඔහුට නොරිසි නිසා බව ඔහු පාර්ලිමේන්තුව අමතා කළ කෙටි පැහැදිලි කිරීමෙහි ගැබ්වූ බව අපට හැඟුණි. ජනාධිපති ගෝඨාභය පාලනයේ ලිහිල් හා දුහුල් තැන් අද ඔහු මෙන්ම පොහොට්ටු මන්ත්‍රීවරු ද පිළිගනිති. එහෙත් රට නන්නත්තාර කළ ඒ ව්‍යසනයට වගකිව යුතු සමහරු අදත් හිස් සඟවා ගෙන සිටිති. දේශපාලනය යනු අත්දැකීම්, සමාජ හා මානව සම්බන්ධතා ඇසුරෙන් ලබන පත්තරයකින් තියුණු නොවූ නායකයකුට සාර්ථක නොහැකි ක්ෂේත්‍රයක් බව අද අප දකින එක් සත්‍යයකි. තමන් අතින් ගිලිහී ගිය දෙයින් පාඩම් ඉගෙන යළි සාර්ථකත්වයට පත්විය යුතුය යන අදිටන ද ජනාධිපතිවරයා තුළ තිබේ. සිය ධුර කාලය හා ජනවරම අනුව ඉදිරි කාලයත් ගෙවීමට ඔහු තීරණය කර තිබේ. සිය සහෝදරයන් තිදෙනකු මෙන්ම ඥාති පුතුන් දෙදෙනකු ද ඇමතිධුරවලින් ඉවත් කළේ ද ඒ අදහසින්ම විය හැකිය. එහෙත් ඔහුගේ අගමැති මෙන්ම මුදල් ඇමතිවරයා පවසා ඇත්තේ මේ අර්බුදය අතිශය සංකීර්ණ අභියෝගයක් බවයි. අගමැති රනිල්ගේ අවධාරණය වන්නේ අලුතින් හිතන, අභිනව දේශපාලන සම්මුතියක් රටට අවශ්‍ය බවය. ඒ සඳහා කැපකිරීම්, අසීමිතව වැඩකිරීම් මෙන්ම සාමූහික ක්‍රියාදාමයක්ද වුවමනා බව ඔහු දක්වා තිබේ. මූල්‍ය පරිපාලනය අවිධිමත් වීමත්, සදොස් දේශපාලන ප්‍රතිපත්ති අනුව කටයුතු කිරීමත්, අපේ දිගු කාලීන මිත්‍ර රටවල් වන ඉන්දියාව හා චීනය ද අප කෙරෙහි නොපහන් සිතින් සිටින බව ද අපේ අර්බුදවලට හේතුවූ බව ඔහුගේ විශ්ලේෂණය තුළින් ප්‍රකාශ විය. එසේම අපට හිස කෙළින් තබාගෙන ක්‍රියාකළ හැක්කේ 2048 වන වසරේ එළැඹෙන නිදහසේ සියවස් වැනි දිගු කලකින් පසුව බව ද ඔහුගේ නිගමනයකි.

අගමැති රනිල්ගේ ඒ අනාගත වාක්‍ය තරමක උත්ප්‍රාසයද දනවන්නකි. ඔහු අපේක්ෂා කරන ආර්ථික සංවර්ධනය සහිත ශ්‍රී ලංකාව අපට දැකගත හැක්කේ 2048 දී නම් ඒ තවත් වසර 26කට පමණ පසුවය. ඒ වනවිට අද හැත්තෑ වසරක් ඉක්මවූ වැඩිහිටි ප්‍රජාවගෙන් කීදෙනෙක් ජීවත්වෙත් ද යන්නත් කිසිවකුට කිව නොහැක. කුමක් වුවත් වත්මන් අගමැතිවරයා වුවද ඒ වනවිට අනූවිය ඉක්මවූවෙකි. එතුමාට චිර ජීවනය පතමින් ඒ උත්කර්ෂවත් මොහොත දැකබලා ගැනීමට සියවන සියවස තෙක් ජීවත්වීමේ භාග්‍ය වැඩි දෙනෙකුට ලැබේවායි පතනු හැර වෙන දෙයක් අපට කිව නොහැක. මන්ද යත්? කවර ව්‍යවස්ථා සංශෝධනයකින් වුවද රටේ ජනතාවට ආයුෂ ලබාදිය නොහැකි හෙයිනි. එනිසා මෙහිදී අපට එක් යෝජනාවක් කළ හැකිය. ඒ එදා ජේ. ආර්. ජයවර්ධන කළ ආකාරයේ කඩිනම් මහවැලිය වැනි කඩිනම් ආර්ථික සැලැස්මක් ඉදිරිපත් කර ක්‍රියාවට නැංවීමය.

ඉහත සඳහන් කළ ආකාරයට ජනාධිපති ගෝඨාභයට තමන්ට හිමිවූ ධුරකාලය සම්පූර්ණ කළ හැකි සමාජ දේශපාලන වාතාවරණයක්ද අද තිබේද යන්නත් සැක සහිතය. ගාලු මුවදොර විරෝධතාකරුවෝ ''ගෝඨා ගෝ හෝම්'' සටන්පාඨය බිම නොදමති. එයට අමතරව අගමැති රනිල්ට ද විවේචන නැගෙයි එනිසා මේ පසුබිම තුළ ජනාධිපතිවරයා තුළ එබඳු අදිටනක් තිබේ නම් ඒ සඳහා විධිමත් හා බුද්ධිමත් ප්‍රතිපත්තිමය රාමුවක්ද අප්‍රමාදව ඉදිරිපත් කළ යුතුය. රාජපක්ෂ පාලනයට එරෙහිව නැඟුණු ජනතා විරෝධය මෙන්ම ගාලු මුවදොර අරගලය නොතකා හෝ එයට උඩින් පැන යෑමට හෝ මේ ආණ්ඩුවට නොහැකි බව අද අප දකින යථාර්ථයයි. ගෝඨාගෝගම තරමක් සන්සුන්වූ බව පෙනේ. එහෙත් ඒ විරෝධතා දුරලිය හැකි ප්‍රබුද්ධ ක්‍රියාකාරී වැඩපිළිවෙළකින් පමණක් බව අපගේ අදහසයි. ගාලු මුවදොර විරෝධය දිය කළ හැකි යැයි හෝ ඒ විරෝධතා නොතකා ආණ්ඩුවට ගමන් කළ හැකි යැයි හෝ සිතීම ද මෝඩකමකි. අරගල බිමේ සිටින දමිතා අබේරත්න කලාකාරිණිය පැවසූ පරිදිම ටොෆි, ලොසිංජර දී ජනතාව රැවටිය නොහැකිබව අගමැති රනිල් ද පවසා ඇත. දූෂණයෙන් හා වංචාවෙන් තොර රටක් හොරුන්ට දඬුවම් දෙන ශක්තිමත් නීතිරීති පද්ධතියක් ගැන ද අගමැති රනිල් මතක් කළේ ද ගාලු මුවදොර අරගල භූමියට ප්‍රතිචාර දැක්වීමට විය යුතුය. මේ වගකීමට උරදීම අද මහජන නියෝජිතයන්ගේ පරම යුතුකම බව අමුතුවෙන් කිව යුතු නැත. එහෙත් දියවන්නා රඟමඬල පිළිබඳ සත්‍යය කුමක්ද?

අද මෙරටේ දේශපාලන සංස්කෘතියක් නැත. රටේ පාලනය, අනාගතය භාරව සිටින ආණ්ඩුවල සංයුතිය කුමක්ද? අප යෝජනා කරන්නේ ඉහළම බුද්ධිමතුන්, ශාස්ත්‍රවන්තයන්, වෘත්තිය නිපුණතාවෙන් යුතු අයගෙන් පමණක් ආණ්ඩුවක් සමන්විත යුතු බව නොවේ. මහජන ඡන්දයෙන් එබඳු අයට පත්වීමට මේ කපේදීවත් හැකිවේදැයි කිව නොහැක. මොනව වුවත් ජයවර්ධන යෝජනා කළ ජාතික ලැයිස්තු ක්‍රමය ඒ සඳහා වෙන්කළ හැකිව තිබුණි. එහෙත් අපේ ජනතා නියෝජනය පවුල් වාදයට නැඹුරු වූවකි. කිසිම ප්‍රබුද්ධබවක් නැති තක්කඩියන්ගේ අම්බලමක තත්ත්වයට පාර්ලිමේන්තුවක් පත්කර ගත් දේශපාලන නායකයන්ට කිසිදු සමාවක් දියයුතු ද නැත. අද දැඩි ආන්දෝලනයට ලක්ව තිබෙන රාජපක්ෂ පවුල් ගසට අමතරව මෙරටේ දේශපාලනය ගමන් කළ ආකාරය විමසා බලන කවරකුට වුවද පෙනීයන්නේ එහි තිබෙන පිය උරුමය, පවුල් උරුමය නොබිදී නොසිදී ගලා ආ අයුරු නොවේද?

මුල් යුගවල තහවුරුවූ ප්‍රභූ දේශපාලනය අද වනවිට පාදඩකරණයට ලක්ව තිබෙන ආකාරය බොහෝදෙනකු විසින් පෙන්වනු ලැබ ඇත. ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා පාර්ලිමේන්තුවේදී කළ (07දා) ප්‍රකාශය බරපතළ චෝදනා පත්‍රයක් වැන්න. කොකේන් භාවිත කරන, ගණිකාවන් සමග සබඳතා පවත්වන අය ඇමැතිවරුන් අතර ද සිටින බව ඔහු පවසා තිබුණි. මැති ඇමතිවරුන් අතර ව්‍යාපාර ක්ෂේත්‍රයට සම්බන්ධ අය පවා සිටිති. විවිධ දූෂණ, ක්‍රියාකාරකම්වලට සම්බන්ධ අයගේ නම් ද බොහෝ අවස්ථාවල ජනමාධ්‍යවලින් පවා හෙළිකර තිබේ. ඇමැති බලය භාවිත වන ආකාරය ද ලජ්ජා සහිතය. විජිත හේරත් පාර්ලිමේන්තුවේදීම ප්‍රකාශ කළේ අධිකරණයකින් වැරදිකරුවකු වූ අයෙක් ඇමැතිමණ්ඩලයක සිටීම ප්‍රශ්නයක් බවයි. දේශපාලන සංස්කෘතිය පිරිහී ගිය ආකාරය මෙන්ම පවතින ක්‍රමය තුළ නිතරම දේශපාලනඥයා සුරකෙන බවත් මේවායින් අපට තහවුරු වේ. අද මේ රටේ ප්‍රාදේශීය මට්ටමේ සිට පාර්ලිමේන්තුව දක්වා ම තිබෙන දේශපාලන ක්‍රමය කෙතරම් දූෂිත ද යන්න පිළිබඳ කිසිවකුට අමුතුවෙන් විස්තර කළ යුතු ද නොවේ. දේශපාලනය ජනතාව වෙනුවෙන් සිදුකෙරෙන යහපත් සේවයක් නොව වරප්‍රසාද, ප්‍රතිලාභ සකසා දෙන වෘත්තියක් බවට පත්ව තිබීම ද මේ පරිහානියට හේතු වී තිබේ. මේ ආණ්ඩුවේම ප්‍රබල ඇමැතිධුර හෙබවූ ඩලස් අලහප්පෙරුම උත්ප්‍රාසයෙන් දැක්වූ පරිදිම අද සිදුවන්නේ දියවන්නා ශාලාවේ ප්‍රදර්ශනය වන ''පාර්ලිමන්ට් ජෝක්ස්'' රඟදැක්වීමකි. ඇතැම් මුග්ධ මන්ත්‍රීවරයෙක් විසින් කරනු ලබන අවිචාර ග්‍රාම්‍ය වාද විලි ඇති මිනිසුන්ට අපුල දනවන සුළුය. එක් වාචාලයෙක් ගරු මන්ත්‍රීවරියකට සමච්චල් කිරීමට යොදාගත් ''වම්බටු කතාව'' එයට දිය හැකි මෑත කාලීන නිදසුනකි. කොහොමටත් අද එහි සිටින ශිෂ්ට හා විදග්ධ දේශපාලනඥයන් පවා මේවා අනුමත නොකරන බවද නිසැකය.

මේ වර්ගයේ අශිෂ්ට ග්‍රාම්‍ය දේශපාලන පිසාචයන් සමග විදග්ධ හා සදාචාරාත්මක දේශපාලන සංස්කෘතියක් ගැන කවර කතා ද? ඩලස් කියන ආකාරයට ම අද සිදුවන්නේ මිලියන විසිදෙක ගැන බැලීම නොව එකසිය දහතුන වෙනුවෙන්ම ඇදට යන දේශපාලන ගමනකි. එහි අවසානය කනත්ත වීම ද නිසැකය. එහෙත් අපට තිබෙන ප්‍රශ්නය ජනතාව වන අප විසින්ම තෝරාගනු ලබන 225කින් මේ රට එබඳු අගාධයකට වැටීමය. අද දේශපාලනයට එන බහුතරයක අරමුණ මුදල් ඉපයීමත් තම දූ දරුවන් සමග ''සුඛිත මුදිත ජීවිත ගෙවීමත්ය. ඔවුන් බොහෝ දෙනෙකුගේ ජීවිත දර්ශනය වී ඇත්තේ ''ජීවිත් උනත් මැරුණත් මට උන් මොකද - මාවත් මගේ අඹුවත් රැකුනොත් මදි ද '' යන්නයි. ඒ ජන කවියෙන් පෙන්වා දෙන්නේද අතීතයේත් එබඳු නීචයන් සමාජයෙහි සිටි බවය. ධනය වුවමනා වුවද එය යහපත් ලෙස උපයා නැති බැරි ජනයාට දීම බුදු දහම ඇතුළු බොහෝ ආගම්වල උපදේශයයි. එහෙත් අපේ දේශපාලන භාවිතය තුළ එබඳු සදාචාර සම්පන්න ඉපයීම් ඉතා අඩුය. ආණ්ඩුවලට හේත්තු වී ව්‍යාපාර ගොඩදමා ගන්නා සේරිවාණිජ වර්ගයේ අය බහුලව සිටිනු මේ රටේ ඒ වර්ගයේ ගසාකෑම් ගැන ඕනෑ තරම් නිදසුන් ඉදිරිපත් කළ හැකිය. මුදලත් - දේශපාලනයත්, යන දෙකම මානව සමාජයට සිදුකරන විනාශය සුළුපටු නැත. සියලු නොහොබිනා ක්‍රියා වසාගැනීමට මුදල මෙන්ම දේශපාලන බලය ද එකසේ යොදා ගත හැකිය. දේශපාලන ඩීල්, කප්පම් ආදී සියලු තැන්හි ප්‍රමුඛ වන්නේද මුදල්ය.

අප යළිත් අගමැති රනිල්ගේ විශ්ලේෂණය වෙත යොමුවුවහොත්, එහි විශේෂ අවධාරණයක් කළ කැපකිරීම් සරල ඇවතුම් පැවතුම් පිළිබඳ යථාර්ථය කුමක්දැයි දැකගත හැකිය. ජනතාවට පටි තද කර ගැනීමට කියන අගමැතිවරයාගේ, ඇමැතිවරුන් හෝ රාජ්‍ය නිලධාරීන් හෝ ඒ සම්බන්ධයෙන් රටට දෙන ආදර්ශය කුමක්ද? ඇතැම් මැති ඇමැතිවරුන් පාවිච්චි කරන ඉතා සුඛෝපභෝගී නවීන වාහනයකින් වී 8, ප්‍රාඩෝ, බෙන්ස් ආදී සුපිරි වාහන) ලීටරයකින් කිලෝමීටර් තුන හතරකට වඩා දිවිය නොහැක. නිලධාරීන් අතර ද එබඳු පෙට්‍රල් හා ඩීසල් බොන වර්ගයේ වාහන පාවිච්චි කරන ආකාරය රහසක් නොවේ. තවමත් වාහන හත අට පිරිවරාගෙන යන දේශපාලනඥයෝ ද සිටිති. ඇත්ත වශයෙන්ම මහජන නියෝජිතයකුට වාහනයක් මිලට ගැනීම සාධාරණ ක්‍රමයක් තිබීම ප්‍රශ්නයක් නැත. එයට විරුද්ධ අය ද සිටිති. කුමක් වුවද ඇමැතිවරුන් සඳහා මිල අධික ඉන්ධන අධිකව වැයවන වාහන වෙනුවට හොඳ තාක්ෂණයෙන් උසස් එකම වර්ගයක වාහනයක් (කාර් හෝ ජීප්) ලබාදීමට බැරිකමක් නැත.

බොහෝ ඇමැතිවරු රථගායෙන් පෙළෙන්නෝය. ඔවුන්ගේ මහන්තත්ත්වයට ගැළපෙන වාහන ද කෝටි ගණන්වලින් මිල කෙරෙන ඒවාය. සමහරුන්ට පරිවාර වාහන දෙක තුනක් නැතිවම බැරිය. මේ රටේ පොදු ප්‍රවාහන සේවයේ (දුම්රිය, බස්) තත්ත්වය කොබඳු දැයි විස්තර කළ යුතු නැත. එහෙව් රටක ඇමැතියාට, ඇමැති බිරිඳට, දරුවන්ට පමණක් නොව නෑයන්ට ද ආණ්ඩුවේ වාහන ලබාගැනීම අවීචිමහ නරකාදියේ වැටීමට හොඳටම සෑහේ. මේ භාග්‍යය ලත් නිලධාරීහු ද සිටිති. මේ වර්ගයේ වාහනවලින් ඉගිලෙන ඇමැති උතුමන්ට, පයින්ම ගමන් බිමන්වලට වැටී සිටින අපට එබඳු අරපිරිමැසුම් ගැන වැදිබණ දෙසිය හැකිද? ඇතැම් මැතියන්ගේ තරම පෙන්වන නිවාස මඟඩියක් ගැන පසුගිය දිනවල වාර්තා වී තිබුණි. ගෙවල් පිනට ලබාගැනීමට බොරු දිවුරුම් ප්‍රකාශ පවා දුන් අය වූහයි ද කියති. මේ වර්ගයේ අය අපට දෙන ආදර්ශය මොනවාද? පසුගිය දිනවල මැති ඇමැති නිවෙස් ගිනි ලැව් ද සමාජ විරෝධය ඉස්සරහට දාගෙනය. එබඳු ත්‍රස්තවාදී ප්‍රහාර නීච හා දුෂ්ට මෙහෙයුම් බව නිසැකය. එහෙත් ඒවා ව්‍යාප්ත වූයේ සමාජගතවී තිබෙන මේ කුණු වී ගිය දේශපාලන භාවිතය ඇතිවූ වෛරයෙන් නොවේද?

අද මෙරටේ දරුවන් ශීඝ්‍රයෙන් මන්දපෝෂණයට ගොදුරු වන බව ළමා රෝග විශේෂඥයෝ පවසති. රිජ්වේ රෝහල ආශ්‍රිතව කළ සමීක්ෂණයකින් ද එය තහවුරු විය. එහෙත් එදිනෙදා අමාරුවෙන් ජීවත්වන පවුල්වල තත්ත්වය කෙබඳු දැයි කිසිවෙක් දනිත්ද?

පසුගිය දිනක රූපවාහිනිය නාලිකාවක දිස්වූයේ රෝස් පාන් බාගයක් දිලිඳු නිවසක දරුවන් තිදෙනකුගේ ආහාරය වූ බවය. අගමැතිවරයා කියන සාගතය මෙයයි. එය දැන් සෑහෙන කාලයක සිට දුප්පතුන්ගේ කටුක අත්දැකීමක් වී තිබේ. වරප්‍රසාද පන්තියෙහි දරුවන්ට මෙබඳු ගැහැට නැත. ලොවම ගෞරවයට පාත්‍ර වූ මාක්ස්ට පවා සිය ජීවිතයෙහි මෙබඳු විපත් පැමිණි බව දැක්වේ. වරක් ආහාර අහේනිය නිසා රෝගී වූ මාක්ස්ගේ දරුවන් බෙහෙතක් පවා නොමැතිව මියගිය බව ද සඳහන් වේ. මාක්ස්ගේ බිරිඳ අග හිඟකම් නිසා පත්ව සිටි මානසික පීඩාව ගැන ද දැක්වේ. මාක්ස් යනු දේශපාලන දර්ශනයක පීතෘවරයෙකි. එහෙත් ඔහුගේ ජීවන රටාව සරල හා චාම් එකක් වූ බව එංගල්ස් විසින්ම අනාවරණය කර තිබේ.

අපට අද තිබෙන වඩාත්ම ප්‍රායෝගික විසඳුම හැකි පමණින් ආහාරය ගත හැකි දෙයක් වැවීම බව සත්‍යයකි. කඩා වැටුණු කෘෂිකර්මය යළි ඔසවා, සරල චාම් ජීවිතවලට ජනතාව හුරුවිය යුතු බව අවිවාදිතය. ඒ වෙනස රටේ ඉහළ සිටම පහළට දැකගත හැකි පරමාදර්ශ අද ජනතාවට දීමට ඉතා වැදගත්ය. මැති ඇමැති වැටුප් ගැන, ඔවුන්ගේ ප්‍රතිලාභ, චර්යාවන් රටම දන්නා දේවල්ය. මේ අය අතර ඉතා විශිෂ්ට ජීවිත ගෙවන දේශපාලන චරිත ද තිබේ. මානව සංස්කෘතිය ආඪ්‍ය කළ හැකි දේශපාලනයක් අද ජනතාව අපේක්ෂා කරති. ගාලු මුවදොර විරෝධතාව ඒ අභිලාෂයට දේශපාලනය ප්‍රවිෂ්ඨ කරවීමය. වාචාල, අමන, පාදඩ දේශපාලන කෝම්බ නැති පාර්ලිමේන්තුවක් ඒ තරුණයෝ අපේක්ෂා කරති. මේ මජර දේශපාලනය තවදුරටත් නඩත්තු කළ නොහැකි බව ආණ්ඩුව ද තේරුම්ගත යුතුය.

මේ රටේ පාලන බලය ලබාගත් ප්‍රධාන දේශපාලන පක්ෂවලට තවදුරටත් ජනතාව රැවටිය නොහැකිය. රූට හවුලේ ගෙවල් බිඳින හොරුන් සේ දවල්ට එකිනෙකාට බැණ, අඩ ගසා ගන්නා තුච්ඡ දේශපාලනය කෙතරම් අප්‍රසන්නද? අද තිබෙන ප්‍රධාන පක්ෂවල චෝදනා නැති, කෙළින් වැඩ කරන කී දෙනෙක් සිටිත්දැයි විමසා බැලීම ඒ නායකයන්ට ම පැවරෙන වගකීමකි. අපි එයට ඉක්මන් නොවෙමු. අවසන් වශයෙන් තවත් එක් දෙයක් සඳහන් කරමු. ඒ 21 වන සංශෝධනය ගැනය. දනට තිබෙන වාර්තාවලට අනුව නම් එය සම්මත කර ගැනීමට වුවමනා කෝඳුරු තෙල් හත්පට්ටය හොයාගෙන තිබේ. එහෙත් තව ඩිංගක් වුවමනාය. තවම එය සොයා ගත නොහැකිවී තිබේ. මේ ලියන මොහොත වනවිට 21 සංශෝධනයට තුඩුදුන් දේශපාලන චරිතය වන බැසිල් රාජපක්ෂ ද ඉල්ලා අස්වීමට යන බව වාර්තා විය. එය 21ට පමණක් නොව මේ දේශපාලන මෙහෙයුම් සියල්ල කෙරෙහිම බලපෑ හැකි සාධකයක් වනු ඇත.

● ගාමිණී සුමනසේකර





# වැටෙන ආර්ථිකයට දිරච්ච මුක්කු !

වර්තමානයේ අප මුහුණ දී සිටින අතිශය දරුණු ආර්ථික වසනයට හේතු රැසක් තිබිය හැකිය. ඒවා අප වඩාත් පුළුල් ඇසකින් දැකිය යුතු වේ. එනම් මෙයට දිගුකාලීන හේතු මෙන්ම ආසන්න හේතු ද තිබෙන බවයි. ආසන්න හේතු ලෙස ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපති වීමෙන් පසු ක්‍රියාත්මක වූ රජයේ ආර්ථික කළමනාකරණයේ දුර්වලතා සහ අඩුපාඩු මෙන්ම කොවිඩ් වසංගතය ද හේතුවී ඇත. දිගුකාලීනව සෑම රජයක් යටතේම පාහේ ආර්ථිකයේ විශාල විදේශ විනිමය හිඟයක් සහ අයවැය හිඟයක් පැවති බව ද රහසක් නොවේ. කොවිඩ්වලට පෙර ඇමෙරිකානු ඩොලර් බිලියන දහයක් පමණ දක්වා වෙළෙඳ හිඟය වර්ධනය වී තිබුණි. එනම් අපි අපගේ භාණ්ඩ පිටරටට අපනයනය කර උපයා ගන්නා විදේශ විනිමය ආදායම මෙන් දෙගුණයක් වටිනා භාණ්ඩ පිටරටින් ආනයනය කර පරිභෝජනය කිරීමට හුරු වී සිටියෙමු. රට රැකියා කරන විදේශ ශ්‍රමිකයන් සහ මෙරටට පැමිණෙන විදේශ සංචාරකයන්ට පින් සිදුවන්නට රටට ලැබුණු විදේශ විනිමය ආදායමෙන් සහ තවදුරටත් විදේශ ණය ගැනීමෙන් මේ විදේශ විනිමය හිඟය පියවාගෙන රෝල් ගසාගෙන මෙතෙක් කල් දිගටම පැමිණියත් එය මෙවර කළ නොහැකි වී ඇත.

## ● කොවිඩ් වසංගතය හා වෙනත් හේතු

මේ විනිමය හිඟයට අමතරව පසුගිය කාලයේ විශාල වශයෙන් විදේශ ණය ගැනීමෙන් එකතු වූ විශාල ණය සේවාකරණ වියදමක් ද දැරීමට සිදුව තිබිණි. විශේෂයෙන්ම මේ වසරේ (2022) ඇමෙරිකානු ඩොලර් බිලියන 7 කට ආසන්න ණය වාරික හා පොලී ප්‍රමාණයක් ගෙවීමට තිබිණි. ඒ අනුව ඉතිහාසයේ ප්‍රථම වතාවට විදේශ ණය ගෙවා ගැනීමට මෙන්ම ඊට අමතරව අපට අත්‍යවශ්‍ය ආනයන කර ගැනීමට ද විදේශ විනිමය නොමැති වී ජනජීවිය විශාල පීඩාවට පත්ව තිබේ. විදේශ විනිමය අර්බුදය දිගටම තිබුණු එකක් වුවත් එය මෙතරම් දරුණු තත්ත්වයකට පත් වීමට කොවිඩ් වසංගතය සමඟ ඇති වූ වටපිටාව මෙන්ම තවත් සාධක ද හේතු වී ඇත. ප්‍රශ්නය උග්‍ර වීමට කොවිඩ් වසංගත තත්ත්වය හේතු වී තිබුණත් සියල්ල කොවිඩ් වසංගතයෙන් බැර කළ හැකි නොවේ. ලෝකයේ වෙනත් රටවලට ද කොවිඩ් වසංගතය අඩු වැඩි වශයෙන් බලපෑ බව අප දනිමු. එසේ නම් මේ සඳහා අපට බලපාන ලද සුවිශේෂ කරුණු තිබිය යුතුය. ඒ ගැන මේ දිනවල සාකච්ඡා වෙයි. මේ සඳහා බොහෝ හේතු තිබිය හැකි නමුත් මින් අපට ආසන්න හේතු වශයෙන් පෙනෙන ප්‍රධාන කරුණු තුනක් ඇත. එනම් 2019 වසර අගදී සිදුකළ විශාල බදු කප්පාදුව, අයිඑම්එෆ් එකට යැමට ප්‍රමාද වීම සහ රුපියල ඩොලරය අතර හුවමාරු අගය රු. 203 ක ස්ථාවර අගයක දිගුකාලයක් තිස්සේ පවත්වාගෙන යැම යන කරුණු මේ අතරින් ප්‍රධාන වේ.

මේ ආර්ථික අර්බුදයේ හේතු සෙවීමට අනුර ප්‍රියදර්ශන යාපා මහතාගේ ප්‍රධානත්වයෙන් රැස් වෙන පාර්ලිමේන්තුවේ මුදල් කාරක සභාව ද පියවර ගෙන ඇත. මේ අනුව මේ රජයේ හිටපු ආර්ථික බලධාරීන් ද පසුගිය සතියේ (ජූනි 08 දින) පාර්ලිමේන්තු මුදල් කාරක සභාව හමුවට කැඳවා තිබිණි.

ඒ අනුව හිටපු ජනාධිපති ලේකම් ආචාර්ය පී. බී. ජයසුන්දර, හිටපු මුදල් අමාත්‍යාංශ ලේකම් එස්. ආර්. ආටිගල සහ හිටපු මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් යන මහත්වරුන් මුදල් කාරක සභාවට කැඳවා තිබුණු අතර වත්මන් මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා ඇතුළු මහ බැංකු නිලධාරීන් මෙන්ම මහ බැංකු මුදල් මණ්ඩල සාමාජිකයන් සහ මුදල් අමාත්‍යාංශ ලේකම් මහින්ද සිරිවර්ධන මහතා ද මේ අවස්ථාවට එක්ව සිටිනු දැකගත හැකි විය. ආර්ථික හා මූල්‍ය කටයුතු වාර්තා කරන මාධ්‍යවේදීන් වශයෙන් මේ සියලු දෙනා සමඟම කටයුතු කිරීමට මේ ලියුම්කරුට හැකිව ඇත. ඒ අනුව ඔවුන් කියන දේවල් සහ රාජ්‍ය ප්‍රතිපත්ති වාර්තා කිරීමට අමතරව ඔවුන්ගේ ධුර කාලයෙන් හි දී ආර්ථික ප්‍රතිපත්තිවල අප දකින වැරදි අඩුපාඩු ද අප නොයෙක් විට පෙන්වා දී ඇත. එහිදී මේ රජය 2019 අගදී පත් වූ පසුව සිදුකළ අතිවිශාල බදු කප්පාදුව, කාබනික කෘෂිකර්ම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ ආකාරය, අයිඑම්එෆ් එකට යැමට ප්‍රමාද වීම සහ රුපියල දිගු කලක් ස්ථාවර අගයක තියා ගැනීම යන කරුණු ගැන බොහෝ දෙනෙක් රජයට සහ මේ හිටපු ආර්ථික බලධාරීන්ට විවේචන ඉදිරිපත් කර තිබේ. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා මේ වනවිට වරදක් පැවසුවේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට මීට පෙර යැමට තිබුණු බවයි. එසේම පොහොර ගැන ගත් තීරණ ද වැරදි බව රජය ප්‍රමාද වී හෝ පිළිගෙන තිබේ. මේ ලියුම්කරුගේ මතයට අනුවත් කාලයක් තිස්සේ පැවති සහ කොවිඩ් නිසා තවත් වර්ධනය වූ විදේශ විනිමය අර්බුදය තවත් උග්‍ර කිරීමට මේ කරුණු ද හේතු වී ඇත. ඒ බව නොයෙක් වර අපගේ ලිපි මඟින් ඉදිරිපත් කර තිබේ. එසේම මේ ලියුම්කරු ඇතුළු බොහෝ මාධ්‍යවේදීන් ද මේ ගැන නොයෙක්වර මාධ්‍ය හමුවලදී මෙන්ම සම්මුඛ සාකච්ඡාවල දී ද ප්‍රශ්න කර තිබේ. එහෙත් ඒ හැම විටම පාහේ අඩුපාඩු පිළිගන්නවා වෙනුවට ඒවා සාධාරණීකරණය කිරීමේ කතා කළ අයුරු අපට මතකය. ජනාධිපතිවරයා ද මුලදී රසායනික පොහොර ආනයනය වහාම නතර කිරීමට ගත් තීරණය වැරදි බව පිළිගත්තේ නැත. කෙසේ හෝ මේ හේතු සාධක බොහොමයක් එකතු වී අප අද මුහුණ දෙන ආර්ථික තත්ත්වය උදා වී ඇත. සියලු විදේශ ණය කලට වෙලාවට ගෙවනවා කිව්වත් අවසානයේ අපටම ණය ගෙවීමට නොහැකි බව ලෝකයට කියා විදේශ ණය ගෙවීම පසුපස හැරීම සිදු විය. බොහෝ දෙනා අර්ථකථනය කරන පරිදි රට බංකොලොත් වී ඇත.

## ● 2019 අග සිදු කළ බදු කප්පාදුව

පසුගිය ජූනි 08 වැනිදා පාර්ලිමේන්තුවේ මුදල් කාරක සභාවේ පැවති ප්‍රශ්න කිරීම් සහ ඒවාට හිටපු ආර්ථික බලධාරීන් ලබා දුන් පැහැදිලි කිරීම් මුළුමනින්ම අප දන්නේ නැත. එහෙත් පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් මාධ්‍යට යම් නිල නිවේදනයක් සහ එහි වැදගත් කොටස්වලට අදාළ වීඩියෝ පටයක් එවා ඇත. ඒ නිසා එම කරුණුවලට සීමා වෙමින් අපට මේ ගැන සාකච්ඡා කිරීමට සිදුව ඇත. මෙහිදී මුදල් අමාත්‍යාංශයේ හිටපු ලේකම් එස්. ආර්. ආටිගල මහතා ආණ්ඩුවේ බදු ප්‍රතිපත්ති වෙනස් වීමට වඩා වාහන ආනයනය නැවතීම ඇතුළු කොවිඩ් තත්ත්වය රටේ ආර්ථික බිඳවැටීමට හේතු වූ බව පවසා ඇත. 2019 වර්ෂයේ දෙසැම්බර් 04 වන දින හිටපු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරනු ලැබූ පළමු කැබිනට් පත්‍රිකාවට අනුව බදු ප්‍රතිපත්ති සම්බන්ධයෙන් මෙලෙස තීරණ ගනු ලැබූ බවද ආටිගල මහතා කියා ඇත. මේ නිසා 2019 වසර අවසානයේ නව ආණ්ඩුවේ බදු ප්‍රතිපත්ති වෙනස් වීම හේතුවෙන් රුපියල් බිලියන 500කට ආසන්න මුදල් ප්‍රමාණයක් රටට අහිමි වූ බව ප්‍රකාශ කිරීම සාධාරණ නොවන බවත් ඒ සඳහා වාහන ආනයනය නතර කිරීම ඇතුළුව පනවනු ලැබූ ආනයන සීමා හේතුවෙන් ඇති වූ පාඩුව සහ කොවිඩ් තත්ත්වය හේතුවෙන් ඇති වූ ආර්ථික සංකෝචනය ඇතුළු හේතුන් බලපෑ බව ද එස්. ආර්. ආටිගල මහතා පවසා ඇත. එහි සත්‍යයක් තිබේ. ආර්ථික කටයුතු අඩපණ වන විට සහ ආර්ථිකය හැකිලෙන විට රජයට අය කළ හැකි බදු ආදායම් අඩුවන බව ඇත්තය. අප සිතන්නේ කොවිඩ් තත්ත්වය අයකළ හැකි බදු ආදායම අඩු වීමට හේතු වුවත් රජයේ විශාල බදු කප්පාදුව ද රජයට කොවිඩ් තත්ත්වය යටතේ අඩුවෙන් හෝ අය කළ හැකිව තිබූ රජයේ බදු ආදායම තවත් අඩු කිරීමට හේතු වූ බවයි.

## ● නිලධාරීන්ට කළ හැකි දේ

සාමාන්‍ය නිලධාරීන්ට නම් රාජ්‍ය ප්‍රතිපත්තිය සහ රජයේ තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීම හැර වෙනත් විකල්පයක් නැත. එහෙත් ආර්ථිකය ගැන තීන්දු තීරණ ගන්නා ප්‍රබල නිලධාරීන්ට එය එසේම අදාළ නොවේ. පසුගිය මැතිවරණයට ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන දේ වුවත් යම් ආර්ථිකයට සහ ජනතාවට අහිතකර තත්ත්වයන් ඇති වෙනවා නම් ඒවා ජනාධිපතිවරයාට මෙන්ම මුදල් ඇමැතිවරයා හරහා රජයට පෙන්වා දීමේ හැකියාවක් ඔවුන්ට තිබේ. දේශපාලනඥන් යනු හැම විටම ආර්ථික විද්වතුන් නොවේ. ඒ නිසාම ඔවුන්ට බොහෝ විට මේ නිලධාරීන් මත යැපීමට ද සිදු වන බව රහසක් නොවේ. මෙහිදී මුදල් කාරක සභා සාමාජිකයන්ගේ අදහස වී ඇත්තේ කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමේදී ඒ අදාළ විෂය සම්බන්ධයෙන් ඊට සමගාමීව පසුබිම් සටහනක් සහ වාර්තාවක් තිබිය යුතු බවත් එහි සම්පූර්ණ වගකීම ඇත්තේ එම විෂය සම්බන්ධ නිලධාරීන්ට බවත්ය. යම් යම් නොවැළැක්විය හැකි තත්ත්වයන් තිබුණු බව පිළිගත හැකි වුවද මහ බැංකුවේ සහ මුදල් අමාත්‍යාංශයේ නිසි අධ්‍යනයකින් පසුව මෙවන් තීරණ ගත යුතුව තිබූ බවද මුදල් කාරක සභා සාමාජිකයන්ගේ අදහස විය. අපත් සිතන්නේ ක්‍රියාත්මක වන ප්‍රතිපත්ති හෝ අපේක්ෂිත ප්‍රතිඵල නොලැබෙන බව එම තීරණ ක්‍රියාත්ක වීමෙන් පසුව හෝ පෙනෙනවා නම් ඒවා වෙනස් කළ යුතුව ඇති බවයි. අහිතකර ප්‍රතිපත්තිවල දිගටම මතවාදීව එල්බ සිටීමෙන් වනු ඇත්තේ එම අහිතකර බලපෑම් තවත් වැඩි වීමයි. මහජනයා තවත් පීඩාවට පත් වීමයි. මේ නිසා 2019 අගදී හඳුන්වා දුන් බදු ප්‍රතිපත්තියේ පුළුල් වෙනසක් ඉදිරි වසර 5 ටම සිදු නොවන බව එදා කීවත් මේ වන විට බදු වැඩිකර පුළුල් බදු ප්‍රතිසංස්කරණයක් සිදුකර තිබේ. මේ නිසා රජයේ ප්‍රබල නිලධාරීන්ට අවශ්‍ය නම් යහපත් පැත්තටම රජයේ ආර්ථික ගමන්මගේ දිශානතිය වෙනස් කිරීමට බොහෝ දේ කළ හැකිව තිබේ. එහෙත් ඒ සම්බන්ධයෙන් අපට සෑහීමට පත් විය හැකි ද ?

මෙහිදී රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ කමිටු සාමාජිකයන් තවදුරටත් විමසා සිටියේ කොවිඩ් තත්ත්වය මතු වීමට ප්‍රථම, එවකට දේශපාලන බල අධිකාරිය විසින් ගනු ලැබූ මූල්‍යමය ප්‍රතිපත්ති තීරණ සම්බන්ධයෙන් ඉදිරියේදී මතු විය හැකි ගැටලුකාරී තත්ත්වයන් පිළිබඳ මුදල් මණ්ඩලයේ පැහැදිලි නිගමන ඇතුළත් වාර්තාවක් ආර්ථික විශේෂඥයන් සහ වෘත්තිකයන් වශයෙන් කිසිවෙකු හෝ ලිඛිතව දැනුම් දීමට කටයුතු කරනු ලැබුවේද යන්නයි. මෙහිදී අදහස් දක්වා ඇති හිටපු ජනාධිපති ලේකම් ආචාර්ය පී. බී. ජයසුන්දර මහතා පවසා ඇත්තේ මෙවන් තීරණ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන බවත්, ඉන්පසුව එය කාරක සභා වෙතද යොමු කරනු ලබන බවත්ය. මෙහිදී රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයන් නැවතත් විමසා සිටියේ, ආර්ථික විශේෂඥයන් සහ වෘත්තිකයන් වශයෙන් දේශපාලන අධිකාරිය ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ නිවැරදි නොවන අවස්ථාකදී, එවකට රජයේ වගකිවයුතු තනතුරු දැරූ නිලධාරීන් ලෙස එය නිසි අයුරින් සිය ඉහළ බලධරයන්ට පෙන්වා දීමට හා දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබුවේද යන්නයි.

## ● මහ බැංකු අධිපතිගේ අදහස

මෙහිදී අදහස් දැක්වූ වත්මන් මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා පවසා සිටියේ රජයේ වගකිව යුතු නිලධාරීන් දේශපාලනය කිරීමෙන් වැළකිය යුතු බවත් දේශපාලඥයකු සහ නිලධාරියකු අතර තිබෙන වෙනස නිසි ලෙස හඳුනාගත යුතු බවත්ය. තවදුරටත් අදහස් දක්වමින් ඒ මහතා පවසා සිටියේ දේශපාලඥයන් විසින් ගනු ලබන තීරණ නිවැරදි නොවන අවස්ථාවන්හිදී එය පැවසීම නිලධාරීන්ගේ වගකීම සහ යුතුකම වන බවත්, එවන් තීරණවලට ලැබෙන ප්‍රතිඵල සඳහා දේශපාලඥයන් පමණක් වගනොකිය යුතු බවත්ය. වසර දෙකක් යන තුරු රටේ ආර්ථිකය නිසි මාර්ගයේ ගමන් නොකළ බව මෙන්ම රටේ ආර්ථිකය බිඳ වැටෙනතුරුම තමන් දැනුවත් නොවූ බවත් දේශපාලන අධිකාරියේ තීරණ මත පමණක් පදනම්ව එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළා යැයි පැවසීම අනුමත කළ නොහැකි බවත් මෙහිදී වීරසිංහ මහතා වැඩිදුරටත් පෙන්වා දුන්නේය.

## ● මුදල් කාරක සභාවේ සභාපතිගේ ප්‍රතිචාරය

මෙම කාරක සභාවට සහභාගි වූ මන්ත්‍රීවරුන් පැවසුයේ තමන් මෙම ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ඇතිවිය හැකි අතුරු ප්‍රතිඵල පිළිබඳ විවිධ අවස්ථාවන්වලදී වගකිව යුතු නිලධාරීන්ට සහ එවකට දේශපාලන බලාධිකාරියට පැවසුවද කිසිවෙක් ඒ පිළිබඳ අවධානය යොමු නොකළ බවයි. එහිදී කාරක සභා සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර ප්‍රියදර්ශන මහතා පවසා සිටියේ උපයන විට ගෙවීමේ බදු ක්‍රමය කිසිදු හේතුවක් නොමැතිව ඉවත් කිරීම මගින් විශාල ගැටලු රාශියක් ඇති වූ බවත් මෙලෙස බදු කපා හැරීම් හේතුවෙන් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 12.5 ව තිබූ රාජ්‍ය ආදායම සියයට 8.7 දක්වා අඩු වූ බවත් ය. එසේම මහ බැංකුවේ නිලධාරීන් සහ පාර්ලිමේන්තුව අතර සම්බන්ධතාව වැඩි කර ගනිමින් නිසි සන්නිවේදනයක් සහිතව රටේ වැදගත් තීරණ ගැනීමේදී කටයුතු කළ යුතු බවද කාරක සභා සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර ප්‍රියදර්ශන යාපා මහතා අවධාරණය කළේය. මේ අනුව කාරක සභා සභාපතිවරයා පැවසුවේ මේ පිළිබඳව තවදුරටත් සාකච්ඡා කළ යුතු බැවින් මෙම සාකච්ඡාව නැවතත් එළඹෙන ජූනි 17වන දින සිදු කරන බවයි. අනුර ප්‍රියදර්ශන මහතාගේ ප්‍රධානත්වයෙන් රැස් වූ රජයේ මුදල් පිළිබඳ කාරක සභා
රැස්වීමට විරුද්ධ පාර්ශ්වයේ නායක සජිත් ප්‍රේමදාස මහතා ඇතුළු ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ මන්ත්‍රීවරු රැසක් සහභාගි වී සිටියහ.

## ● බැසිල්ගේ ඉල්ලා අස්වීම

බැසිල් රාජපක්ෂ මහතා පසුගිය ජූනි 09 වැනිදා සිය ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස් වූ අතර ඉන්පසු බත්තරමුල්ල නෙළුම් මාවතේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ කාර්යාලයේ දී මාධ්‍ය හමුවක් ද පවත්වන ලදී. එහිදී මූලික වශයෙන්ම ඔහු සඳහන් කළේ රාජ්‍ය පාලනයෙන් ඉවත්වන බවත් දේශපාලනයෙන් ඉවත් නොවන බවත්ය. යෝජිත 21 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට තමා පුද්ගලිකව විරුද්ධ බව ද ඔහු කීවේය. මේ නිසා බැසිල්ගේ ඉල්ලා අස්වීමට මෙම යෝජිත 21 වැනි ආණ්ඩු ව්‍යවස්ථා සංශෝධනය ද හේතු වී ඇත. එහි ද්විත්ව පුරවැසියන්ට පාර්ලිමේන්තුවට පැමිණිය නොහැකි බවට වන වගන්තියක් තිබේ. එය සම්මත වුවහොත් කොහොමත් බැසිල් රාජපක්ෂ මහතාට පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය දැරීමට නොහැකි වෙයි. මේ නිසා ඔහු 21 ට විරුද්ධ වන්නේ ඔහුගේ මන්ත්‍රී ධුරය අහිමි වන නිසා බවට තර්කයක් මතුවන බැවින් ඔහු මෙසේ කලින්ම ඉල්ලා අස් විය. එසේම ඔහු පාර්ලිමේන්තුවට පිවිසියේ මුදල් ඇමැති අමාත්‍යාංශයේ වගකීම භාර ගැනීමට බවත් එහෙත් මුදල් අමාත්‍ය ධුරයෙන් ඉල්ලා අස් වීම නිසා තමාට පාර්ලිමේන්තුවේ කරන්නට දෙයක් නැති බව ද ඔහු මාධ්‍යවේදීන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් සඳහන් කළේය. ඔහු කීවේ රාජ්‍ය පාලනය සහ දේශපාලනය කිරීම දෙකක් බවත් තමන් රාජ්‍ය පාලනයෙන් ඉවත් වන බවත්ය. එසේම ඔහුගේ ඉල්ලා අස්වීමෙන් හිස්වෙන පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයට ප්‍රකට ව්‍යාපාරික ධම්මික පෙරේරා මහතා පත් කිරීම සම්බන්ධයෙන් කළ විමසුමකට පිළිතුරු දෙමින් හිටපු මුදල් ඇමැති බැසිල් රාජපක්ෂ මහතා කීවේ තවමත් තමන්ට ඒ ගැන කිව නොහැකි බවත් ඒ ගැන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විසින් තීරණයක් ගනු ඇති බවත්ය. එහෙත් මේ වන විට ධම්මික පෙරේරාගේ පත්වීම වඩාත් තහවුරු වී තිබේ.

● ශ්‍යාම් නුවන් ගණේවත්ත
shyam.divaina@gmail.com

# රටට කන්න දෙන්න ගමින් ගමට සහයෝගිතාවයේ කුස්සියක්...

# Community Kitchen






**සහයෝගිතා මුළුතැන්ගෙය එහෙමත් නැත්නම් මේ දිනවල නිතර සමාජ මාධ්‍යයේ සංසරණය වන රූප දැන්වීම්වල දකින community kitchen කියන වචනය ගැන බොහෝ දෙනෙක් කතා කරන්න පටන් අරන්. ශ්‍රී ලංකාවේ අපිට නුහුරු නුපුරුදු අලුත්ම සංකල්පයක් ලෙස මේ සහයෝගිතා මුළුතැන්ගෙය වැඩසටහන දැනුණත්, ලෝකය පුරා බොහෝ රටවල මේ සංකල්පය ඉතාමත්ම ජනප්‍රිය සංකල්පයක්. ඒ වගේම ලෝකයේ බොහෝ රටවල්වල අදටත් පවත්වාගෙන යන සහයෝගිතා මුළුතැන්ගෙය දිගුකාලීන ඉතිහාසයක් තියෙන සමාජ සත්කාරයක්.**

ඉන්දියාව, ඇමෙරිකාව, වගේ රටවල්වල මේ සහයෝගිතා මුළුතැන්ගෙය සාර්ථකව ක්‍රියාත්මක කරනවා. එක් එක් රටවල් මේ සංකල්පය විවිධ ආකාරවලට ක්‍රියාත්මක කරනවා. පිසින ලද ආහාර, සුප් වර්ග, වියළි ආහාර ද්‍රව්‍ය, එළවළු පලතුරු බෙදා දීම ඒ අතරින් කැපී පෙනෙනවා. ඒ ඒ රටවල්වල ජනතාවට ආහාරපාන සපයා ගන්නට නොහැකි අවස්ථාවලදී එනම් යුදමය වාතාවරණවලදී, සාගත අවස්ථාවලදී මේ සහයෝගිතා මුළුතැන්ගෙය ඇතිවුණා කියලා තමයි බොහෝ දෙනෙක් කියන්නේ. ලෝකයේ විවිධ රටවල්වල සහයෝගිතා මුළුතැන්ගෙය ආරම්භ වීම සම්බන්ධයෙන් විවිධ මතවාද තියෙනවා. කොහොම වුණත් මේ වැඩසටහන හරහා මිනිසුන් විසින් මිනිසුන්ටම උදව් උපකාර කර ගැනීම තමයි සිද්ද වෙන්නේ.

සහයෝගිතා මුළුතැන්ගෙය සංකල්පමය විදිහට බැලුවොත් අලුත් සංකල්පයක් කියලා කෙනෙක්ට හිතෙන්න පුළුවන්. ඒත් අපේ රටේ ඉතිහාසය පුරාවටම අපේම මිනිසුන්ට උදව් අවශ්‍ය වූ හැම මොහොතකම ඒ සඳහා පෙරමුණ අරගෙන අපේම මිනිසුන් උදව් උපකාර කරලා තියෙනවා. කන්න බොන්න තියෙන දේවල් බෙදා හදාගෙන තියෙනවා. ඒ කළ සමාජ සත්කාරවලට සමාන ක්‍රියාවලියක් විදියටත් මේ සහයෝගිතා මුළුතැන්ගෙය හඳුන්වා දෙන්න හැකියාව තියෙනවා.

## ● ආහාර අර්බුදය තිබෙන බොහෝ රටවල ජනප්‍රිය සංකල්පයක්...

දැවැන්ත අර්බුද රාශියකට ජනතාවට මුහුණ දෙන්න සිද්දවෙලා තියෙන වෙලාවක ඔවුන්ට තියෙන ප්‍රධානම ප්‍රශ්නය තමයි ආහාර සපයා ගැනීම. මේ වෙද්දි අත්‍යවශ්‍ය භාණ්ඩ, එළවළු පලතුරු සහ සියලුම දේවල්වල මිල ගණන් එකට එකක් ඉහළ ගිහින්. තවත් මාස දෙක තුනක් යද්දී දරුණු ආහාර හිඟයක් ඇති වෙනවා කියලත් ඒ සම්බන්ධයෙන් වන විශේෂඥයන් අනතුරු අඟවලා තියෙනවා. මේ වෙද්දි ලංකාව පුරා බොහෝ දෙනෙක් එදිනෙදා තමන්ට අවශ්‍ය ආහාර ටිකවත් සපයා ගන්න බැරි තරමටම අසරණ වෙලා කියන එක රහසක් නෙමෙයි.

ඒ වගේ දුෂ්කර වෙලාවක තමයි අසරණ වූ අපේම මිනිසුන් වෙනුවෙන් මේ සහයෝගිතා මුළුතැන්ගේ ආරම්භ වෙන්නේ. සින්ගියුලාරිටි ශ්‍රී ලංකා (Singiularity Sri Lanka) ආයතනයේ මූලිකත්වයෙන් සර්වෝදය ආයතනයේ සහයෝගිතා ගිවිසුම්ගතව ආරම්භ වුණු සහයෝගිතා මුළුතැන්ගෙය (community kitchen) පසුගිය මැයි 25 වැනිදා, බොහෝ පිරිසකට රාත්‍රී ආහාර වේල සපයා දෙමින් ඉතාමත් සාර්ථකව පළමු අත්දැකීම ජනතාවත් සමඟ බෙදා ගත්තා.

ශ්‍රී ලංකාව ඉතාමත්ම තීරණාත්මකව සිටින අවස්ථාවක, ලංකාවේ මිනිසුන් තමන්ගේ ආහාර අවශ්‍යතාවය ගැන දැඩි පීඩනයක ඉන්න වටපිටාවක මෙවගේ සත්ක්‍රියාවක් ආරම්භ කිරීමට මූලිකත්වය ගත් සින්ගියුලාරිටි ශ්‍රී ලංකා ආයතනයේ නිර්මාතෘ, ඇමෙරිකා එක්සත් ජනපදයේ ආයෝජන බැංකුකරුවෙක් ලෙස කටයුතු කරන මංජු නිශ්ශංක මහතා හමුවීමටත් අපි අමතක කළේ නැහැ.

''බුද්ධි මණ්ඩලයක සාමාජිකත්වයෙන් ආරම්භ කළ සින්ගැයුලාරිටි ශ්‍රී ලංකා ආයතනයේ මුල් සමාජ සත්කාරය සහයෝගිතා මුළුතැන්ගෙයයි. දැනට ශ්‍රී ලංකාවේ තියෙන අර්බුදයන් කෙටිකාලීන මධ්‍ය කාලීන සහ දිගුකාලීන ලෙස හඳුනාගෙන එහි මූලිකම යාවත්කාලීන අර්බුදයක් ලෙස මිනිසුන් පත්ව ඇති අහාර අර්බුදයට යම් කෙටිකාලීන විසඳුමක් ලෙස මෙම සහයෝගිතා මුළුතැන්ගෙය ආරම්භ කළා. මෙම ආහාර අර්බුදය ග්‍රාමීය මට්ටමටත් වඩා බලපාන්නේ නාගරික අඩු ආදයම්ලාභීන්ට කියලා මට හිතෙනවා. තවමත් ග්‍රාමීය ජනතාවට තමන් අවට පරිසරය තුළින් හෝ ආහාර අවශ්‍යතා යම් මට්ටමකට හෝ සපුරා ගත ගන්න පුළුවන්. නමුත් නාගරිකව ජීවත්වෙන අඩු ආදායම්ලාභීන්ට එවන් අවස්ථාවක් නැහැ. ඔවුන්ට අවට පරිසරයෙන් කොස් දෙල් හෝ වෙනයම් ආහාරයක් සපයා ගැනීම ඉතාමත්ම අපහසුයි. ඒ වගේම ග්‍රාමීය නිවෙස් වල දර ළිපෙන් හෝ තවමත් ආහාර පිළියෙල කළ හැකියි. නමුත් නාග රිකව ජීවත්වෙන තට්ටු නිවැසියන්ට හෝ වතු ආශ්‍රිතව ජීවත්වෙන පිරිසට භූමිතෙල් හෝ ගෑස් ලිපක් නොමැතිව තම ආහාර පිළියෙල කර ගැනීම දුෂ්කරයි.''

එවැනි මිනිසුන් වෙනුවෙන් පවතින රජය යම් ක්‍රමවත් වැඩපිළිවෙළක් ආරම්භ කරන තුරුවත්, කෙටිකාලීන වැඩපිළිවෙළක් ලෙස හෝ අපේම මිනිසුන් අප බලාගත යුතුයි කියන හැඟීම පෙරදැරිව මේ සහයෝගිතා මුළුතැන්ගෙය ආරම්භ කළා කියලා මංජු නිශ්ශංක මහත්මයා සිහිපත් කළා.

''මේ සත්ක්‍රියාව වෙනුවෙන් පෞද්ගලික හා රාජ්‍ය නොවන ආයතනවල සහයෝගය ලබා ගැනීමට බලාපොරොත්තු වූ අවස්ථාවේදී ඒ වෙනුවෙන් සර්වෝදය ආයතනය හා ගිවිසුම්ගතව මනා සහයෝගයකින් මෙම සත්කාරය ඇරඹීමට හැකිවීම සතුටට කාරණාවක්. ඒ වෙනුවෙන් මුල් අදියරේදී නාගරික ප්‍රජාව වෙනුවෙන් සතියකට උණුසුම් ආහාර වේල් 5000 ක් බෙදාහැරීමේ වැසටහන ආරම්භ කළා.''

සහයෝගිතා මුළුතැන්ගෙය සංකල්පයට සමගාමීව සංකේතාත්මක වැඩසටහනක් ලෙසින්, මුල්ම උණුසුම් ආහාර වේල් දහස බෙදාහැරීම පංචිකාවත්ත අබේසිංහාරාම පන්සල මූලික කරගෙන පසුගිය මැයි විසිපස් වැනිදා ආරම්භ වුණා. විහාරස්ථානයේ දායක සභාව සහ අරගල භූමි තරුණ පිරිසකගේ ශ්‍රම දායකත්වය ඒ සඳහා අඩුවක් නැතිව ලැබුන බවත් මේ වැඩසටහනට සම්බන්ධ වුණු බොහෝ දෙනෙක් අදහස් දක්වමින් කියා සිටියා.

දැනට සහයෝගිතා මුළුතැන්ගෙය සඳහා සම්පූර්ණ මූල්‍ය දායකත්වය දරන්නේ සින්ගියුලාරිටි ශ්‍රී ලංකා ආයතනය. මේ වැඩසටහන ඉදිරි මාස 6 ක් වැනි කාලයක් පුරාවට පවත්වාගෙන යැම තමයි ඔවුන්ගේ බලාපොරොත්තුව.

''සහයෝගිතා මුළුතැන්ගෙය සඳහා යම් ආධාරයක් ලබාදීමට කැමති කෙනෙක් ඉන්නවනම්, සර්වෝදය ආයතනයේ නිල වෙබ් අඩවියට ඇතුල් වීමෙන් එහි පරිත්‍යාග සඳහා වෙන් කළ ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් ඒ සඳහා දායකත්වය ලබා දෙන්න පුළුවන්. කිසිදු තෝරා ගැනීමකින් සහ කොන්දේසියකින් තොරව කුසගිනි දැනෙන ඕනෑම පුද්ගලයෙක් වෙනුවෙන් උණුසුම් ආහාරවේලක් ලබාදීම තමයි අපේ ආයතනයේ බලාපොරොත්තුව. මේ සත්ක්‍රියාවේදී සර්වෝදය සභාපතිතුමා වින්ද්‍යා ආරියරත්න මහතාට "SL work යූ ටියුබ් චැනලයේ හිමිකරු බෘනෝ මහතාට මෙන්ම පළමු වැඩසටහන් දිනයේ ස්වෙච්ඡාවෙන් සහභාගි වී ශ්‍රම දායකත්වය ලබාදුන් අරගල භූමියේ තරුණ පිරිසටත් විහාරස්ථාන දායක සභාවත් ඉතාමත් ස්තුතිපූර්වකව සිහිපත් කරනවා.''

මිනිසා වෙනුවෙන් මිනිසා උදෙසාම නිර්මාණය වූ සහයෝගිතා මුළුතැන්ගෙය පිළිබඳව කරුණු සොයා ගිය ගමනේ අපේ ඊළඟ නවාතැන්පළ වුණේ මේ සංකල්පය මුල්මවරට ක්‍රියාත්මක වූ අබේසිංහාරාම විහාරස්ථානය. එහිදී පංචිකාවත්ත අබේසිංහාරාම විහාරස්ථානාධිපති, කොළඹ නව කෝරලේ උප ප්‍රධාන සංඝ නායක, මරදාන සංඝරාජ මහා විද්‍යාලයේ විශ්‍රාමලත් විදුහල්පති, මැද කොළඹ ශාසනාරක්ෂක මණ්ඩලයේ ප්‍රධාන ලේඛකාධිකාරී පූජ්‍ය මේධංකර ස්වාමීන් වහන්සේ මේ වැඩසටහන සම්බන්ධයෙන් මෙලෙස අදහස් දැක්වූහ.

''සින්ගියුලාරිටි ශ්‍රී ලංකා සහ සර්වෝදය යන ආයතන හා එක්වෙලා විහාරස්ථාන දායක සභාවේ ශ්‍රම දායකත්වයෙන් ආරම්භ කළ සහයෝගිතා මුළුතැන්ගෙය පසුගිය දිනක ඉතාමත් සාර්ථක අයුරින් පැවැත්වුවා. ඒ ගැන මට තියෙන්නේ විශාල සතුටක්. කුසගින්න කුමන ආගමක කුමන ජනවර්ගයක කුමන වයස් සීමාවක වර්ග කිරීමකින් තොරව පොදුවේ මිනිසාට දැනෙන හැඟීමක්. කිසිදු කොන්දේසියකින් තොරව උණුසුම් ආහාර වේලකින් කුසගිනි නිවන්නට ලැබේනම් එය මහත් පුණ්‍ය කර්මයක්. එවන් සත්ක්‍රියාවක් උදෙසා මටත් විහාරස්ථාන දායක සභාවටත් සහභාගිවීමට ලැබීම ඉතාමත් භාග්‍යයක්.''

මෙම වැඩසටහන වෙනුවෙන් විහාරස්ථානයට ලබා දිය හැකි සම්පූර්ණ සහයෝගය ලබාදුන් බවත් ඉදිරියේදීත් සතිපතා මෙම වැඩසටහන විහාරස්ථාන භූමියේදී සිදුකරන බවත් විහාරාධිපති හිමියෝ සිහිපත් කළහ.

## ● ශ්‍රී ලංකාවේ ආරම්භය මරදානෙන්....

පංචිකාවත්ත අබේසිංහාරාම විහාරස්ථානය, ග්‍රෑන්ඩ්පාස් සෙන්ජෝසප් දේවස්ථානය, වැල්ලම්පිටිය මුස්ලිම් දේවස්ථානය යන ස්ථානවල සතියට දින තුනක් නාගරික ප්‍රජාව වෙනුවෙන් උණුසුම් ආහාර වේල් අවම වශයෙන් 5000 ක ප්‍රමාණයක්වත් ලබාදීම සින්ගියුලාරිටි ශ්‍රී ලංකා ආයතනයේ බලාපොරොත්තුවයි.

ලාංකික අපි සංග්‍රහය සහ පරිත්‍යාගය යන මානුෂීය ගුණාංගවලින් පිරිපුන් ජාතියක් බව අමුතුවෙන් කිව යුතු නැහැ. මේ ගෙවෙන්නේ අපි එකිනෙකාට උදව් කරගත යුතුම කාලයක්. කොළඹින් පටන්ගත් සහයෝගිතා මුළුතැන්ගෙය රට පුරාම ආරම්භ වන්නේ නම් මේ මොහොතේ සමස්ත රට වැසියන්ට එයින් ලැබෙන සහනය වචනයෙන් විස්තර කර නොහැකි තරම්. ඒ වෙනුවෙන් උදව් කරන්න අපේම මිනිසුන් අනිවාර්යෙන්ම ඉදිරිපත් වෙනවා.

ශක්තිමත් හිත් කීපයක මූලිකත්වය ගැනීම විතරයි අවශ්‍ය වෙන්නේ. සහයෝගිතා මුළුතැන්ගෙය රටටම ආදර්ශයක් සපයමින් ඒ වැඩසටහන මූලික අදියර ආරම්භ කරලා අවසානයි.

දිස්ත්‍රික්ක මට්ටමින් නගර මට්ටමෙන් රට පුරාම ඇති හැකි මිනිසුන්ට නැති බැරි මිනිසුන්ට උදව් කරන්න දැන් අවස්ථාවක් ලැබිලා තියෙනවා. මේ ගෙවෙන්නේ මිනිස්සුන්ට මිනිසුන්ගේ උදව් අවශ්‍යම කාලයක්. මේ දුෂ්කරම කාලය ඇතුළේ අපේම මිනිස්සු වෙනුවෙන් අපි එකතු වුණොත් අපේ සමාජයට, රටට වගේම මුළු ලෝකයටම ආදර්ශයක් සපයන්න අපිට නැවතත් අවස්ථාවක් ලැබෙනවා. කොහොම වුණත් අපේම මිනිසුන් සිය දහස් ගණනක් අපේ උදව් ලැබෙනකම් ගම්වල නගරවල බලාගෙන ඉන්නවා කියලත් අපි නැවත වතාවක් සිහිපත් කරනවා.

● කුමාරි ඉරුගල්බංඩාර - තනූජා සමරවික්‍රම

## විදුලි මහපුටු දැල්වෙයි ...

**අකාර්යක්ෂමතාව දැයි සෙවීම සඳහා වහාම සේවක කාර්ය සාධනයක් හා විද්‍යාත්මක විගණනයක් සිදු කළ යුතු යැයි ලංවීම තාක්‍ෂණික ඉංජිනේරු හා අධිකාරි සංගමයේ සභාපති ඒ. ජී. යූ. නිශාන්ත මහතා ''දිවයින' ඉරිදා සංග්‍රහයට පැවසීය.**

මේ වනවිට විදුලිබල මණ්ඩලයේ ඉංජිනේරුවන් මසකට ලබන වැටුප් හා දීමනා සම්බන්ධයෙන් සමාජ මාධ්‍යවල දැඩි කථා බහට ලක්ව ඇතැයි ද විදුලිබල මණ්ඩලයේ මේ සා විශාල පාඩුවට සැබෑ හේතුව දැන ගැනීමට ජනතාවට අයිතියක් තිබෙන්නේ යැයි ද ඒ මහතා කීය.

ඉකුත් වසරක කාලයේ දී පමණක් විදුලිබල මණ්ඩලය රුපියල් කෝටි දස දහසක පමණ වාඩුවක් ලබා ඇත්තේ වැඩි වියදම් සහිත විදුලි බලාගාර නිසා නම් අඩු වියදම් බලාගාර ඉදි නොකළේ කවුරුන්ද යන්නත් හා ඊට වග කිවයුතු පාර්ශ්ව රටයට හෙළි කළ යුතු බවද ඒ මහතා කීය.

2019 වසරේ අභියාචනාධිකරණය ලබාදුන් තීන්දුවක්ද නොතකා විදුලිබල මණ්ඩලයේ ඉංජිනේරුවන් සියයට 130කින් ඔවුනගේ මූලික වැටුප ඉහළ දමාගත් බවත් ඇතැම් අය තනතුරු මත විවිධ දීමනා වරප්‍රසාද ලබාගනිමින් සිටින්නේ රාජ්‍ය ප්‍රතිපත්ති ද නොතකා හරිමින් බවත් නිශාන්ත මහතා කියා සිටියේය.

විදුලිබල මණ්ඩලයේ නිලධාරීන්ට සියයට 65කට වඩා දීමනා හා වරප්‍රසාද ලබාගැනීමට නොහැකි වුවත් ඇතැම් උසස් නිලධාරීන් අති විශාල දීමනා ලබාගන්නා බව හෙළිවී ඇතැයි ද ඒ මහතා කීය.

වැඩි මිලට නිපදවන විදුලි ඒකක, ඊට වඩා අඩු මිලකට පාරිභෝගිකයන්ට විකිණීම නිසා මණ්ඩලය වසර හතකදී කෝටි හතළිස් දහසක් පාඩු ලැබුවේද යන්න සෙවීමට හැකි බවද ඒ මහතා පැවසීය.

එනිසා විදුලිබල මණ්ඩලයේ සිටින විසිපන්දහසක් පමණ වන සේවක පිරිස පිළිබඳ කාර්ය සාධකයක් කර විද්‍යාත්මක විගණනයක් මගින් මණ්ඩලයේ සැබෑ පාඩුවට හේතුව සොයා ඊට වගකිවයුතු නිලධාරීන් සිටීනම් ඔවුනට එරෙහිව පියවර ගතයුතු බවද ඒ මහතා කීය.

මණ්ඩලයේ සේවකයන්ට 2014 දක්වා ජීවන අංකයට අදාළව වැටුප් වැඩිවීමක් ක්‍රියාත්මක කළත් 2015 දී එය අහෝසි කොට වසර තුනකට වරක් වැටුප් වැඩිවන ක්‍රමවේදයකට සාමූහික ගිවිසුමක් අත්සන් කළ බවද ඒ මහතා කීය. මෙනිසා ආයතනයේ පහළ හා ඉහළ සේවකයන් අතර විශාල වැටුප් විෂමතාවක් නිර්මාණය වූ බවද ඔහු සඳහන් කළේය.

අඩු වියදම් සහිත බලාගාර ඉදි නොකිරීමට විදුලි පාරිභෝගිකයන් වගකිවයුතු නැති බවත් මේ මොහොතේ සියයට තුන්සියයක් විදුලි ගාස්තු ඉහළ දමා ආයතනයේ වැරදි කළමනාකරණය ජනතාව මත පැටවීම නොකළ යුතු බවත් නිශාන්ත මහතා කීය.

ඒ ඒ ආණ්ඩු ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිසම පුනර්ජනනීය බලාගාර ඉදි නොකර විදුලිබල මණ්ඩලය විනාශ වූ පසු ඒ පව් ජනතාව මත දැමීම අනුමත කළ නොහැකි බවද කී නිශාන්ත මහතා විදුලි පාරිභෝගික ජනතාව වෙනුවෙන් දිවා රෑ කටයුතු කරන විදුලි සේවකයන්ට වඩා ඉහළ නිලධාරින්ගේ අකාර්යක්ෂමතාව මේ තත්ත්වයට හේතු වී ඇතැයි ද ඒ මහතා කීය.

## ඩෙංගු රෝගීහු...

**ශීඝ්‍ර වර්ධනයක් දක්නට ඇතැයි ජාතික ඩෙංගු මර්දන ඒකකයේ අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර මහතා 'දිවයින' ඉරිදා සංග්‍රහය' ට පැවසීය.**

එබැවින් තම නිවාස, පාසල්, ආගමික ස්ථාන, වැඩබිම් පරිශ්‍රයන් අනිවාර්යයෙන් පවිත්‍ර කරගන්නැයි ඒ මහතා ජනතාවගෙන් ඉල්ලා සිටියේය.

ගතවූ මාස 5 යි දින 10 ක කාලය තුළදී දිවයිනෙන්ම ඩෙංගු රෝගීන් 27,000 කට අධික සංඛ්‍යාවක් වාර්තා වන බවද හෙතෙම සඳහන් කළේය.

වැඩිම ඩෙංගු රෝගීන් සංඛ්‍යාවක් වාර්තාවනුයේ බස්නාහිර පළාතෙන් බවත්, එය සියයට 50ක ප්‍රමාණයක් බවත් හෙතෙම කියා සිටියේය.

පැය 24 කට වඩා උණ, හිසරදය ඇත්නම් ළඟම වෛද්‍යවරයකු හමුවට යොමුවන ලෙසත් පැරසිටමෝල් හැර වෙනත් ඖෂධ ලබානොගන්නා ලෙසත් ඒ මහතා ජනතාවගෙන් ඉල්ලා සිටියේය.

ඩෙංගු මදුරු කීටයන් බෝවිය හැකි පොල්කටු, යෝගට් කෝප්ප, නිවසේ වැහි පිහිලි හා ජලය එක්රැස්වන ස්ථාන විනාශ කර දමන්නැයිද ඒ මහතා ජනතාවගෙන් ඉල්ලා සිටියේය.

## රාජ්‍ය අනුග්‍රහය දෙනවා නම්...

**සපුරාදීමට තමන් සූදානම් බව පරිසර හිතකාමී පොහොර නිෂ්පාදකයන්ගේ සංගමයේ සභාපති ශම්මි කිරින්දේ මහතා සඳහන් කළේය.**

වැඩිදුරටත් අදහස් දැක්වූ සභාපතිවරයා කියා සිටියේ දැනටමත් යල කන්නයට අවශ්‍ය පොහොර අවශ්‍යතාවය වන මෙට්‍රික් ටොන් තුන්ලක්ෂ පහළොස්දහසෙන් මෙට්‍රික් ටොන් දෙලක්ෂ විසිපන්දහසක් රජයේ පොහොර ලේකම් කාර්යාලය හරහා බෙදා දී ඇති බවත් තවත් මෙට්‍රික් ටොන් අනූදහසක් බෙදාහැරීමට නියමිතව ඇති බවත්ය. බෙදා දුන් පොහොරවලට අයවිය යුතු රුපියල් බිලියන 15ක ප්‍රමාණයෙන් අවම තරමින් රුපියල් බිලියන 10ක්වත් කඩිනමින් රජය මගින් ලබා දෙන්නේ නම් යල කන්නයේ වගා කටයුතු සඳහා හිඟයකින් තොරව පරිසර හිතකාමී පොහොර සපයා දිය හැකි බව ද හෙතෙම පැවසීය. පොහොර පිළිබඳව ගොවි ජනතාවට අනවශ්‍ය බියක් ඇති නොකර ගන්නා ලෙසද, පහසුකම් සපයා දෙන්නේ නම් රටේ සියලු පොහොර අවශ්‍යතාව තමන්ට කඩිනමින් සපුරා දිය හැකි බව ද සභාපතිවරයා මෙහිදී සඳහන් කළේය.

## 'ජීවන බර අඩුකරනු'...

**මෙම මස 15 වැනිදා සිට විරෝධතා මාලාවක් ආරම්භ කරන බව වෘත්තීය සමිති මධ්‍යස්ථානය පවසයි.**

මෙහිදී 'ජීවන බර අඩුකරනු', 'සේවක දීමනා කප්පාදුව නවතනු', 'ජාතික සම්පත් විකිණීම නවතනු', 'රැකියා අහිමි නොකරනු', 'ආණ්ඩුවේ මර්දනය නවතනු', 'විසඳුම් නොදෙන ගෝඨා-රනිල් ආණ්ඩුව ගෙදර යනු', ආදී සටන් පාඨ ඔස්සේ විරෝධතා මාලාව වැඩබිම් මට්ටමින් ක්‍රියාත්මක කරන බව එම මධ්‍යස්ථානයේ සම කැඳවුම්කරු වසන්ත සමරසිංහ මහතා 'දිවයින ඉරිදා' සංග්‍රහයට පැවසීය.

පවුලක් විසින් රටම බංකොලොත් තත්ත්වයට පත්කර ඇති බවත් ඉන් නොනැවතී පොහොර ප්‍රශ්නයක් ඇති කර වත්මන් පාලකයන් ජනතාවට සාගතයක් ඇතිකර ඇති බවත් ඒ මහතා කීය. තවදුරටත් මේ ආකාරයෙන් වත්මන් පාලකයන්ට රට පාලනය කරගෙන යෑමට ඉඩදිය නොහැකි බවත් ඔවුන් ඉවත්වී ජනතාවට සහන දිය හැකි නව පාලනයක් බිහිකර ගැනීමට අවස්ථාව ලබාදිය යුතු බවත් කියමින් ජූලි මස සිට රට පුරා දැවැන්ත විරෝධතා පවත්වන බවත් සමරසිංහ මහතා වැඩිදුරටත් පැවසීය.



• 2048 වෙනකොට රට සංවර්ධනය කරනවා කියලා

අගමැති රනිල් කියන්නේ...!

• ආවේ පැය 48 න් ගොඩදානවා කියලා නේද...?

## පොසොන් පෝදා සිතුල්පව්ව...

පොසොන් දින වාර්ෂික ආලෝක පූජාව 35 වැනි වසරටත් උපාලි සමූහ ව්‍යාපාරයේ අනුග්‍රහයෙන් පැවැත්වේ.

මෙවර පොසොන් උත්සවය සිතුල්පව්ව රජමහා විහාරයේ විහාරාධිපති ශාස්ත්‍රපති පණ්ඩිත මැටරඹ හේමරතන නාහිමිපාණන්ගේ අනුශාසකත්වයෙන් සංවිධානය කර තිබේ.

පොසොන් පෝදා සවස ආලෝක පූජාව සිතුල්පව්ව දායක සභාවේ උප සභාපති ධම්මික ආටිගල සහ උපාලි සමූහ ව්‍යාපාරයේ කළමනාකාර අධ්‍යක්ෂ නිමල් වෙල්ගම යන මහත්වරුන් විසින් සංවිධානය කරනු ලබති.

දාන, ශීල, භාවනා සහ දන්සල් ආදී ආගමික උත්සව රැසක් මෙම වාර්ෂික පොසොන් උත්සවයේදී සංවිධානය කර තිබේ.

## අයි. එම්. එෆ්. නියෝජිතයෝ 20 වැනිදා දිවයිනට

ශ්‍යාම් නුවන් ගනේවත්ත

**මෙරටට මූල්‍ය පහසුකමක් ලබාගැනීමේ ක්‍රියාවලියේ ඉදිරි සාකච්ඡා සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජිතයන් ලබන 20 වැනි දින ශ්‍රී ලංකාවට පැමිණීමට නියමිතය.**

මේ සාකච්ඡාවලින් පසු මේ මස අග වනවිට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග කාර්ය මණ්ඩල මට්ටමේ එකඟ වනු ඇතැයි බලාපොරොත්තු වන බව මුදල් ඇමැති හා අගමැති රනිල් වික්‍රමසිංහ මහතා පැවසීය.

මේ වනවිට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ප්‍රථම වටයේ තාක්‍ෂණික සාකච්ඡා මාර්ගගත ආකාරයෙන් පවත්වා අවසන් කර ඇති අතර එහි ඉදිරි පියවර වශයෙන් මෙසේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජිත පිරිස ලබන 20 වැනි දින මෙරටට පැමිණීමට නියමිතව ඇත.

මෙසේ මූල්‍ය පසුකමක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබාගැනීමේදී විදේශ ණය තිරසාරත්වය පිළිබඳ සහතික වීමක්ද එම අරමුදලට අවශ්‍ය වන අතර ඒ සඳහා දැනට ගෙවීම අත්හිටුවා ඇති විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීම අත්‍යවශ්‍ය වේ.

## පාසල් වෑන් - පෞද්ගලික බස් ධාවනය වන්නේ 20% යි

### පාසල් ළමුන් ප්‍රවාහන සේවා සංගමය

ප්‍රදීප් ප්‍රසන්න සමරකෝන්

**පවතින ඩීසල් හිඟය නිසා දෛනිකව ධාවනය වන පාසල් වෑන් රථ සහ පෞද්ගලික බස් රථ සංඛ්‍යාව සියයට 20 දක්වා පහත බැස ඇතැයි සමස්ත ලංකා අන්තර් දිස්ත්‍රික් පාසල් ළමුන් ප්‍රවාහන සේවා සංගමයේ සභාපති එන්. එම්. කේ. හරිස්චන්ද්‍ර පද්මසිරි මහතා 'දිවයින' ඉරිදා සංග්‍රහයට පැවසීය.**

දිවයින පුරා ඇති පාසල් වෑන් රථ සහ පෞද්ගලික බස් රථ සංඛ්‍යාව වන 40,000න් මේ වනවිට දිනකට ධාවනය වනුයේ පාසල් වෑන් රථ 10,000ක් සහ පෞද්ගලික බස් රථ 15,000ක් අතර සංඛ්‍යාවක් බවද හෙතෙම පැවසීය.

ඉන්ධන ගාස්තු වැඩිකිරීම හේතුවෙන් පාසල් වෑන් රථ වල ගාස්තුව සියයට 40 කින් ඉහළ දැමීමත් සමඟ බොහෝ දෙමාපියන් තම දරුවන් පාසල් වෑන් රථ වලින් ඉවත්කර ගනිමින් සිටින බවද පැවසූ ඒ මහතා මෙම තත්ත්වය මත පාසල් වෑන් රථ කර්මාන්තය පවත්වාගෙන යා නොහැකි මට්ටමට ඇදවැටී ඇතැයිද කීවේය.

## මාස්ක් අනිවාර්යය නැතත් සෞඛ්‍ය පුරුදු පිළිපදින්න

### විශේෂඥ වෛද්‍ය හේමන්ත හේරත්

ප්‍රදීප් ප්‍රසන්න සමරකෝන් සහ චමින්ද සිල්වා

**තවමත් මෙරටින් දිනකට කොවිඩ් රෝගීන් 10 ත් 15 ත් අතර සංඛ්‍යාවක් වාර්තාවන බැවින් මුඛ ආවරණ පැළඳීම අනිවාර්යය නොවුණත් සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන් තවදුරටත් අනුගමනය කරන්නැයි නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විශේෂඥ වෛද්‍ය හේමන්ත හේරත් මහතා ජනතාවගෙන් ඉල්ලීමක් කළේය.**

රටේ කොවිඩ් වසංගතයක් පැවතුනු බව මේ වනවිට ජනතාවට අමතක වී ගොස් ඇතැයිද ඒ මහතා කියා සිටියේය.

මෙහිදී තවදුරටත් කතාකළ විශේෂඥ වෛද්‍ය හේමන්ත හේරත් මහතා මෙසේද කීය.

කොවිඩ් තාම ලෝකයෙන්ම තුරන් වෙලා නැහැ. තවමත් අනෙකුත් රටවල් වලින් කොවිඩ් රෝගීන් වාර්තා වෙනවා. ඒ වගේම කොවිඩ් මරණත් වාර්තා වෙනවා. ඒ විතරක් නොවෙයි අපේ රටෙනුත් කොවිඩ් රෝගීන් තාමත් වාර්තා වෙනවා. සමහර අයට කොවිඩ් ගැන දැන් මතකවත් නැහැ. සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අමතක කර දමමින් සමාජයේ කටයුතු කරන ආකාරයක් දකින්නට තිබෙනවා.

මේ නිසා මුඛ ආවරණය පැළඳීම අනිවාර්ය නැතිවුණත් දෑත් සබන් යොදා තත්පර 20 ක් සේදීම, මීටරයක පරතරය තබාගෙන වැඩකටයුතු කිරීම කියන මේ සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද තවදුරටත් අනුගමනය කිරීම ඉතා වැදගත්. ඒ විදිහට කටයුතු කළොත් හැමදෙනාටම කොවිඩ් වලින් ආරක්ෂා වෙන්න පුළුවන්.

## ඉන්දියානු යූරියා මෙට්‍රික් ටොන් 50,000ක් යල කන්නයට

### සහල් අර්බුදයක් ලොකුවට එන්නේ නෑ

අරුණ බෝගහවත්ත

**ඉන්දීය රජය විසින් ලබාදෙන යූරිය පොහොර මෙට්‍රික් ටොන් හැටපන්දහසක ප්‍රමාණයෙන් මෙට්‍රික් ටොන් පනස්දහසක් මෙවර යල කන්නයේ වී ගොවිතැන සඳහා ලබාදීමට රජය තීරණය කර ඇත. ඉතිරි ප්‍රමාණයෙන් මෙට්‍රික් ටොන් දසදහසක් තේ වගාවටත් මෙට්‍රික් ටොන් පන්දහසක් බඩ ඉඟුරු වගාවට ලබාදීමටත් සැලසුම් කර තිබේ.**

මෙවර යල කන්නය සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් වගා කිරීමට සැලසුම් කර ඇති කුඹුරු ප්‍රමාණය හෙක්ටෙයාර් හයලක්ෂ එක්දහස් දෙසිය හැට එකයි දශම හතයි තුනක් වන අතර ඉන් සියයට අනූවක (90%) භූමි ප්‍රමාණයක් මේ වනවිට ගොවි ජනතාව විසින් වගා කිරීමට පියවර ගෙන ඇති බව කෘෂිකර්ම ඇමැති මහින්ද අමරවීර මහතා සඳහන් කරයි.

මැයි මස වනවිට රසායනික පොහොර සහ කෘමි නාශක නොමැතිව ගොවීන් කුඹුරු හෙක්ටයාර් දෙලක්ෂ හැට හය දහස් පන්සියයක ප්‍රමාණයක වගා කටයුතු ආරම්භ කර ඇති බවද ඇමැතිවරයා සඳහන් කළේය.

ඒ අනුව මේ මස අවසන් වනවිට අවශ්‍ය කරන රසායනික පොහොර ලැබීමත් රජය අපේක්ෂිත බිම් ප්‍රමාණයෙන් සියයට අනූවක ප්‍රමාණයක් කුඹුරු වගා කිරීම හේතුවෙන් විශාල සහල් අර්බුදයකට මුහුණ පෑමට සිදු නොවනු ඇති බව ද කෘෂිකර්ම ඇමැතිවරයා වැඩිදුරටත් සඳහන් කළේය.

## ඔය කියන වැටුප් දීමනා...

විදුලිබල ඇමැති කංචන විජේසේකර මහතා 09 වැනිදා පාර්ලිමේන්තුවේදී තමන්ගේ වැටුප් ගැන කී කතාව පිළිබඳ කනගාටු වන බවද ඒ මහතා කීය.

මේ අය ජනතාව නොමග යැවීම සඳහා මෙවැනි කතා කියන බවත් අවශ්‍ය නම් තම වැටුප් වාර්තා බැලීමට හැකි බවද ඉංජිනේරු සංගම් සභාපතිවරයා කියා සිටියේය.

## කොච්චිකඩේ දේවමැදුරේ මංගල්‍යය හෙට

නෝමන් පලිහවඩන

**කිතුනු බැතිමතුන් ඉමහත් බැතියෙන් සමරන කොළඹ කොච්චිකඩේ ශාන්ත අන්තෝනි මුනිතුමාණන්ගේ දේවමැඳුරේ වාර්ෂික මංගල්‍යය හෙට (13 දා) පැවැත්වේ.**

පාස්කු ඉරිදා සිදුවූ බෝම්බ ප්‍රහාරවලින් ජීවිතක්‍ෂයට පත්වූ කිතුනු බැතිමතුන් ඇතුළු පිරිස සිහිපත් කිරීම සඳහා මෙහිදී විශේෂ යැදුම් මෙහෙයන්ද සිදුකෙරේ.

කොළඹ අගරදගුරු මැල්කම් රංජිත් කාදිනල් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් මෙම දේව මෙහෙය සිදුකරනු ලබයි.

## මෙගාවොට් 2700ක පුනර්ජනනීය ව්‍යාපෘති ඇරඹීමට හැකි වෙයි

ශිරාන් රණසිංහ

**ශ්‍රී ලංකා විදුලි (සංශෝධන) කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත කරගත් නිසා මෙගාවොට් 2000ක සුළං සහ මෙගාවොට් 700ක සූර්ය විදුලි ව්‍යාපෘති ආරම්භ කිරීමට හැකියාව ලැබෙන බව ලංකා විදුලිබල මණ්ඩලය කියා සිටියි.**

2009 අංක 20 දරන විදුලි පනත සංශෝධනය කිරීමට අවස්ථා කිහිපයකදී උත්සාහ ගත්තත් විදුලි ඉංජිනේරු සංගමය ඇතුළු ලංවිම වෘත්තීය සමිති ඊට එරෙහිවීම නිසා මෙම ව්‍යාපෘති අතරමග නවතා දමා තිබිණි.

කෙසේ වෙතත් ඉකුත් බ්‍රහස්පතින්දා (9 වැනිදා) මෙම ශ්‍රී ලංකා විදුලි (සංශෝධන) පනත පාර්ලිමේන්තුවේ සම්මත වූ නිසා අවසන් අනුමැතිය ලැබී තිබෙන සූර්ය හා සුළං විදුලි ව්‍යාපෘති කඩිනමින් ආරම්භ කළ හැකි වෙතැයි ලංවිම ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවෝ විශ්වාසය පළකර සිටිති.

## ජිනීවා සමුළුව සඳුදා ඇරැඹෙයි රුසියාව එනවාද යන්න තවම රහසක්

### ඩයස්පෝරා කණ්ඩායම් 10ක් ගිහිල්ලා

කීර්ති වර්ණකුලසූරිය

50 වැනි ජිනීවා මානව හිමිකම් සමුළුව ජූනි 13 වැනි සඳුදා ආරම්භ වෙයි.

රුසියාව මෙම සමුළුවට සහභාගි වන්නේද යන්න ගැන මෙතෙක් වාර්තාවී නැත. බටහිර රටවල් විසින් රුසියාව මානව හිමිකම් සමුළුවෙන් ඉවත් කළ යුතු බව දක්වෙන යෝජනාවක් ගෙන ඒමට ක්‍රියාකරන බවද අනාවරණය වී ඇත. මේ අතර කොටි ඩයස්පෝරා කණ්ඩායම් 10 ක් මේ වනවිට ජිනීවා වෙත පැමිණ තිබේ. ඔවුන් ශ්‍රී ලංකාව තුළ වෙනම රටක් ඇති කළ යුතු බවට දක්වෙන යෝජනාවක්ද මානව හිමිකම් කවුන්සිලය වෙත යෝජනා කර ඇත.

## සඳුදා රජයේ විශේෂ නිවාඩු දිනයක්

චමින්ද සිල්වා

ලබන 14 වැනිදාට යෙදී ඇති පොසොන් පොහොය නිමිත්තෙන් ප්‍රකාශයට පත් කර ඇති රජයේ නිවාඩු දිනයට අමතර 13 වැනිදා සඳුදා දිනය ද රජයේ නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇත.

ඒ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ලලිත් රෝහණ ලියනගේ මහතා නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුව රටේ පවතින ප්‍රවාහන අපහසුතා සහ විදුලිය ගැටලු සැලකිල්ලට ගෙන මෙම විශේෂ නිවාඩු දිනය ප්‍රකාශයට පත්කර තිබේ.

කෙසේ වෙතත් මෙම නිවාඩු නිසා රජයේ අත්‍යවශ්‍ය සේවාවන් පවත්වාගෙන යෑමට බාධාවක් නොවිය යුතු බවද ලේකම්වරයා සඳහන් කරයි.

## ඩීසල්-පෙට්‍රල් සපයනතුරු ලීසිං සහනයක් දෙන්න

### ලීසිං හා ණය වාරික ගෙවන්නන්ගේ ඒකාබද්ධ සංගමය

චමින්ද සිල්වා

**ඩීසල්, පෙට්‍රල්, ගෑස් ගැටලුවකින් තොරව ලබාගැනීමට හැකිවන තුරු වාහන ලීසිං හා ණය ගෙවීමේදී සහනයක් ලබාගැනීම ඇතුළු ඉල්ලීම් 5කට විසඳුම් ඉල්ලා ලීසිං හා ණය වාරික ගෙවන්නන්ගේ ඒකාබද්ධ සංගමය ශ්‍රී ලංකා මහ බැංකුව සහ අගමැති රනිල් වික්‍රමසිංහ මහතා වෙත ලිපි ඉදිරිපත් කර තිබේ.**

2020 අප්‍රේල් 04වැනි දා දින මහ බැංකුව විසින් රටේ ජනතාවගෙන් අයකරන සියයට 11.5ට අමතර පොලිය නැවත සංශෝධනය කිරීම 2022 දෙසැම්බර් 31 දක්වා වාහන අත්පත් කරගැනීම නැවැත්වීම, ඩීසල්, පෙට්‍රල්, ගෑස්, ගැටලුවකින්තොරව ලබාගැනීමට හැකිවන තුරු ණය ගෙවීමේදී සහනයක් ලබාදීම වැඩිකරන ලද ස්ථාවර තැන්පතුවලට අදාළ පොලිය නැවත අඩුකර ණය වාරික සඳහා වැඩි කළ පොලිය අඩු කිරීම ජනතාවට අහිතකර 2000 අංක 56/1990 අංක 02/1990 අංක 04 දරන පනත් සංශෝධනය කිරීම එම ඉල්ලීම් අතර වෙයි.

ලීසිං සමාගම් විසින් අසීමිත ලෙස පොලී වාරික වැඩි කිරීම ඇතුළු පනවා තිබෙන බැඳීම් නිසා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් මෙන්ම සාමාන්‍ය ජනතාව ද දැඩි ලෙස අසරණ භාවයට පත්ව ඇතැයි ද එම සංගමයේ මාධ්‍ය ලේකම් අසංක සුමේධ අමරසිංහ මහතා කියා සිටී. මේ පිළිබඳව ලිඛිතව යෝජනා යොමුකර ඇති බව ද හෙතෙම පවසයි.

## උසාවි නියෝගයටත් උඩින් සීසර්ලා වැඩ

### නීතිඥ සඳරුවන් සේනානායක

චමින්ද සිල්වා

**ලීසිං වාරික ගෙවීම ප්‍රමාදවන වාහන ලීසිං සමාගම්වලට බලහත්කාරයෙන් ලබාගත නොහැකි බව අධිකරණය මගින් නියෝග ලබාදී තිබියදීත් ලීසිං සමාගම් විසින් වාහන බලහත්කාරයෙන් අත්පත් කර ගැනීම් සිදුකරන බව නීතිඥ සඳරුවන් සේනානායක මහතා පවසයි.**

ඒ මහතා වැඩිදුරටත් මෙසේද කීය. 2000 අංක 56 දරන කල්බදු මූල්‍ය කරන පනත මගින් වාහනයක් බලෙන් ගන්න බැහැ. කැමැත්ත තියෙනවා නම් පමණයි ගන්න පුළුවන් කියලා තියෙනවා. එහෙම කැමැත්තක් නැතිව වාහනයක් ගන්න ක්‍රමයක් ගැන මේ පනතේ කිසිම තැනක ඇතුළත් වෙලා නැහැ. වාහනයක් ලීසිං සමාගමට ලබාගත හැක්කේ අදාළ ප්‍රදේශයේ දිසා අධිකරණයේ හෝ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් පැවරීමෙන් බව පනතෙන් පෙන්වා දී තිබෙනවා. එම පනත මගින් තමන්ගේ අයිතිවාසිකම අධිකරණයේදී පෙන්වලා වාහනය ලබාගන්න හැකි බව පෙන්වා දී තිබෙනවා. ඒ වගේම යම් හෙයකින් වාහනයක් අත්පත් කර ගන්නවා නම් ප්‍රචණ්ඩත්වයෙන් තොරව ලීසිං සමාගමේ හෝ ආයතනයේ නිසි බලධාරියෙකුට හැකියාව පවතිනවා. එහෙම කරනවා නම් අදාළ ප්‍රදේශයේ පොලිසියේ පැමිණිල්ලක් දාලා තිබිය යුතුයි.

## නම මැකොට

චමින්ද සිල්වා

**ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජාතික සංවිධායක හිටපු ඇමැති බැසිල් රාජපක්ෂ මහතා පාර්ලිමේන්තු ධුරයෙන් ඉවත් වීමෙන් පසු ඇතිවූ පුරප්පාඩුව සඳහා ප්‍රකට ව්‍යාපාරික ධම්මික පෙරේරා මහතාගේ නම ඇතුළත් කරමින් ගැසට් නිවේදනයක් නිකුත් කිරීමට මැතිවරණ කොමිසම ඊයේ (10 දා) කටයුතු කර ඇත.**

බැසිල් රාජපක්ෂ මහතා ඉවත් වීමෙන් පසු එම පුරප්පාඩුව සඳහා ධම්මික පෙරේරා මහතා පත් කරන ලෙස ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ලේකම් සාගර කාරියවසම් මහතා ඊයේ (10 දා) මැතිවරණ කොමිසමෙන් කරන ලද ඉල්ලීමකට අනුව මෙම ගැසට් නිවේදනය නිකුත් කර තිබේ. ධම්මික පෙරේරා මහතා ඔහුට අයත් සියලු සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල තනතුරුවලින් ද ඉවත් වීමට ඊයේ (10 දා) තීරණය කර තිබිණි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස ධම්මික පෙරේරා මහතා පත් කිරීමෙන් පසු ඒ මහතාට ආයෝජනයට සම්බන්ධ ප්‍රබල ඇමැති ධුරයක් ලැබීමට නියමිත බවද දේශපාලන ආරංචි මාර්ග සඳහන් කළේය.

## පොහොට්ටුව නෙළාගනී

ශ්‍යාම් නුවන් ගනේවත්ත,චමින්ද සිල්වා

ප්‍රකට ව්‍යාපාරික ධම්මික පෙරේරා මහතා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සාමාජිකත්වය ලබාගෙන ඇත.

ඡායාරූපයෙන් දැක්වෙන්නේ ධම්මික පෙරේරා මහතා ඊයේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මහලේකම් සාගර කාරියවසම් මහතා අතින් පසුගියදා එම පක්ෂයේ සාමාජිකත්වය ලබාගත් අයුරුයි. හිටපු මුදල් ඇමැති බැසිල් රාජපක්ෂ මහතා ඉල්ලා අස්වීමෙන් හිස් වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජාතික ලැයිස්තු මන්ත්‍රී පුරප්පාඩුව සඳහා ධම්මික පෙරේරා පත්වීමට නියමිතය.

## තාක්ෂණ හා ආයෝජන ප්‍රවර්ධන ඇමැති ධුරය ?

චමින්ද සිල්වා

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජාතික සංවිධායක බැසිල් රාජපක්ෂ මහතා පාර්ලිමේන්තු මන්ත්‍රි ධුරයෙන් ඉවත්වීම නිසා ඇතිවූ ජාතික ලැයිස්තු මන්ත්‍රීධුර පුරප්පාඩුවට පත්කළ ප්‍රකට ව්‍යාපාරික ධම්මික පෙරේරා මහතාට අලුතින් පිහිටුවනු ලැබූ තාක්ෂණ හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය ලැබීමට නියමිත බව වාර්තාවේ.

එම අමාත්‍ය ධුරය මෙරට ආර්ථිකය යහපත් අතට රැගෙනයෑම සඳහා මුල්වන ආයෝජන ප්‍රවර්ධන ඇතුළු ආයතන රැසක් හිමිවන ලෙස පිහිටුවා ඇත. බැසිල් රාජපක්ෂ මහතා ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරයෙන් ඉවත්වීමෙන් පසු ධම්මික පෙරේරා මහතා පත්කරන ලෙස ශ්‍රී ලංකා පොදු පෙරමුණේ ලේකම් සාගර කාරියවසම් මහතා මැතිවරණ කොමිසමෙන් කළ ඉල්ලීමකට අනුව ඒ මහතාගේ නම ඇතුළත් කරමින් ගැසට් පත්‍රයක් මුද්‍රණය කිරීමට ද මැතිවරණ කොමිසම කටයුතු කර තිබේ.

## සමාගම්වල තනතුරුවලින් අස්වෙයි

ශ්‍යාම් නුවන් ගනේවත්ත

**ප්‍රකට ව්‍යාපාරික ධම්මික පෙරේරා මහතා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස පත්වීම සඳහා ඔහු දැනට දරමින් සිටින සියලුම සමාගම් අධ්‍යක්ෂ ධුරවලින් ඉවත්වීමට තීරණය කර ඇතැයි වාර්තා වේ.**

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සාමාජිකත්වය ලබා සිටින ධම්මික පෙරේරා මහතා එම පක්ෂයේ ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට පත්වීමට නියමිතය. ඔහු සිය සමාගම් අධ්‍යක්ෂ ධුරවලින් ඉවත්වන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස පත්වීමට ඇති නීතිමය බාධා ඉවත්කර ගැනීමටය.

ශ්‍රී ලංකාවේ දැවැන්ත ලැයිස්තු ගත සමාගම් සමූහ දෙකක් වන වැලිබල් වන් හා හේලීස් සමාගම්වල පාලක කොටස් හිමිකාරිත්වය ධම්මික පෙරේරා මහතා සතුය. මේ සමාගම් සමූහ දෙක යටතේ අනුබද්ධ සමාගම් රැසක් පාලනය වේ.

## රන්ජන් නිදහස් කරන්න

### මැති ඇමැතිවරු ජනපතිට කියයි

නෝමන් පලිහවඩන

**රන්ජන් රාමනායකට ජනාධිපති සමාව ලබාදී ඔහු බන්ධනාගාරයෙන් නිදහස් කරගැනීම සඳහා ආණ්ඩුවේ මැති ඇමැතිවරු පිරිසක් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට කරුණු ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත.**

රන්ජන් රාමනායක මහතා බන්ධනාගාර ගතවීම හේතුවෙන් ඔහු රඟපාන සිනමා නිර්මාණ කීපයක්ම රූගත කිරීම් නතර කර ඇති බවට කලා ශිල්පීන් රැසක් දැනුම්දීම හේතුවෙන් මැති ඇමැතිවරුන් පිරිසක් ජනාධිපතිවරයාට කරුණු ඉදිරිපත් කිරීමට මෙසේ පියවර ගෙන තිබේ.

අධිකරණ ඇමැති විජේදාස රාජපක්ෂ මහතා පාර්ලිමේන්තු මන්ත්‍රී ගීතා කුමාරසිංහ මහත්මිය ඇතුළු මැති ඇමැතිවරුන් පිරිසක් රන්ජන් නිදහස් කරගැනීමට ගන්නා උත්සාහයට මුල්වී ක්‍රියා කරති.

## සාම විනිසුරු පදවි ලබයි



සමාජ සේවක, දේශශක්ති, දේශබන්දු ඒ. ඩී. එච්. ස්මයිල් මහතා මුළු දිවයිනටම සාමදාන විනිසුරුවරයකු ලෙස පසුගියදා කොළඹ දිසා උසාවියේ දිසා විනිසුරු ආර්. එම්. ඔගස්ටා අතපත්තු මහතා ඉදිරියේ දිවුරුම් දුන්නේය.

ස්මයිල් මහතා සමාජ සේවකයකු ලෙස වසර ගණනාවක සිට කටයුතු කරයි.

## මීළඟ ඡන්දයේදී රාජපක්ෂලාට මොකද වෙන්නේ උදයංගගේ කතාව නාලිකාවේ

divaina.lk

දිවයින Online

ඉදිරි මැතිවරණයකදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ඉරණම සහ එහිදී රාජපක්ෂවරුන්ට ජනතාවගෙන් ලැබෙන ප්‍රතිචාර සම්බන්ධව රුසියාවේ හිටපු තානාපති උදයංග වීරතුංග මහතා විශේෂ අනාවරණයක් 'දිවයින' ඔන්ලයින් යූටියුබ් නාලිකාව වෙත සිදු කළේය.

එහිදී ඒ මහතා සිදුකළ ආන්දෝලනාත්මක තොරතුරු සවිස්තරාත්මකව දැන ගැනීමට Divaina Online Youtube නාලිකාවට පිවිසීමෙන් හැකිය.

## බියගම මූලික රෝහලට තෑග්ගක්



බියගම මූලික රෝහලේ අඩුපාඩුවක් සම්පූර්ණ කරමින් ශ්වසන යන්ත්‍රයක් භාරදීමේ චාම් උත්සවයක් රෝහලේ වෛද්‍ය අධ්‍යක්ෂිකා පඬුවාවල මහත්මියගේ ප්‍රධානත්වයෙන් සිදු විය. මියගිය දෙමව්පියන් සිහිකර ගේල්ස්බර්ග් රොටරි සමාජයේ මේරි බර්ගලන්ඩ් පවුලේ අය සමග හේරත් පවුල්වල අය මෙම ඔමොරෝන් 900 වර්ගයේ ශ්වසන උපකරණය භාර දුන්නේය. රෝහලේ වාට්ටු කීපයකටම ලොකු අඩුවක් සපුරාලීම ගැන පඬුවාවල මහත්මිය තම කෘතඥතාව පුද කළාය. කොට්ටුන්න පාරේ පදිංචි ඩී. එස්. සී. හෙට්ටිආරච්චි මහතා, එම මහත්මිය හා පුතණුවන් රෝහල් කාර්යමණ්ඩලය සමග රුපියල් ලක්ෂයක් පමණ වටිනා මෙම උපකරණය භාරදුන් මොහොත මෙහි දැක්වේ.



# රංචු ගැසී 'දූෂණය' කළ ශ්‍රී ලංකාව

**රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් ප්‍රියන්ත මායාදුන්න දේශද්‍රෝහීන් ලෙස කණ්ඩායම් තුනක් නම් කර ඇත. රටේ මූල්‍ය තත්ත්වය ව්‍යසනකාරී ලෙස පිරිහී ඇති තත්ත්වයක් යටතේ අත්‍යවශ්‍ය එලෙසම තව දුරටත් ප්‍රමාද කළ නොහැකි ආර්ථික - දේශපාලනික - සමාජීය ප්‍රතිසංස්කරණ කළ යුතු බව එතුමා අවධාරණය කර ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මැදිහත් වන තුරු ආණ්ඩුව බලා සිටිය යුතු නැත. අවශ්‍ය ප්‍රතිසංස්කරණ වහා ක්‍රියාත්මක කිරීමට කටයුතු නොකරන දේශපාලන පක්ෂ සහ එම ක්‍රියාවලියට විරුද්ධ වන වෘත්තීය සමිති සහ සිවිල් සංවිධාන දේශ ද්‍රෝහීන් ලෙස ජනතාව හඳුනා ගන්නා බවට කළ ප්‍රකාශය පාර්ලිමේන්තුවේ අවධානයට යොමු විය යුතුය. ආණ්ඩුවට ගැළපෙන ආකාරයේ 21 වන ව්‍යවස්ථා සංශෝධනයක් නීතිගත කිරීමෙන් වර්තමාන අර්බුදකාරී තත්ත්වය සමනය කළ නොහැකිය. ආණ්ඩුවට සහ විපක්ෂයට මායාදුන්න මහතා මතු කළ කරුණු කාරණා සම්බන්ධයෙන් තව දුරටත් අන්ධයන්, ගොළුවන් සහ බිහිරි පුද්ගලයන් ලෙස සිටිය නොහැක. ශ්‍රී ලංකාව තීරණාත්මක අභියෝගයකට මුහුණ දී ඇත. අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියකට වහාම නොගියහොත් ශ්‍රී ලංකාව නැවතත් ගල් යුගයකට යනු ඇත.**

ශ්‍රී ලංකාව නැත්තටම නැති කළ අතිශය විනාශකාරී පක්ෂ දේශපාලන ක්‍රියාවලිය සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ නව ලේකම් නීතිඥ ප්‍රියන්ත මායාදුන්න කළ ආන්දෝලනාත්මක ප්‍රකාශය විධායකයේ, ව්‍යවස්ථාදායකයේ සහ අධිකරණයේ අවධානයට ලක් විය යුතුය.

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා එතුමාව මෙම තනතුරට පත් කිරීමට පෙර අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් ධූරය දැරූ මායාදුන්න පසුගිය වසර 30 දී එජාපය සහ ශ්‍රීලනිපය නායකත්වය දුන් සියලුම ආණ්ඩුවල සැබෑ තත්ත්වය අවධාරණය කළේය. මායාදුන්න මහතා මැයි 28 කොළඹ තැපැල් ශ්‍රවනාගාරයේදී කළ ප්‍රකාශය විමසා බැලිය යුතු වන්නේ මැයි 25 දින ශ්‍රී ලංකා මහා බැංකුවේ ඉහළ නායකත්වය (එහි අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ ඇතුළු) සහ මුදල් අමාත්‍යාංශයේ නව ලේකම් මහින්ද සිරිවර්ධන පොදු ව්‍යාපාර කාරක සභාව ඉදිරියේ කළ හෙළිදරව් ද සැලකිල්ලට ගැනීමෙනි.

වර්තමාන පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම දේශපාලන පක්ෂවල අවධානය මෙම ප්‍රකාශවලට අනිවාර්යයෙන්ම යොමු විය යුතුය. සමස්ත ආර්ථිකය බිංදුවටම බැස්සවූ කණ්ඩායම සම්බන්ධයෙන් ඉතාමත් පැහැදිලි අවබෝධයක් රටට දිය යුතුය.

සමස්ත ජනතාවගෙන් අති බහුතරයක් හිඟමනට පත් කළ ආසන්නතම හේතුව පොදු ව්‍යාපාර කාරක සභාව ඉදිරියේ හෙළිදරව් වී ඇත. වර්තමාන පෝළිම් යුගයේ නිර්මාතෘවරු කවුරුදැයි පාර්ලිමේන්තුවේදීම හෙළි වී ඇත.

ආචාර්ය නන්දලාල් වීරසිංහ, මහින්ද සිරිවර්ධන සහ මුදල් මණ්ඩලයේ සාමාජිකයන් වන ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන සහ ආචාර්ය රාණි ජයමහ ඉතාමත් පැහැදිලිව නිදහසින් පසුව ශ්‍රී ලංකාව මුහුණ දෙන බරපතළම අර්බුදයේ නිර්මාතෘවරුන් ලෙස හිටපු අගමැති මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ, මහ බැංකුවේ අධිපතිවරුන් වන මහාචාර්ය ඩබ්ලිව්. ඩී. ලක්ෂ්මන් සහ අජිත් නිවාඩ් කබ්රාල් සහ එවකට ජනාධිපති ලේකම් ආචාර්ය පී. බී. ජයසුන්දර මත වගකීම පවරා ඇත.

පොහොට්ටු ජාතික ලැයිස්තු මන්ත්‍රී මහාචාර්ය චරිත හේරත් නායකත්වය දෙන පොදු ව්‍යාපාර කාරක සභාවේ දී සමගි ජනබලවේගය නියෝජනය කරන පාඨලී චම්පික රණවක සහ ආචාර්ය හර්ෂ ද සිල්වා කළ ප්‍රශ්න කිරීම හමුවේ චෝදනාවට ලක්වූ මහජන නියෝජිතයන් සහ නිලධාරීන් රට අකර්මණ්‍ය කළ ආකාරය හෙළිදරව් විය. ඒ විනාශකාරී ක්‍රියාදාමය ආරම්භ වන්නේ 2020 මාර්තු -අප්‍රේල් කාලයේදී බව අවධාරණය විය.

නමුත් 2010-2015 ආණ්ඩුවේ ආර්ථික කළමනාකරණ අමාත්‍ය වූ බැසිල් රාජපක්ෂගේ භූමිකාව සහ ඔහු මුදල් ඇමැති ලෙස (ජුලි 2021 - මාර්තු 2021) කටයුතු කළ ආකාරය සම්බන්ධයෙන් අවධානය මෙහිදී යොමු නොවීය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඉදිරියේ හතර ගාතෙන් වැටී සිටින වර්තමාන ආණ්ඩුව 2020 දී එම ආයතනය දුන් උපදෙස් නොසලකා ක්‍රියාකළ බව ඔප්පු වී ඇත. ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ණය වහාම ප්‍රතිව්‍යුහගත කළ යුතු බවට කළ අවවාදය කුණු කූඩයට දැම්මේය. රාජ්‍ය බදු කපා හැරීම කිසිසේත් නොකළ යුතු බවට කළ උපදෙස ද නොසලකා හැරියේය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කළ පළමු අවවාදය ඉවත දැමීමට තීන්දුව ගත්තේ ආචාර්ය ජයසුන්දර බව වර්තමාන මහ බැංකු අධිපතිවරයා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කර ඇත. නමුත් රුපියල් බිලියන 600 බදු කපා හැරීමට ගත් ක්‍රියාමාර්ග යට වගකිවයුත්තා නම් කළේ නැත. නමුත් එම බදු කපා හැරීම සම්බන්ධයෙන් ගත් තීන්දුව සම්බන්ධයෙන් ආණ්ඩුව මහ බැංකුවෙන් කිසිදු විමසීමක් නොකළ බවද එතුමා ප්‍රකාශ කළේය.

ජනාධිපති නීතිඥ ජයවර්ධන සහ ආචාර්ය ජයමහ පැවසුවේ එවකට මහා බැංකු අධිපති මහාචාර්ය ලක්ෂ්මන් (මුදල් මණ්ඩලයේ සභාපති), මුදල් අමාත්‍යාංශයේ ලේකම් එස්. ආර්. ආටිගල සහ සමන්ත කුමාරසිංහ ඇමෙරිකානු ඩොලරයේ අගය රුපියල් 203 පවත්වා ගැනීම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල දුන් උපදෙස් නොසලකා කටයුතු කිරීමේ බරපතළ වරදට වගකීම ගත යුතු බවයි. නමුත් රණවක සහ හර්ෂ ද සිල්වා මහජන නියෝජිතයන් ඉතාමත් නිවැරදිව දිගින් දිගටම අවධාරණය කළේ නිලධාරීන්ට තම වගකීම් සහ වගවීම්වලින් කිසිසේත් ගැළවිය නොහැකි බවයි.

වසර 30 කට වැඩි කාලයක් රාජ්‍ය සේවයේ සිටි, තවමත් සිටින රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් මායාදුන්න දේශපාලන නායකත්වයේ රෙදි ගැළවීම විමසා බැලිය යුත්තේ නිලධාරී පැලැන්තියේ වගකීම සහ වගවීමද විමසා බලමිනි. තත්ත්වය අවාසනාවන්තය.

තමිල්නාඩුවෙන් පිනට ලැබෙන සහල් ලබා ගැනීමට ශ්‍රී ලංකාව පත් කළ දේශපාලන නායකත්වය සහ ඉහළ නිලධාරී පැලැන්තිය ලැජ්ජා වියයුතු නොවේද? වගකිව යුතු නොවේද? වගවිය යුතු නොවේද? දේශපාලන නායකත්වය සහ ඉහළ නිලධාරී පැලැන්තිය සාමූහිකව ශ්‍රී ලංකාව ජාත්‍යන්තරය ඉදිරියේ හැල්ලුවට ලක් කර ඇත. රංචු ගැසී රටක් විනාශ කර ඇත. තවදුරටත් විනාශ කරමින් සිටින බව නොකියා බැරිය. වර්තමාන මහා බැංකු නායකත්වය සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් කළ හෙළිදරව් සම්බන්ධයෙන් ආණ්ඩුව ගන්නා ක්‍රියාමාර්ග මොනවාද? සියලුම දේශපාලන පක්ෂ නිහඬ පිළිවෙතක් අනුගමනය කරන බව පෙනේ. පොදු ව්‍යාපාර කාරක සභාව ඉදිරියේ රණවක සහ හර්ෂ ද සිල්වා මන්ත්‍රීවරුන් කළ සටන පාර්ලිමේන්තුව තුළ සිරවිය යුතු නැත. මායාදුන්න මහතා අනතුරු අඟවන සමස්ත ආර්ථිකය කඩා වැටීමට වගකිව යුතු ආණ්ඩු කළ

**ශ්‍රී ලංකාවේ අවශ්‍යතාවය ලක්ෂ 5 ක් රාජ්‍ය සේවයකි. පවතින තත්ත්වය අනුව එය ලක්ෂ 8 ක් දක්වා ප්‍රසාරණය කිරීම රටට දරාගත හැකිය. නමුත් වර්තමානයේ රාජ්‍ය සේවය මිලියන 1.5 ඉක්මවා ඇත. විශ්‍රාම වැටුප් ගෙවීමත් අර්බුදකාරීය. තීරු බදු රහිත වාහනයක් ආනයනය කිරීමේ බලපත්‍රය අද රටේ පවතින තත්ත්වය මත වටිනාකමක් නොමැති කොළයකි. රුපියල් බිලියන 17 ක් වන රාජ්‍ය සේවයේ පාරිතෝෂික දීමනා ගෙවීමට ශක්තියක් ආණ්ඩුවට නැත.**

දේශපාලන පක්ෂ, ජනාධිපතිවරයා, මහජන නියෝජිතයන් සහ රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් ජනතාව කෙලෙස ප්‍රතිචාර දැක්විය යුතුද ?

විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය ඉදිරියේදී ක්‍රියාකරන ආකාරය ජනතාව අවධානයෙන් සිටිය යුතුය. දේශපාලනිකව කෙතරම් අහිතකර වුවත් වර්තමාන ආණ්ඩුව සහ විපක්ෂය ගත යුතු තීන්දු තීරණ ඇත.

ශ්‍රී ලංකාව අස්ථාවර කිරීමට හේතුවූ ප්‍රධානතම කරුණක් ලෙස මායාදුන්න මහතා අවධාරණය රටේ ආර්ථිකයට දරා ගත නොහැකි රාජ්‍ය සේවයයි. වර්තමාන විනාශකාරී තත්ත්වයට තමන් ඇතුළු පසුගිය දශක තුන තුළ රාජ්‍ය සේවයේ නියුතු සියලුම නිලධාරීන් අඩු වැඩි වශයෙන් වගකිව යුතු බව පිළිගත් මායාදුන්න මහතා ශ්‍රී ලංකාවට උහුලාගත නොහැකි රාජ්‍ය සේවය රටට සාපයක් වී ඇති ආකාරය අවධාරණය කළේය. එතුමා කළ බරපතළ ප්‍රකාශ ගොන්නට සාධාරණය කිරීමට සමස්ත මුද්‍රිත මාධ්‍යට නොහැකි විය. රූපවාහිනී නාලිකා සහ සමාජ මාධ්‍ය ජාලා නොවන්නට සත්‍යය ජනතාව දැනගන්නේ නැත.

පාර්ලිමේන්තුව මහජන නියෝජිතයන්ගේ වරප්‍රසාද, රාජ්‍ය ව්‍යාපෘති සහ බඳවා ගැනීම් සම්බන්ධයෙන් වග කීමෙන් ක්‍රියා කළ යුතු ආකාරය අවධාරණය කළ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා, රාජ්‍ය සේවය රටට දරාගත නොහැකි ආකාරයේ පීඩනයක් වී ඇති ආකාරය මෙලෙස පැහැදිලි කළේය.

ශ්‍රී ලංකාවේ අවශ්‍යතාවය ලක්ෂ 5 ක් රාජ්‍ය සේවයකි. පවතින තත්ත්වය අනුව එය ලක්ෂ 8 ක් දක්වා ප්‍රසාරණය කිරීම රටට දරාගත හැකිය. නමුත් වර්තමානයේ රාජ්‍ය සේවය මිලියන 1.5 ඉක්මවා ඇත. විශ්‍රාම වැටුප් ගෙවීමත් අර්බුදකාරීය. තීරු බදු රහිත වාහනයක් ආනයනය කිරීමේ බලපත්‍රය අද රටේ පවතින තත්ත්වය මත වටිනාකමක් නොමැති කොළයකි. රුපියල් බිලියන 17 ක් වන රාජ්‍ය සේවයේ පාරිතෝෂික දීමනා ගෙවීමට ශක්තියක් ආණ්ඩුවට නැත. මුදල් අච්චු ගසා රටේ අවශ්‍යතාවය පිරිමසා ගන්නා තත්ත්වයට ආණ්ඩුව පත්වී ඇත. මායාදුන්න මහතා අවධාරණය කළ කරුණු කාරණා ශ්‍රී ලංකාවේ අනාගතයට බරපතළ තර්ජනයකි. ව්‍යසනකාරී තත්ත්වයකි. ආණ්ඩුව සහ විපක්ෂය මෙන්ම ජනතාව අර්බුදයේ දිග පළල තවමත් තේරුම්ගෙන නැත.

සමස්ත ජනතාවගෙන් අති බහුතරයක් හිඟමනට පත් කළ ජනතා නියෝජිතයන් සහ ඉහළ නිලධාරී පැලැන්තිය තවමත් යහතින් සිටී. ශ්‍රී ලංකාව පසුගිය වසර 30 තුළම ආණ්ඩු කළ සියලුම පක්ෂ සහ එම පක්ෂ නායකත්වය දුන් සන්ධාන කර ඇත්තේ රට අවුලෙන් අවුලට පත් කිරීම බව තවදුරටත් රහසක් නොවේ. පාර්ලිමේන්තු කාරක සභාවලින් හෙළිදරව් වන්නේ විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණ ක්‍රියාවලිය අතිශය ප්‍රශ්නසහගත බවයි.

නිවැරදිව, රටේ අනාගතය සහ ජනතාවගේ සුරක්ෂිතභාවය සලකා ගත් තීරණයක් නැති තරම්ය. පෙට්ටි කඩයක් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට වඩා පිළිවෙළකට කරනු ඇත. බොරු, කයිවාරුකාර අතිශය දූෂිත රැලක් දශක තුනක් තිස්සේ ශ්‍රී ලංකාව ග්‍රහණයට ගෙන ඇත. හිටපු කථානායක කරු ජයසූරිය පාර්ලිමේන්තු අතරින් නමුත් 2010-2015 ආණ්ඩුවේ ආර්ථික කළමනාකරණ අමාත්‍ය වූ බැසිල් රාජපක්ෂගේ භූමිකාව සහ ඔහු මුදල් ඇමැති ලෙස (ජුලි 2021 - මාර්තු 2021) කටයුතු කළ ආකාරය සම්බන්ධයෙන් අවධානය මෙහිදී යොමු නො වීය. පාර්ලිමේන්තුව ඊට මෙවලමක් පමණි. පාර්ලිමේන්තු අතරින් හොඳම පාර්ලිමේන්තුවක් ලෙස යහපාලන කථානායක කරු ජයසූරිය හැඳින්වූ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ තත්ත්වය විමසා බැලිය යුත්තේ කාරක සභා කරනු ලබන හෙළිදරව් අවධානයට ලක් කිරීමෙනි.

පාර්ලිමේන්තුව දේශපාලන පක්ෂ, එම පක්ෂවල නියෝජිතයන්, රාජ්‍ය සේවයේ ඉහළ තලය, දූෂිත ව්‍යාපාරික ප්‍රජාව සහ වන්දි භට්ටයන්ගේ යහපත පිණිස බව අමුතුවෙන් කිව යුතු නැත. ජනතාවට ඇති ප්‍රයෝජනයක් නැත.

ආර්ථිකය කඩා වැටීමත් සමඟ වර්තමාන හිඟන පාත්‍රය රැගෙන ලෝකය ඉදිරියට ගොස් ඇත. ඉන්දියාවේ ප්‍රාන්තයකින් මානුෂීය ආධාර ලබා ගැනීමට තරම් තත්ත්වය බරපතළය. පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම පක්ෂ අඩු වැඩි වශයෙන් ජනතාවගෙන් සමාව ගත යුතුය. පෙරදිග ධාන්‍යාගාරය වූ ශ්‍රී ලංකාව තමිල්නාඩු ප්‍රාන්තයෙන් ශ්‍රී ලංකා රුපියල් බිලියන 2 ආධාර ලබා ගැනීමට සුදුසුකම් ලබා ඇත. බංග්ලාදේශයද සැලකියයුතු මූල්‍ය සහ බෙහෙත් ආධාර ලබා දී ඇත. පිනට ලැබෙන ආධාර භාර ගන්නා මහජන නියෝජිතයන් එම තත්ත්වයෙන්ද උපරිම ප්‍රයෝජන ගනිති. ජනතාවට ආධාර බෙදා දෙන ඡායාරූප මාධ්‍යයේ පළකරවා ගනී. කිසිදු ලැජ්ජාවක්, හිරිකිතයක් නැත. අනුන්ගේ ළමයින්ට උප්පැන්න දීම හැර මෙවැනි ක්‍රියා සමාන වන වෙනත් අවස්ථාවක් නැත. ධීවර අමාත්‍ය ඩග්ලස් දේවානන්ද මෑතකදී ඉන්දියාවෙන් නොමිලේ ලබා දුන් ඉන්ධන උතුරේ ධීවරයන්ට බෙදා දෙන ඡායාරූප මාධ්‍යයට නිකුත් කළේය. මානුෂීය ආධාර ප්‍රදානය කරන රටවල් ශ්‍රී ලංකාව අවඥාවට ලක් කරන බව කපටි දේශපාලනඥයන්ට තේරෙන්නේ නැද්ද ? ශ්‍රී ලංකාව විනාශ කිරීමට විදේශීය සතුරු බලවේග අවශ්‍ය නැත. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක තරු පහේ 'ඩිමොක්‍රසිය' තුළ රට විනාශ කිරීමේ වගකීම මහජන ඡන්දයෙන්ම පත්වූ දේශපාලන පක්ෂ සිදු කරයි. අත්‍යවශ්‍ය භාණ්ඩ සහ සේවා වෙළෙඳපොළ තුළ නැති කළේ එම විනාශකාරී දේශපාලනයයි. යුරෝපීය සහ ශ්‍රී ලාංකික මහජන නියෝජිතයන්ටම ආවේනික වූ සුදු ඇඳුමින් සැරසී පාර්ලිමේන්තුව තුළ රජකරන රොත්ත (කවුරු බලයේ සිටියත්) අති බහුතර ජනතාවක් එක වේලක් නිසියාකාරව ගැනීමට නොහැකි තත්ත්වයට පත් කර ඇත. වසර 90 ක ඡන්ද උරුමය ජනතාවට දායාද කළ 'වටිනාකම' හිඟමනයි.

**● ශමින්ද්‍ර ෆර්ඩිනැන්ඩෝ**

---

# සිතමු!



ඉම්තියාස් බාකීර් මාකාර්

## ජනතාවගේ ඇස් වසා වෙස් අඳින ආණ්ඩුව!

**අග්‍රාමාත්‍යවරයා, පාර්ලිමේන්තුවේදී සිදුකළ විශේෂ ප්‍රකාශයේදී, රට ගොඩනැගීම සඳහා, සම්ප්‍රදායික දේශපාලන කටයුතුවලින් සහ මතවාදවලින් බැහැරවී, සාමූහිකව කටයුතු කිරීම ගැන සඳහන් කළා.**

ඒ තුළින්, එතුමන් පෙන්වන්නට කල්පනා කළේ සියලු පක්ෂ සමග, සහයෝගයෙන් එකමුතුව කටයුතු කිරීමේ චේතනාව, එතුමන් තුළ තිබෙන බවයි.

හැබැයි වැදගත් වන්නේ, චේතනාව, වචනයෙන් පමණක් නොව, ක්‍රියාවෙන් සහ හැසිරීමෙන්ද, පෙන්වීමයි.

විපක්ෂ නායකතුමන්, හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නායකතුමන්, ඇතුළු විපක්ෂ බලවේග සියල්ලම වාගේ මැති ඇමැති තනතුරු ගත්තද, නොගත්තද, රට වෙනුවෙන් සහයෝගයෙන්, අවබෝධයෙන් වැඩකිරීමේ චේතනාව ප්‍රකාශ කර තිබුණා.

සියලු පක්ෂ හා සාකච්ඡා කර, අවබෝධයකට ඒම මිසෙක, දේශපාලන පක්ෂවලින්, තනතුරු, මුදල්, වරදාන ආදිය තුළින්, මන්ත්‍රීවරුන් ඩැහැගැන්මේ මෙහෙයුම්වලට නොයන ලෙස, විශේෂයෙන් මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිවරයා ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර සිටියා.

එසේ කියා තිබියදීත්, රජය පාර්ශ්වයෙන් ඔබතුමන්ලා සර්ව පාක්ෂික සහභාගිත්වය සඳහා කටයුතු කළේ කොහොමද?

වචනයෙන් සහ කථාවෙන් පමණක්, එකමුතුව, සහයෝගයෙන් සාම්ප්‍රදායික දේශපාලනයෙන් බැහැරව, රට වෙනුවෙන් අවබෝධයෙන් කටයුතු කරමු, කියා කියමින්, ක්‍රියාවෙන් සහ හැසිරීමෙන් කටයුතු කළේ කොහොමද?

යහපත් චේතනා ගැන කථා කරමින්, වැරදි තීන්දු තීරණ, වැරදි ප්‍රතිපත්ති සහ උද්ධච්ච හැසිරීම් තුළින්, අපේ රට ඓතිහාසික අගාධයකට ඇද දැමූ, මෙවැනි විනැහියකට ගොදුරු කළ වගකිවයුත්තන්ට, හුස්ම ගන්නට කෙටි විරාමයක් ලබාදීමේ, ජවනිකාවක් රඟ දක්වමින් සිටීමයි.

අප අද දකිමින් සිටින්නේ.

මේ විනැහියට, මේ අගාධයට රට පත්කිරීමට වග කිවයුතුවූත්, ජනතා විශ්වාසය, නැතිකරගෙන ඇත්තාවූත් නායකත්වයක් සහ පාලනයක් ආරක්ෂා කර ගන්නට, වෙස් මුහුණු කිහිපයක් ඉදිරියට දැමූ මෙහෙයුමක් අපි දකිමින් සිටින්නේ. අපේ රට මුහුණ දී තිබෙන මේ අර්බුදකාරී මොහොතේ පාලකයන් තමන්ගේ බල න්‍යාය පත්‍රය වෙනුවෙන් දේශපාලන වෙස් ක්‍රීඩාවක යෙදෙනවා.

විපක්ෂයේ පක්ෂවලින්, තනතුරු, වරදාන දීම් තුළින්, ඩැහැගත් කිහිපදෙනෙකුට, වෙස් මුහුණු පළඳවා, ජනතාව ප්‍රතික්ෂේප කළ, එමෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී ලෝකය නොපිළිගන්නාවූ දූෂිත පාලනයක පැවැත්ම රැකදීමේ කොන්ත්‍රාත්තුවයි, අප දකිමින් සිටින්නේ.

පසුගිය සතියේ බ්ලූම්බර්ග් මාධ්‍ය ආයතනයට ප්‍රකාශයක් කරමින් ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා ප්‍රකාශයක් කර තිබුණා.

"තමන් අසමත් ජනාධිපති කෙනෙකු ලෙස සමුග න්නට සූදානම් නැති බවත්, තමන්ගේ නිල කාලය අවසන් වන තෙක්ම තමන් ඒ ධූරයේ සිටින්නට බලාපොරොත්තු වන බවටත්."

ජනාධිපතිවරයාගේ මේ කර ඇති ප්‍රකාශයෙන් කරුණු දෙකක් පැහැදිලි වෙනවා.

පළමුවැන්න,

තමන් අසමත් බව ඔහු පිළිගෙන තිබීමයි. එහි ප්‍රතිඵලයක් ලෙසින් කෝටි දෙකකට අධික ශ්‍රී ලාංකික ජනතාව එහි විපාක විඳිමින් සිටිනවා.

පෙන්නුම් කරන දෙවෙනි කාරණය වන්නේ,

ඒ අසමත් ජනාධිපතිවරයා, බලය අත් නොහැර සිටින බව, සහ ඔහුගේ ඒ ස්ථාවරය, වර්තමාන අග්‍රාමාත්‍යවරයා සහ අමාත්‍ය මණ්ඩලය විසින් ආරක්ෂා කරන බවත්ය.

මෙය ශ්‍රී ලංකාවේ ජනතාවගේ අභිලාෂයන්ට සම්පූර්ණයෙන්ම පටහැනි ස්ථාවරයක්. පවතින මේ පාලනය ගැන රටත්, ලෝකයත් කල්පනා කරන ආකාරය අප අවබෝධ කරගැන්ම ඉතා වැදගත්.

අගමැතිවරයාගේ ප්‍රකාශය තුළින්, මේ ගැටලුව ගැන, ඍජු ඇමතීමක් නොකළද, මේ ගැටලුව, ඒ ප්‍රකාශය තුළින් කිහිප විටකදීම එළියට ඒම අපි දකිනවා.

මම කැමතියි, එතුමන්ගේ ප්‍රකාශයෙන්ම කොටස් කිහිපයක් උපුටා දක්වන්නට. මම ඒ කොටස් උපුටා දක්වනවා.

"යම් යම් වැරදි ක්‍රියාමාර්ග නිසා අපි ලෝකයෙන්ම කොන් වෙච්ච රටක් බවට පත් වෙමින් යනවා. ඒ තත්ත්වය ආපසු හැරවීම ලෙහෙසි නැහැ."

"අපට ණය සහ ආධාර ලබාදෙන රටවල් අතර ඉදිරියෙන්ම ඉන්නේ ඉන්දියාව, චීනය සහ ජපානයයි. අපට කවදත් හිතවත්ව සිටි මේ රටවල් සමග ඇති සබඳතා දැන් බිඳ වැටී තිබෙනවා."

"ජපානය අපේ දීර්ඝ කාලීන මිතුරෙක්. අපේ රටට බොහෝ උදව් උපකාර කළ මිත්‍ර රටක්. නමුත් පසුගිය කාලයේ සිදුවූ අවාසනාවන්ත සිදුවීම් නිසා දැන් ඔවුන් ඉන්නේ හිත හොඳින් නොවෙයි.

යම් යම් ව්‍යාපෘති අත්හිටුවීම් පිළිබඳව අපේ රට ජපානයට විධිමත් අයුරින් දැනුම්දීමක්වත් කර නැහැ. ජපානය අපේ රටේ සිදුකළ සමහර ව්‍යාපෘති අතරමග නවතා දමා ඇත්තේ තනි පුද්ගලයෙක් ලබාදුන් වාර්තා අනුවයි. මිත්‍ර රටවලින් අපට ලබාදුන් ඉතා වටිනා ව්‍යාපෘති පදනම් විරහිතව, අහේතුකව නවතා දැමීම පිළිබඳව විමර්ශනය කරන මෙන් පාර්ලිමේන්තුවේ රාජ්‍ය මූල්‍ය කමිටුවෙන් ඉල්ලා සිටිනවා." උපුටා දැක්ම අවසන්.

රාජපක්ෂ පාලනයේ වැරදි විදේශ පිළිවෙත නිසා ශ්‍රී ලංකාව ලෝකය තුළ හුදෙකලා තත්ත්වයකට පත්ව සිටී. අග්‍රාමාත්‍ය ප්‍රකාශය තුළින් පැහැදිලිව කියා සිටිනවා.

අග්‍රාමාත්‍ය ධුරයේ සිට මේ සති කිහිපය තුළ තමන් බ්‍රිතාන්‍ය අග්‍රාමාත්‍යවරයාට, එක්සත් අරාබි රාජධානියේ (එමීර්) පාලකවරයාට, ජපාන රජයේ නිලධාරීනට සහ අනෙකුත් රාජ්‍යයන් සමහරක නියෝජිතයන්ට කථාකළ බව අග්‍රාමාත්‍යවරයා ප්‍රකාශ කළා.

එහෙත් බටහිර රටවලින්වත්, මැදපෙරදිගින්වත්, ජපානයෙන්වත් එවැනි කිසිදු ආධාරයක් රජයට ඍජුව ලැබී නැහැ.

මෙයින් පෙන්නුම් කරන්නේ, එම විදේශීය රාජ්‍යයන්, මේ පවතින පාලනය නව පාලනයක් ලෙසින් නොදැකීමයි. පැවති දූෂිත, මානව අයිතීන් උල්ලංඝනය කළ, ප්‍රජාතන්ත්‍ර විරෝධී පාලනයේම දිගුවක් ලෙසින් දැකීම සහ එවන් රජයක් කෙරෙහි විශ්වාසයක් නොතිබීම හේතුවෙන්, මෙතෙක් රටට අවශ්‍ය කඩිනම් සහාය ලබාගත නොහැකිවීම අපි දකිමින් සිටිනවා.

නිදහසින් පසු යුගයේදී සිවිල් යුද්ධයනට, ප්‍රචණ්ඩ තරුණ කැරලි දෙකකට, මෙන්ම සුනාමි වැනි ස්වභාවික විපත්වලට මුහුණ දුන්නද, ආර්ථික වශයෙන් මෙවැනි අගාධයකට, දුෂ්කර තත්ත්වයකට, මිලියන 22 ක් පමණ වූ අපේ ජනතාවට මුහුණ දෙන්නට සිදුවුණේ නැහැ.

වගවීම් නැති, වගකීම් නැති, උත්තර බැඳීම් නැති, උද්ධච්ච, ගෝත්‍රික පාලනයක් නිසයි, මේ විනැහිය සිදුවුණේ.

20 සංශෝධනයත් සමග බලය එක් පුද්ගලයෙකුගේ ග්‍රහණයට ගැනීමේ ක්‍රියාවලිය නිසයි, මේ විපාකයන් බොහෝමයක් සිද්ධවුණේ.

කෘෂිකර්මාන්තයේ අර්බුදය, ස්වෛරී බැඳුම්කරවලට ගෙවීම, අසූචි පොහොර නැවට ගෙවීම, ජාත්‍යන්තර මූල්‍ය අර්බුදයට යෑම ප්‍රමාද කිරීම, සුපිරි ධනවතුනට බිලියන ගණනින් බදු සහන ලබාදීම,

නම පවතින්නට ආරම්භ කළ සුදු අලි ව්‍යාපෘතිවලට අධික පොලියට ලබාගත් ණය මෙන්ම බිලියන ගණනින් ජනතාවගේ මුදල් මංකොල්ල කෑ දූෂිත ගනුදෙනු ආදියට වගකිව යුතු උදවියගේ වගවීම හෝ ඒ මුදල් කන්දරාවන් නැවත ජනතාවට ලබාගැන්ම ගැන ජනතාව නගන හඬ පිළිබඳ වූ කිසිදු ඇමතීමක් හෝ සඳහනක් අගමැතිවරයාගේ ප්‍රකාශයේ දකින්නට නැහැ.

හිටපු මුදල් අමාත්‍ය අලි සබ්‍රි මැතිතුමන් නම් පාර්ලිමේන්තුවේදී පිළිගත්තා "බදු සහන ලබාදීම, ඩොලරය අල්ලාගෙන සිටීම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත නිසි කලට නොයෑම, ණය ප්‍රතිව්‍යුහගත කිරීමට කල්ගතවීම ආදිය නොකළ යුතුව තිබුණු බව."

ජනාධිපතිවරයාත් ප්‍රකාශකර තිබුණා, මේ තත්ත්වයට හේතුවූ තමන්ගේ වැරදි තිබුණු බව. ඒත් ඒ පව් සමා කිරීම් පමණක් ප්‍රමාණවත්ද? වගවීමක් තිබිය යුතුයි.

අලුත් වෙස් මුහුණු බැඳ ගැනීම් තුළින්, රට මෙවැනි අගාධයකට ඇද දැමීමට වගකිවයුතු පාලනයක් ආරක්ෂා කර ගැන්මට, ඔවුන්ගේ පැවැත්ම රැකදීමට ගන්නා වූ රැවටිලිකාර ප්‍රයත්නයන්, ඇන්දවීම්, වචන හරඹ තුළින්, රටත් ලෝකයත් මුළා කිරීමට පුළුවන්කමක් නැහැ.

දිළිඳුකමට, බඩගින්නට, මන්දපෝෂණයට, විරැකියාවට, එපමණක් නොවෙයි, මුළු දවසම, මුළු පවුලම පෝළිම්වල ගතකරන තත්ත්වයට, මේ රට ඇද දැමූ වගකිව යුත්තන් බලයේ තබාගෙන, තීරණ තීන්දු ගැන්මේ පුටුවල තබාගෙන, දැනට උද්ගතවී ඇති තත්ත්වයට විසඳුම් ලබාදීමට හැකි යැයි කල්පනා කිරීම මිථ්‍යාවක්.

එදිනෙදා වියදම් පියවාගත නොහැකි භාණ්ඩාගාරයක් සහ අධික පොලී සමගින් වූ මහා ණය කන්දරාවක බර උසුලා ගැන්මට සිදුව ඇති පසුබිමක, පසුගිය පාලනය හැසිරුනේ කිසිදු දුරදැක්මකින් තොරව "උණුවන තෙක් දිය සැලියේ සැපයක් යැයි කකුළුවා දිය කෙළියේ" කවිය සිහිගන්වන ගජමිතුරු ධනවාදය කරපින්නාගත් ගමනක්ය.

කෙසේ වෙතත් සමගි ජන බලවේගය පසුගිය කාලය තිස්සේම පාර්ලිමේන්තුවේදී අවධාරණය කළ නව වැදෑරුම් වැඩපිළිවෙළේ අඩංගු කර තිබූ ඇතැම් ප්‍රතිපත්ති සමහරක් අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රකාශය තුළ අන්තර්ගත කිරීම දකින්නට තිබෙනවා.

ආධාර ලබාදෙන රටවල සමුළුවක් පැවැත්වීම, දූෂණ වංචා ගැන ස්වාධීන ආයතන පත් කිරීම, පාඩු ලබන රාජ්‍ය ආයතන සම්බන්ධව නිවැරදි තීරණ තීන්දු ගැනීම සහ, අපනයනයට ප්‍රමුඛතාව දෙන ආර්ථිකයකට යොමුවීමේ කඩිනම් අවශ්‍යතාව වැනි කරුණු ගැන අපේ ආර්ථික කණ්ඩායමත්, විපක්ෂ නායකවරයාත් පාර්ලිමේන්තුවේදී සහ සතිපතා පැවැත්වෙන මාධ්‍ය සාකච්ඡාවලදී නිරතුරුව පෙන්වා දුන්නා.

මේ නිවැරදි මගට අපේ රට ප්‍රවේශ කරගත යුතුව තිබෙනවා. ඒ සඳහා එඩිතරව තීන්දු තීරණ ගත යුතුව තිබෙනවා.

අරගල භූමියේ මාධ්‍ය සාකච්ඡාවක සිට අදහස් පළ කළ දමිතා අබේරත්න මහත්මියගේ ඉල්ලීමක් අග්‍රාමාත්‍යවරයා උපුටා දක්වා තිබුණා.

අරගලයේ නිරත එතුමිය ඇතුළු තරුණ පිරිස කියන්නේ කුමක්ද?

"ගෝටා ගෝ හෝම්" කියලායි.

ඔවුන් කියන්නේ අද රට මුහුණ දී ඇති මේ ගැටලුවලට වගකිව යුතු මේ පාලනයේ නිමාවක් අවශ්‍ය බවයි.

එම ඉල්ලීම් නොසලකා ක්‍රියා කරන්නේ නම් ඒ වෙනුවට හිස් වචන වලින් ඔවුන් රවටන්නට ප්‍රයත්න දරනවානම් එය "ටොපි ලොසින්ජර දී රැවටීමක්ම තමයි."


දැන් ඇති මේ රැවටීම. අද ඉන්න පරපුර රටත්, ලෝකයත් ගැන අවධියෙන් ඉන්නේ. ඔවුන්ව තවදුරටත් "ටොපි ලොසින්ජර දීලා රවටන්නට බැරි බව තේරුම් ගන්න."

ඔවුන්ගේ හඬට, රටේ බහුතර ජනතා හඬට සවන් දෙන්න. ඊට අවනත වෙන්න. ප්‍රජාතන්ත්‍රවාදයට ඉඩදෙන්න.

මේ මොහොතේ තීරණාත්මක සංධිස්ථානයකට අපේ මව්බිම පැමිණ ඇත. තවදුරටත් ගජමිතුරු ධනවාදී ගමනකට හෝ විසඳුමක් නැති වෛරය පතුරවන සටන් පාඨ දේශපාලනයකට හෝ ඉඩදී සිටීම මේ රටට දැරිය හැක්කක් නොවේ. රටත් ලෝකයත් පිළිගන්නා වූ ස්ථාවර පාලනයක් සමගින් නිවැරදි මාවතට අපේ මව්බිම ප්‍රවේශ කර ගනිමින් මේ දුෂ්කර අභියෝග ජයගත යුතු වෙමු. ශ්‍රී ලංකාව ලෝක සිතියම තුළ අභිමානවත් දේශයක් බවට පත්කර ගැන්ම සඳහා වූ තිරසාර අදිටනින් අනාගතයට යොමුවෙමු.

**● ඉම්තියාස් බාකීර් මාකාර්**

# රටක් ගිනි තැබූ දා



# රටකට ආදරය කළ හදවතකට ගිනි වැදිණි..

## ● වසර 35 ක් දුරු රට සිට හරි හම්බ කර සැදූ නිවස ගිනි තැබූ හැටි

## ● අපි දේශපාලනට කිසිම සම්බන්ධයක් නෑ ගේ ගිනි තියපු දවසෙත් හිටියෙ ප්‍රංශයේ...

ගින්න බිහිසුණුය. ජනතා අරගලයක් මතින් උපදින ගින්න අතිශය බිහිසුණුය. පසුගිය මැයි මස 09 වැනිදා එවැනි ගින්නකින් මුළු රටම දැවිණි. ඒ අන්ධකාර රාත්‍රියේ පැය කිහිපයක් ඇතුළත මෙරට කෝටි ගණනක දේපළ ගිනිබත් විය. පුද්ගලයන් අටදෙනකුගේ දිවිමඟ නතර විය. ගිනිගත් ඒ මූසල හෝරා කිහිපය යළිත් සිහිපත් වූයේ දේශපාලනයට කිසිදු සම්බන්ධයක් නැති, මහින්ද රාජපක්ෂ හිටපු අගමැතිවරයාගේ අවසාන භෝජන සංග්‍රහය පැවැත්වෙන එදින ප්‍රංශයේ ජීවත් වූ ලලනි කැලුම් රුබේරුගේ පුංචි පවුල මෙරට ජීවත් වූ නොම්බර 51/ඒ, මඩපාත, පිළියන්දල ලිපිනයේ පිහිටි නිවසත් එම ගින්නෙන් දැවී අළු වී ගිය ඛේදනීය කතාව ඇසීමත් සමඟය. හදවත කම්පනයට පත් කරවන ඒ කතාව ඔබත් ඇසිය යුතුය. ඒ අපේ වචනවලින් නොවේ. ජීවිතයෙන් අඩකටත් වැඩි කාලයක් දුක්මහන්සියෙන් ගෙ ාඩනඟාගත් සිහින මාළිගාවේ හිමිකරුවන්ගේ වචනවලිනි. මේ පෙළඟ ැසෙන්නේ හද කකියවන ඒ කතාවය.

"අපි ජීවත් වෙන්නේ ප්‍රංශයේ. මගේ මහත්තයා කොම්පැණියක විධායක ශ්‍රේණියේ රැකියාවක් කරනවා. මමත් පොඩි ජොබ් එකක් කරනවා. අපේ පුතත් ආයතනයක හොඳ ජොබ් එකක් කරනවා. එරට මොන තරම් සැපවත් ජීවිතයක් ගත කළත් අපි කැමැති ලංකාවේ ජීවත් වෙන්න. ඒ නිසා තමයි 1987 දෙසැම්බර් මාසෙ ලංකාවෙන් ගිය දවසෙ ඉඳලා මුදල් ටික, ටික එකතු කරගෙන අපේ සිහින මාලිගාව හදන්න ගත්තේ. අපේ සිහිනය වෙලා තිබුණේ හෙළ උරුමය ඉස්මතු කරමින් පරණකම අලුත් කර සුන්දර නිවහනක් තනාගන්න. අවුරුදු පහළොවක් තිස්සෙ ඉඳලා ඒ සිහින මාලිගය හැදුවා. අදටත් වැඩ ඉවර නෑ. ගෙදර ඉතිරි වැඩ ටිකත් ඉවර කරගෙන ලබන අවුරුද්දේ පුතාගේ විවාහ මංගල්‍යය ලංකාවේ අපේ ගෙදර ගන්න තමයි සැලසුම් කරගෙන හිටියේ. ඒත් දැන් ඒ සියලු සැලසුම් සිහින පමණයි. ගෙදර ගන්න දෙයක් නෑ. සේරම පිච්චිලා. රටේ ආරක්ෂක අංශවල කශේරුකා බිඳිලා කැලෑ නීතිය රජ වෙච්ච මැයි 09 වැනිදා ඉඳලා ගෙවී ගිය දවස් කිහිපයේදී නිවස තුළ තිබුණු ගින්නෙන් පිච්චුනේ නැති බඩු, භාණ්ඩ සේරම කොල්ලකාගෙන ගිහින් තිබුණා. මේ වෙනකොට ඉඳිකටුවක තරමේ දෙයක් අපේ නිවස ඇතුළේ නෑ. අදටත් මම කල්පනා කරන්නේ ඇයි අපිට මෙහෙම කළේ කියලා..."

"මගේ අම්මා, තාත්තා දේශපාලනය කරලා නෑ. මගේ අයියා දේශපාලනය කරන්නේ නෑ. මගේ මහත්තයා දේශපාලනයට අබමල් රේණුවක තරමේ කැමැත්තක් නෑ. මගේ ජීවිතයට මේ රටේ පැවැති කිසිදු මැතිවරණයකදී ඡන්දය පාවිච්චි කරලා නෑ. අවුරුදු 35 ක් ප්‍රංශයේ ජීවත්වන අපිට මේ රටේ දේශපාලනඥයන්ගේ උදව් උපකාර අවශ්‍යත් නෑ. අපේ නංගි දේශපාලනඥයෙක් කසාද බැඳලා හිටියා කියලා පවුලේ සියලු දෙනාගෙන් පළිගත්ත එක වැරදියි. ඒ වගේම මගේ නංගිගේ මහත්තයා, කැස්බෑව නගරාධිපති ලක්ෂ්මන් පෙරේරා බඩගෙ ාස්තරවාදී දේශපාලනඥයෙක් නෙමෙයි. ප්‍රදේශයට දැනෙන්න වැඩක් කරපු ජනතා නායකයෙක්. ඒ වගේම අපේ නිවස පිටුපස දේශපාලනඥයෙක්ගේ ගෙයක් තිබුණා කියලා අපි මොනව කරන්නද? අපි මේ දේවල් ගොඩනඟාගත්තේ රටේ සල්ලි හොරකරම් කරලා නෙමෙයි. අවුරුදු තිස්පහක් පිටරට ජීවත්වෙමින් දුක් මහන්සියෙන් උපයාගත් ධනයෙන්. ඒත් ගිනි තියපු අය ඒ කිසිම දෙයක් බැලුවේ නෑ. පළිගැනීමේ චේතනාවෙන් නංගිලාගේ ගෙදරට ගිනි තියාගෙන එනකොට අපේ ගෙදරටත් ගිනි තිබ්බා. එකම වත්තේ ගෙවල් දෙක තිබුණු පමණින් දේශපාලනඥයාගේ නිවසයි, සාමාන්‍ය පුරවැසියාගේ නිවසයි හඳුනාගැනීමට බුද්ධියක් නැති මිනිසුන්ගේ අරගලයක් තුළින් අන්තිමේ අපේ සිහින බිඳිලා ගියා. මගේ පුතාට කසාද බැඳලා එන්න ගෙයක් නැති වුණා. පුතාගේ විවාහ මංගල්‍යය ඉවර වෙලා මේ දේ වුණා නම් "ඒ කටයුතුත් ඉවරයි..." කියලා හිතට යම් සහනයක් තියෙනවා. දැන් ඒ සහනයත් නෑ. අපේ හිත් බිඳිලා, කුඩු වෙලා ඉවරයි..."

"මැයි 09 වැනිදා ප්‍රකෝපකාරී මිනිසුන් පළිගත්තේ දේශපාලනඥයන්ගෙන් විතරක් නෙමෙයි, මුළු රටෙන්ම. එදා හවස 2.00 ට විතර කොල්ලො කිහිපදෙනෙක් යතුරුපැදිවලින් ඇවිත් අපේ වත්තට රතිඤ්ඤා දාලා, තාප්පය පුරා විවිධ වැකි ලියලා ගිහින් තිබුණා. එදාම සවස 3.20 ට පොලිසියෙන් ඇවිත් 'කලබලයක් ඇති වෙන්න ඉඩ තියෙනවා' වයසක අය ඉන්නවා නම් ගෙදරින් ඉවත් කරගන්න කියලා දැනුම් දීලා තිබුණා..."

'අපි මොන වරදක් කළාට ද ගෙවල්වලින් ඉවත් වෙන්නේ... මගේ පොඩි දුවගේ මහත්තයා දේශපාලනය කළා කියලා අපි පලිද...' පැමිණ හිටිය පොලිස් නිලධාරීන්ගෙන් අම්මා එහෙම අහලා තිබුණා. අම්මගේ කතාව ඇත්ත... මගේ නිවස පිටුපස ඥාති දේශපාලනඥයෙක්ගේ ගෙයක් තිබුණා කියලා අපි ගෙවල්වලින් ඉවත් වෙන්නෙ මොකටද? ඔය සිද්ධිය වෙන දවසෙ අපි ලංකාවේ හිටියා නම් අපේ නිවස ගිනි පත්තු කරන්න දෙන්නේ නෑ. මැරෙන්න හරි අපි දෙන්නා ඉන්නවා. ඒත් වයසක අම්මට එහෙම ඉන්න බෑ. අම්මට වයස අවුරුදු 75 ක්. ආතරයිටිස් රෝගියෙක්. ඇවිදගන්නත් අමාරුයි. මේ වෙනකොට අපේ අම්මා ඉතුරු වෙලා තියෙන්නේ ඇඳිවත විතරයි. අවුරුදු දාසයේදී විවාහ ජීවිතයට ඇතුළු වී අපේ අම්මා ජීවිත කාලයේදීම හරි හම්බ කරපු සියලු දේ තිබුණෙත් අපේ ගෙදර. අම්මා එක දවසකටවත් ගෙදරින් පිට ඉන්න කැමැති නෑ. ඒත් අද අපේ අම්මා ජීවත් වෙන්න පිටගෙදරක..."

"එදා සවස පොලිසිය ඇවිත් ගෙවල්වලින් ඉවත් වෙන්න කියලා ගියාට අපේ දේපළ ආරක්ෂා කිරීමට ආරක්ෂක වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වුණේ නෑ. කෝපකාරී පිරිස පාලනය කරගැනීමට රටේ ආරක්ෂක අංශවලට බැරි වුණා. ඔවුන් වගකීම් පැහැර හැරියා. ජෙල් වෙච්ච ආණ්ඩුව 09 වැනිදා සිද්ධියේදී බිඳවැටී වැටුණා. අන්තිමේ නීතියක් නැති රටේ කරුමයට වන්දි ගෙවන්න වුණේ අසරණ අපිට..."

"මේ රටේ දේශපාලනය නරා වළක් බව අපිත් පිළිගන්නවා. දේශපාලනඥයන් බලු වෙලා කියලා අපිට පේනවා. ඇතැම් දේශපාලනඥයන් හොරා කන විත්තියත් ඇත්ත. අප්‍රමාණ ආර්ථික ගැටලුවලින් හෙම්බත් වී සිටින ජනතාවට සාධාරණයක් වෙන්න ඕන කියන තැන එදා ඉඳලා අපිත් හිටියා. ප්‍රංශ ජාතික හිතවතුන්, එරට ජීවත්වන ශ්‍රී ලාංකිකයන් දුනුවත් කරමින් අපට පුළුවන් උපරිමයෙන් මෙරට දුප්පත් ජනතාවට උදව් උපකාර කළා. ලෝකයේ මොන කොදෙව්වක හිටියත් අපි හොඳට ආගම, දහම අදහන මිනිස්සු. අදටත් උපන් රටට ආදරෙයි. මගේ පුතා ප්‍රංශයේ ඉපදුණාට, එරට හැදුනට සිංහල හොඳට කතා කරනවා. එයාගේ විවාහ මංගල්‍යය කරන්නෙත් මෙරට චාරිත්‍රානුකූලව. අපි ප්‍රංශයේ ජීවත් වුණාට සැඳෑ සමය ගෙවන්න සැලසුම් කරලා තිබුණේ ලංකාවේ උපන් ගමේ. වයසක අපිට දරුවට, රටට බරක් නැතිව ජීවත් වෙන්නත්, ඉපදුණු රටට යමක් කරන්නත් සිතාගෙන 2019 වර්ෂයේදී කන්ට්‍රක්ෂන් කොම්පැණියක් ආරම්භ කළා. මේ වෙනකොට අපේ ආයතනයේ පහළොස්දෙනෙක් විතර වැඩ කරගෙන යනවා. පිළියන්දල, වෑවල හාඩ්වේයාර් එකක් තියෙනවා. ඒ සියලු ව්‍යාපාර දැනට අපි ප්‍රංශයේ ඉඳලා පාලනය කරගෙන යනවා. ඒ වගේම අවුරුදු පහළොවක් තිස්සේ ඉඳලා සිහින මාලිගාව විචිත්‍රවත් කරගෙන ආවේ සැඳෑසමය මානසික සුවයෙන් ගතකරන්න. තනිමහල් කාමර පහකින් යුත් අපේ ගෙදර තියෙන කෑම මේසයයි, පුටු දහයයි මිලදී ගන්න අවුරුදු පහළොවකට පෙර රුපියල් ලක්ෂ පහළොවක් වියදම් වුණා. ඉන්දුනීසියන් තේක්ක ලීයෙන් තමයි ඒ බඩු හදලා තියෙන්නේ. ගෙදර තියෙන අනිත් ලී බඩුත් ඇන්ටික්. වහළ, උළුවහු ජනෙල් සේරම ඇන්ටික් විදිහට තමයි හදලා තියෙන්නේ. ඇන්ටික් හවුස් එකක් නිර්මාණය කිරීම අපි දෙන්නාගේම එකම සිහිනය. දැන් ඒ සිහිනය පිච්චිලා ගියා. කෝටි ගාණක අලාභයක්. නැවත ඒ නිවස ගොඩනැඟීම හිතාගන්නවත් බෑ. අලුතින් ගෙවල් හදන්න අපිට වයසත් නෑ. දැන් මට වයස අවුරුදු 55 යි. විශ්‍රාම යන්න තව ටික කාලයයි. මහත්තයට වයස අවුරුදු 59 යි. තව අවුරුදු 6 න් විශ්‍රාම යනවා. පුතාට වයස අවුරුදු 28 යි. එයාව ලංකාවේ ජීවත් කරවන්න ඕන නිසා තමයි අපේ ශ්‍රමය, ධනය කැප කරලා ඇන්ටික් හවුස් එක ගොඩනැගුවේ..." ඇයට වචන පැටලිණි. හදවතේ තෙරපෙමින් තිබුණු වේදනාව දෙකපුල් රත් කරගෙන ඇඳුමට වැටෙන අයුරු අපි දුටිමු. ඇයගේ හදවතේ කැකෑරෙන වේදනාව කඳුළු කිරීමට ඉඩ දී අපි බලා සිටියෙමු.



ලලනි රුබේරු සහ ඉඳුනිල් ඉලේපෙරුම



ගිනි තැබීමට පෙර



ගිනි තැබීමට පසු

ලලනි රුබේරුගේ පමණක් නොව දේශපාලනයට සම්බන්ධයක් නැති, ලොකු අප්පච්චිගේ අවසාන භෝජන සංග්‍රයට නොපැමිණි සිවිල් වැසියන් බොහෝදෙනකුගේ නිවාස, දේපළ පසුගිය මැයි 09 වැනිදා රාත්‍රියේ ගිනිබත් වූ බව සැබෑය. හොරකමෙන් තොරව මහත්මා දේශපාලනයක් කරගෙන ගිය ජනතා නායකයන්ගේ නිවාස, දේපළ ද විනාශ කර ඇති බව සැබෑය. එමෙන්ම හොරකම් කර ගොඩනඟාගත් හෝ නිවාස, දේපළ විනාශ කිරීම මේ රට තුළ තව, තවත් වෛරය වැපිරීමකි. සාපය පැළ කිරීමකි. 09 වැනිදා මූසල හැන්දෑවේ ගිනිබත් වූ දේපළවල අයිතිකරුවන් බහුතරයක් දැන් සිටිනුයේ මෙරට ජනතාව සමඟ වෛරයෙනි. කෝපයෙනි. ඇතැම්හු තම දේපළ ගිනි තැබූ අයට පමණක් නොව මේ රටටම හෙණ ඉල්ලන්නාහ. එවැනි රටකට සොබාදහමේ සරණ හෝ නොලැබෙන තරම්ය.

"අවුරුදු පහළොවක කාලයක සිට ගොඩනඟාගෙන එන සිහින මාළිගාව ගිනි පත්තු වෙන හැටි අපි ප්‍රංශයේ ගෙදර ඉඳලා බලාගෙන හිටියා. ඒ මොහොතේ දැනුණු වේදනාවට හදවත නතර නොවුණා පුදුමයි..." ඉකිබිඳුම තුළින් නැවත ලලනි කතා කරන්නීය.

"ඒ වගේ වේදනාවක් නම් කුරා කුහුඹුවකුටවත් නොවෙන්න ප්‍රාර්ථනා කරන්න ඕනෑ. අපි මේ රටේ අහිංසක සිවිල් වැසියන්. අපිට කරපු විනාශයට උපරිම සාධාරණය ඉෂ්ට වෙන්න ඕනෑ. එහෙම නොවෙන්න මම ජාත්‍යන්තර අධිකරණය ඉදිරියට යනවා. මැයි 09 වැනිදා ඛේදවාචකයෙන් අගතියට පත් සාමාන්‍ය පුරවැසියන් සියලු දෙනා අපිත් එක්ක එකතු වෙන්න. අපිට වෙච්ච අසාධාරණය වෙනුවෙන් හඬක් නඟමු. අපේ දේපළ හානිවලට අනිවාර්යෙන්ම රජයෙන් වන්දි ගෙවිය යුතුයි. ඒ වන්දි ගෙවීමේදී අපි වගේ සාමාන්‍ය පුරවැසියන්ට වෙච්ච අලාභහානිවලට ප්‍රමුඛතාව ලැබෙන්න ඕනෑ. ඒ වගේම මැයි 09 වැනිදා සිද්ධියෙන් පස්සෙ ඇති වූ කම්පනයට දැන් අපේ අම්මට ඇවිදගන්නම බෑ. ඇඳ මත උඩ බලාගෙන 'දැන් මට මොකද වෙන්නෙ' කියලා අහනවා. ඒ වචන ඇහෙනකොට හදවත පිච්චෙනවා. තවත් මේ දුක ඉවසගෙන ඉන්න බෑ. නටබුන් ගොඩක් වෙච්ච සිහින මාලිගාව දකින වාරයක් පාසා අපේ සිත් තැවුලට පත් වෙනවා. ඒ නිසා ටික දවසකට නැවත අපි ප්‍රංශයට යනවා..." ලලනි කැලුම් රුබේරු මහත්මියගේ කතාවට ඇයගේ සැමියා ඉඳුනිල් ඉලේපෙරුම ද විටින් විට එකතු විය. ඔවුන්ගේ බිඳුණු හඬ දැවෙන මානසික කම්පනයේ තරම අපට අවබෝධ කර දුන්නේය. ඒ දැවීම අපගේ හදවත්වලට ද බරකි.

ප්‍රකෝපකාරී වියරුවෙන් හැසිරෙමින් මැයි 09 වැනිදා හැන්දෑවේ රට පුරා ගිනි ඇවිළ වූ නොහික්මුණු චණ්ඩි දැන් නොණ්ඩිය. රට ගිනි තැබීමට පෙරමුණ ගත් කාලකණ්ණි දේශපාලන රැල ද නිහඬය. ගිනිබත් වූ රාජ්‍ය දේපළවලට මෙන්ම පෞද්ගලික දේපළවලට වන්දිගෙවීමට සිදුව ඇත්තේ මෙරට පීඩිත ජනතාවටමය. දැන් අපට ඇසීමට ඉතිරිව ඇත්තේ මෙපමණකි.

දැන් සැපද?

**● තරංග රත්නවීර**

---

## "උයා ගන්න ගෑසුත් නෑ කන්න බොන්න විදියක් නෑ දියව් දියව් ගෑස් දියව් උයා ගන්න ගෑස් දියව්"



# ගෑස් අමතක කර විකල්ප ලිපකින් උයමු

පසුගිය දවස්වල රට පුරා පැවැති අරගලවලින් ගෑස් ඉල්ලා නැගුණු හඬ කිසිවෙකුටත් අමතක නැතැයි සිතමි. තවමත් රට පුරාම ගෑස් ඉන්ධන, අත්‍යවශ්‍ය භාණ්ඩ සහ සේවාවන් සඳහා දිගු පෝලිම් ය. තමාට සමීපයේම ඇති ගෑස් අලෙවි සලට ගෑස් ලැබෙන ආරංචියට මිනිසුන් පෝලිම් වන්නේ පෙරදා රාත්‍රියේ සිට ය. ඇතැමුන් කුසට හරිහමන් ආහාරයක්වත් නොගෙන ගෑස් වෙනුවෙන් බලා සිටියි.

පැය ගණනාවක් තිස්සේ කිලෝමීටර් ගණනාවක් දුර ගෙවාගෙන වෙළෙඳපොළ සමීපයට යන විට ගෑස් ඉවරයි ලෙස මුදලාලි කියද්දී මිනිසුන්ගේ බඩේ ගෑස් ඉහට ගසනවා මිස වෙනත් යමක් සිදු වන්නේ නැත.

ගෑස් ප්‍රශ්නයට අද හෙට විසඳුම් ලැබෙන බවට බලධාරීන් හිත සනසන වදන් පැවසුවද තවමත් ගෑස් ප්‍රශ්නයට විසඳුමක් පෙනෙන තෙක් මානයේ නැත. ඇතැම් අවස්ථාවල දුෂ්කර ගම්මානවල ඇති ගෑස් අලෙවිසල් වෙත ගෑස් ලැබුණ කාලයක් මතක නැතැයි වෙළෙඳුන් පවසයි.

කොළඹ සහ නාගරික ප්‍රදේශවල ජීවත්වන පිරිසටත්, ග්‍රාමීයව ජීවත්වන පිරිසටත් ගෑස් හිඟයත් සමඟම වචනයෙන් කිව නොහැකි තරම් ගැටලු රාශියකට මුහුණ පාන්නට සිදු වී ඇත. ගෑස් හිඟය නිසා රට පුරා ඇති අවන්හල්, ආපනශාලා සහ බේකරි විශාල ප්‍රමාණයක් මේ වන විටත් වසා දමා අවසන්ය.

ගෑස් හිඟවීමත් සමඟ බොහෝ දෙනකු විදුලියෙන් ආහාර පිසීම සඳහා යොමු වුවත් විදුලි බිල ඉහළ නැංවීම සහ විදුලි කප්පාදුව නිසා විදුලියෙන් ආහාර පිසීමේ ක්‍රමවේදය ද එතරම් සාර්ථක වූයේ නැත. ඒත් සමඟම බොහෝ දෙනෙක් දර ලිප්, මැටි ලිප් සහ භූමිතෙල් ලිප් වැඩි වශයෙන් මිලදී ගත්තේ ඒවායේ විකුණුම් මිල වෙළෙන්දන් විසින් සිතූ සේ වැඩි කළ යුගයක ය.

නමුත් අද වන විට භූමිතෙල් ලිප් වලින් ආහාර පිස ගැනීමටද නොහැකි තත්ත්වයක් උදාවී තිබේ. ගෑස්වලට මෙන්ම භූමිතෙල් සඳහාද ඉන්ධන පිරවුම්හල් අසල දිගු පෝලිම් ය.

මේ අතර ගෑස් පෝලිමට එක් වන්නට නොආ කොටසකුත් තවමත් අපි අතර සිටින බව සිහිපත් කළ යුතුය. ග්‍රාමීයව ජීවත්වෙන බොහෝ දෙනකු දන්නා දා සිට ආහාර පිස ගත්තේ දර ලිපට පින් සිදු වන්නටය. ඒ සඳහා අවශ්‍ය දර හිඟයක් නැතිව ගම්වලින් සපයා ගත හැකිය. විවෘත ආර්ථිකයත් සමඟ සියලු දේ පහසුවෙන් සහ ඉක්මනින් කර ගැනීමට පෙළඹුණු මිනිස්සු දර ලිප සහ දර ලිප් සංස්කෘතිය අමතක කර දමා ඒ වෙනුවට විදුලිය සහ ගෑස් ආධාරයෙන් ආහාර පිසීම සඳහා පෙළඹුණහ. විශේෂයෙන්ම මහල් නිවාස සහ පැල්පත් නිවාසවල ජීවත් වන පිරිසට ගෑස්වලින් ලැබුණේ වචනයෙන් කිව නොහැකි සහනයකි.

කළු දැලි සහ දුම නිසා දර ලිපේ ඉවීම බොහෝ දෙනකු ප්‍රතික්ෂේප කරයි. නමුත් සැබෑවටම දර ලිපේ පිසින ආහාර රසවත්ය. එහෙත් කාර්යබහුල ජීවිතයක් ගත කරන බොහෝ දෙනකුට ආහාරවල රස ගුණ ගැන හිතනවාට වඩා පහසුව ගැන සිතා තීරණ ගන්නට සිදුවිය. ඒ නිසා ඔවුහු ගෑස් ලිප මුළුතැන්ගෙයි සමීපතමයා බවට පත්කර ගත්හ.

නමුත් ගෑස්වල සංයුතිය වෙනස් වීමත් සමඟ දිගින් දිගටම ගෑස් පුපුරා යද්දී, විදුලි බිල වැඩි වෙද්දී ගෘහණියන් බොහෝ දෙනෙක් අකැමැත්තෙන් වුවත් ගෑස් වලින් ඈත් වී විකල්ප ක්‍රම වෙත යොමු විය.

යුග ගණනාවක් ආපස්සට ගියද දර ලිපේ ආදීනව වචනයෙන් කිව නොහැකි තරම්ය. නාගරික පිරිසට දර ලිප දල්වා ගැනීම අපහසු වුවත් ග්‍රාමීය පිරිසට දර ලිප දල්වා ගැනීම පහසු කාර්යයකි.

මේ උත්සාහ ගන්නේ නැවතත් ගල් යුගයට ගොස් දර ලිපට ආවඩන්නට මිනිසුන්ගේ මනස හදන්නට නොවෙයි. නමුත් ගෑස් එකදිගට ගෑස් පෙන්වද්දී ඒ වෙනුවට විකල්ප ක්‍රමවේද සෙවීම යුගයේ අවශ්‍යතාවයි.

ගෑස් හිඟයත් සමඟ ග්‍රාමීයව වෙසෙන බොහෝ දෙනෙක් දර ලිප් භාවිත කරන නමුත් නාගරිකව ජීවත්වන පිරිසට දර සපයා ගැනීමේදීද ගැටලු පැන නඟී. නමුත් අද වන විට නාගරිකව ජීවත්වන බොහෝ දෙනෙක් ද දර මිලදී ගනිමින් හෝ දර ලිප් භාවිත කර ආහාර පිසීමට පෙළඹී සිටිති. මේ අතර පිටරටින් ගෙන්වන ගෑස්වල ගෑස් නොබලා ජීව වායුව හරහා ආහාර පිසීමේ ක්‍රමවේදය පිළිබඳවද බොහෝ දෙනකුගේ අවධානය යොමු විය. රුපියල් 20,000 ක් වැනි මුදලකට ලංකාවේ ඕනෑම ප්‍රදේශයකට ගොස් ජීව වායුව හරහා ආහාර පිසීමේ ක්‍රමවේදයට අවශ්‍ය පහසුකම් සලසා දෙන අපූරු මිනිසකු අපට මුණගැසෙන්නේ මේ අතර ය.

ඔහු තිස්සමහාරාමයේ පදිංචි ප්‍රසන්න මුතුමාලය. ජීව වායුව ආශ්‍රයෙන් ආහාර පිසීම සම්බන්ධයෙන් ප්‍රසන්න දැක්වූයේ මෙවැනි අදහසකි.

"ගෑස් නැති එක දැන් රටටම ප්‍රශ්නයක් වෙලා. ඇත්තටම ගෑස්වලට හුරු වුණ හින්ද තමයි ඒක අපිට බරපතළ ප්‍රශ්නයක් විදිහට දැනෙන්නේ. නමුත් ඉසද ටී හෙවත් ජීව වායුව කියන්නේ ස්වභාවික ක්‍රියාවලියක්. ඒකට කිසිම සීමාවක් පනවන්න කාටවත් බෑ. මුළුතැන්ගෙයින් ඉවත දමන ආහාර කොටස්, සත්ත්ව මළ පහ වැනි දේවල් උපයෝගී කරගෙන අපිට මේ ජීව වායුව සකස් කරන්න පුළුවන්."

මුළුතැන්ගෙයින් ඉවත දමන අපද්‍රව්‍ය භාවිත කරමින් ජීවිත කාලයටම අවශ්‍ය ගෑස් ලබා ගැනීමට හැකියාව ඇති බවත් ප්‍රසන්න වැඩිදුරටත් කියා සිටියි. එමෙන්ම ගොම වැනි සත්ත්ව මළ පහ භාවිතයෙන් මහා පරිමාණයෙන් වුවද ජීව වායුව නිෂ්පාදනය කරගත හැකි බවත් ඒ හරහා ආපන ශාලාවල පවා ආහාර පිසිය හැකි බවත් සිහිපත් කළ යුතුය.





"සාමාන්‍යයෙන් මුළුතැන්ගෙයින් කොයිතරම් ආහාර ප්‍රමාණයක්, ඉවත දානවද? මහා පරිමාණයෙන් මේ ජීව වායුව නිෂ්පාදනය කළොත් දවසේ පැය 24ම වුණත් ආහාර පිස ගන්න හැකියාව තියෙනවා. ඇත්තටම අපිට අඩුම මුදලකට ජීවිත කාලයටම ගෑස් ලබා ගන්න හැකියාව තියෙනවා. අපි ඒ ක්‍රම හොයාගන්නේ නැති එක තමයි ප්‍රශ්නේ."

තිස්සමහාරාමයේ පදිංචි ප්‍රසන්නට දර වලින් අඩුවක් නැත. නමුත් ඔහු මේ ක්‍රමය පිළිබඳව දිගින් දිගටම අත්හදා බලන්නේ ගෑස් නොමැතිව පීඩා විඳින ජනතාවට සහනයක් වනු පිණිසය. ලීටර් පන්සියයේ වතුර ටැංකි දෙකක් හෝ දාහක වතුර ටැංකියක් ගෙන ජීව වායුව සකස් කර ගැනීම සඳහා අවශ්‍ය මූලික උපකරණ නිර්මාණය කරන නිසා ඒ වෙනුවෙන් මුදලක් අයකර ගැනීමට සිදු වුවද ඉන්පසුව ඒ සඳහා කිසිදු මුදලක් වැය වන්නේ නැති බවට ද ප්‍රසන්න සහතික වෙයි.

අපේ රට තුළ ඉවතලන ආහාර කොටස් ආහාර කොයිතරම් ද යන්නට කුණු කඳු සාක්ෂි දරනු ඇත. එවන් වටපිටාවක තවත් ගෑස් නැවක් එනතුරු පැය ගණනාවක්, දින ගණනාවක් පෝලිම්වල බලා සිටිනවාද එසේත් නොමැති නම් මෙවැනි විකල්ප ක්‍රමවේද සඳහා යොමු වෙනවා ද යන්න ජනතාවගේ තීරණයයි. කෙසේ නමුත් මේ ජීව වායුව හරහා ආහාර පිසීමේ ක්‍රමවේදය ගෑස් හිඟයට විසඳුමක් මෙන්ම ආහාර කොටස් වැනි දිරන කැළිකසළ බැහැර කිරීම කළමනාකරණය කිරීම සඳහාත් අපූරු විසඳුමක් වනු නොඅනුමානය.

මේ අතර නවීන ක්‍රමයට සකස් කරන ලද පොල්කටු අඟුරු ලිප් නිෂ්පාදනය කරන චමෝද් කවිශ්ක අපට හමුවන්නේ කැලණිය ප්‍රදේශයෙනි. නිවසේ ඉවතලන පොල් කටු, පොල්කටු අඟුරු කර භාවිත කිරීමට හැකියාව ඇති මෙම ලිපෙහි දැලි සහ දුම නොමැතිවීම ගෘහණියන්ට අපූරු ප්‍රතිලාභයකි. මේ පොල් කටු අඟුරු ලිප් සකස් කර ඇත්තේ කොන්ක්‍රීට්වලින් වීම නිසා සවි ශක්තිය පිළිබඳව ගැටලුවක් ඇතිවන්නේ ද නැත.

"මේ ලිප අපි හැදුවේ ගෑස් හිඟයට විසඳුමක් විදියට. පොල් කටු අඟුරු දාලා උයන්න හැකියාව තියෙනවා. අළු ටික පහසුවෙන් ඉවත් කරන්න පුළුවන්. ගිනිගන්න දේවල් නැති නිසා ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රශ්නයක් නෑ. කුඩා විදුලි පංකාවක් තියෙනවා විදුලියට සම්බන්ධ කරන්න. හැබැයි විදුලියට සම්බන්ධ නොකර භාවිත කරන්නත් අවශ්‍ය පහසුකම් සලසලා තියෙනවා. පොල් කටු තුනක අඟුරුවලින් ව්‍යංජන තුනක් වගේ පිළියෙල කරගන්න පුළුවන්. ගින්දර අඩු වැඩි කිරීමේ හැකියාව තියෙන නිසා වලට සමානවම පොල්කටු අඟුරු ලිපෙනුත් උයන්න පුළුවන්. පොල් කටු අඟුරු සපයා ගන්න බැරි කෙනෙක් හිටියොත් අඟුරු කිලෝ එකක් රුපියල් දෙසීයක් වැනි මුදලකට අපෙන් ලබාගන්න පුළුවන්."

මෙම ලිපක් වෙළෙඳපොළේ රුපියල් හත්දාහක් අටදාහක් අතර ප්‍රමාණයකට මිලදී ගැනීමට හැකියාව ඇත.

මේ ගෑස් හිඟයට සාර්ථක විකල්ප ක්‍රම සෙවූ පුද්ගලයන් දෙදෙනකු පමණි. මෙවැනි සාර්ථක නව නිර්මාණ කරන බොහෝ දෙනෙක් අපේ රටේ තවමත් සිටිනවාට සැකයක් නැත. ගැටලු ඇත්තේ ඔවුන්ට ඒ නිෂ්පාදනයන් කිරීම සඳහා අවශ්‍ය වටපිටාව නිර්මාණය නොවීමයි. තවදුරටත් ගෑස්වල ගෑස් බලමින් මහා පාරටම දවසේ පැය 24න් වැඩි කාලයක් දිය කරනවාද, එහෙමත් නැත්නම් මෙවැනි විකල්ප ක්‍රම අනුගමනය කරමින් අපි අපිම මේ ප්‍රශ්නයෙන් ගොඩ එනවාද යන්න තීරණය කළ යුත්තේ අපිමයි.

දේශීයව බිහිවන මෙවැනි නිපැයුම් සඳහා නිසි වටිනාකමක් ලබාදී එම නිෂ්පාදන ලංකාව පුරා බෙදා හැරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට බලධාරීන්ගේ අවධානය දැන්වත් යොමුවිය යුතුය. එමෙන්ම සියලු දේම රුපියල් සත මත තීරණය වන යුගයක මැටි ලිපේ සිට මෙවැනි නිපැයුම් සිදුකරන සියලු දෙනාද සාධාරණව මුදල් උපයමින් මේ මොහොතේ ජනතාවට ද ජනතාවට ද සහනයක් සැලසිය යුතු බවද සිහිපත් කරමි.

**● කුමාරි ඉරුගල්බංඩාර**

දිවයින
ඉරිදා සංග්‍රහය





# සතියේ දේශපාලනය





# ජනපතිගේ සාකච්ඡාවට අමුතු අමුත්තෙක්

පසුගිය සතිය සුවිශේෂී සතියක් විය. ඒ සුවිශේෂීබවට තුඩුදුන් විශේෂ කාරණා දෙකක්ම තිබිණි. එකක් පසුගියදා පැවති අරගලවල දී වත්මන් ආණ්ඩුවේ වඩාත්ම කතාබහට ලක්වූ පුද්ගලයා වන බැසිල් රාජපක්ෂ පාර්ලිමේන්තු දේශපාලනයට ආයුබෝවන් කීමයි. දෙවෙනි විශේෂ කාරණාව වූයේ මේ රටේ විදුලිබල උත්පාදනය සඳහා වූ එක්තරා බලවත් බාධකයක් බිඳ දමන්නට පාර්ලිමේන්තුව තීන්දුවක් ගැනීමයි. මෙම කාරණා දෙක වටා ගොනු වූ හා පසුබිම් වූ කරුණු කාරණා රැසක් පසුගිය සතියේ අපේ දේශපාලන කතිකාවේ සාකච්ඡාවට බඳුන් විය.

ඉහත කී කාරණා දෙක පසුගිය සතියේ අපේ රටේ දේශපාලනයේ මොන මොන කතා ඇති කළත් පසුගිය සතියේදී සුපුරුදු ලෙස අපේ දේශපාලන කතිකාවේ වඩාත්ම බැනුම් ඇසූ සහ අපවාදයට ලක් වූ පුද්ගලයා වූයේ ද අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහයි. රනිල් වික්‍රමසිංහ සමහර දේශපාලන කල්ලි කණ්ඩායම්වලට තඩි බාන්නට හොඳ ''මුවහමක්'' වුවත් රනිල්ගේ පැත්තෙන් බලනවිට පෙන්නුම් කළ කාරණාව වූයේ රනිල් තලන්නට තලන්නට පන්නරය ලබන යකඩයක තත්ත්වයට දේශපාලනය තුළ හැඩගැසී ඇති බවකි.

පසුගිය සතිය පාර්ලිමේන්තු සතියක් විය. රනිල් මේ සතියේ පාර්ලිමේන්තුවට එන්නට පෙර විදේශීය මාධ්‍ය කීපයකටම දේශපාලන සාකච්ඡා ලබා දෙන්නට කල්පනා කළේ රට මුහුණ පා තිබෙන අර්බුදවල ඇත්ත ඇති සැටි ලෝකයට වටහා දෙන්නට හොඳ සූදානමක් ඇතිව ය. ඔහුගේ අරමුණ වූයේ ලෝකයට රට මුහුණ පා ඇති සැබෑ තත්ත්වය පැහැදිලි කර දී ඔවුන්ගේ අවධානය දිනා ගත යුතු බවය. එහිදී ඔහුට විදේශ මාධ්‍යවේදීන්ගේ අසීරු හරස් ප්‍රශ්න රාශියකට ද මුහුණ දෙන්නට සිදු විය.

කෙසේ වෙතත් පාර්ලිමේන්තුව තුළ ද ඔහුට පසුගිය සතියේ සිදු වූයේ හුදෙකලා සටනක් කරන්නට ය. තම පක්ෂයේ කිසිදු මන්ත්‍රීවරයෙකුගේ සහාය නොමැතිව, විපක්ෂයේ කිසිදු සහයක් නොමැතිව, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයේ කිසිදු සහයක් නොමැතිව ආණ්ඩු පක්ෂයේත් ඇතැම් බලවේගවල විවිධ විවේචන මැද ජනාධිපති තනතුර සහ ආණ්ඩුව ඉදිරියට ගෙන යෑම ඔහුට පහසු වූයේ නැත. ඇතැම් කාටූන් ශිල්පීන් මෙය උපමා කර තිබුණේ කුණාටු සුළි සුළං මැදින් ගිලෙන්නට ඔනන මෙන්න තිබෙන යාත්‍රාවක් මහා බර කන්දරාවක් ද සමගින් අසීරුවෙන් ගොඩබිමක් කරා යාත්‍රා කරවන යාත්‍රිකයෙකුගේ විලාසයකටය.

සඳුදා පෙරවරුවේ අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත පැමිණි අගමැතිවරයා ආර්ථික අර්බුදය විසඳීම වෙනුවෙන් අවශ්‍ය සැලසුම් සකස් කළ අතර පසුදින පාර්ලිමේන්තුවේදී කරන කතාව සම්බන්ධයෙන් වැඩි වේලාවක් වෙන් කර තිබුණි. ඒ වෙනුවෙන් මුදල් අමාත්‍යාංශයේ හිටපු ලේකම් සමරතුංග ගේ ද සහාය ලබා ගත්තේය.

එදිනම කැබිනට් මණ්ඩල රැස්වීම යෙදී තිබුණ අතර අගමැතිවරයා ඊට පෙර නීතිපතිවරයා හා නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මෙන්ම අධිකරණ ඇමැති විජයදාස රාජපක්ෂ මුණ ගැසුනේ 21 වෙනි සංශෝධනය ගැන සාකච්ඡා කිරීමටය.

''විපක්ෂය ඉදිරිපත් කර ඇති 21 වෙනි සංශෝධන පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතේ තත්ත්වය මොකක්ද'' අගමැති විමසා සිටියේය.

''ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ එය තවම විභාග වෙනවා. එහි තීන්දුව ලද පසුව අපට ආණ්ඩුවේ පනත ගැන ඉදිරි කටයුතු කරන්න පුළුවන්.'' නීතිවේදියෙකු කීවේය.

''එම තීන්දුව ගැන මාව දැනුවත් කරන්න.'' අග මැතිවරයා නීති නිලධාරීන්ට දැනුම් දුන්නේය.

අගමැතිවරයා අධිකරණ ඇමැතිවරයාට දැනුම් දුන්නේ ඇමැති මණ්ඩලයට 21 වෙනි සංශෝධනයේ කෙටුම්පතක් ලබා දෙන ලෙසය. එය අධ්‍යයනය කොට ඊළඟ සතියේ ඇමැති මණ්ඩලයේදි සාකච්ඡා කළ හැකි බව අගමැතිවරයා එහිදී දන්වා සිටියේය. ඒ අනුව 21 වෙනි සංශෝධනයේ පිටපතක් හා රුපියල් බිලියන 695 ක පරිපූරක ඇස්තමේන්තුව ඇමැති මණ්ඩලය වෙත ඉදිරිපත් වූ අතර ඇමැති මණ්ඩලය එය අනුමත කරන ලදී.

හරීන් ප්‍රනාන්දු ඇමැතිවරයා විසින් කොවිඩ් සමයේදී හා ආර්ථික අර්බුදයේදි බිඳ වැටුනු සංචාරක කර්මාන්තයේ සිටින ව්‍යාපාරිකයන්ගේ බැංකු ණය වෙනුවෙන් සහනයක් ලබා දෙන ලෙස ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවට ද අනුමැතිය හිමිවිණි. අගමැතිවරයා විසින් ඇමැතිවරුන් වසරක කාලයක් ඇමැති වැටුප් නොගෙන වැඩ කිරීමට ඉදිරිපත් කළ යෝජනාව ද ඇමැතිවරු ඒකමතිකව පිළිගත්හ.

කැබිනට් රැස්වීමේදී රැකියා සඳහා විදේශගත වීමේ වයස අවුරුදු 25 සිට 18 දක්වා අඩු කිරීමට යෝජනාවක් ඉදිරිපත් විය. එම යෝජනාව ඉදිරිපත් කර තිබුණේ, කම්කරු සහ විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාරය.

එහෙත් ඇමැති දිනේෂ් ගුණවර්ධන ඊට එරෙහි විය.

''අපේ රටේ ළමයි පාසල් ජීවිතය හමාර කරන්නේ, අවුරුදු 18න්. මේ නිසා මේ ළමයි වගේම විශේෂයෙන් ගැහැනු ළමයි ඒ වගේ වයසකදී විදේශ රැකියා සඳහා යැවිය යුතු නෑ'' දිනේෂ් එසේ කියද්දී අගමැති රනිල් වික්‍රමසිංහද අදහස් දැක්විය.

''ඒක හරි, අවුරුදු 18 කියන්නේ ළමා වයස අවසන් වුණා විතරයි. කමිටුවක් දාල අපි ඒ ගැන තව සොයා බලමු'' දිනේෂ් යළි කතා කළේය.

''ළමාරක්ෂක පනත අනුව තියෙන ළමයින් සඳහා නිර්වචනයත් අපි සලකා බලන්න ඕනේ''

ඒ වගේම යෝජිත 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සඳහාද දිනේෂ් ගුණවර්ධන මහතා ප්‍රමුඛ මහජන එක්සත් පෙරමුණ පසුගිය සතියේ සිය යෝජනා ඉදිරිපත් කළේය.

''ජනමත විචාරණයකින් හෝ පාර්ලිමේන්තුවේ ආයු කාලය දීර්ඝ නොකළ යුතුය, යන එක අපේ එක යෝජනාවක්, හැම මන්ත්‍රීවරයෙකුට ම පාලනයට එන්න පුළුවන් වෙන්න යළි විධායක කාරක සභා ක්‍රමය ඇති කළ යුතුයි.''

අදාළ සාකච්ඡාවේදී දිනේෂ් ප්‍රකාශ කළ අතර, ''පාර්ලිමේන්තුව නියෝජනය කරන හැම පක්ෂයකින් ම 21 වන සංශෝධනයට අදහස් ගත යුතුයි'' යනුවෙන්ද පැවසීය. අගමැති ඉවත් කිරීමේ බලයත් ජනාධිපතිට හෝ පාර්ලිමේන්තුවට තිබිය යුතුය යනුවෙන් හා විපක්ෂ නායක ධුරය ගැන ව්‍යවස්ථාවේ අර්ථ නිරූපණයක් හා පත්වන ආකාරය ගැන නිශ්චිත විධිවිධාන ඇතුළත් කළ යුතුය යනුවෙන්ද එම යෝජනාවලට ඇතුළත්ය.

ඇමති මණ්ඩල රැස්වීමෙන් පසුව අගමැතිවරයා නැවත සිය ආර්ථික උපදේශක සමරතුංග ඇතුළු කණ්ඩායම මුණ ගැසී අඟහරුවාදා පාර්ලිමේන්තුවේ දී කරන කතාව සකස් කරන්නට විය. පසුදින පාර්ලිමේන්තුවේදී ඔහු ආර්ථික තත්ත්වය ගැන කතා කළ අතර කතාව අවසානයේ කළ වින්සන්ට් චර්චිල්ගේ ප්‍රකාශය ගැන මන්ත්‍රීවරු බොහෝමයක් අගමැතිවරයා මුණ ගැසී ඒ ගැන විමසන්නට වූහ. අගමැතිවරයාද කිසිදු ලෝබකමකින් තොරව එම කතාව කියා සිටියේ සතුටිනි.

අගමැතිවරයා පාර්ලිමේන්තු සතියේ වැඩි කාලයක් පාර්ලිමේන්තුවේ රැඳී සිටි අතර අගමැති කාර්යාලයේදී සේම පාර්ලිමේන්තු ලොබියේදී ද පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් අගමැතිවරයා මුණ ගැසී පවතින ආර්ථික තත්ත්වය විමසන්නට වූහ.

''ආර්ථික තත්ත්වය එන්න එන්නම අමාරු වෙනවා. මොකද කරන්නේ.'' පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු බොහෝමයකගේ පැනය එය විය.

''අපි උත්සාහ කරනවා. සැලසුම් සකස් කරනවා. ජනවාරි වෙනකම් අමාරුවෙන් තමයි යන්න වෙන්නේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය ලැබුණ ගමන් අපට ඉස්සරහට යන්න පුළුවන්.'' අග්‍රාමාත්‍යවරයා පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් හමුවේ කීවේ එකම කතාවකි.

## ● ප්‍රසන්නගේ තීන්දුවට මැතිසබේ තහනම්ද?

පොහොට්ටුවේ මන්ත්‍රීවරුන්ට යහපාලන සමයේ පවරන ලද නඩු බොහෝය. නාගරික සංවර්ධන හා නිවාස ඇමැති ප්‍රසන්න රණතුංගටද එවන් නඩුවක් තිබිණි. මහාධිකරණය හමුවේ පවරා තිබූ එම නඩුවේ චෝදනා 15ක් ඉදිරිපත් කර තිබූ අතර චෝදනා 14 කින්ම මොහු නිදහස් වූවත් එක් චෝදනාවකින් වරදකරු බව අධිකරණය ප්‍රකාශ කර තිබිණි. ඒ අනුව ඔහුට ලබා දුන්නේ වසර දෙකකින් අත්හිටුවනු ලැබූ සිරදඬුවමකි.

සඳුදා සවස තීන්දුව ප්‍රකාශයට පත් කිරීමේ අවස්ථාවට මහින්දානන්ද, නිමල් ලාන්සා, නලින් ප්‍රනාන්දු, සහන් ප්‍රදීප් වැනි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ද පැමිණ සිටියහ. තීන්දුව ප්‍රකාශයට පත් කිරීමෙන් පසු අධිකරණයෙන් පිටතට පැමිණි ප්‍රසන්නට මුල්ම ඇමතුම ලැබුණේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගෙනි.

මොකක්ද ප්‍රසන්න වෙලා තියෙන්නෙ..? නඩු තීන්දුව පැහැදිලි කළ ප්‍රසන්න තමන් එදින කැබිනට් රැස්වීමට සහභාගි නොවන බව කීවේය.

''සර් මම තාම ඇපිල් කළේ නෑ.. ඇපිල් කරනකන් මම කැබිනට් රැස්වීමට එන එක සදාචාර සම්පන්න නෑ. ඒ නිසා අද කැබිනට් රැස්වීමට මම එන්නෙ නෑ ..'' ප්‍රසන්න කීවේය.

''ඔව් ඒක හොඳයි ප්‍රසන්න'' ජනාධිපතිවරයා උත්තර දුන්නේය.

මේ අතර ප්‍රසන්නගේ තීන්දුව පිළිබඳව රට තුළ විවිධ අර්ථකථන මතු කරන්නට විපක්ෂය කටයුතු කරමින් තිබිණි. ජවිපෙ ප්‍රචාරක ලේකම් විජිත හේරත් කීවේ ප්‍රසන්න ඇමැති ධුරයෙන් ඉවත් කළ යුතු බවය. පැෆරල් සංවිධානයත් මේ බව ප්‍රකාශ කර තිබිණි.

මෙය දැනගත් ප්‍රසන්න ද මේ පිළිබඳව නීතිමය තත්ත්වය පැහැදිලි කර ගන්නට කටයුතු කළේය. ඇමැතිවරයාට හිතවත් නීතිඥ වේදියෙකු මේ පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයාගෙන් ද විමසුවේය. මැතිවරණ කොමසාරිස් ජනරාල් සමන් ශ්‍රී රත්නායක කීවේ නඩු තීන්දුව හේතුවෙන් ප්‍රසන්නගේ මන්ත්‍රී ධුරය අහෝසි නොවන බවය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 (ඇ) වගන්තිය අනුව මාස 6ක කාලයක් බන්ධනාගාර ගත වූවොත් පමණක් මන්ත්‍රීධුරය අහෝසි වන බව මැතිවරණ කොමසාරිස්වරයා පැහැදිලි කළේය.

කැබිනට් රැස්වීමට සහභාගි නොවුණ ද ප්‍රසන්න එදින (6) සවස ජනාධිපති මන්දිරයේ පැවැති ආණ්ඩු පක්ෂ මන්ත්‍රී කණ්ඩායම් රැස්වීමට සහභාගි වූයේය. රැස්වීමට ගිය ප්‍රසන්න වටකරගත් මන්ත්‍රීවරු නඩු තීන්දුව ගැන ඇසුවේය.

''ව්‍යාපාරයක් සම්බන්ධයෙන් මගේ බිරිඳට ලැබිය යුතු මුදලක් ලබා ගැනීමට ස්වාමිපුරුෂයා ලෙස මැදිහත්වීම පමණයි මම කළේ. මම මේ ගැන ඇපීල් කරනවා'' තමන් සිදුකළ බව කියන වරද මන්ත්‍රීවරුන්ට පැහැදිලි කළ ප්‍රසන්න ව්‍යාපාරිකයාගෙන් කප්පමක් ගත් බවට නැගෙන චෝදනා වැරදි බව ද කීවේය. මේ වන විට තවදුරටත් අධිකරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වන බැවින් තමන් මේ පිළිබඳව පැහැදිලි කිරීමක් සිදුනොකරන බවද කීවේය.

## ● අරගලයට සහායෙන් වරායට බර පාඩුවක්..

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ පසුගිය සති අන්තයේත් වැඩ රාජකාරි රැසක් සමඟ සිටියේය. ඒ අතර උත්සවද කීපයක් විය. නැගෙනහිර හා වයඹ විශ්වවිද්‍යාලවලට කුලපති හා උපකුලපතිවරු පත් කිරීම, විදේශ රටවල හිඟ පාඩුව තිබූ තානාපති පත්වීම් කීපයක් කිරීම ආදී උත්සව කීපයකි.

ඒ අතර ජනාධිපතිවරයා පසුගිය නම වැනිදා උදේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ විශේෂ ප්‍රගතිය සමාලෝචන රැස්වීමක් කැඳෙව්වේ ප්‍රගති සමාලෝචනය සඳහාම පමණක් නොව, වර්තමානයේ මතු වී ඇති වෙනත් ප්‍රශ්න කිහිපයකට ද විසඳුම් සෙවීම සඳහාය. ඒ වනවිට නතර කරවාගෙන සිටි රුසියානු ගුවන් යානය පිළිබඳ ප්‍රශ්නය ද ඒ අතර විය. බොහෝ දෙනකු අර්ථ දක්වා තිබුණේ මෙය අහක යන කුණු ගොඩක් ඇඟේ දමා ගැනීමක් හැටියටය. එහෙත් එය අහක යන කුණු ගොඩක් නොව, රජය අපහසුතාවට හෙළීමේ තවත් එක් කුමන්ත්‍රණයක පැතිකඩක් ලෙස මේ සිදුවීම නිරීක්ෂණය කරන පිරිසක් ද සිටියහ.

උදේ දහයට ජනාධිපතිවරයා ගේ ප්‍රධානත්වයෙන් ආරම්භ වූ මෙම රැස්වීම සඳහා අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා, ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී අනුර දිසානායක, අමාත්‍යාංශ ලේකම්, වරාය සභාපති ආචාර්ය ප්‍රසන්න, ගුවන්තොටුපළ හා සිවිල් ගුවන් සේවා ආයතනයේ සභාපති විශ්‍රාමලත් හමුදා ජනරාල් වී. ඒ. චන්ද්‍රසිරි ඇතුළු අමාත්‍යාංශයේ වගකිවයුතු නිලධාරීන් පිරිසක් පැමිණ සිටියහ. මෙහිදී මුලින්ම අරමුණු පැහැදිලි කළේ නිමල් සිරිපාල ද සිල්වා ඇමතිවරයා ය.

''පහුගිය නම වෙනිදා අරගලකරුවන්ගේ සහයෝගයට වරාය කම්කරුවෝත් එකතුවෙලා වෘත්තීය ක්‍රියාමාර්ග ගත්තා. වරායේ බඩු බාන්න ආපු නෞකා විශාල ප්‍රමාණයක් හරවලා ඇරියා. එකෙන් දැනට ගණන් බලපු විදිහට අපිට සිද්ධ වුණු පාඩුව ඇමරිකන් ඩොලර් මිලියන 1.2 ක් විතර. සාමාන්‍යයෙන් ලොකු නැව්වල කන්ටේනර් හා බඩු ගෙනත් ඒවා පොඩි පොඩි නැව්වලට පටවලා ඉන්දියාවට පකිස්තානෙට අවට රටවල්වලට යවන්නෙ කොළඹ වරායෙන්. ඒක අපිට තියෙන ලොකු ආදායමක්. එදා සිද්ධ වෙච්ච ඒ කලබැගෑනිය නිසා දැන් සමහර නැව් ලංකාවට එන්නත් බෑ කියනවා. එහෙම කරාම නැති වෙන්නේ ලංකාවට ඩොලර් වශයෙන් එන්න තියන මුදල්.'' ඇමැති නිමල් කීවේය.

''රටට ඩොලර් එන එක නවත්තන්න ලොකු කුමන්ත්‍රණයක් ක්‍රියාත්මක වෙනවා'' නිලධාරීන් කීහ.

''එහෙම නෙමෙයි. ඔයගොල්ලෝ මේ වෘත්තිය සමිති එක්ක කතා කරන්න. උඹලා මේ විදිහට නැති කර ගන්නේ තමන්ගෙම තියෙන ආදායම් මාර්ග ටිකයි කියලා එයාලට පැහැදිලි කරලා දෙන්න. සමහර අය හිතන්නේ ඔය වගේ දේවල් කළාම පාඩු වෙන්නේ රජයට විතරයි කියලා. ඒ පාඩුව එයාලටත් බලපානවා කියලා පැහැදිලි කරන්න.'' ජනාධිපති කීවේය.

ඉන්පසුව සාකච්ඡා කළේ චයිනා හාබර් සහ ඇක්සස් ලංකා ආයතන දෙක එක්ව ඉදිකිරීම් කරන වරායේ නැගෙනහිර ජැටිය ඉදිකිරීම් ගැනය. ඩොලර් හිඟය ඩීසල් හිඟය හා මතුව ඇති දුෂ්කරතා ගණනාවක් නිසා එහි වැඩකටයුතු අකර්මණ්‍ය වී ඇතැයි වාර්තා විය.

''වරාය සේවකයෝ අකුරටම ඒගොල්ලන්ගෙ දීමනා ගැන හොයනවා. බෝනස් ඉල්ලන්න එනකොට දේශපාලන මතිමතාන්තර නිසා විරසක වෘත්තිය සමිතිත් හරිම සමගියි. හැබැයි ආදායම් එන එක වර්ධනය කරන්න සහයෝගය දෙන්නේ නෑ'' වරාය ලොක්කෙක් කරුණු කියන්නට විය.

''වරායට ඔරොත්තු නොදෙන තරම් විශාල සේවක සංඛ්‍යාවක් ඇතුළේ ඉන්නවා. 2015 - 19 කාලේ ඒ තිබුණු ආණ්ඩුව 1500ක් වරායට රිංගෙව්වා. අනවශ්‍ය බරක්. උදාහරණයක් හැටියට මෙහෙයුම් කරන අලිටග් යාත්‍රාවක ඉන්න ඕන සේවකයෝ 15 දෙනයි. නමුත් දැන් 56 ක් ඉන්නවා. හරිම ප්‍රශ්නයක්. අපේ කාලේ අපි ගත්තෙ අත්‍යවශ්‍යම තාක්ෂණික සේවකයෝ විතරයි.'' ඇමැතිවරයා වරායේ වියදම් වැඩිවීම සම්බන්ධයෙන් ඇති ප්‍රායෝගික ප්‍රශ්නයක් කතා කළේය. ඒ අතර වරාය සේවකයන් නොමිලේ ලබාගන්නා ආහාර පාන පහසුකම් හා වරප්‍රසාද ගැන නිලධාරියෙක් හෙළිදරව් කළේ ඒවාට රජය වැයකරන වියදම ද පෙන්වා දෙමිනි.

''ආදායම වැඩි කරගන්න පුළුවන් මාර්ග මොනවද'' ...ජනාධිපති විමසීය.

''අපි දැනට මේ තරම් පහසුකම් තියාගෙනත් වරායෙන් කරන්නේ ප්‍රතිඅපනයන කටයුතු 3%යි. මේක 25% දක්වා වර්ධනය කළ හැකියි. ලෝකෙ තියෙන හොඳම නැව් සමාගම් 11ක් අපේ වරායට එනවා. තේරුමක් නැති වෘත්තීය ක්‍රියාමාර්ග ඒකට ලොකු බාධාවක්'' සභාපතිවරයා ඇතුළු නිලධාරීන් කතා කළහ.

ත්‍රිකුණාමලය වරාය දැනට ප්‍රීමා සමාගමට භාර දී සුදු අලියෙක් වී ඇති බව මෙහිදී කතාබහට ලක්විය. ගාලු වරාය දියුණු කිරීමට ඇති බාධා ගැනද කතාබහ විය.

මේ අතර දැනට වරායට බරක් වී ඇති අතිරේක කාර්ය මණ්ඩලවලට කුමක් කරන්නේද කියා ඇතිවූ සාකච්ඡාවේදී ජනාධිපති උපදෙස් දුන්නේ ඔවුන්ව අයින් නොකර වෘත්තීය හා තාක්ෂණික පුහුණුවක් ලබාදී රට රැකියාවන්ට හා වෙනත් රැකියාවන්ට යොමු කරන්නට උත්සාහයක් ගන්නා ලෙසය.

ජනාදිපතිතුමනි... ගුවන්තොටුපළේ ප්‍රශ්න තියෙනවා. ටර්මිනල් 2 ප්‍රොජෙක්ට් එක අඩුපාඩු රැසක් සහිතයි. ඒ ගැන කිව්වට එතන ඉන්න සමහර බලධාරීන් ඒව කනකට ගන්නේ නෑ. ඒ ගැන වෙනම සාකච්ඡාවක් ඕන.'' ඇමති නිමල් පැහැදිලි කළේය. ඉන්පසුව කතාබහ වූයේ මත්තල සහ රත්මලාන ගුවන්තොටුපළවල ඉදිරි කටයුතු ගැනය.

ඉන් පසුව ජනාධිපතිවරයා පසුගියදා ආන්දෝලනයට ලක්වූ රුසියානු ගුවන් යානය ගැන කතා කළේය.

''මේ ගුවන් සමාගම ගුවන් ගමන් නතර කළොත් එක අපිට ලොකු පාඩුවක්. ගුවන් යානය නිදහස් කරන්න සාකච්ඡා කරන අතරතුරේ ගුවන් සමාගම එක්කත් සාකච්ඡා පටන් ගන්න. මේ සම්බන්ධතා අපි නැති කර ගත යුතු නෑ...''

''ඊයේ දවසටම සංචාරකයෝ ලංකාවට ඇවිත් තියෙන්නෙ 600යි. මේ ගුවන් සමාගම විතරක් එක ගමනකදී මගීන් 500ක් අරන් එනවා. සතියට ඒ වගේ ගමන් හතරක් එනවා. මේ කරපු හානිය බරපතළ වරදක්.'' ගුවන්තොටුපළ සභාපති කීවේය.

''දැන් මේවා සම්බන්ධයෙන් කටයුතු කරන වගකිවයුතු ආයතන පවා දේශපාලනය මුල් කරගෙන තීන්දු ගන්න පටන් අරන්. රට ගැන හිතලා වගකීමකින් වැඩ කරන එක වගකිවයුතු අයත් පැහැර හරිනවා. ඒ නිසයි මේ වගේ බරපතළ අත්වැරදීම් වෙන්නේ...'' ජනාධිපති විස්තර කළේය.

මෙහිදී ගුවන් යානයට අදාළ වාණිජ අධිකරණයේ නඩුව හා ඊට අදාළව නීතිඥවරුන්ගේ අධිකරණයේ හා නිලධාරීන්ගේ ක්‍රියා කලාපය ගැන ජනාධිපතිවරයා පිරිස අතර තවත් විනාඩි කිහිපයක කරුණු පැහැදිලි කර ගැනීමක් විය. ඉන් අනතුරුව 11.35 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් විය.

## ● ප්‍රවාහන දියුණුවට බන්දුලගෙනුත් අදහසක්...

ඉන්පසුව හවස ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශයේ ප්‍රගති සමාලෝචන රැස්වීම ද ජනාධිපතිවරයා ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. ඇමැති බන්දුල පැමිණීමට තරමක් ප්‍රමාද වූ බැවින් රැස්වීම පටන් ගත්තේ තරමක් ප්‍රමාද වී හයයි තිහට පමණ ය.

''ලංගමය මේ වෙලාවේ ලොකු සේවයක් කරනවා. නමුත් එතන වැටුප් විෂමතාවක් තියෙනවා. 2018 හිටපු ආණ්ඩුවෙන් සේවකයන් පිරිසගේ පඩි වැඩි කළා. තවත් පිරිසකට ඒ වැඩිවීම හමුවුණේ නැහැ. දැන් ඒ අය ඒක ඉල්ලනවා. මේක සාධාරණ ඉල්ලීමක්.'' ඇමති බන්දුල කියද්දී ජනාධිපතිවරයා පෙන්වා දුන්නේ සාධාරණ ඉල්ලීමක් නමුත් කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ගෙනවිත් එය ඉටු කර දීම යුතුකමක් බවයි.

ඉන්පසුව සාකච්ඡාව ඇතිවූයේ පුද්ගලිකව ගමන් බිමන් මේ අවස්ථාවේ දුෂ්කරව ඇති බැවින් පොදු ප්‍රවාහන සේවාවන් දියුණු කිරීමේ ඇති වැදගත්කම ගැනය. ඇමැතිවරයා මේ ගැන යෝජනා කරද්දී ජනාධිපති කතා කළේය.

''ඕක මම හැමදාම කියනවා. ඕනම දියුණු රටක පොදු ප්‍රවාහනය තමයි දියුණු. ඕක අපි කියවලා වැඩක් නෑ පොදු ප්‍රවාහන සේවාවන් දියුණු කරන්නෙ නැතුව. මිනිස්සුන්ට තමන්ගේ පුද්ගලික රථය පාක් එකක දාල නගරයට ඇවිල්ල රස්සාව කරන්න පොදු ප්‍රවාහන පද්ධතියක් හැදෙන්න ඕන. පාක් ඇන්ඩ් ඩ්‍රයිව් හඳුන්වලා දෙන කොට අපි ඒක හැමෝටම ගැළපෙන විදිහට කරන්න ඕනේ. තමන්ගෙ කාරෙක මාකුඹුරේ හරි කොහේ හරි දාලා බස් එකේ හරි කෝච්චියෙ හරි නැගලා හිර වෙලා ඇවිල්ලා දාඩිය පෙරාගෙන රස්තියාදු වෙලා කාර්යාලයට එන්න කවුරුවත් කැමති නෑ. ඒකට අපි පහසුකම් පද්ධතිය දියුණු කරන්න ඕන.'' ජනාධිපති උදාහරණ දක්වමින් ලොකු විස්තරයක් කළේය.

''කොට්ටාවේ මාකුඹුරේ තියෙන තැන වුණත් parking charges වැඩියි. රුපියල් 400ට තියන ටිකට් එක රුපියල් 100ට ගන්න ඕන. එතකොටයි මිනිස්සු පෙලඹෙන්නේ.'' බන්දුල කීවේය. කඩවත හා රත්මලාන තවත් මධ්‍යස්ථාන බිහිකරන්නට කතාබහ විය. ඒ අතර දුම්රිය ප්‍රවාහනය සඳහා ඇති වී තිබෙන දැඩි ඉල්ලුම ගැන ද සාකච්ඡා විය.

මෙහිදී දුම්රිය සාමාන්‍යාධිකාරි වරයා දුම්රිය සම්බන්ධයෙන් තිබෙන අඩුපාඩු හා දුෂ්කරතා පෙන්වා දුන්නේය.

පාසල් ළමුන් ප්‍රවාහනයට ඇති දුෂ්කරතා ගැන ද සාකච්ඡාවක් ඇති විය.

''ලංකා ලේලන්ඩ් එකෙන් ගෙනාපු බස් පන්සියයක් විතර තවමත් ගාල් කරලා තියෙනවා පාවිච්චියට ගන්නැතුව. ඒවත් අපි ඉදිරියේදී ප්‍රවාහනයට යොදවනවා.'' ලංගම සභාපති කීවේය.

මෙහිදී නිලධාරීන් පෙන්වා දුන්නේ බස් රථ සඳහා අමතර කොටස් හා ටයර් ලබාගැනීමට ඇති දුෂ්කරතා ගැන ය. අමතර කොටස් ලබාගැනීමේදී ආයතනයේ අනුමත මිල හා දැන් තිබෙන මිල අතර පරතරය පියවා ගැනීමේදී නිලධාරීන් වංචාවලට අසු වේ යැයි බියක් ඇති බව සාකච්ඡා විය.

''බස් විශාල ප්‍රමාණයක් අපි ටයර් හා අමතර කොටස් නැතිව අයින් කරල දාල තියෙනවා''

ජනාධිපති ඒ සම්බන්ධයෙන් තම කාර්ය මණ්ඩල ප්‍රධානියාට උපදෙසක් දුන්නේය.

ඒ අතර ජනාධිපතිවරයා උපදෙසක් දුන්නේ දේශපාලන පත්වීම් ලැබ පැමිණ ආයතන වල නිකරුනේ වැටුප් ලබමින් සිටින අතිරික්ත සේවකයන් කම්කරුවන් ලෙසම තබා නොගෙන ශිල්පීන් ලෙස පුහුණු කර ඵලදායක යමකට යොමු කිරීමට වැඩපිළිවෙළක් සකස් කරන ලෙසයි.

උඩරට මාර්ගයේ දුම්රිය සංචාරක ව්‍යාපාරය සඳහා යොදා ගැනීමේ ප්‍රවණතාව ගැන ද අදහස් හුවමාරු කරගත්හ. දැනට වරායේ ගෙන්වා ඔහේ දමා තිබෙන දුම්රිය මැදිරි ප්‍රයෝජනයට ගෙන වැඩි වෙන ඉල්ලුම සපුරා ගන්නා ආකාරය ගැනද කතාබහ ඇති විය. ඒ අතරතුර මෙතෙක් වේලා නිහඬව සිටි තවත් සුවිශේෂී පුද්ගලයෙක් කටහඬ අවදි කළේය.

## ● ගැමුණුගෙන් ජනපතිට කල්පවතින උත්තරයක්

''මේ සාකච්ඡාවට අපිටත් එන්න කියලා තියෙනවා. මන් දන්නෑ මොනවටද කතා කළේ කියලා. ඒ වුණාට දුම්රියට වඩා මේ රටේ මඟී ප්‍රවාහනයට කැපවෙලා අදටත් වැඩි සේවයක් කරන්නේ පුද්ගලික බස් රථ. ඒවාටයි මේ දවස්වල වැඩිපුර ප්‍රශ්න තියෙන්නේ.'' එසේ කතා කළේ බස් ගැමුණු ය.

මොනවද ප්‍රශ්න තියෙන්නෙ... කියන්න.

''අපට අද තියෙන ලොකුම ප්‍රශ්නය තමයි ඉන්ධන ලබා ගැනීම...''

''ඇයි ඔයාලට දැන් ලංගමෙන් ඉන්ධන දෙනව නේ...?''

''ඒ දෙන තැන්වල හතරහමාරට පහට වහල දානවා. ආයෙ අරින්නේ පහුවදාට. දුර ගමන් සේවා ගිහිල්ලා එන්නේ හවස් වෙලා. ඒවට ඉන්ධන ලබා ගන්නැතුව පහුවදා දුර දුවන්න බෑ. දවස් තුන හතර පෝලිමේ ඉඳල පිටින් පුරවගෙන මේ වැඩේ කරන්න බෑ.''

''ඇයි මෙයාලට රාත්‍රී කාලේ ඉන්ධන දෙන්න බැරි...''

''සේවකයන්ට අතිකාල මුදල් ගෙවීම ප්‍රශ්නයක්...'' නිලධාරීන් කීහ.

''ඒ තැන්වල වැඩ කරන අයට අතිකාල සඳහා යම් මුදල් ප්‍රමාණයක් අපි දෙන්නම්. අපිට ඒක පෝලිමේ දවස් තුන හතර ඉන්නවට වඩා ලාබයි... මොකද අපිට මේක කර්මාන්තයක් හැටියට රැකගන්න ඕන. අපේ බස් 19,000ක් දිව්වා. කොරෝනා නිසා බස් 7000ක් කර්මානතය අතඇරියා. අරගල කාරයෝ බස්රථ සීයකට වඩා කුඩු කරලා පුච්චලා විනාශ කළා.'' බස් ගැමුණු උත්තරයක් දුන්නේය.

''මේ ගොල්ලන්ගේ අදහස් වටිනවා. මේවා සැලකිල්ලට අරගෙන සාකච්ඡා කරලා අපි එකතුවෙලා මේ වැඩේ කරමු. කොහොමද අපි පුද්ගලික බස් සමග එකට කටයුතු කරන්නේ...

''ඒකාබද්ධ ගමන්වාර වැඩිදියුණු කරන්න ඕන. ඒකට අපේ විධිමත් කාල සටහනක් හදන්ඩ ඕන.'' ගැමුණු තවදුරටත් කීවේය.

එක් අතකින් මෙය සුහද කතාබහක් විය. තවත් පැත්තකින් තිබෙන ප්‍රශ්න ගණනාවකට උත්තර ලැබුණු සාකච්ඡාවක් ද විය. හවස හතයි තිහට පමණ සාකච්ඡාව අවසන් වී සුහදව කතා බහ කර සියල්ලෝම විසිර ගියේ තේ පානයෙන් ද පසුවය.

## ● බැසිල්ගේ අරමුණු දෙකම ඉටු වුණා ලු

පසුගිය සතියේ විසි එක් වන සංශෝධනය පිළිබඳව ලොකු කතාබහක් සමාජයේ ඇතිවිය. පුනර්ජනනීය බලශක්තිය බිහිකිරීම සඳහා අවශ්‍ය බාධක ඉවත් කරන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට යෝජිතව තිබුණේද මෙම සතියේය. විදුලිබල මණ්ඩලයේ ඉංජිනේරු වෘත්තීය සමිතිවලින් මේ යෝජනාවට දැඩි විරෝධතා එල්ල වන්නට විය. අමාත්‍ය කංචන විජේසේකර ඒ විවේචන හා අභියෝග සම්බන්ධයෙන් නොසැලී කටයුතු කිරීම විශේෂත්වයක් විය.

අවසානයේ එම පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ ඉංජිනේරු සමිති සමාගම්වල දැඩි විරෝධතා හා තර්ජන මත වුව එය පාර්ලිමේන්තුවේ වැඩි ඡන්දයෙන් සම්මත කර ගන්නට කංචන සමත් විය. ඉංජිනේරු ඩීසල් මාෆියාවේ අවස්ථාවාදී අවශ්‍යතාවය කුමක් දැයි මුළු රටේම ජනතාවට දැනුවත් වෙන්නට මෙය කදිම අවස්ථාවක් විය.

ඒ අතරතුර හිටපු මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ පාර්ලිමේන්තු දේශපාලනයෙන් ඉවත් වී ඔහු වෙනුවට ප්‍රකට ව්‍යාපාරික ධම්මික පෙරේරා පාර්ලිමේන්තුවට ඒමට නියමිත බවටද සමාජයේ කතාවක් පැතිර ගියේය.

එම ආරංචිය හුදු කතාවකටම සීමා වූයේ නැත. බැසිල් පසුගිය බ්‍රහස්පතින්දා උදේ පාර්ලිමේන්තුවට ගොස් පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා හමුවී සිය ඉල්ලා අස්වීමේ ලිපිය භාර දුන්නේය. ඉන් පසුව හිතවතුන් හා කතා බහ කර ඉතා කෙටි සමුගැනීමකින් අනතුරුව ඔහු කෙලින්ම ආවේ නෙළුම් මාවතේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මූලස්ථානයටය. එහි ඒ වන විට පුවත්පත් සාකච්ඡාවක් සංවිධානය වී තිබිණි.

සාගර කාරියවසම්, තිස්ස කුට්ටිආරච්චි, සංජීව එදිරිමාන්න, ජයන්ත කැටගොඩ, රංජිත් බණ්ඩාර වැනි මන්ත්‍රීවරු කිහිප දෙනෙක් බැසිල් පිළිගන්නට පැමිණ සිටියහ.

පුවත්පත් සාකච්ඡාව සඳහා වෙනදාට වඩා වැඩි පිරිසක් දක්නට ලැබුණේ ඇතැම් යූ ටියුබ් නාලිකාවලින්ද පැමිණ සිටි නිසාය.

● බුලිත ප්‍රදීප් කුමාර



# සිංහරාජය බේරාගත් අරගලයට වසර 50යි

## තිලෝ නැත්නම් සිංහරාජයක් නෑ




**1946 දී මෙරටට කෘෂි උපදේශකවරයකු ලෙස සේවය කිරීමට පැමිණි විදේශිකයකු අප රට සංවර්ධනයට, විශේෂයෙන් පරිසරය සුරැකීමට, වන සතුන් ආරක්ෂා කිරීමට කැප වී ක්‍රියාකිරීම අප අගේ කළ යුතුව ඇත. ඒ අන්කිසිවකු නොව, සිංහරාජ වනාන්තරය බේරාගැනීමට පුරෝගාමීව කටයුතු කළ තිලෝ එම්. ඩබ්ලිව්. හොප්මන් මහතා ය.**

මෙම ලිපියෙන් අරමුණු කෙරෙන්නේ මෙම වටිනා වැසි වනාන්තරය බේරා ගැනීමට මුල සිට ම ඔහු ගත් ක්‍රියාමාර්ගත්, මතුවූ ප්‍රශ්නවලට මුහුණදීමත්, එය බේරා ගැනීමෙන් පසු ශ්‍රී ලංකාවේ පරිසරය, ජාතික වන උයන් ඇති කිරීමට හා පරිසරය ආරක්ෂා කරගැනීමට මතු පරපුර දැනුවත් කිරීමට ඔහු ගත් උත්සාහයන් පැහැදිලි කිරීමට ය.

පෞද්ගලික කටයුතු සඳහා ඔහු වරින්වර තම ජන්මභූමිය වූ ස්විට්සර්ලන්තයට ගියත් නොකඩවා ශ්‍රී ලංකාවේ අවුරුදු 60කට වඩා වාසය කළේය. අප රට ප්‍රමුඛ පෙළේ පැරණිතම පරිසරය හා වන සතුන් ආරක්ෂා කරගැනීමේ සංගමය වූ ශ්‍රී ලංකා වන සත්ත්ව හා ස්වභාව ආරක්ෂක සංගමය (WNPS) හි පළමුව ලේකම්වරයකු ලෙසත්, පසුව එහි සභාපති ලෙසත් අවුරුදු තිහකට (30) වැඩි කාලයක් රටට වැඩදායක ක්‍රියාදාමයක් ඉටුකිරීමට ඔහු ක්‍රියා කළේය.



එම සංගමයේ කමිටු සාමාජිකයකු වශයෙන් 1972 සිට ක්‍රියා කළ මාහට ඔහුගේ අප රට ගැන තිබූ ඇල්මත්, පරිසර ප්‍රශ්නවලට මුහුණදිය යුතු ආකාරයත් ඔහුගෙන් දැනුමක් ලබාගැනීමට මට හැකියාවක් ලැබිණි.


සබරගමුව හා දකුණු ප්‍රදේශවලට මායිම්ව රත්නපුර, ගාල්ල, හා මාතර දිස්ත්‍රික්කවලට අයත් සිංහරාජ වැසි වනාන්තරය, ඒ වටා ඇති රක්ෂිත 14ක් අතරින් ආරක්ෂිත වූ වනයකි. වර්ෂ 1960 වනවිට මෙම වනාන්තරයේ වැදගත්කම හෝ වටිනාකම ගැන දේශපාලනඥයන්ට, බලධාරීන්ට හෝ මහජනතාවට වටිනාකමක්, තේරුමක් නොවීය. රජය එයින් තෙත් කලාපයේ ඉතිරිව තිබූ වනාන්තර, දැව ලබාගැනීමට විශේෂයෙන් තේ පෙට්ටි සෑදීමට කපා දැමීම ආරම්භ කෙරිණි.

ආරම්භයක් වශයෙන් මහා පරිමාණ සැලැස්මක් අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි රාජ්‍ය දැව සංස්ථාව සඳහා සිංහරාජ රක්ෂිතයට අයත් මොරපිටිය, රූණකන්ද වනාන්තරය කැපීම ආරම්භ විය. මෙම දැව 'ප්ලයිවුඩ්' හා 'චිප්බෝඩ්' (Chip Board) බවට පරිවර්තනය කිරීමට වර්ෂයකට ඝන අඩි මිලියන 04ක් ලබාගැනීමට රුමේනියානු ආධාර ඇතිව කොස්ගම සාලාවේ කර්මාන්ත ශාලාවක් ආරම්භ කරන ලදි. දැව කඳන් කැපීම සඳහා යන්ත්‍ර සූත්‍ර ලබාගැනීමට කැනේඩියානු ආධාර ලබාගන්නා ලදි. කැනේඩියානුවන් විසින් කපාගත් දැව ප්‍රවාහනය කිරීම සඳහා පාරවල්, පළල් කරන ලද අතර පාලම් සකස්කොට දැල ( Dela ) දුම්රිය ස්ථානයෙහි පිහිටුවන ලද අංගණයකට ගෙන යන ලදි. මෙම දැව සිංහරාජයේ සිට කොස්ගමට කිලෝමීටර් 85ක දුරක් ප්‍රවාහනය කිරීමට සිදුවිය. එම යන්ත්‍ර අලුත්වැඩියා හා නඩත්තු කිරීමට සිංහරාජය තුළ ම විශාල පෙදෙසක් වෙන් වූ අතර එම පෙදෙස යන්ත්‍ර තෙල්වලින් තෙත් වී දූෂණයට ලක් විය. මේ සඳහා කැනේඩියානුවන් එතෙක් ලෝකයේ දැව ලබාගැනීමට උපකාරී වූ විශාලතම යන්ත්‍ර භාවිතයට ගනු ලැබීය.

1969 දී ශ්‍රී ලංකා වන සත්ත්ව හා ස්වභාවික ආරක්ෂක සංගමයෙහි වාර්ෂික මහා සභා රැස්වීමේදී මෙහි භයානක ඵලවිපාක සහ එම වනාන්තරයේ වටිනාකම සාමාජිකයන්ට හොප්මන් මහතා විසින් කියා දුන් අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් රාජ්‍ය දැව සංස්ථාව මාර්ගයෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කළේ මෙම නොයිඳුල් වනාන්තරයෙන් අක්කර 1000 - 1200ක් වත් විද්‍යාත්මක පර්යේෂණ සඳහා වෙන්කර දෙන ලෙස ය.

1971 වාර්ෂික මහා සභා රැස්වීමේදී සාමාජික වියර් ද මෙල් මහතා සිංහරාජ වනාන්තරය බේරාගැනීමට සංගමය මගින් ගතයුතු සියලු ක්‍රියාමාර්ග ගැනීම කළ යුතු බවට යෝජනාවක් ඉදිරිපත් කොට ස්ථිරකර ගන්නා ලදි. ඒ අනුව සංගමයේ සභාපති වශයෙන් තිලෝ හොප්මන් මහතාට භාරදූර කාර්යයක් පැවරුණ අතර, ඒ සඳහා වැඩපිළිවෙළක් ඔහු විසින් සකස් කරන ලදි. එම විද්‍යාත්මක සැලැස්ම අනුව

**1. සිංහරාජය පිළිබඳ සියලු පැරණි තොරතුරු රැස්කිරීම**
**2. සිංහරාජයට ගොස් භූමියේ තත්ත්වය නිරීක්ෂණය කොට තත්ත්ව වාර්තාවක් සැපයීම.**
**3. අනෙක් අදාළ සංවිධාන 'සිංහරාජ බේරාගැනීමේ සටනට ඇතුළත් කර ගැනීම.**
**4. මෙම වනාන්තරය රැකගැනීමේ වටිනාකම ගැන පුවත්පත් හා අනෙකුත් මුද්‍රිත මාධ්‍යවලින් ප්‍රසිද්ධියක් ලබාගැනීම සිදුකෙරිණි.**




ඒ අනුව කටයුතු කළ හොප්මන් මහතා 1972 දී පෙබරවාරි 26 - 28 දක්වා දින තුනක් සිංහරාජය හා අවට වනාන්තරයේ තත්ත්වය පරීක්ෂා කිරීමට දින 03ක් එහි ගත කරන ලදී.

අනතුරුව 'සිංහරාජ වනාන්තරය - 1972' යනුවෙන් ප්‍රකාශයක් සකස් කරන ලද අතර, මෙය අගමැති සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට ඉදිරිපත් කිරීමට පිළිගැන්වීමට හැකිවන පරිදි රටේ පිළිගත් සංවිධාන, විශ්වවිද්‍යාලවල මහාචාර්යවරුන් හා පුද්ගලයන් ගේ කැමැත්ත හා අත්සන් ලබාගත යුතුව තිබිණි. මෙහිදී සඳහන් කළ යුතු වැදගත් කරුණක් වන්නේ ඉතාමත් කැමැත්තෙන් ගෞරවයෙන් ගාලු පිරිවනේ ප්‍රධාන සංඝනායක පූජ්‍ය නෙළුවේ ගුණානන්ද හිමිගේ පූර්ණ සහයෝගය ලබාගැනීම, ආයුර්වේද වෛද්‍ය පර්යේෂණ සංගමයේ සහයෝගය ලබාගැනීම හා සමස්ත ලංකා බෞද්ධ සම්මේලනයේ සභාපති ජී. පී. මලලසේකර මහතාගේ සහයෝගය ලබාගැනීමය. මෙම ප්‍රකාශයේ සඳහන් වැදගත් කරුණු වන්නේ

**1. මෙය ලංකාවේ විශාලතම නිවර්තන වැසි වනාන්තරය වීම හා මෙම තත්ත්වයට පැමිණීමට අඩු තරමින් වර්ෂ මිලියන 100ක් වත් ගතවිය හැකි බවත් ඒත්තු ගැන්වීම.**
**2. එය කපා දැමූ පසු අසමසම පරිණාමයේ සිහිවටනයක් නැතිකර ගැනීමක් බවත්,**
**3. මිනිසා විසින් මෙම වනය විනාශ කළ හැකි බවත්, නැවත එය බිහිකිරීමට කිසි දිනෙක නොහැකි බවත්,**
**4. මෙම වනාන්තරය ගැන මෙතෙක් විද්‍යාත්මක අධ්‍යයනයක් නොකර ඇති බවත්, මෙහි රටට ප්‍රයෝජනයක් අත්වන හා වෘක්ෂලතා තිබිය හැකි බවත්, ඒවා විනාශයට යා හැකි බවත්,**
**5. එය කපා දැමීමෙන් විශාල වශයෙන් පාංශුඛාදනය ඇතිවිය හැකි බවත්, එයින් මහජනතාවට නොමැකෙන අපහසුතාවට පත්විය හැකි බවත් ය.**

මෙම විරෝධතාවයට ප්‍රතික්‍රියාවක් දැක්වූ රජය එකල ධීවර ඇමැති ජෝර්ජ් රාජපක්ෂගේ සභාපතිත්වයෙන් කමිටුවක් පත්කරන ලදි. මෙම කමිටුවේ සාකච්ඡා අවුරුදු කිහිපයක් ඇදී ගිය අතර, මෙම යෝජනාවලට මුලදීම විරුද්ධ වූයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා එම අමාත්‍යාංශය, කර්මාන්ත අමාත්‍යාංශය හා කැනේඩියානු කොන්ත්‍රාත්කරුවන් බව සඳහන් කළ යුතුව ඇත.

1975 ශ්‍රී ලංකා වන සත්ත්ව සංගමයේ කමිටු සාමාජිකයන්, සිංහරාජ වනාන්තරයේ තත්ත්වය නිරීක්ෂණය කිරීමට එහි සංචාරයක යෙදුණ අතර, මම ද ඒ සඳහා සහභාගි වූවෙමි. එහිදී අප දුටු දෙයින් අපගේ හදවත් සසල විය. අපගේ නිරීක්ෂණ වූයේ

**1. අදාළ විශාල ගස් කරා ළඟාවීමට එම විශාල යන්ත්‍ර සඳහා යා හැකි මාර්ග සකස් කිරීම නිසා විශාල වශයෙන් වෘක්ෂලතා හා සත්ත්වයන් මියයන බවත්, සෑම විශාල ගසක් මගින් විනාශ වන කුඩා ගස් සංඛ්‍යාවක් අති මහත් බවයි.**
**2. මුලදී අක්කර 1500ක් කැපීමට යෝජනා වී ඇති නමුදු අක්කර 3000කට වඩා ඒ වනවිට කපා දමා විනාශ කර ඇති බව පැහැදිලි විය. විරෝධතා මධ්‍යයේ සිංහාරාජය දිගට ම කපා දැමීම සිදු වූ අතර මේ තත්ත්වය මහජනයාට අවබෝධ කර දීමට පරිසරය සුරැකීමේ වගකීම අරමුණු කරගෙන 1976 දී හොප්මන් මහතා සංරක්ෂණය ද, විනාශය ද යනුවෙන් පොත් පිංචක් මුද්‍රණය කර මහජනයාට එයින් පිටපත් ලක්ෂයක් බෙදා දෙන ලදි. සිංහරාජය කැපීමෙන් කිසිදු උවදුරක් නොවන බවත්, එය අවුරුදු 20කින් නැවත වැවෙන බවත් ඉන්දියාවෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ගෙන්වා ගත් විශේෂඥයකු මාධ්‍යයට කරුණු දැක්වූ අතර මාධ්‍යයෙන්ම හොප්මන් මහතා කදිම පිළිතුරක් ලබා දුන්නේය.**

1976 දී වනයක අවසන් අනුස්මරණ යනුවෙන් ලිපියක් ද හොප්මන් මහතා ප්‍රසිද්ධ කරන්නේ අරගලය දිගමට පවත්වාගෙන යන අතර තුරදීය.

කෙසේ වෙතත් 1977 වර්ෂයේදී අලුත් රජයක් බිහිවිය. හොප්මන් මහතා කළේ වහාම එකල නව අගමැති ජේ. ආර්. ජයවර්ධන මහතා හමුවීමය. එතුමා සිංහරාජ අරගලය ගැන දැන සිටියේය. හොප්මන් මහතාගේ පැහැදිලි කිරීමට සවන් දුන් නව අගමැතිතුමා, නිවැරදි තීරණයක් ගනු ලැබීය. එම රජයේ මූලික කටයුත්තක් වශයෙන් වහාම සිංහරාජය කැපීම නතර කරන ලෙසට ඔහු නියෝග දුන් අතර, සියලු කැනේඩියානුවන් තම යන්ත්‍රෝපකරණ රැගෙන ආපසු රටින් පිටවිය. සිංහරාජය බේරා ගනු ලැබීය. මෙම වටිනා නොඉඳුල් වනාන්තරය මතුවට ඇතිවිය හැකි බාධා මැඩපැවැත්වීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පසුව (ඉතා ප්‍රමාදව) තේරුම් ගිය අතර, එහි ඇති ජෛව විවිධත්වය සොයා බැලීමට, විද්‍යාත්මක පර්යේෂණ කිරීමට 1978 දී විද්‍යාඥයන්ට අවසර දෙනු ලැබීය. ඒ අනුව එම වර්ෂයේ දීම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආචාර්ය සාවිත්‍රි ගුණතිලක හා නිමල් ගුණතිලක විසින් මූලික පර්යේෂණ වැඩසටහනක් සිංහරාජයේ දියත් කරන ලදී.

මෙහිදී මතක තබා ගතයුතු කරුණු වන්නේ

**1. 1978 අප්‍රේල් මස සිංහරාජය ජාත්‍යන්තර මිනිසා හා ජෛව ගෝල රක්ෂිතයක් වශයෙන් ප්‍රකාශයට පත්කිරීම. ඒ අනුව සිංහරාජයට ජාත්‍යන්තර පිළිගැනීමක් ඇතිවීම.**
**2. 1985 නව පනතක් අනුව එනම් ජාතික උරුමවන අඩවි පනතින් එය ජාතික වන අඩවි භූමියක් ලෙස අලුතින් ප්‍රකාශයට පත් කරනු ලැබීය.**

1985 දී ලෝක වන සත්ත්ව අරමුදල හා සොබාදහම සංරක්ෂණ සංවිධානය සමග එකතු වී මෙම වනාන්තරය සංරක්ෂණය කිරීමට විස්තරාත්මක සැලැස්මක් සකස් කිරීම.

1989 දී මෙම වනාන්තරයේ වටිනාකම තේරුම් ගත් යුනෙස්කෝ සංවිධානය එය ලෝක උරුම බිමක් යනුවෙන් ප්‍රකාශයට පත් කොට එයට ජාත්‍යන්තර පිළිගැනීමට ලක්කරන ලදි. ඒ අනුව සිංහරාජ වනාන්තරය ලෝකයෙහි සියලු ජනතාවට අයත් බව පැහැදිලි කරන ලදි.

ඒ අනුව මෙම සිංහරාජ වනාන්තරයෙහි වටිනාකම තක්සේරු කළ නොහැකි බව පිළිගැනීමට පත්කෙරුණි.

සිංහරාජය බේරා ගැනීමේ සටනට මූලිකත්වය දුන් හොප්මන් මහතා එයට අමතරව ලංකාවේ වන සත්ත්ව හා පරිසර සංරක්ෂණය සඳහා කළ කාර්යභාරය ඉතා වැදගත්ය. ඒ මහතා වන සත්ත්ව හා වෘක්ෂලතා ආඥා පනත අනුව ස්ථාපිත කරන ලද උපදෙස් කමිටුවේ 1968 සිට 1993 දක්වා සේවය කළ අතර, ඒ අනුව මෙම විෂයට අදාළ නොයෙකුත් නිවැරදි තීරණ රජයට හා අදාළ නිලධාරීන්ට ලබාදීමට ඔහු කටයුතු කළේය. එයට අමතරව වන සත්ත්ව සංරක්ෂණය සඳහා ජාතික ප්‍රතිපත්තියක් තැනීමේ කමිටුව (1979) හා ජාතික සංරක්ෂණ උපාය මාර්ග (1982) නම් කමිටුවේ සාමාජිකයකු වශයෙන් රජයට සහාය විය.

**● ඩග්ලස් බී. රණසිංහ**
(හිටපු සභාපති ශ්‍රී ලංකා වන සත්ත්ව හා ස්වභාව ආරක්ෂක සංගමය)

# වැවක් තනා රටට බත දෙන උපාධිධාරී ගොවියා

**ඇතැම් අයට එක් දිනක් කියන්නේ පැය අටක් වුණාට මට දිනයක් කියන්නේ පැය විසිහතරම. මේ පැය විසි හතරෙ වෙලාව කුමක්ද කියා අදාළ නැහැ අපිට වැඩ කරන්න පුළුවන්.**

තරුණ පරපුරට මම කියන්නේ රටක් වශයෙන් අපේ ලංකාව දැන් වැටෙන්න තැනක් නැහැ. වැටෙන්න පුළුවන් අන්තිම අගාධයට වැටිල තියෙන්නේ. මේ රට ගොඩනගන්න ජවය තියෙන හයිය තියෙන පිරිසක් හැටියට තරුණ පරපුරට විශාල කාර්යභාරයක් තිබෙනව. ඒ කාර්යභාරය ඉටු කිරීමේදී තම තමන්ට පුළුවන් ක්ෂේත්‍රවල කටයුතු රට වෙනුවෙන් ඉෂ්ට කරන්න ඕන. මොකද අපේ රට ඉතිහාසයේ මේ වගේ දරිද්‍රතාවයෙන් පෙළුණ රටක් නෙවෙයි. අපේ රටේ වියළි කලාපයේ වැව් 15000ක් තිබෙන රටක් මේක. ඉතිහාසයේ පිටරටටත් හාල් යවපු රටක් මේක. අපේ රටේ හැම තැනම සරු පොළොවක් තියෙනව. ඕනෑම දෙයක් හදන්න පුළුවන් රටක් මේක.

අපි මෙහෙම දුප්පත් වෙන්න ඕන රටක් නෙවෙයි. ඒ නිසා විශේෂයෙන්ම මතක් කළ යුතුයි. මේ රටේ පුරවැසියෝ විදියට අපේ අයිතිවාසිකම් දිනාගන්න අරගල කරන තරමට, හඬ නගන තරමටම රටක් හැටියට අපේ යුතුකම් මේ රටට ඉෂ්ට කරලද කියන කාරණය තමන්ගේ හදවත්වලින් අහන්න ඕන කාලය ඇවිත් තියෙන්නේ. මොකද අපේ යුතුකම හරියට කරනවා නම් මේ රට ගොඩදාන එක එතරම් ප්‍රශ්නයක් නෙවෙයි.

ඒ ඇඹිලිපිටිය උඩවලව සංඛපාල පදිංචි මොරගොඩ ලියනගේ ප්‍රසාද් හරීන්ද්‍ර කුමාර ගේ අදහසක්. ඔහු වයස අවුරුදු 40ක තරුණයෙකි. මේ වන විට තමන් විසින්ම වැවක් ඉදිකර අක්කර 30ක් පමණ සරුසාරයට වවන අපේ රටට බත සපයන උපාධිධාරී තරුණයෙකි ප්‍රසාද්. ඔහුගේ මේ යෝධ වැඩ බලන්නට අපි ප්‍රසාද්ගේ වගා බිමට ගියෙමු.

සංඛපාල පන්සල ඉදිරිපිට පදිංචි වුවත් ප්‍රසාද්ගේ ගොවිපළ ඇත්තේ පනහඩුව මාර්ගයේ ගොස් පනහඩුව ලයිට්පාරේ කරවිලයාය ප්‍රදේශයේය. මෙම ඉඩම සංඛපාල විහාරස්ථානයට අයත් නින්දගම් ඉඩමකි. අපි එම ගොවිපළට ඇතුළු වන විටත් ප්‍රසාද් ගොවිතැන් කටයුතුවල නිරත වෙමින් සිටින අයුරු දක්නට විය.




ප්‍රසාද් තිත්තවැල්පත විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබා පසුව උසස් අධ්‍යාපනය සඳහා පල්ලේබැද්ද මහා විද්‍යාලයට ඇතුළත්ව ඇත. ඉන් අනතුරුව 2007 දී රුහුණ විශ්වවිද්‍යාලයේ උපාධිය ලබාගෙන ඇති අතර පශ්චාත් උපාධිය ලෙස ජනසන්නිවේදනය කැලණිය විශ්වවිද්‍යාලයෙන් හදාරා ඇත. පසුව පරිසර කළමනාකරණය හා සංරක්ෂණය විවෘත විශ්ව විද්‍යාලයෙන් හදාරන ඔහුට 2008 දී රජයේ රැකියාවකට යන්න අවස්ථාව ලැබුණ ද එය සඳහා යොමු නොවී ගොවිතැන් කටයුතු කරන්නට විය.

ප්‍රසාද් කියන්නේ මට මගේ පවුලේ ගොවිතැනට ගොඩක් ඉඩ තිබුණා හොඳ පසුබිමක් තිබුණා. අපේ පවුලේ අම්මයි තාත්තයි නංගියි මායි ඉන්නේ. මට පොඩි කාලයේ ඉඳලම ගොවිතැන් පිළිබඳව හොඳ අත්දැකීමක් තිබුණා.

මම එදා රැකියාවට ගියා නම් අද මේ වගේ වැවක් ඉදිකරල විශාල පිරිසකට රැකියාවන් දෙන්න වෙන්නේ නැහැ. මේ වන විට දිනපතාම 20ක් පමණ මගේ ගොවිපළේ සේවය කරනව. මේ අයගේ පවුල් රැකෙන්නේ ඒ ගන්නා මුදලින්.

2012 දී තමයි මම වැව හදන්න පටන් ගත්තේ. වැවක් හදනවිට සම්පූර්ණ පරිසර පද්ධතියම වෙනස් වන බව මම විශ්වවිද්‍යාලය තුළදී ඉගනගෙන තියෙනව. භූගත ජල මට්ටම ඉහළට එන බව මම දැනන් හිටියා. මේ වැවේ ධාරිතාවය අක්කර දෙක හමාරක පුරා විහිදී තියෙනවා. කුරුල්ලන් සිටි ස්ථාන පොඩි දූපත් හැටියට මේ වන විට ඒ ආකාරයෙන්ම තියල තියෙනව.



හොඳට වැස්ස ලැබුණොත් මේ වැව පිරෙනව. ඉතින් මට කන්න දෙක වගා කරන්න හොඳටම මේ ජලය ප්‍රමාණවත්. ඒ කාලේ හැටියට මට ලක්ෂ 30ක් පමණයි මේ වැව හදන්න ගියේ.

මගේ මේ ඉඩම දෙපැත්තෙන්ම ඇළවල් දෙකක් යනවා. මේ ඇළක් මට හරස් කරල දුන්නොත් මීට වඩා යමක් කරන්න පුළුවන්. මේ වැවේ වැව් බැම්මේ දිග අඩි 165යි. පළල අඩි 15ක් හා උස අඩි 16ක් වෙනවා. ඔහු මේ වැව සඳහා කොහොඹ ගහ වැව තියා නම් තබා ඇත.

මේ වන විට ප්‍රසාද් පාන්දරින්ම නැගිට තම ගොවිපළට පැමිණෙන අතර පැය කිහිපයක් එහි වැඩ කර මේ වන විට ගොඩකවෙල ප්‍රාදේශීය සභාවේ සංවර්ධන නිලධාරියකු ලෙස වැඩ කරන අතර පසුව ඒ සඳහා පිටත්ව යයි. ඉන් අනතුරුව තම රාජකාරිය නිමා කොටද එන්නේ තම ගොවිපළ වෙතය.

මේ වන විට ප්‍රසාද් පොල් ගස් දහසක් සිටුවා ආදායම් ලබමින් පවතී. ඔහුම සාදාගත් වැවෙන් ජලය ගෙන කුඹුරු අක්කර 5ක් අස්වද්දා ඇත. මේ රටේ හැදෙන සෑම එළවළුවක්ම පලතුරක්ම කාලයෙන් කාලයට වගා කරන බව ප්‍රසාද් පවසයි.

මේ වන විට ටී.ජේ.සී අඹ වගාවක්, කජු, කවුපි, මුං, එළබටු, තම්පලා, තණ, කංකුන්, තක්කාලි කැරට්, බීට්, වට්ටක්කා යන බෝග වගාකර ඒවායින් සරු ඵලදාවක් ලබමින් පවතී.

අපි මේ වැඩ කරන්නේ සංඛපාල පන්සලේ ඉඩම්වල. මේවට අපි බදු ගෙවනවා. සෑම බෝගයකම මුල් කොටස අපි පන්සලට පූජා කරලයි අස්වනු නෙළීම ආරම්භ කරන්නේ.

මෙම වැව ආශ්‍රිතව ප්‍රසාද් විසින් සංචාරකයින් සඳහා නවාතැන් පලක්ද මේවන විට ඉදිකරමින් පවතිනවා. ප්‍රසාද් කියා සිටින්නේ විදේශිකයන් ගොවිබිම්වල ඇති සංචාරක බංගලා සම්බන්ධයෙන් වැඩි කැමැත්තක් දක්වන බවත් ඒ වෙනුවෙන් ශ්‍රී ලංකාවට විදේශ විනිමය ගෙන ඒමට හැකියාව ලැබෙන බවයි.

රාජකාරියක් කරන ගමන් තමන්ගේ මහන්සියෙන් වැවක් තනා රටට බත සපයන මේ තරුණයා රටටම ආඩම්බරයකි.

**● ඕමල්පේ ප්‍රගීත් ජනක**

# රට පුරාම කුඩු කාරයන්ගේ නඩු නැති මරණ



**කුඩු පාතාලය හිටි හැටියේ සක්‍රීය වීමට පටන් ගෙන ඇත. පසුගිය සතියක් වැනි කෙටි කාල සීමාවක් තුළදී කොළඹ සහ දකුණු පළාත කේන්ද්‍ර කරගෙන සිදු වූ පාතාල මිනිස් ඝාතන ප්‍රමාණය හයක් දක්වා ඉහළ ගොස් තිබුණේය.**

මේ සියලු ඝාතනයන් මත්ද්‍රව්‍ය ජාවාරම් මුල් කරගෙන සිදුවූ ආරවුල් මත වූ ප්‍රහාර බව විමර්ශනවලින් අනාවරණය විය.

ජන ශූන්‍ය ප්‍රදේශවල පමණක් නොව අතිශය ජනාකීර්ණ පිටකොටුව නගර මධ්‍යයේදී පවා මේ පාතාල දඩයක්කරුවන් සිය ඉලක්කයන් ලබාගෙන තිබුණේ රටේ ආරක්ෂාව තුට්ටුවට දමමින්ය.

කොළඹ පොලිස් මූලස්ථානය පෙනෙන මානයේදී පවා ටී 56 ගිනි අවි යොදාගෙන දෙනෝදාහක් දෙනා බලා සිටියදී නිරායුධ මිනිසුන් වෙඩි තබා ඝාතනය කර පාතාල මැරයන් නිරුපද්‍රිතව පලා යෑම රටේ ආරක්ෂාව බින්දුවට වැටී ඇති බවට තවත් නිදසුන් කුමටද?

මේ ඝාතන වැල ආරම්භ වන්නේ පිකොටුව බැස්ටියන් මාවතේ සිදුවූ මිනිස් ඝාතනයත් සමගය.

අලුත්කඩේ අධිකරණයේ විභාග වූ නඩුවකට පෙනී සිටි තරුණයන් තිදෙනෙක් සිය නිවෙස් බලා යෑමට පිටකොටුව බැස්ටියන් මාවත බස් නැවතුම් පොළට එද්දී ඔවුන් පසුපස හඹා ආ පාතාල අළුගෝසුවන් දෙදෙනෙක් දෙනෝදාහක් දෙනා බලා සිටියදී ටී 56 ගිනි අවිය ක්‍රියාත්මක කළේය.

නිරායුධ ජනතාව හිස්ලු ලූ අත දිව ගොස් දිව ගලවා ගත්ත ද තරුණයන් දෙදෙනකු ප්‍රහාරයට ලක්විය. ඒ තරුණයන් දෙදෙනා යුද හමුදා කොමාන්ඩෝ බළකායේ රාජකාරි කර ඉන් ඉවත් වූවන් දෙදෙනෙකි. ප්‍රහාරයෙන් එක් තරුණයකු එම ස්ථානයේම මිය ගිය අතර අනෙකා තුවාල ලබාදිවි ගලවා ගත්තේය.

මේ ප්‍රහාරය පිළිබඳව විමවර්ශන පැවැත්වූ පොලිසිය අවසානයේ හෙළි කර ගත්තේ පාතාල මැරයන්ට සිදුවූ අත් වැරදීමකින් මෙම යුද හමුදා කොමාන්ඩෝ බළකායේ හිටපු සෙබළා ඝාතනයට ලක්ව ඇති බවයි.

විමර්ශන කණ්ඩායම් පවසන අන්දමට ප්‍රහාරය පිටුපස සිටියේ ගණේමුල්ලේ සංජීව නැමැති පාතාල මැරයාය. ප්‍රහාරයට හේතු වී තිබුණේ හෙරොයින් කිලෝග්‍රෑම් 200ක් සම්බන්ධයෙන් ඇතිවූ ආරවුලක්ය. ගණේමුල්ලේ සංජීව ඇතුළු පාතාල කල්ලි ප්‍රබලයන් සිව් දෙනෙකුට අයත් හෙරොයින් තොගයක් අල්ලා දීම සඳහා ඔත්තු ලබා දුන් බව කියන ට්‍රෝලර් බෝට්ටුකරුවකු මොවුන්ගේ ඉලක්කය වී තිබුණේය.

මේ ට්‍රෝලර් බෝට්ටුකරු ද නඩු විභාගයක් සඳහා එදින අලුත්කඩේ අධිකරණය වෙත පැමිණීමට නියමිතව සිටියේය.

එල්ල වී තිබූ ජීවිත තර්ජන නිසා බෝට්ටුකරු එදින අධිකරණ වෙත පැමිණ සිටියේ නැත. හමුදා කොමාන්ඩෝ සෙබළා මෙන්ම බෝට්ටුකරු ද ස්වරූපයෙන් එක හා සමානය.

ගණේමුල්ල සංජීවගේ ඔත්තුකරුට සිදුවූ අත්වැරදීමකින් ඔහු පාතාල මැරයන්ට හමුදා සෙබළා තම ඉලක්කය බව පෙන්වා දුන්නේය.

මත්ද්‍රව්‍ය ජාවාරමට තබා කිසිම අපරාධයකට සම්බන්ධයක් නැති රට ජාතිය වෙනුවෙන් කැපවී රාජකාරි කළ නිර්භීත හමුදා සෙබළකු අවසානයේ පාතාල මැරයන්ගේ ගොදුරක් බවට පත් වූයේය.

පානදුර ප්‍රදේශයේ දී එළවළු ව්‍යාපාරිකයකු ඝාතනය වන්නේ මේ සිදුවීමෙන් පසුවය. තම මිතුරකු සමග යතුරු පැදියක නැගී යද්දී ඔවුන් ලුහුබැඳ ආ පාතාල මැරයන් දෙදෙනකු ව්‍යාපාරිකයාට වෙඩි තබා ඝාතනය කර පලා ගොස් තිබුණේය.

මේ ඝාතනය සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වූ පොලිසිය අවසානයේ අනාවරණය කර ගත්තේ මත්ද්‍රව්‍ය ගනුදෙනුවක් සම්බන්ධයෙන් ඇතිවූ ආරවුලක් ඝාතනයට හේතු වූ බවයි.

පොලිසිය පවසන අන්දමට මේ ඝාතනය පිටුපස සිටියේ මත්ද්‍රව්‍ය ජාවාරමේ ප්‍රධානිකු බවට පත්ව සිටින පානදුරේ සලිඳු නැමැත්තා බවය.

පානදුරේ නගරයේ උණුසුම මැකී යෑමටත් පෙර අලුත්ගම මොරගොල්ල ප්‍රදේශයේ දී තවත් මිනිස් ඝාතනයක් සිදු වුණේය. තැඹිලි කපා විකිණීම සිය රැකියාව කරගෙන සිටි තරුණයකු මෙසේ පාතාල මැරයන්ගේ ගොදුරක් බවට පත්ව සිටියේය.

මෙහිදී ඝාතනයට ලක්වූ තරුණයා බැස්ටියන් මාවතේදී පාතාල මැරයන්ගේ ගොදුරක් බවට පත්වීමට නියමිතව සිටි බෝට්ටුකරුගේ මස්සිනාය. තැඹිලි විකිණූ මේ තරුණයා ද මත්ද්‍රව්‍ය කිලෝ 200යේ වැටලීමේ ඔත්තුකරුවකු බවට පත්ව සිටි අයෙකු බව පසුව හෙළි විය. පොලිසිය පවසන්නේ මේ ඝාතනය පිටුපස ගණේමුල්ල සංජීව නමැති පාතාල මැරයා සිටින බවයි. මේ ඝාතන සිද්ධි පැය 24ක් ගත වන්නටත් පෙර තංගල්ලේ සහ අකුරැස්සේ මිනිස් ඝාතන දෙක්ක වාර්තා වුණේය. මේ ඝාතන දෙකම සිදුවන්නේ මත්ද්‍රව්‍ය ජාවාරම් සම්බන්ධයෙන් ඇතිවූ ආරවුල් මතය. විමර්ශන කණ්ඩායම් පවසන අන්දමට ඝාතන දෙක පිටුපස සිටින්නේ මිදිගම නඳුන් චින්තක නොහොත් හරක් කටා නමැති පාතාල මැරයාය.



පිටකොටුවේ වැරදීමකින් වෙඩි වැදී මිය ගිය තරුණයා



පානදුරේ සිළිඳු

මේ ඝාතන වැලේ අවසාන ගොදුර බවට පත්ව සිටියේ මෝදර ප්‍රදේශයේ තරුණයෙකි. මෝදර ඉබ්බගෙවත්ත ප්‍රදේශයේ සිදුවූ ප්‍රහාරයකින් තරුණයකු ඝාතනයට ලක් වන්නේ කුඩු පාතාලයේ තවත් ගොදුරක් බවට පත් වෙමින්ය.

මත්ද්‍රව්‍ය ජාවාරම් සම්බන්ධයෙන් ඇතිවූ ආරවුලක් මේ ඝාතනයට ද හේතුවී ඇති බව විමර්ශනවලින් හෙළි විය. ප්‍රහාරය එල්ල කර තිබුණේ කිඹුලාඇලේ ගුණාගේ පාතාල කල්ලියේ සිටි අළුගෝසුවකු විසින්ය.

මේ ආකාරයට සතියක් වැනි කෙටි කාල සීමාවක් තුළදී කුඩු පාතාලය විසින් ජීවිත හයක් බිලිගෙන තිබුණේය. හිටි හැටියේම කුඩු පාතාලය මේ ආකාරයට සක්‍රීය වීමට හේතු කීපයක් බලපා ඇති බව පැහැදිලිය.

ඉන් ප්‍රධානම තැන ගන්නේ පොලිස් දෙපාර්තමේන්තුව මේ වනවිට හබලක් නැති ඔරුවක් බවට පත්ව තිබීමය. පොලිසිය තුළ පවතින සීතල යුද්ධය පාතාලය නැවතත් සක්‍රීය වීමට ප්‍රධානම හේතුව බවට පත්වී හමාරය.

පොලිස්පතිවරයා සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් අතර පවතින ගැටුම මේ වනවිට උඩුදුවා හමාරය. පොලිසියට නිවැරදි නායකත්වයක් දෙන්නට මේ වනවිට කිසිවකුත් ඉදිරිපත් වී නැත.

වගකීමක් භාරගැනීමට ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කටයුතු නොකිරීම නිසා පහළ නිලධාරීන් සිය රාජකාරි පැහැර හැරීමට පටන් ගෙන සිටිති. පහළ නිලධාරීන්ගේ පැත්තෙන් ඔවුන් ගෙන තිබෙන තීණය සාධාරණය.

ඒ මන්ද යත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිළිබඳව විශ්වාසය තබා පාතාල මර්දන මෙහෙයුම් ක්‍රියාත්මක කළහොත් අවසානයේ ඔවුන්ට සිදුවන්නේ හිරේවිලංගුවේ වැටීමටය.

මේ වනවිට රටේ ක්‍රියාත්මක වන පාතාල කල්ලිවලට නායකත්වය දෙන මැරයන් මේ රටේ නීතිය පොලිසිය හැසිරෙන ආකාරය පිළිබඳව හොඳ අවබෝධයකින් කටයුතු කරන මැරයන්ය.

මේ පාතාල මැරයන්ට උපදෙස් දීමට ඇතැම් පොලිස් නිලධාරීන් මෙන්ම ඇතැම් නීතිඥ මහත්වරුන් ද සැදී පැහැදි සිටිති.

රටේ නීතිය ආරක්ෂාව දියාරු වී යන හැම මොහොතකම පාතාලය සක්‍රීය වූ බව ඉතිහාස සිදුවීම්වලින් පැහැදිලිය.

රටේ ආර්ථිකය කඩාවැටීම දේශපාලන අස්ථාවරයත්වය නීතිය ආරක්ෂාව වල්වැදීයෑම පොලිසිය ඉච්චාභංගත්වයට පත්ව සිටීම ඇතුළු තවත් කරුණු කාරණා රාශියක් මේ වනවිට රට භුක්ති විඳිමින් සිටියි.

## • සතියක කාලයකදී ජීවිත හයක් බිලි අභිංසකයෙකුත් ඒ අතර

අළුයට ගිනි පුළිඟු මෙන් තිබෙන පාතාලයේ වෛරය, පළිගැනීම එකිනෙකා මරා ගැනීම වැනි අපරාධ සක්‍රීය තත්ත්වයට පත්වන්නේ රටේ මේ පවතින අස්ථාවරත්වයත් සමගය.

එමෙන්ම තවත් ප්‍රධාන කරුණු කීපයක් මේ පාතාල ක්‍රියාකාරකම් වර්ධනය වීමට බලපා ඇති බව පැහැදිලිය.

පාතාලය දරුණු අපරාධකරුවන් මර්දනය සහ විමර්ශන කිරීම සඳහා විශේෂ පොලිස් ඒකක පිහිටුවා තිබේ. කොළඹ අපරාධ කොට්ඨාසය මෙන්ම පැලියගොඩ, නුගේගොඩ, කළුතර අපරාධ කොට්ඨාස මෙම විශේෂ ඒකකයන්ය.

පසුගිය දිනවල රටේ සිදුවූ අර්බුදකාරී තත්ත්වයත් සමගම ගිනි තබා විනාශ කළ දේශපාලනඥයන්ගේ නිවාස දේපොළ සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේ කටයුතු මේ වනවිට භාරදී තිබෙන්නේ මෙම පාතාල මර්දන ඒකකයන් වෙතය. පාතාල මර්දන මෙහෙයුම් පසෙක තබා මෙම ඒකකවල නිලධාරීන් මේ වනවිට සිදු කරන්නේ දේශපාලනඥයන්ගේ දේපොළ විනාශ කිරීමේ සම්බන්ධයෙන් වූ විමර්ශනයන්ය.

මේ විශේෂ ඒකක පාතාල මර්දන මෙහෙයුම්වලින් ඉවත් වීම පාතාල කණ්ඩායම්වලට රජමගුල් බවට පත් වී හමාරය.

පාතාල මැර කණ්ඩායම් ඉවක් බවක් නොමැතිව මිනිස් ඝාතන සිදු කරන්නට පටන් ගන්නේ මෙම විශේෂ ඒකක සිය රාජකාරිවලින් බැහැර වීමත් සමගය.

ඉදිරියේදී මේ තත්ත්වය තවත් බැරෑරුම් තත්ත්වයට පත්වීම වැළැක්විය නොහැක.

රැකියා අහිමි වූ තරුණයන් මේ වනවිට ලක්ෂ දෙකකට අධිකය. ඉදිරියේදී මේ තත්ත්වය තවදුරටත් වර්ධනය වනු ඇත. රටේ පවතින ආර්ථික තත්ත්වයත් මුදල් හිඟකමක් නිසා රැකියා අහිමිවන තරුණයන් බොහෝ දෙනෙකු මත්ද්‍රව්‍ය ජාවාරම්වලට සම්බන්ධ වීම වැළැක්විය නොහැක.

මේ තත්ත්වය පාලනය කිරීමට රජයේ හෝ පෙලිසියේ නිවැරදි වැඩපිළිවෙළක් සැලසුමක් නොමැත.

රටේ පවතින අස්ථාවර තත්ත්වය මත ඉදිරියේදී මීට වඩා අපරාධ සිදුවනු ඇත. පාතාල මැර කණ්ඩායම් තවතවත් දරුණු අපරාධවල මිනිමැරුම්වල මෙන්ම මත්ද්‍රව්‍ය ජාවාරම්වල නිරත වීම ශීඝ්‍රයෙන් ඉහළ යනු ඇත.

පාතාල මර්දනය ගැන පෙලිසිය තුළ මේ වනවිට නිසි සැලසුමක් නැත. බොහෝ පොලිස් නිලධාරීන් කරන්නේ ඇඟ බේරාගෙන ඊළඟ උසස්වීම ලබාගැනීමට නිකං උඩබලාගෙන සිටීමය. පාතාල මර්දනය කිරීමට මත්ද්‍රව්‍ය ජාවාරම් මැඩලීමට හදවතින්ම කටයුතු කරන නිලධාරීන්ට සිදුවන්නේ එක්කෝ හිරගෙවල්වල තැපීමටය. එහෙමත් නැත්නම් උසස්වීමක් හෝ නොලබා කොහේ හෝ තුත්තුකඩියකට මාරුවී යෑමට ය. ඒ අපේ රටේ හැටිය.

අද පොලිස් දෙපාර්තමේන්තුවේ අපරාධ අංශය භාර නියෝජ්‍ය පොලිස්පතිවරයකු නැත. පොලිසියට නිවැරදි දැක්මක් නැත. පොලිසියේ උසස්ම නිලධාරීන් ඇනකොටා ගනිද්දී පහළ නිලධාරීන්ගේ රාජකාරි ගැන කවර කථා ද?

මේ සියලු කාරණා ගැන මනා අවබෝධයකින් සහ අවධානයකින් සිටින පාතාල මැරයන් මෙන්ම මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සිය කාර්යයන් තමන්ට අභිමත පරිදි කිරීමට පටන් ගෙන ඇත.

පසුගිය කාලයේ සිදුවූ ඇතැම් සිදුවීම් නිසා අපරාධකරුවන් අද පොලිස් නිල ඇඳුමට තිබූ බය පක්ෂපාතීත්වය ගිලිහී ගොසින්ය. පාතාල මැරයන් කුඩුකාරයන් පොලිස් නිලධාරීන්ට අභියෝග කරන තත්ත්වයකට පත්ව සිටිති.

මේ තත්ත්ව ඉතාම භයානක බව අප සැවොම තේරුම් ගත යුතුය. පාතාලයට කුඩුකාරයන්ට මැරයන්ට නීතිය අතට ගැනීමට ඉඩ ලබාදුන්නොත් ඇතිවන තත්ත්වය තේරුම් ගතයුතුය.

ඉකුත් මැයි 09 වැනිදා රටේ සිදුවූ භයානක තත්ත්වය ඊට කදිම නිදසුනකි. පාතාල මැරයන් කුඩුකාරයන් අපරාධකාරයන් රටේ නීතිය සියතට ගෙන පැය 24ක් තුළ සිදුකළ අපරාධයන් මොන තරම් භයානකද යන්න අපි දුටුවෙමු. මේ ආකාරයට පාතාල මැරයන්ට කුඩු කාරයන්ට රිසිසේ කටයුතු කිරීමට ඉඩ ලබානොදීමට රජය මෙන්ම පොලිසිය ද වගබලාගත යුතුය. අවිගත් පාතාල මැරයන් අවියෙන්ම මට්ටු කළ යුතුය. මාකඳුරේ මධුෂ්, කොස්ගොඩ තාරක ඇතුළු දරුණු පාතාල මැරයන් රැසක් පසුගිය දිනවලදී ජීවිතක්ෂයට පත් වන්නේ පාතාල මර්දන මෙහෙයුම් ක්‍රියාත්මක වෙද්දීය.

මධුෂ්ලා, කොස්ගොඩ තාරකලා ජීවතුන් අතර සිටියේ නම් අද අපට භුක්ති විඳින්නට සිදුවන්නේ කුමන තත්ත්වයකට දැයි සිතා ගැනීමටවත් නොහැක.

එවැනි තත්ත්වයක් ඇතිවීමට ඉඩකඩ ලබානොදී පාතාල මැරයන් මෙන්ම සන්නද්ධ කණ්ඩායම් මර්දනය කර රටේ නීතිගරුක පුරවැසියන්ට නිදහසේ ජීවත්වීමට වාතාවරණයක් සකස් කර දීමට රජය වගබලා ගත යුතුය.

**• හේමන්ත රන්දුණු**

# පැදුරු කොට්ටත් අරගෙන පාස්පෝට් පෝලිමට එන්න

**දවසින් දවස තමන්ගේ මූලික අවශ්‍යතා වෙනුවෙන් පැය ගණන් දවස් ගණන් පෝළිම්වල ගත කරන මිනිස්සු මේ රටේ පාලකයන් ගැන වගේම මේ රට ගැන කතා කරන්නෙත් කලකිරීමෙන්.**

ඒ කලකිරීම නිසාම කොහොම හරි රට යන්න තිබුණා නම් හොඳයි කියලා නොහිතෙන කෙනෙක් ඉන්නවනම්, ඒ කලාතුරකින්. කොහොම වුණත් අද වෙද්දී ගෑස්වලට ඉන්ධන වලට වගේම විදේශ ගමන් බලපත්‍රය හදාගන්නත් බත්තරමුල්ල ආගමන විගමන දෙපාර්තමේන්තුව අසල දිගු පෝළිම් නිර්මාණය වෙලා. පසුගිය සිකුරාදා (10) 'දිවයින' අපි සුහුරුපායට යද්දිත්, ඒ අවට දිගු පෝළිම් දැක ගන්න හැකි වුණා.

පෝළිම්වල වගේම තැන් තැන්වලට වෙලා කතාබහ කරන මිනිස්සු, තමන්ගේ වාරය එනකම් බලාගෙන ඉන්න මිනිස්සු, පෝළිම්වල ඉන්න අයගේ නෑදෑයන් හිතමිතුරන් නිසා සුහුරුපාය අවට ජනාකීර්ණත්වය දෙතුන් ගුණයකින් වැඩි වෙලා තිබුණා. තමන්ගේ අම්මා තාත්තා පාස්පෝට් එක හදාගෙන එනකම් බලාගෙන ඉන්න කුඩා දරුවෝ, තමන්ගේ දරුවා පාස්පෝට් එක හදාගෙන එනකම් බලාගෙන ඉන්න දෙමාපියෝ හැම දෙනෙක්ගෙන්ම මුහුණේ තිබුණේ කියාගන්න බැරි වෙහෙසකාරී බවක්. ජාති ආගම් භේදයක් නැතිව, බාල වැඩිහිටි තරුණ භේදයක් නැතිව හැම කෙනෙක්ම තමන්ගේ වාරය එනකම් පෝළිම්වලට වෙලා බලාගෙන ඉන්නවා.

ඇත්තටම කියනවා නම් පාස්පෝට් එක හදාගන්න වගේම පාස්පෝට් එකක් හදාගන්න කිසිම බලාපොරොත්තුවක් නැති මිනිස්සුත් එතැන ඕන තරම් හිටියා. එහාට මෙහාට තෙරපමින්, හූල්ලමින්, තවත් වෙලාවක සමීපයේ සිටින පුද්ගලයන් සමග අල්ලාප සල්ලාපයේ යෙදෙමින් ඉන්න මේ මිනිස්සු මට පෙනුනේ තවත් අරගලකරුවන් පිරිසක් විදිහට.

"දැනට අවුරුද්දකට විතර කලින් පාස්පෝට් හදාගන්න ආව මිනිස්සුන්ට වඩා දහ දොළොස් ගුණයක් මිනිස්සු දැන් පාස්පෝට් එක හදාගන්න එනවා. සමහර අය ඊයේ රෑ ඉඳලා මෙතන ඉන්නේ. තවත් අය කල්තියා දින වෙන් කරවාගෙන මෙතෙන්ට ආව අය. කොහොම වුණත් තරුණයන් වගේම මැදි වයසේ පුද්ගලයනුත් පාස්පෝට් හදාගන්න එනවා. රට යන්න බලාපොරොත්තුවක් නැති මිනිස්සු පවා පාස්පොට් හදා ගන්න එනවා කියලා තමයි මට නම් හිතෙන්නේ"

එතැන සිටි ආරක්ෂක නිලධාරියෙක්ගෙන් අපි තොරතුරු විමසන අවස්ථාවේ දී ඔහු දුන්නේ ඒ වගේ පිළිතුරක්. ඇත්තටම අදහසක් දක්වන්න විනාඩියක්වත් වෙන්කර ගන්න බැරි තරම් ඔවුන් කාර්යබහුල වෙලා හිටියා. දිවයිනේ විවිධ ප්‍රදේශවලින් විදේශ ගමන් බලපත්‍රය සකස් කර ගැනීම සඳහා විශාල පිරිසක් ඒ වන විටත් බත්තරමුල්ලට පැමිණෙමින් ඉන්නවා. සාමාන්‍ය ලෙස විදේශ ගමන් බලපත්‍රය සකස් කර ගැනීමට පැමිණි පිරිසට වඩා වැඩි පිරිසක් එක් දින සේවාව ලබා ගැනීම සඳහා පැමිණ සිටීමත් සුවිශේෂී කාරණාවක්. මේ විදියට විදේශ ගමන් බලපත්‍රය හදාගන්න එන පිරිසට බත්තරමුල්ල අවට වෙනමම නවාතැන්පළවල් සකස් වෙලා තිබුණා. පැයට දෙකට, දවසට ඔවුන් මේ පිරිසගෙන් මුදල් අයකරගෙන නවාතැන් පහසුකම් සපයනවා වගේම ඇඳුමක් මාරු කරගන්නවට, මුහුණ කට ටිකක් හෝදගන්නවාටත්, ගෙදරින් ගෙනාව කෑම පාර්සලේ දිගෑරගෙන කනවටත් මිනිස්සුන්ගෙන් සල්ලි අය කරගන්න තත්ත්වයට ඒ අවට වටපිටාව සකස් වෙලා තිබුණා.

නිවසේ ඉදිරිපස තියෙන කාමරයක පැය දෙක තුනක විවේක ගන්න කාලසීමාවට රුපියල් හයසීයක් දාහක් අතර ප්‍රමාණයකුත්, ස්නානය කිරීම සඳහා රුපියල් පන්සියයකුත් අය කරගන්න කිහිප දෙනකුත් ඉන්නවා කියලා අපට දැනගන්න ලැබුණා.

කොහොම වුණත් මේ විදිහට පෝළිම්වල පැය ගණන් දවස් ගණන් ඉන්න මිනිස්සුත් එක්ක කතා කරද්දි, විදේශ ගමන් බලපත්‍ර පෝළිම් සංස්කෘතියේ අමුතු සිදුවීම් රැසක් ද අනාවරණය කරගන්න අපට හැකි වුණා.

පෝළිම්වල තමන්ගේ වාරය එනකම් ඉන්න මිනිසුන්ගෙන් මුදල් අයකරගන්නා කිසියම් පුද්ගලයන් පිරිසක් අදාළ පුද්ගලයාගේ වෙනුවට පෝළිම්වල රැඳී සිටින සිදුවීමක්ද අපට වාර්තා වුණා. එක් අතකින් එය පැය ගණන් පෝළිම්වල බලා සිටින පුද්ගලයන්ට සහනයක් ලෙස පෙනුනත්, මේ විදිහට විවිධ මාර්ග ඔස්සේ කූට ලෙස මුදල් උපයන්න වෑයම් කරන පුද්ගලයන් ආරක්ෂක අංශවල ඇස් වසමින් සූක්ෂමව තමන්ගේ කටයුතු ජයටම කරගෙන යනවා. මේ විදියට විවිධාකාරයෙන් සහයෝගය දක්වන්නට පැමිණෙන පිරිස කිහිප වතාවක්ම මුදල් වංචා කර ඇති බවත් අපිට දැනගන්න ලැබුණා. ඒ වගේම දැන් සුහුරුපාය අවට ගැට කපන්නන්, මංකොල්ල කන්නන්, හොරුන් වංචාකාරයන් මෙන්ම සල්ලාලයන් පිරුණු තැනක් බවට පත්වෙලා. මේ සිදුවීම් ගැන වැඩිදුර අදහස් දැනගන්න අපි ආගමන විගමන දෙපාර්තමේන්තුවේ නිලධාරියෙක් මුණගැහුණා. මේ දිනවල සුහුරුපාය අවට තිබෙන තත්ත්වය පිළිබඳව ඔහුත් සමග අපි දිගින් දිගටම සාකච්ඡා කළත් අනන්‍යතාවයන් ගෙනහැර දැක්වීම ඔහුගේ වෘත්තීයට ගැටලුවක් වන නිසා ඔහු කියූ කාරණාවල අන්තර්ගතය මේ විදියට සටහන් කරන්න අපි තීරණය කළා.

"ලංකාවෙන් පිට වෙන්න පාස්පෝට් හදාගන්න එන දුක් විඳින මිනිස්සු ගැන අපිටත් තියෙන්නේ ලොකු කලකිරීමක්. පෙට්‍රල් පෝළිම්වල, ගෑස් පෝළිම්වල තත්ත්වයට වඩා පාස්පෝර්ට් පෝළිමේ තත්ත්වය වෙනස්. පෙට්‍රල්, ගෑස් වගේ දේවල් ගෙන්වනකම් ඩොලර් ගෙවලා නිදහස් කරනකම් බලන් ඉන්න වෙනවනේ. ඒත් පාස්පෝර්ට් එකක් ගන්න කවුරුත් මේ විදිහට දුක් විඳිය යුතු නැහැ. ක්‍රමවත් වැඩපිළිවෙළක් තිබුණානම් පාස්පෝර්ට් එක හදා ගන්න එන මිනිස්සු මේ තරම් පෝළිම්වල දුක් විඳින එකක් නැහැ. ඇත්තටම කියනවනම් පාස්පෝර්ට් එක හදා ගන්න එන මිනිස්සුන්ට මීට වඩා පැහැදිලි ක්‍රමවේදයකට තමන්ගේ සේවාව සපයන්න වැඩපිළිවෙළක් සකස් කරන්න පුළුවන්. ඒත් ඒ ගැන කවුරුත් උනන්දු වෙන්නේ නැහැ."

ඒ නිලධාරීයා පෙන්වා දෙන ආකාරයට තවමත් මුද්‍රණය කළ විදේශ ගමන් බලපත්‍ර ප්‍රමාණයක් ආගමන විගමන දෙපාර්තමේන්තුව සතුව තියෙනවා. ඒ ප්‍රමාණය ඉවර වෙන්නේ තවත් මාස දෙක තුනකින් නම් මේ තරම් මිනිසුන් පෝළිම්වල දුක් විඳින්නේ ඇයි කියන ප්‍රශ්නයට වගකිවයුතු නිලධාරීන් පිළිතුරු ලබා නොදෙන්නේ ඇයි?

ඇෆ්ගනිස්තාන වැසියන් තලෙයිබාන් ප්‍රහාර එල්ල වූ අවස්ථාවේ දී රටෙන් යන්න උත්සාහ කළා වගේ තත්ත්වයක් තමයි දැන් උදාවෙලා තියෙන්නේ. පැදුරු එලාගෙන පාර දිගට මහ රෑටත් මිනිස්සු බලාගෙන ඉන්නවා. ගෑනු ළමයි පවා මහ වැස්සට තෙමි තෙමි රෑ තිස්සේ දුක් විඳිනවා. මේ තත්ත්වය මඟහරවා ගන්න අවශ්‍ය පියවර ගන්න බලධාරීන්ට හැකියාව තිබෙද්දීත් ඔවුන් කිසිත් නොකර නිහඬ පිළිවෙතක් අනුගමනය කරන්නේ ඇයි කියන ප්‍රශ්නය අපිටත් තියෙනවා.

## මේ රටේ ඉන්න එක වගේම රටෙන් යන එකත් ලේසි වැඩක් නෙමෙයි.

"ජනවාරි මුල ඉඳලා මැයි මාසේ වෙද්දි විශාල ප්‍රමාණයක් පාස්පෝට් හදාගෙන. සාමාන්‍යයෙන් අවුරුද්දකටම පාස්පෝට් හතළිස් දෙදහක් පනස්දාහක් අතර ප්‍රමාණයක් තමයි වෙනදාට නිකුත් කරන්නේ. මේ අවුරුද්දේ මැයි මාසේ වෙද්දිත් ලක්ෂ තුනකට ආසන්න පිරිසක් පාස්පෝර්ට් එක හදාගෙන තියෙනවා. මේ ධාරිතාවය දෙපාර්තමේන්තුවටවත් කාර්ය මණ්ඩලයට වත් දරාගන්න බැහැ. මේ සිස්ටම් එකක්වත් ඔය කියන මට්ටමට හැදිලා නැහැ."

2022 වර්ෂයේ මැයි මාසයේ විසි දෙවැනි දා ඉඳලා තිස් වෙනිදා වෙද්දී ආගමන විගමන දෙපාර්තමේන්තුව මගින් විදේශ ගමන් බලපත්‍ර දාහක් සහ දාහත් හයසීයකට ආසන්න ප්‍රමාණයක් නිකුත් කරලා තියෙන බවට තොරතුරු අනාවරණය වුණා. දවසින් දවස විදේශ ගමන් පත්‍රය ලබා ගැනීමට පැමිණෙන පිරිසේ වර්ධනයක් මිස අඩුවක් පෙන්නුම් කරන්නේ නැහැ. ඒ වගේම ගම්වල තරුණ තරුණියන්ට විදේශ රැකියා අවස්ථා ලබා දෙන බව කියමින් ගම්වලට පැමිණෙන පිරිසක් එම තරුණ තරුණියන් ගෙන් මුදල් ලබාගෙන ඔවුන්ව විදේශ ගමන් බලපත්‍රය සකස් කර ගන්නා තැනට රැගෙන එනවා. එතැනදී තරුණ තරුණියන්ට විශ්වාසය ඇති වන විදියට වැඩ කරන ඔවුන් විශාල මුදලක් මෙන්ම රුපියල් පහළොස් දාහක් වැය කර එක්දින සේවාව යටතේ සකස් කරගන්නා විදේශ ගමන් බලපත්‍රය ද රැගෙන පළා යනවා. විදේශ ගමන් බලපත්‍ර හදාගන්න එන පිරිස ළඟ මුදල් යහමින් තියෙන බව හොඳින් දන්නා ජාවාරම්කරුවන් කොහොම හරි මුදල්හරි පැහැර ගන්න සැලසුම් හදනවා.

ඒ අවට ඉන්න ඇතැම් ත්‍රිරෝද රථ රියැදුරන්, සුළු ව්‍යාපාරිකයන්, මේ වංචාකරුවන්ට උදව් උපකාර කරන බවට තමයි තොරතුරු වාර්තා වෙන්නේ. කොහොම වුණත් සුහුරුපාය අවට ගැට කපන්නන් මංකොල්ලකරුවන් බහුලව සිටින නිසා රන් භාණ්ඩ, ජංගම දුරකථන, ගමන්මළු පරිස්සම් කරගන්න ලෙසට නිරන්තරයෙන් ආරක්ෂක අංශ ජනතාවට දැනුවත් කරනවා.

ආගමන විගමන දෙපාර්තමේන්තුව පිටත වගේම ඇතුළතත් ඇතැම් නිලධාරීන් විවිධ අරමුණු ඉෂ්ට කර ගැනීම සඳහා ආයතනික නීති රීති වලින් පරිබාහිරව කටයුතු කරනවා කියලත් අපිට දැනගන්න ලැබුණා.

"සාමාන්‍යයෙන් පාස්පෝර්ට් එකට ගන්න ෆොටෝ එක රීඩ් කරන්නේ සිස්ටම් එකක් හරහා. ලංකාවෙ තියෙන ගොඩක් ස්ටුඩියෝවලට පාස්පෝර්ට් එකට අවශ්‍ය ෆොටෝ එක ගන්න බලතල දීලා තිබුණා. දැන් පිට පළාත්වලවත් කොළඹ දිස්ත්‍රික්කයේවත් කිසිම ස්ටුඩියෝ එකකින් පාස්පෝර්ට් ෆොටෝ ගන්න බැහැ. ඔවුන්ට ඒ සිස්ටම් එකට කනෙක්ට් වෙන්න බැහැ. ඒත් බත්තරමුල්ලේ ස්ටුඩියෝ කිහිපයක විතරක් කිසිම ප්‍රශ්නයක් නැතිව ෆොටෝ ගන්න පහසුකම් සපයලා තියෙනවා."

ෆොටෝ එකක් අරන් කීයක් හරි හොයා ගත්ත ගොඩක් දෙනෙක්ට අද මේ ගැටලුව නිසා මුදල් උපයන්න බැරිවෙලා. තෝරගත්ත කිහිපදෙනෙක් පමණක් මේ වරප්‍රසාද භුක්ති විඳින්න කොහොමද කියන ප්‍රශ්නය ආයතනයේ ඇතුළේ ඇතැම් නිලධාරීන්ටත් තියෙනවා. නමුත් පවතින වාතාවරණයත් සමඟ නිවැරදි දේ වෙනුවෙන් කතා කළොත් සිදුවෙන දේ හොඳින්ම දන්න නිසා ඒ නිලධාරීන් මේ සම්බන්ධයෙන් වැඩිදුර අදහස් දක්වන්න කැමැත්තක් දක්වන්නේ නෑ.

ඒ වගේම දිවා රාත්‍රී සේවා මුර සපයලා විදේශ ගමන් බලපත්‍ර කඩිනමින් නිකුත් කරන්න අවශ්‍ය සම්පත් ආගමන විගණන දෙපාර්තමේන්තුව සතුව තියෙද්දිත් මේ විදියට දිගින් දිගටම රෑ දවල් මිනිස්සු පෝළිම්වල රස්තියාදු කරන්නේ ඇයි කියන කාරණයට තවමත් පැහැදිලිව පිළිතුරක් හොයාගන්න අපිටත් හැකියාව ලැබුණේ නැහැ.

මේ විදිහට ආගමන විගණන දෙපාර්තමේන්තුව තුළ සහ ඒ අවට සිදුවෙන සිදුවීම් සම්බන්ධයෙන් ආගමන විගණන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පාලක, මාධ්‍ය ප්‍රකාශක පියුමි ඉන්දිකා බණ්ඩාර මේ විදිහට අදහස් ඉදිරිපත් කළා.

"අපි දවසකට ගමන් බලපත්‍ර දෙදහස් පන්සියයක් නිකුත් කරන්න තමයි කටයුතු කරන්නේ. කලින් දින වෙන් කර ගත්ත දාහකට අමතරව වෙනම පෝළිමක රැඳී ඉන්න පිරිසකුත් ඇතුළු කර ගැනීමට අපි කටයුතු කරනවා. ඒ හැම දෙනෙක්ගේම කටයුතු එකම දවසේ ඉවර කරගන්න බැරි වුණොත් අපි ඔවුන්ට වෙනත් දිනයක් ලබා දෙනවා. ඒ දිනය අපි සටහන් කරන්නේ අයැදුම්කරුගේ ඡායාරූපය මත. සුළු පිරිසක් එළියට ගිහින් ඡායාරූපය අයින් කරලා වෙන ඡායාරූපයක් අරගෙන ඊළඟ දවසෙත් පෝළිමට එනවා. ඒ හින්දා හැමදෙනෙක්ම අපහසුතාවයට පත් වෙනවා.

දැන් බොහෝ මිනිසුන්ගේ එකම බලාපොරොත්තුව වෙනත් රටකට යෑමයි. නමුත් හෙට අනිද්දාට රට යන එකත් හිතන තරම් ලෙහෙසි පහසු කටයුත්තක් නොවන බවට ඉහත සඳහන් කළ සිදුවීම් ඕනෑවටත් වැඩියෙන් සාක්කි සපයයි.

**• කුමාරි ඉරුගල්බංඩාර**




සංස්කරණය - ප්‍රභාත් විතාන



# සම්පත් බැංකුව සිය ශක්තිමත් ප්‍රාග්ධන පදනම හා දූරදර්ශී අවදානම් කළමනාකරණය තුළින් අභියෝගාත්මක ආර්ථික පරිසරය සාර්ථකව ජය ගනී

පවතින පීඩාකාරී ආර්ථික තත්වයන් හේතුවෙන් ඇති විය හැකි අලාභයන් අවශෝෂණය කර ගැනීමට ප්‍රමාණවත් මට්ටමේ ප්‍රාග්ධන ස්වාරක්ෂකයන් තිබීමත්, සුපරීක්ෂාකාරී අවදානම් කළමනාකරණ ක්‍රමෝපායන් සහ විවිධාංගීකරණය වූ ආයෝජන කලඹක් තිබීමත් තුලින් ඍණාත්මක ආර්ථික පසුබිමක් තුල වුවද සිය සම්බන්ධිත පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා වලට ප්‍රමුඛතාව දීමට සම්පත් බැංකුවට හැකි විය.

තියුණු අභියෝගකාරී ආර්ථික වාතාවරණයක් මධ්‍යයේ වුවද 2022 මාර්තු 31න් අවසන් වූ පළමු කාර්තුව සඳහා සම්පත් බැංකුව බදු පෙර ලාභය රුපියල් බිලියන 6.5 ක් හා බදු පසු ලාභය රුපියල් බිලියන 4.7ක් වාර්තා කිරීමට සමත් වූ අතර එය ණය අත්තිකාරම් සහ ආයෝජන සඳහා ප්‍රමාණවත් අපහායන ප්‍රතිපාදනයන් වෙන් කිරීමෙන් ද පසුව 2021 පළමු කාර්තුවට සාපේක්ෂව පිළිවෙලින් 5.3%ක හා 2.9%ක වර්ධනයකි.




සම්පත් බැංකු පීඑල්සී හි සභාපති හර්ෂ අමරසේකර මහතා (වම), සම්පත් බැංකු පීඑල්සීහි කළමනාකාර අධ්‍යක්ෂ නන්ද ප්‍රනාන්දු මහතා (දකුණ)

සම්පත් බැංකුව හා සමූහය විසින් 2022 පළමු කාර්තුව සඳහා වාර්තා කරන ලද මූල්‍ය ප්‍රතිඵල - සාමාන්‍ය බර තබන ලද ප්‍රමුඛ ණය අනුපාතය (AWPLR) වර්ධනය වීමත් සමගම ශක්තිමත් ශුද්ධ පොලී ආන්තිකයක් වාර්තා කිරීමට සම්පත් බැංකුව සමත් විය. ඇමරිකා එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය 47%කින් අවප්‍රමාණය වීම නිසා විදේශ විනිමය ආදායම 248%කින් වර්ධනය විය. කාඩ්පත් හා වෙළෙඳ ආශ්‍රිත මෙහෙයුම් මූලික කරගත් ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායමේ 74.6% ක සැලකිය යුතු වර්ධනයක් කාර්තුව තුල දී ළඟා කරගත හැකි විය. ඇති විය හැකි ආර්ථික අවිනිශ්චිතතාවයන් අවම කර ගැනීමට ණය අත්තිකාරම් හා ආයෝජනයන් සඳහා ඉහල අපහායන ප්‍රතිපාදනයක් වෙන් කරන ලදී. සමූහයේ බදු පසු ලාභය 4.9%ක ආන්තික පහල බැසීමක් වාර්තා කළ අතර බදු පෙර ලාභය 1.6% ක සුළු වර්ධනයක් වාර්තා කරන ලදී. සමූහයේ බදු පෙර ලාභය හා බදු පසු ලාභය 2022 පළමු කාර්තුව සඳහා පිළිවෙලින් රුපියල් බිලියන 6.8ක් හා රුපියල් බිලියන 4.9 ක් විය.

සම්පත් බැංකුව 2022 පළමු කාර්තුව සඳහා රුපියල් බිලියන 24.9 ක පොලී ආදායමක් උපයාගත් අතර මෙය සංසන්දනාත්මක කාලච්ඡේදයේ රුපියල් බිලියන 20.7 හා සැසඳීමේදී 20%ක වර්ධනයකි. මේ සඳහා ප්‍රධාන වශයෙන් ණය අත්තිකාරම් හා ආයෝජනයන්හි පොලී අනුපාතිකයන් ඉහළ යාම හේතු විය. සාමාන්‍යය බර තැබූ ප්‍රමුඛ ණය අනුපාතය (AWPLR) 2021 මාර්තු 31 දිනට පැවති 5.75% ට සාපේක්ෂව මේ වසරේ පළමු කාර්තුව අවසානය වන විට 9.71% දක්වා පදනම් ලකුණු 396 කින් ඉහළ ගොස් ඇත. තවද වසරකින් කල් පිරෙන භාණ්ඩාගාර බිල්පත් සඳහා වන පොලී අනුපාතය සංසන්දනාත්මක කාලච්ඡේදයේ වාර්තා කල 5.11% සිට පදනම් ලකුණු 717 කින්

# HNB 2022 සඳහා ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම පාරිභෝගික බැංකුව ලෙස ඒෂියන් බෑන්කර් සඟරාවේ ගෞරවයට

පාරිභෝගික බැංකුකරණයේ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛයා ලෙස නැවතත් සිය විශිෂ්ටත්වය සනිටුහන් කරමින් ඒෂියන් බෑන්කර් සඟරාව විසින් පැවැත්වූ 2022 කීර්තිමත් ජාත්‍යන්තර පාරිභෝගික මූල්‍ය සේවා සම්මාන උළෙලේදී 12 වැනි වරටත් ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම පාරිභෝගික බැංකුව ලෙසින් හැටන් නැෂනල් බැංකුව අභිසෙස් ලැබීය-

ලොව පාරිභෝගික මූල්‍ය සේවා සඳහා වන කීර්තිමත් සහ විනිවිදභාවයෙන් යුත් සම්මාන උළෙලක් ලෙස මෙය සලකනු ලබයි. ස්ථාවරත්වය, නවෝත්පාදනය හා ඩිජිටල් හැකියාව සහ වේගවත්, තිරසාර වර්ධනයක් කරා ක්‍රියාවලි අළුතින් නැවත සකස් කිරීමේදී නව සන්ධිස්ථානයන් සනිටුහන් කරන කලාපයේ මූල්‍ය ආයතන ඉස්මතු කිරීම සඳහා මෙම සම්මාන උළෙල පවත්වනු ලබයි.



HNB කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී, ජොනතන් අලස් මහතා



HNB පාරිභෝගික සහ සුළු සහ මධ්‍ය පරිමාණ බැංකු කටයුතු පිළිබඳ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, සන්ජේ විජේමාන්න මහතා

මෙම සුවිශේෂී ජයග්‍රහණය පිළිබඳව අදහස් දක්වමින් HNB කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී ජොනතන් අලස් මහතා පැවසුවේ " HNB ආරම්භ කරන ලද්දේ අවංකභාවය සහ සේවාව මත ගොඩනැගුණු සැබෑ හවුල්කාරිත්වයන්ගේ ප්‍රගතිය උදෙසා වන මූලධර්මය මතයි. වසර 134 ක් පුරා පරම්පරා ගණනාවක විශ්වාසය දිනාගනිමින් මහත් අභිමානයකින් සහ වගකීමකින් අපි මෙම සේවාව පත්වාගෙන යනු ලැබුවා. බැංකුව සිය හැකියාවන් නිරන්තරයෙන් පරිවර්තනය කිරීමටත්, රටේ යහපත් හා අයහපත් කාලවලදී ශ්‍රී ලාංකිකයින්ට හැකි සෑම අවස්ථාවකම සේවය ලබා දීම සඳහා කාලයත් සමඟින් ඉදිරියට යාමට මෙම වටිනාකම් ඉහවල් වුනා." යනුවෙනි.

# ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වසරේ ඉහළම ජනාදරයට පත් ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ සන්නාමය සහ වසරේ වඩාත් අගනා සාමාන්‍ය රක්ෂණ සන්නාමය බවට පත්වෙයි

දේශයේ රක්ෂකයා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්, සිය විශිෂ්ටත්වය නැවතත් තහවුරු කරමින් වසරේ ඉහළම ජනාදරයට පත් ජීවිත රක්ෂණ සන්නාමය, ඉහළම ජනාදරයට පත් සාමාන්‍ය රක්ෂණ සන්නාමය සහ වසරේ වඩාත් අගනා සාමාන්‍ය රක්ෂණ සන්නාමය ලෙසද අඛණ්ඩව පස් වන වසරටද බ්‍රෑන්ඩ් ෆයිනෑන්ස් වෙතින් ඇගයීමට ලක්ව තිබේ.




වසරේ වඩාත් අගනා රක්ෂණ සන්නාමය බවට පත්වූ සාමාන්‍ය රක්ෂණ කාණ්ඩයේ වෙළඳපල ප්‍රමුඛයා වන ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්, සාමාන්‍ය රක්ෂණ වෙළෙඳපොළ තුළ පවත්නා රක්ෂණ අවශ්‍යතාවලට අනුකූලව සුවිශේෂී රක්ෂණ විසඳුම් හඳුන්වා දී තිබේ. එසේම සාමාන්‍ය රක්ෂණ කාණ්ඩයේ ප්‍රමුඛතම සන්නාමය වන ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෝටර් ප්ලස්, මෝටර් රථ රක්ෂණ වෙළඳපල තුල සිය ආධිපත්‍ය තහවුරු කරමින් අනු සන්නාම රැසක් යටතේ විවිධ වෙළඳපල කාණ්ඩ රැසකට රක්ෂණ පහසුකම් රැසක් ලබාදෙයි. Bee Express හිමිකම් පියවීමේ පද්ධතිය රු. 75,000/- දක්වා වන හිමිකම් වැඩකරන පැය 3ක් ඇතුළතදී පියවීම සිදුකරන අතර රක්ෂණ ඔප්පු හිමියන්ට නිරවද්‍ය තක්සේරුවක් ලබාදීම සඳහා අවශ්‍ය ඉහළම තාක්ෂණික දැනුමින් සහ ප්‍රවීනත්වයෙන් සපිරි කාර්ය මණ්ඩලයකින් යුතුය. එසේම ශ්‍රී ලංකාවේ සීග්‍රයෙන් ඉහළ යන මාර්ග අනතුරු සහ මරණ සංඛ්‍යාව සැලකිල්ලට ගනිමින් එක්සත් ජාතීන්ගේ ගෝලීය මාර්ග ආරක්ෂණ සතියට සමගාමීව ක්‍රියාත්මක කරනු ලැබූ Motor Plus Road Safety Heroes වැඩසටහන මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුවත්භාවය ඇතිකිරීම සඳහා ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ලයිෆ් විවිධ රක්ෂණ අවශ්‍යතා සඳහා සරිලන නවමු ජීවිත රක්ෂණ විසඳුම් රැසක් හඳුන්වාදී ඇති අතර පාරිභෝගිකයන්ට ජීවිත රක්ෂණ සඳහා ඇති ප්‍රවේශය වඩාත් පහසු කරමින් සිය සුවිශේෂී රක්ෂණ විසඳුම් නවීකරණය කර තිබේ. එමෙන්ම ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ලයිෆ් අඛණ්ඩව රක්ෂණ ක්ෂේත්‍රයේ වැඩිම බෝනස් මුදල ප්‍රකාශයට පත් කරයි.

එසේම ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සිය මෙහෙයුම් පද්ධති සහ පාරිභෝගික සේවා පද්ධතීන් ඩිජිටල්කරණය කිරීමේ ක්‍රියාවලියෙහි ස්ථාවර ප්‍රගතියක් අත්කරගෙන තිබෙන අතර ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ජංගම දුරකථන ඇප් හරහා වෙනස්වන පාරිභෝගික අවශ්‍යතා සමගින් නිරන්තරයෙන් වෙනස්වෙමින් වැඩිදියුණු කල විශේෂාංග රැසක් හඳුන්වා දී තිබේ. එමෙන්ම අභ්‍යන්තර ක්‍රියාවලීන් වඩාත් ශක්තිමත් කරමින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කාර්යමණ්ඩලය සහ අලෙවි බලකාය බලගන්වමින් විශිෂ්ට සේවාවක් ලබාදීමට කටයුතු කරමින් සිටී.

# Samsung ලෝක සාගර දිනයට සමගාමීව සමුද්‍ර ආරක්ෂණය සඳහා වූ සිය කැපවීම යළිත් අවධාරණය කරයි

ශ්‍රී ලංකාවේ අංක 1 smartphone සන්නාමය වන සැම්සුන් ඉවත දැමූ ධීවර මාළු දැල් ඔවුන්ගේ smartphones වලට එක්කරන ප්‍රයත්නය සමගින් සමුද්‍ර ජීවීන් ආරක්ෂා කිරීම උදෙසා ඇති ඔවුන්ගේ කැපවීම යළිත් අවධාරණය කළේය.




පසුගිය දශකය පුරාවට සැම්සුන් ඉලෙක්ට්‍රොනික්ස් විසින් ස්වභාවික සම්පත් කෙරෙහි අවධානය යොමුකරමින් තම නිෂ්පාදන සැලසුම් කිරීමට සහ සංවර්ධනය කිරීමට කටයුතු කළේය. සැම්සුන් හි ඒ වෙනුවෙන් වූ නවතම පියවර වූයේ මෑතකදී Galaxy තාක්ෂණය සහිත නව අමුද්‍රව්‍යයක් නිර්මාණය කිරීමයි. සාගර ආශ්‍රිතව ඇති ඉවත දැමූ ධීවර මාළු දැල් නැවත වෙනත් අරමුණක් සඳහා භාවිත කිරීමේ අරමුණින් (repurposed) මෙම නව අමුද්‍රව්‍ය නිපදවනු ලබයි.

ඉවතලන ධීවර මාළු දැල් සාගර ජීවීන්ට සහ ස්වභාවික පරිසර පද්ධතිවලට බරපතල තර්ජන එල්ල කරයි. මුහුදු ජලයට සහ පාරජම්බුල කිරණවලට දිගු කාලීනව නිරාවරණය වීම හේතුවෙන් මාළු දැල් දිරාපත් වී කැබලි ලෙස ජලයට මුසුවන අතර එය නැවත වැඩිදියුණු කිරීම අපහසු වෙයි. මෙම ගැටළුවට පිළියමක් සොයා ගැනීම සඳහා සාගර සුරකින අතරතුර සැම්සුන් සිය smartphones වල ගුණාත්මකභාවය පවත්වා ගෙන යන අමුද්‍රව්‍යයක් ද නිර්මාණය කළේය.

බාධක බිඳ දමමින් කාර්යසාධනය සහ තිරසාරත්වය පවත්වාගත හැකි නවෝත්පාදනයන් නිර්මාණය කිරීමට සියලුදෙනාගේ සහයෝගීතාව ඉතා වැදගත් බව සැම්සුන් සැමවිටම විශ්වාස කරයි. එබැවින් නව හැකියාවන් තුළින් සාගර දූෂණය යන සංකීර්ණ අභියෝගයට මුහුණ දීම වෙනුවෙන් සැම්සුන් මේ හා සමාන අදහස් දරන තවත් සංවිධාන සමඟ අත්වැල් බැඳගත්තේය.

# ජාතික ලොතරැයි මණ්ඩලයෙන් බිහිවූ සුපිරි ත්‍යාගලාභීන්ට චෙක්පත් ප්‍රදානය කරයි

ලොතරැයි ලොවේ ප්‍රමුඛයා වන ජාතික ලොතරැයි මණ්ඩලයේ ලොතරැයි පත් අතුරින් පසුගිය වකවානුවේ බිහිවූ සුපිරි ත්‍යාගලාභීන් සඳහා ජයග්‍රාහී චෙක්පත් ප්‍රදානය ජාතික ලොතරැයි මණ්ඩලයේ සභාපති නීතිඥ ලලිත් පියුම් පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් එම මූලස්ථානයේදී පසුගියදා සිදු කෙරිණි.

එහිදී සුපිරි ත්‍යාග ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් අට දෙනකු සඳහා රු. 15,25,13,340.80ක මුදලක් ත්‍යාග තලස ප්‍රදානය කරනු ලැබීය.

මෙහිදී විශාලම මුදල් ත්‍යාගය ලෙස රු. 68,452,898.40ක මුදලක් දිනාගත් වැල්ලම, එස්. එම්. පී. රත්නායක මහතාට අදාළ චෙක්පත ජාතික ලොතරැයි මණ්ඩලයේ සභාපති නීතිඥ ලලිත් පියුම් පෙරේරා මහතා අතින් ලබාගත් අවස්ථාව ඡායාරූපයෙන් දැක්වේ. එම අවස්ථාවට එක්වූ ජාතික ලොතරැයි මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරි නීතිඥ සංජීව එදිරිසිංහ, හා ප්‍රධාන මූල්‍ය නිලධාරි ආචාර්ය හර්ෂ බණ්ඩාර යන මහත්වරුද ඡායාරූපයේ වෙති.




සටහන හා ඡායාරූපය - ජූඩ් ඩෙන්සිල් පතිරාජ

# HNB FINANCE PLC අඛණ්ඩව දෙවැනි වරටත් ශ්‍රී ලංකාවේ වටිනාම සන්නාම අතරට

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම මූල්‍ය සමාගමක් වන HNB FINANCE PLC අඛණ්ඩව දෙවැනි වරටත් ශ්‍රී ලංකාවේ වටිනාම පාරිභෝගික සන්නාමයන් එළිදක්වනු ලබන Brand Finance ලැයිස්තුගත කිරීමට ඇතුළත් වීමට සමත් විය. LMD සඟරාව විසින් වාර්ෂිකව මෙරට පාරිභෝගික ප්‍රසාදය දිනූ වටිනාම සන්නාමයන් 100 නිවේදනය කරනු ලබන අතර මූල්‍ය ස්ථාවරත්වය, සේවා විශිෂ්ටත්වය සහ පාරිභෝගික විශ්වාසය ඇතුළු නිර්ණායකයන් රැසක් මේ සඳහා සලකා බලනු ලැබේ.



Brand Finance වර්ගීකරණයට අනුව HNB FINANCE PLC හි සන්නාම වටිනාකම රුපියල් මිලියන 1264 ක් වන අතර ශ්‍රී ලංකාවේ වටිනාම වෙළෙඳ නාම 100 අතරට එක් වෙමින් එහි පළමු සන්නාම 57 අතරට එක්වීමට සමත් විය. එමෙන්ම Brand Finance ශ්‍රේණිගත කරණයට අනුව HNB FINANCE සමාගම ᵓ සන්නාම ශ්‍රේණිගත කිරීම හිමිකර ගෙන ඇත.

Brand Finance වර්ගීකරණයට අනුව බැංකු නොවන මූල්‍ය සමාගම් අතර ක්ෂේත්‍රයේ සෙසු තරගකරුවන් අතුරින් HNB FINANCE ඉදිරියෙන් සිටින මූල්‍ය සමාගමක් ලෙස දශක දෙකකට අධික කාලයක් තුළ මෙරට පාරිභෝගිකයන්ගේ විශ්වාසවන්ත මූල්‍ය සහකරුවකු ලෙස සිය නාමය සමාජය තුළ තහවුරු කර ගැනීමට HNB FINANCE සමත් වී ඇත. එමෙන්ම මෙරට විශාලතම වාණිජ බැංකුවක් වන HNB හි අනුබද්ධ සමාගමක් ලෙස ශක්තිමත් පදනමක තිරසාර බව HNB FINANCE PLC වෙත නිරන්තරයෙන්ම හිමිවේ.

මෙම වර්ගීකරණය HNB FINANCE හි ස්ථාවරත්වය සහ සේවා විශිෂ්ටත්වය පෙන්නුම් කරන ස්වාධීන විවරනයක් බව මගේ අදහසයි. අඛණ්ඩව ගුණාත්මකව වර්ධනය කරන පාරිභෝගික සේවා අත්දැකීමක් ලබා දීමට HNB FINANCE දක්වන කැපවීමට ලද ගෞරවයක් ලෙස මෙම වර්ගීකරණය පෙන්වා දිය හැකියි. දශක දෙකක් තුළ මෙරට පාරිභෝගික ප්‍රසාදය දනූ සන්නාම අතර මුල්පෙළේ රැඳී සිටීමට හැකි වීම තුළ පාරිභෝගිකයින් අප වෙතින් අපේක්ෂා කළ සේවාවට වැඩි යමක් ලබා දෙන්නට අපට හැකි වූ බව මම විශ්වාස කරනවා යනුවෙන් HNB FINANCE හි කළමනාකාර අධ්‍යක්ෂ, ප්‍රධාන විධායක නිලධාරී චමින්ද ප්‍රභාත් මහතා පැවසීය.

# SLT-MOBITEL තම 5G පර්යේෂණ ජාලය දිවයින පුරා ව්‍යාප්ත කරයි

ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විසඳුම් සම්පාදක වන SLT-MOBITEL, සිය පූර්ව-වාණිජ 5G පර්යේෂණ ජාලය දිවයින පුරා ව්‍යාප්ත කිරීමට මේ වනවිට පියවර ගෙන තිබේ.

මෙය ජංගම සහ ස්ථාවර අන්තර්ජාල සම්බන්ධතා වලදී 5G තාක්ෂණයේ සුවිශේෂී බලය අත්විඳීමට පාරිභෝගිකයන්ට ලැබෙන මහඟු අවස්ථාවක් වනු ඇත.

කොළඹ, මහනුවර, අනුරාධපුර,ගාල්ල සහ යාපනය යන ප්‍රදේශ වල වෙසෙන, 5G තාක්ෂණය අන්තර්ගත සහ SLT-MOBITEL 5ධ පර්යේෂණ ජාලයට අනුකූල ජංගම දුරකථන හෝ අන්තර්ජාල උපාංග (Internet Devices) හිමි පාරිභෝගිකයන්ට මෙය අත්විඳීමට අවස්ථාව ලැබේ. මීට අමතරව මෑතකදී කොළඹ ප්‍රදේශයේ නව 5G යටිතල පහසුකම් ස්ථාපිත කිරීමටද SLT-MOBITEL කටයුතු කළේ ය.

https://5g.sltmobitel.lk වෙත පිවිසීම මගින් පාරිභෝගිකයන්ට තම උපාංග (ඇඩසජ) වල 5G තාක්ෂණ පහසුකම් තිබේද යන්න පරීක්ෂා කළ හැකි වේ. 5G තාක්ෂණය භාවිතා කළ නොහැකි උපාංග (Device) හිමි පාරිභෝගිකයන්ට, තෝරාගත් SLT-MOBITEL මධ්‍යස්ථාන වෙත පැමිණීමෙන් 5G තාක්ෂණයේ මහිමය අත්විඳීමට අවස්ථාව ලැබෙනු ඇත.

අධිවේගී දත්ත සම්ප්‍රේෂණය, Latency අවම වීම, වැඩි සම්බන්ධතා ධාරිතා හැකියාව සහ අන්තර්ජාල අත්දැකීම් ඉහළ නැංවීමේ හැකියාව යනාදී ගුණාංග සහිත 5G තාක්ෂණය, රැහැන් රහිත සන්නිවේදනයේ නවතම තාක්ෂණික පෙරලිය ලෙස සැලකේ. පාරිභෝගිකයන්ට මෙන්ම ව්‍යාපාර වලටද වැදගත් වන HD video streaming" augmented reality" virtual reality" factory automation" remote operations" mission critical communications" massive IOT වැනි තාක්ෂණයන් හා හැකියාවන් රාශියක් 5ධ මගින් බලගැන්වේ.



# යුරෝපයේ එදා මෙදාතුර ඉදිවූ විශාලතම තොරණ



යුරෝපයේ එදා මෙදාතුර ඉදිවූ විශාලතම තොරණ මෙවර ශ්‍රී සද්ධාතිස්ස ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය නොඑසේ නම් කිංස්බරි පන්සල ඉදිරිපිට ලබන 10 වැනිදා සිට ප්‍රදර්ශනය කිරීමට නියමිතය. යුරෝපයේ බුදු දහම ප්‍රචලිත කිරීම සඳහා ශ්‍රී සද්ධාතිස්ස ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයෙන් ඉටුවන්නේ සුවිශේෂී කාර්යයකි. ඒ ගලයායේ පියදස්සි නායක හිමියන්ගේ අනුශාසනාවෙන් ගලයායේ ධම්මදස්සි ස්වාමීන් වහන්සේගේ මෙහෙයවීමෙනි. මේ අනුව යුරෝපයේ ඉදිවූ දැවැන්තම තොරණ පසුගිය වසරේදී එහි නිර්මාණය විය. ඒ පඨාචාරා ජාතක කතාව ඇතුළත්ව අඩි 25 ක උසකිනි.

මෙවර එම වාර්තාව අලුත් කරමින් කිංස්බරි පන්සල ඉදිරිපිට ස්වර්ණ හංස ජාතකය ඇතුළත් පොසොන් තොරණ ඉදිකර ඇත්තේ අඩි 35 ක උසකින් යුක්තවය. විදුලි බුබුළු 25,000 කින් ආලෝකවත්ව හැඩවන එහි ආලෝකකරණ ශිල්පීය නිර්මාණ දායකත්වය ලබා දෙන්නේ දුමින්ද ලියනගමගේ ය. එලෙස මෙවරත් තොරණේ චිත්‍ර හා සියලු කටයුතු සඳහා දායකත්වය ලබා දී ඇත්තේ එංගලන්තයේ වෙසෙන කිංස්බරි පන්සලේ දායකයන් පිරිසය. තොරණ නැරඹීමට පැමිණෙන සියලු දෙනා වෙනුවෙන් සෑම දිනකම දන්සල් පැවැත්වීමටත් දායක මණ්ඩලය කටයුතු කරයි. මේ අතර තොරණ ප්‍රදර්ශනය ආරම්භ වන ලබන 10 වැනිදා දෙමාපියන් විසින් හා අවසන් දිනය වන 28 වැනිදා දරුවන් විසින් බොදු බැති ගී ප්‍රසංග යක් එම පරිශ්‍රයේ පැවැත්වීමට නියමිතව ඇත්තේ සංගීත ආචාර්ය අංජු දාබරේ මහත්මියගේ මෙහෙයවීමෙනි.

මෙම තොරණ ප්‍රදර්ශනය කිරීමෙන් එක්රැස්වන ආධාර මුදලින් ලංකාවේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පානීය ජල ව්‍යාපෘතියක් හා මහරගම අපේක්ෂා රෝහලට මූල්‍යාධාරයක් සිදු කිරීමට නියමිතය. මෙවරත් තොරණ නැරඹීමට නොහැකි සියලු දෙනා වෙනුවෙන් සමාජ මාධ්‍ය වන යූටියුබ් හා ෆේස්බුක් ඔස්සේ සජීවී විකාශයක් ගෙන ඒමට කිංස්බරි පන්සලේ නිල නාලිකා සියලු කටයුතු සූදානම් කර ඇත.

උපාලි නිව්ස්පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් 2022 ජුනි මස 12 වැනිදා ඉරිදා හෝමාගම පිහිටි උපාලි යන්ත්‍රාලයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.



- නාන්න 100යි සබන් 150යි
- අපිට හොඳට කන්න ඕන අපි කෑවොත් දරුවො බඩගින්නෙ
- හිතේ හයියෙන් කිලෝ 1500ක් වුණත් අදින්න පුළුවන්
- මහන්සියෙ තරමට දැන් 'ඉන්කම්' නෑ

## දුප්පතුන් ලෙස ඉපිද දුප්පතුන් ලෙසම මියයන

# නාට්ටාමි ජීවිතත් දැන් නට්ටං

රටට බත බුලත දෙන ගොවියන් පිළිබඳ කතාබහ කළ යුතුය. ඒ පිළිබඳ ප්‍රමාණවත් කතාබහක් කවදත් රට තුළ විය. එවැනි කතාබහ ආදිය තුළින් ඔවුන්ට යම් වටිනාකමක් ලබාදීම තුළ කිසිදු වරදක් නැත. එමෙන්ම පංච මහා බලවේගයේ අනිකුත් ප්‍රපංචයන් වන සඟ, වෙද, ගුරු, ගොවි, යන අංශ පිළිබඳව ද ප්‍රමාණවත් කතිකාවක් සමාජය තුළ කවදත් විය. මැයි පළමු වැනිදාට යෙදෙන ජාත්‍යන්තර කම්කරු දිනය යනු කම්කරුවන් වෙනුවෙන්ම වෙන් වූ දිනයක් වන බැවින් එදින කම්කරුවන් පිළිබඳව සිදුවන කතාබහ බහුලය. පුවත්පත් මුල් පිටු ආදියට පිටකොටුවේ නාට්ටාමි ප්‍රජාව නැතිව බැරි දිනය එදිනය. අල, ලූනු, කරින් ගත් මිනිසුන්, කරත්තකරුවන් කැමරා ඇසට හසුවන්නේ එදිනය.

පිටකොටුවේ කරත්තකරුවන් (නාට්ටාමි) යනු රටේ මිනිසුන්ගේ බඩ කට පිරවීම පිණිස අනවරත අරගලයක යෙදෙන මිනිසුන් සමූහයක්ය. ජීවිතයේ දුප්පත්ම අඩිය නියෝජනය කරන ඔවුන් හඳුන්වන තවත් නමක් වන්නේ 'කුලීකරුවන්'ය. ඔවුන්ගේ මතුපිට ස්වරූපය දකින කල හැඟී යන්නේ ජීවිතයේ මහන්සිය පමණටත් වඩා විඳින ලද මිනිසුන් පිරිසක් වේ නම් ඒ කරත්තකරුවන්ය යන හැඟීමක්ය. කළු කෙසඟ අතපය, බොර දුඹුරු ඇස්, රළු පරළු වදන් ඔවුන්ගේ ජීවිත සමග බද්ධ වූ අනෙකුත් දේවල්ය. ඒ අතර දහවල දහදිය මහන්සියෙන් උපයන සොච්චම් මුදලින් බල්ලන්ට කොත්තු රොටි අරන් දෙන කරත්තකරුවන් ද වෙත්. ඒ අතින් ඔවුන් ද හිතක් පපුවක් සහිත මිනිසුන්ය. පොදු මිනිස් හැඟීම්වලින් සමන්විත මේ කියන කරත්තකරුවන් ද රටේ උද්ගතව ඇති ආර්ථික අර්බුදය හමුවේ අසරණය. කිසිවකුගේ පිළිසරණක් නැති ඔවුන්ගේ කතාව අප හා පළමුව විස්තර කර සිටියේ කුලී රස්සාව පිණිස අලුයම කොළඹ පැමිණෙන කරත්තකරුවන්ගේ ගැලවුම්කාරයා වන සෙල්වම්ය. ඔහුගේ වෘත්තිය වන්නේ දෛනික කුලී පදනම මත කරත්තකරුවන්ට අත් කරත්ත සැපයීමය.


සෙල්වම්



සුරේෂ්

''මේ රස්සාව කරන පිරිස මීට අවුරුදු දෙක තුනකට පෙර තුන්දාහක් හිටියනම් අද වෙද්දි පන්දාහක් පමණ ඉන්නව. මොකද මිනිස්සුන්ට ජීවත් වෙන්න ආදායම් මාර්ග නැතිවෙනකොට ඒ අය පාරට වැටෙනව. උදේට පිටකොටුවට ඇවිත් කරත්තයක් කුලියට අරගෙන බර අදින පිරිසක් ඉන්නව. තවත් සමහරු කරපිටින් බර අදිනව. මම දැන් අවුරුදු හතළිහක් පනහක් තිස්සෙ කරන්නෙ ඒ අයට කුලියට කරත්ත දෙන එක. මේ රස්සාව මට ආවෙ මගෙ අම්මගෙන්. එයාගෙ නම රාසම්මා. නුවරඑළියෙ ඉපදිල පිටකොටුවට ඇවිත් ගැහැනියක් කරත්ත රස්සාව කළා කිව්වොත් කවුරුවත් පිළිගන්න එකක් නෑ. නමුත් මගෙ අම්මා මැරෙනකම් මේ රස්සාව කළා. ඊට පස්සෙ තමයි මම මේ රස්සාවට බැස්සෙ.''

සෙල්වම් තමන්ගේ රැකියාව පිළිබඳවත් එය ඔහු අත පත්වූ ආකාරයත් පිළිබඳ විස්තර කර සිටියේ ඒ ආකාරයෙන්ය. හිරු ගිනියම්ව වැගිරෙන ගැස්පහ හන්දියේ නිතර ඇසෙන වාහන කන්කරච්චලය නොවන්නට අපේ කතාබහ පිණිස වෙනත් බාධාවක් නොවීය. එබැවින් තවදුරටත් ඔහුට ඉඩදී මා නිහඬ විය.

''පිටකොටුවට ඇවිල්ල කරත්තයක් කුලියට අරන් පුළුවන් තරම් මහන්සිවෙලා කීයක්හරි හොයාගන්න තියෙන එකම දේ තමයි මේ කරත්ත රස්සාව. මේ රස්සාව කරන්නෙ කොළඹ ඉන්න දුප්පත්ම මිනිස්සු කියල කෙනකුට හිතෙන්න පුළුවන්. ඒක වැරදියි. ලංකාවෙ හැම තැනකින්ම වගේ මිනිස්සු මේ රස්සාව කරන්න උදේට කොළඹ එනව. දවස තිස්සෙම 'මුට්ට' කරගහල ඒ අය හවස ගෙදර යනව. තවත් පිරිසක් පිටකොටුවෙ නතරවෙලා මේ රස්සාව කරනව. එහෙම ගත්තොත් දවසගානේ නාට්ටාමිල පන්දාහකට වැඩි පිරිසක් පිටකොටුවෙ පමණක් මේ රස්සාව කරනව''.




ගනේෂ්

නාට්ටාමි පුරවරයේ ''කරත්ත රජ්ජුරුවෝ'' හෙවත් සෙල්වම් සඳහන් කරන පරිදි පන්දහසකට අධික නාට්ටාමිවරු පිරිසක් පිටකොටුව තුළ පමණක් දෛනිකව රැකියාවේ නිරත වෙති. අනුන්ගේ බර ඇදීම පිණිස ඔවුන්ට කරත්ත කුලියට ලබාදෙන ප්‍රධාන සැපයුම්කරුවා සෙල්වම්ය. ඔහු වැඩිදුරටත් සඳහන් කර සිටියේ මේ දිනවල රටේ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් කරත්තකරුවන්ගේ ආර්ථිකයට 'හතේ හත' වැදී ඇති බවත්ය. පිට පළාත්වලින් කොළඹ පැමිණෙන ලොරිරථ හිඟවීමත් දිනෙන් දින ඉහළ යන බඩු මිලත් හේතුවෙන් මේ දිනවල කරත්ත විවේක සුවයෙන් පසුවන බව ඔහුගේ කතාවේ හරය විය.


සාහීර්


එම්.ජී.ආර්.

ඉන් අනතුරුව මේ කතාවේ වැදගත්ම පාර්ශ්වය වන 'කරත්තකරුවන්' කීපදෙනෙක් සමඟ කතාබහ කිරීමේ අවස්ථාව හිමි විය. කළු කෙසඟ මිනිසුන් පිරිසක් වූ ඔවුන් හා සිදුකළ කතාබහ තුළ ගැඹුරු, නොගැඹුරු බොහෝ දේ විය. ඔවුන් ද පොදු මිනිස් අවශ්‍යතාවයන් සහිත පිරිසක්ය. වෙනසකට පවතින්නේ කරත්තකරුවන්ගේ අයිතීන් වෙනුවෙන් හඬක් නගන්නට කිසිවකුත් ඉදිරිපත් නොවීමය. වෘත්තීය අයිතීන් වෙනුවෙන් හඬ නගන්නට ඔවුන්ට වෘත්තීය සමිති ආදී කිසිවක් ද නැත. දිවිබර හැල්លු කර ගැනීම පිණිස අනුන්ගේ බර අදින කරත්තකරුවන්ගේ වත්මන් කතාව ඔවුන්ගේම වචනයෙන් පෙළගැසෙන්නේ මේ ආකාරයෙන්ය.



වසර 25ක් තිස්සේ පිටකොටුව 4 වන හරස්වීදිය කේන්ද්‍ර කර ගනිමින් කරත්ත රස්සාවේ නිරත වන සුරේෂ් තම ජීවන අන්දරය හෙළිකර සිටියේ මේ ආකාරයෙන්ය.

''පිටකොටුවට ඇවිත් තොගේට බඩු ගන්න මුදලාලි මහත්වරුන්ගේ බඩු ටික ඇදගෙන ගිහින් ලොරිවලට පටවන එක තමයි මහත්තය මගේ රස්සාව. ඒකට නාටාමි ජොබ් එක කියලත් කියනව. ලක්ෂ කෝටි ගානක බඩු දැනට මේ අත් දෙකෙන් ඇදල තියෙනව. ඒ විශ්වාසය කවදාවත් කඩල නෑ. මේ රස්සාව කරන්න ඇවිත් දැන් අවුරුදු 25ක් වෙනව. මම අදින කරත්තෙ කිලෝ 1250ක් පටවන්න පුළුවන්. ඒ කියන්නෙ කිලෝ පනහෙ මිටි විසිපහක් එකපාර ඇදගෙන යනව. කිලෝ 1250ක් එකපාර අදිනව කියන්නෙ ලේසි වැඩක් කියලද මහත්තය හිතන්නෙ. නෑ. ඒක විශාල බරක්. ඒ බර මම අදින්නෙ ඇඟේ හයියට නෙවෙයි. හිතේ හයියෙන් තමයි ඒ හපන්කම කරන්නෙ. මොකද එහෙම ලොකු බරක් අදිනකොට තමයි කීයක් හරි වැඩිපුර ගානක් ගෙදර අරන් යන්න පුළුවන් වෙන්නෙ. එහෙම බරක් ඇද්දෙ නැත්නම් පොඩි මුදලක් තමයි අපිට ලැබෙන්නෙ. දැන් එහෙම පොඩි ගාණක් අරන් ජීවත්වෙන්න බෑ. පෙට්‍රල්, ඩීසල් ඉහළ ගියා කියල එහෙම නැත්නම් පාන් කාලක් කාල ප්ලේන්ටියක් බොන්න රුපියල් සීයට වැඩිය යනව කියල කවුරුවත් අපට කුලිය වැඩි කරල දුන්නෙ නෑ. මට දරුවො ඉන්නව. ඒ අයගෙ අනාගතේ ගැන හිතන්න ඕන. කන්න බොන්න උගන්වන්න ඕන. මොකද මේ රස්සාව දරුවන්ට දෙන්න බෑ. ඒ හින්ද ඒ අයව ගොඩදාන්න තමයි අපි මහපාරට බැහැල මේ රස්සාව කරන්නෙ.''

තමන්ගේ රැකියාව පිළිබඳ විස්තර කර සිටි සුරේෂ් ඉන් අනතුරුව හෙළිදරව් කර සිටියේ රටේ බහුතරයක් දෙනා මුහුණදෙන ජීවන වියදම ඉහළ යෑම හමුවේ කරත්තකරුවා අන්ත අසරණ වෙමින් සිටින ආකාරය පිළිබඳවය. එය තරමක් රිදුම් උපදවනසුලු හෙළිදරව්වක් විය.

''අද දවස ගත්තොත් මම රුපියල් දෙදාහක් විතර හොයල තියෙනව. නමුත් වියදමත් එක්ක බලද්දි මේක සුළු මුදලක්. කෑම වේලක් කන්න පන්සීයක් දෙන්න ඕන දෙවේල කෑවොත් දාහක් ඒකට යනව.''

> පිටකොටුවේ කරත්තකරුවන් (නාට්ටාමි) යනු රටේ මිනිසුන්ගේ බඩ කට පිරවීම පිණිස අනවරත අරගලයක යෙදෙන මිනිසුන් සමූහයක්ය. ජීවිතයේ දුප්පත්ම අඩිය නියෝජනය කරන ඔවුන් හඳුන්වන තවත් නමක් වන්නේ 'කුලීකරුවන්'ය. ඔවුන්ගේ මතුපිට ස්වරූපය දකින කල හැඟී යන්නේ ජීවිතයේ මහන්සිය පමණටත් වඩා විඳින ලද මිනිසුන් පිරිසක් වේ නම් ඒ කරත්තකරුවන්ය යන හැඟීමය. කළු කෙසඟ අතපය, බොර දුඹුරු ඇස්, රළු පරළු වදන් ඔවුන්ගේ ජීවිත සමග බද්ධ වූ අනෙකුත් දේවල්ය.

''ඉතිරි මුදලින් ගෙදරට ඕන කළමනා ටික පමණක්ම ගත්තත් ගන්න පුළුවන්කමක් නෑ. කරත්ත අදින මිනිස්සුන්ට හොඳට කන්න බොන්න ඕන මහත්තය. දැන් ප්ලේන්ටියක් බොන්නත් රුපියල් හතළිහක් විතර යනව. මහත්තය විශ්වාස කරන්න. දැන් වෙලාව හවස 4.00යි. දවල්ට කෑවෙ නෑ. අපි උදේ දවල් හොඳට කෑවොත් ගෙදර දරුවො බඩගින්නෙ. උදේට කෑම සීනි බනිස් ගෙඩියෙන් තමයි තාමත් දුවන්නෙ. මම විතරක් නෙවෙයි. අලි වගේ බර අදින අපේ මිනිස්සු දහදෙනෙක් ගත්තොත් එයින් අටදෙනෙක්වත් මේ දවස්වල දවල්ට කන්නෙ නෑ. කරත්තකාරයො ගත්තොත් මේ බජාර් එකේ විතරක් හාරදහසක් පන්දහසක් විතර ඉන්නව. ඒ අයගෙන් වැඩි දෙනෙක් ඔය බර අදින්නෙ බඩගින්නෙ. දැන් අපි මේ රස්සාව කරන්නෙ ඉදිරියෙදිවත් ජනතාවට යම් සහනයක් රජයෙන් දෙයි කියන විශ්වාසෙට. එහෙම දුන්නොත් තමයි වෙළෙන්දො බඩු ගන්න කොළඹ එන්නෙ. ඒ ආවොත් තමයි අපිට වැඩ වැටෙන්නෙ.''

ඉන් අනතුරුව මුණගැසුණේ පිටකොටුව කරත්තකරුවන් අතර ඉමහත් ප්‍රසිද්ධියට පත් චරිතයක්ය. බොහෝ දෙනෙක් ඔහුව හඳුවන්නේ එම්. ජී. ආර්. යනුවෙන්ය. ටයි කෝට් හැඳ අව් කණ්ණාඩි යුගලක් පැලඳ කරත්තය අදින එම්. ජී. ආර්. එවෙලෙහිද තම සුපුරුදු වෘත්තියේ නියැලෙමින් සිටි අතර මඳකට කරත්තය නතර කළ එම්. ජී. ආර්. සුපුරුදු ආචාරශීලී බවක් ද සහිතව කතාවට එකතුවිය.

''කියන්න කිසි දෙයක් නෑ. කරත්තය දිහා බැලුවහම මහත්තයට තේරෙනව ඇතිනෙ. කරත්තෙටම තියෙන්නෙ එක බඩු කැල්ලයි. මේක ඇද්දට රුපියල් පනහක් ලැබෙනව. දැන් සති තුන හතරක ඉඳල හරිහමන් වැඩක් නෑ. වෙළෙන්දො බජාර් එකට එන්නෙ නෑ, මිනිස්සු ගාවත් සල්ලි නෑ. ඒ හින්ද පාර මැද්දෙ අපිත් නන්නත්තාරයි. ඉර පායනව ඉර බහිනව. අපිත් ඒ ඉරත් එක්ක පාරට බහිනව හවස ගෙදරට යනව. ඒ මොනව වුණත් මම මගේ පිළිවෙළ නතර කරන්නෙ නෑ, ක්ලීන් සූට්, ක්ලීන් වැඩ. එච්චරයි මහත්තය. පාර මැද්දෙ එම්. ජී. ආර්.ගෙ බෙල්ල ගියත් කඳ හරි කරත්තෙ අදිනව. ලැබීම නොලැබීම කාටත් පොදුයි. ඒක නවත්වන්න බෑ. ඒක තමයි ඇත්ත කතාව මහත්තය.

එම්. ආර්. එම්. සහීර් යනු කරත්ත රස්සාවේ මනා පළපුරුද්දක් සහිත පුද්ගලයෙක්ය.

''පාන් බාගයක් බනිස් ගෙඩියක් කාල මේ රස්සාව කරන්න බෑ. මේ රස්සාව කරන ඕන මනුස්සයෙක් හොඳට කනව. උදේට කන්න දැන් තුන්හාරසීයක් යනව. නමුත් එහෙම වුණා කියල අපිට සත පහක සහනයක් නෑ. මේ වීදි පහ ගත්තොත් හයදාහක් විතර පිරිසක් මේ රස්සාව කරනව. නමුත් දැන් වෙද්දි දරුවන්ට ගෙදරට කන්න දෙන්න නෙවෙයි අපේ වියදමත් අපිට හොයා ගන්න බැරි තත්ත්වයක් උදාවෙලා තියෙනව. මම මේ රස්සාවට ආවෙ අවුරුදු 12ක විතර කොලුගැටයෙක් වෙලා හිටිය කාලේ. එදා ඉඳන් කරන්නෙ මේක තමයි. ඒ කාලෙ බර ඇදල රුපියල් පනහක් හැටක් හොයා ගත්තනම් කාල ඇඳල පිචර් එකක් බලල සුදියෙ ඉන්න පුළුවන්. මම මේ වීධියෙ වැඩ කරන්න අරන් අවුරුදු 40ක් වෙනව. අපි ලස්සනට ජීවත් වෙච්ච කාලයක් තිබුණා. වැඩ ඉවර කරල ලස්සන සරමක් ෂර්ට් එකක් ඇඳල හිටිය. මට දරුවො 06ක් ඉන්නව. ඒ දවස්වල ගෙදරට රුපියල් දහදාහක් ඕන නම් දවස් දෙකෙන් ඒ මුදල යනව. දැන් නම් මොකුත් හිතා ගන්න බෑ. මැනිංමාර්කට් එකයි මාළු කඩෙයි කොළඹින් ගෙ නිච්චට පස්සෙ නාට්ටාමිල දාහක් විතර නන්නත්තාර වුණා. ඒ මිනිස්සු දැන් පාරේ. ඒ මිනිස්සු ගැන හොයන්න බලන්න කිසි කෙනෙක් නැති වුණා. ඒක එහෙම වුණා කියමුකෝ. දැන් රටේ තියෙන තත්ත්වෙත් එක්ක බලද්දි අපේ අත්දැකීමෙන් කියන්න පුළුවන් ඉදිරියෙදි කන්න බොන්න පවා හිඟ වෙනව කියල. දැනටමත් කරත්තවල පටවන්න තරම් බඩුමුට්ටු බජාර් එකේ නැහැ. ඉස්සරහට තවත් නරක අතට හැරේවි. මෙතන වැඩ කරන මිනිස්සු දවසකට කිලෝ හාරපන්දාහක් අදිනව. මට දැන් වයස අවුරුදු 54යි. කිලෝ 1500ක් පටවල දැනුත් මට ගේමක් නැතුව අදින්න පුළුවන්. නමුත් බර උස්සන තරමට අපිට මුදලක් ලැබෙන්නෙ නෑ. කැල්ලකට රුපියල් පහක් වගේ තමයි වැඩිපුර ගෙවන්නෙ. නමුත් හැම දේම මිලයි. හවසට නාන්න විතරක් රුපියල් සීයක් දැන් ගෙවන්න ඕන. සබන් කැල්ලක් ගන්න තව එකසිය ගානක් යනව. එහෙම වුණා කියල කරන්න දෙයක් නෑ. පුරුදු රස්සාව තමයි කරන්න වෙලා තියෙන්නෙ.''

රටම බරපතළ අර්බුදයකය. පිටකොටුවේ කරත්තකරුවන්ද එම අර්බුදයේ කරවටක් ගිලී ගොස් අවසන්ය. නැව් ගණනින් මෙරටට ආනයනය කරන අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළු බොහෝ දේ රටේ සිව්දෙසට බෙදාහැරීම පිණිස මූලික වැඩ කොටසක් ඉටුකරන ඔවුන්ගේ දුෂ්කර ව්‍යායාමය ද මේ වන විට අනතුරුක මුව විටට පැමිණ ඇත. ඔවුන් සමග කරන ලද කතාබහ තුළින් ඒ බව මනාව පැහැදිලි විය. බැල්මෙන් පවා අනිකෙකු බිය වද්දනසුලු රළු පරළු බස් තෙපලන කරත්තකරුවන් යනු 'නැව ගිලුණත් බැන් චූන්' මානසික මට්ටමක පසුවන්නන් බවට සමාජය තුළ මතයක් ඇත. එහෙත් ඔවුන් පවසන්නේ දරු පවුල් රක්ෂා කරනු වස් අනුන්ගේ බර කරමතින් අදින තමන් ද මේ මිනිස් සමූයේ කොටසක් වන බවය. ඔවුන් දැන් පත්ව සිටින්නේ අනුන්ගේ කුසගිනි නිවීම පිණිස තමන්ට කුසගින්නේ වැඩ කිරීමට සිදුවී ඇති තත්වයකය. මැයි පළමුවැනිදාට යෙදෙන කම්කරු දිනයේ 'සංකේත' ලෙස ගැනෙන ඔවුන් මෙරට ශ්‍රම හමුදාවේ පළමු බලඇණිය වන බව ඔවුන් සඳහන් කර සිටින්නේ හේතු කාරණා සහිතවය.

තම වෘත්තිය පිළිබඳව ඔවුන්ට දැනට ආඩම්බර විය හැකි එකම කරුණත් එයම පමණය.

**● රුවන් ජයවර්ධන**



# ඔබේ ලෝකයෙන් මගේ ලෝකය හිස් කිරීම

පිංවත මේ අපි හමුවුනා නොවේ. මේ අපගේ ගෞරවණීය සමුගැනීමයි. රැකවරණයක් නැති ලෝකයක කුමකට නම් යළි හමුවෙන්නද. ජරා, ව්‍යාධි, මරණයන්ටම යටත් වූ අපේ ජීවිත ගැන තවත් කුමන නම් බලාපොරොත්තුවක් තබන්නද. පිංවත ඔය දෑස් අග නලියන ගෞරවයේ උණුසුම් කඳුළු බිංදුවලට යළි පණ දෙන්න එපා. ඒ ගෞරවයේ කඳුළු බිංදු වියළිලාම යන්න ඉඩදෙන්න. ආයෙමත් දවසක ඔය දෑස් අග ගෞර්වයේ කඳුළු පුරෝගෙන, ඔබේම අතීත සංස්කාරයන් දෙස ඔය විදිහට බලන්න එපා. අවිද්‍යාවේ කඳුළු ඔබ පිසදැමිය යුත්තේ ලේන්සුවකින් නොවේ. අවිද්‍යාවේ කඳුළු ඔබ පිසදැමිය යුත්තේ විද්‍යාවෙන්. ඇස කියන්නේ ආයතනයක්. කඳුළු කියන්නේ දෙතිස්කුණුපයක්. ඵස්සය කියලා කියන්නේ බන්ධනයක්. අපගේ මේ ගෞරවණීය හමුවීම කියන්නේ සංස්කාරයක්. පිංවත බන්ධනය කියන්නේ ඔබවත්, භික්ෂුවවත් නොවේ. බන්ධනය යැයි කියන්නේ ඔබ, භික්ෂුව කෙරෙහි ඇතිකොටගත් උපාදානයමයි. පිංවත අවිද්‍යාව නිෂ්පාදනය කොටදෙන කඳුළු, ඔබ දුක පිණිස යළි ආයෝජනය කරන්න එපා. කඳුළට මුල්වූ උපාදානයෝ විනිවිද දකින්න. එවිට ඵස්සය යට සැඟවුණ තෘෂ්ණාව නිරාවරණය වේවි. පිංවත ඔබේ ලෝකයෙන් මගේ ලෝකය හිස්කරන්න.

පරිසරයට අඳුර වැටෙන්න දැන් හොඳටෝම ළඟයි. කුටියේ දොර කවුළු සියල්ලම වසා තිබුණත් ශීතල කුටියට කාන්දුවෙනවා. ශීතල වැඩිවෙනකොට ශරීරයේ සෙම කෝපවෙනවා වැඩියි. ශරීරයේ වායෝ ධාතුව, කෝපවුන සෙම, තම හිසේ තබාගෙන, සිත්සේ ශරීර අභ්‍යන්තරයේ දුවනවා. මේ දිවීමෙන් වා, පිත්, සෙම් යන තුනම කෝපවෙනවා. පිංවත ශරීරයේ සතර මහාධාතුව කෝපවුණාය කියලා, අපි කෝපවෙන්න නරකයි. අපි කෝපවුණොත් අපේ සංස්කාරයන් සියල්ලටම වඩා කෝපවේවි. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, කය ලෙඩ වුනදෙන්, සිත ලෙඩකරගන්න එපාය කියලා. භික්ෂුවගේ ජීවිතය තවමත් අතීත කුසල් සහ අකුසල් සමග සෙල්ලම් කරනවා. වරෙක දිනනවා, තවත් වරෙක පරදිනවා. මරණයක ඉඟියක්වත් අද දවසේ පෙනෙන්නට නැහැ. භික්ෂුවගේ මරණය කුසල් සංස්කාරයෝ සමග නෑගම් ගිහිල්ලා. නිවාඩු කාලය නිසා, ඔය කැමති දවසක ආපුදෙන්. පිංවත් මහත්මයෙක් ප්‍රශ්නයක් ඇසුවා, ස්වාමින් වහන්ස, අකල් මරණ කියලා දෙයක් තිබෙනවාද කියලා. පිංවත අකල් මරණ කියලා දෙයක් ධර්මයේ නැහැ.

ලොකු සහ කුඩා ඕනෑම මරණයක් සිද්ධවෙන්නේ, අවිද්‍යා පච්චයා සංඛාරා, සංස්කාර පච්චයා විඤ්ඤාණ කියන හේතුඵල ධර්මයන් තුළින්මයි. අපේම අතීත සංස්කාරයන්ට අදාළව, මැරෙන්නට තිබෙන මොහොතේ, ඊට අදාළව දැනීම් සකස්කොට දෙනවා. මරණය අයිති අපේම අතීත මරණීය සංස්කාරයන්ට මිස, අකල් මරණයන්ට නම් නොවේ, මරණයක් අකල් මරණයක් බවට පත්කරන්නේ අපේ සක්කාය දිට්ඨිය විසින්මයි. අවුරුදු හැත්තෑවක් ජීවත්වෙලා තමන්ගේ ඥාතියෙක් මැරුණාට පස්සේ, සමහර පිංවතුන්ලාට එයත් අකල් මරණයක්මයි. රාහුල මහෝත්තමයන් වහන්සේ තම ගෞරවණීය දෙමාපියන් ජීවතුන් අතර සිටියදීම, පිරිනිවන්පෑම, බුදුරජාණන් වහන්සේ අකල් මරණයක් ලෙස දැක්කේ නැහැ. මෝනෙයිය වත පිරූ නාලක මහෝත්තමයන් වහන්සේ තරුණ වයසේදීම පිරිනිවන්පෑම, බුදුරජාණන් වහන්සේ අකල් මරණයක් ලෙස දැක්කේ නැහැ. සංස්කාර පච්චයා විඤ්ඤාණං, මරණයේ, අපවත්වීමේ, පිරිනිවන්පෑමේ, සැබෑම හේතුඵල ධර්මතාවයයි.

පිංවත මේ දවස්වල ඔබ මැජික් සංදර්ශන දකිනවා වැඩියි නේද. විශේෂයෙන්ම දේශපාලන මැජික් සංදර්ශන. සමාජය තුළ මැජික් සංදර්ශන වැඩියි කියන්නේ විඤ්ඤාණය නැමති මැජික්කරුවාගේ සක්‍රීයභාවය වැඩිය කියන කාරණයයි. පිංවත අවිද්‍යාව වැඩිවෙනකොට ඵස්සය කෙරෙහි තෘෂ්ණාව වැඩිවෙනවා. අපි කැමති දෙය අයිතිකරගන්න, අපි අකමැති දෙය බැහැර කරන්න, අවිද්‍යාව දක්වන්නේ හරිම කැමැත්තක්. මෙය සටහන් තබන භික්ෂුවටත් කැමති සහ අකමැති දේවල් තිබෙනවා. භික්ෂුව තමන් කැමති සහ අකමැති දේවල් දෙස බලන්නේ, කර්මය කර්මඵල විශ්වාසයෙන්මයි. එවිට අපේ කැමැත්ත සහ අකමැත්ත ධර්මයක්ම වෙනවා.

කවදාකවත් අපේ කැමැත්ත සහ අකමැත්ත අර්බුදයක් වෙන්නේ නැහැ. යම් පිංවතෙක් භික්ෂුවට චෝදනා කළොත්, භික්ෂුව සුවපත් වේවා යැයිම සිතනවා. ප්‍රතිපදාව තුළින්ම භික්ෂුව චෝදනාව ජයගන්නවා. සම්මාදිට්ඨියේ අර්ථයන් අපේ ලෝකය අපිට නිරවුල් කොට දෙනවා. අවිද්‍යාව විසින් අවුල, විදීම් වලින් ගිනි තබනවා. ඵස්සය තුළ බැසගෙන තිබෙන පටිච්චසමුප්පන්න විඤ්ඤාණය, අපේම වදකයා යැයි, අපි නොදකින තාක්කල්, සුදු සහ කළු සංස්කාර තීන්ත වලින් විඤ්ඤාණය නැමති වදකයා අපේ අනාගත සුදු සහ කළු ඉරණම ලියනවා. පිංවත අනුන් ඔබ වෙත එල්ල කරන චෝදනා, විවේචන, ඔබට පීඩාවක් වෙන්නේ, ඔබත්, ලෝකයක් නම් පමණක්මයි. පිංවත් ඔබ ඵස්සය අසලින්, ලෝකය අක්‍රීය කරන්න. එවිට අනුනගේ චෝදනා සහ විවේචන, පෙරලා අනුන්ගේ සංස්කාර දෙසට යන පාරාවළල්ලක්ම පමණයි. පිංවත ගාම්භීර සද්ධර්මයේ සත්‍යයන් ඉදිරියේ, ඔබ සිහිනුවණින් සිටින්න.

උතුම් සද්ධර්මයේ අර්ථයන් අපරාජිතයි. අවිද්‍යාවෙන් පරාජිත ලෝකය ඉදිරියේ, ජය සහ පරාජය යන දෙකම ඒහිපස්සිකයි.

ගෞරවණීය පිංවත ඔබට දැනෙනවාද, මේ සටහන කියවන මොහොතේ ජීවමාන ශාස්තෘන්වහන්සේ ඔබ ඉදිරියේ වැඩසිටිනවා. ඒ සම්මා සම්බුද්ධ අසිරිය, ඒ සම්මා සම්බුද්ධ ඥාණයන්, ගුණයන්, ඒ මහා කරුණා ගුණයන්, ඔබ මනසින් දකිනවා. පිංවත මෙවැනි ගාම්භීර සංස්කාරයනුත් අනාගතයේ දවසක අනිත්‍යවෙලා යනවා. මෙවැනි උත්තරීතර දැක්මක් ඇති අපි, දේශපාලන මැජික්කරුවන් නිසාම, සම්මුති ලෝකය ඉදිරියේ බිංදුවට වැටී තිබෙනවා. පිංවත විඤ්ඤාණය නැමති වදකයාගේ අතොරක් නැති වදයන් ඉදිරියේ ඔබ පලායන්නෙක් වෙන්න එපා. ඔබ ඊට එරෙහිව යන්නත් එපා. ඔබ වදයට ඔරොත්තු දෙන්නෙක් වෙන්න. සද්ධර්මයේ හෙට දවස උදෙසා ඔබ අද ජීවත්වෙන්නෙක් විය යුතුයි. විඤ්ඤාණය නැමති මැජික්කරුවන්ගේ අතොරක් නැති වදයන් ඉදිරියේ, ඔබ සද්ධර්මයේ හෙට දවස උදෙසා, ඔබේ අද දවස කැපකළා කියන්නේ, අද දවස ඔබ අර්ථවත්ව ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුළ සිටියා නම් පමණක්මය. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ උතුම් සම්මා සම්බුද්ධත්වය අවබෝධකොටගත් ඒ පූජණීය මොහොතේ, වසවර්ති මාරයා, බුදුරජාණන් වහන්සේට තර්ජනය කළා, දැන් ඉතිං පිරිනිවන්පාන්නටය කියලා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මාරයා, මා උත්තරීතර සම්මා සම්බුද්ධ ඥාණය අවබෝධකළේ, පිරිනිවීයන්නට නොව, උතුම් චතුරාර්යසත්‍යය ධර්මයෝ ජීවත් කරවන්නය කියලා. පිංවත විඤ්ඤාණය නැමති මැජික්කරුවන්ගේ අභියෝගයන් ඉදිරියේ පසුබසින්න එපා. උතුම් චතුරාර්ය සත්‍යය ජීවත්කරවන්න මධ්‍යම ප්‍රතිපදාව තුළම නොසැලී පෙරට එන්න. ඔබට කවුරු නැති වුණත්, ඔබට ඔබේම කුසල් සංස්කාර, ඔබේ පූජණීය අරමුණ උදෙසා, ඔබට ආරක්ෂාව දෙනවා. පිංවත ඉක්මන් කරන්න ලෝකය අවිද්‍යාවෙන් ගිනිගන්නවා. සෑම තත්පරයක්ම කල්පයකට වඩා ඔබට වටිනවා. එක සිතුවිල්ලක් අපතේ ගියොත්, සම්මා සම්බුද්ධ ශාසනයම අපතේ ගියා වෙන්න පුළුවන්. පිංවත, පොළොව ඇද වගේ පෙනුනත්, බය නැතිව නටන්න. පිංවත් ඔබට පොළොවත්, නැටුමත් යන දෙකම නිරෝධය කිරීමේ ශක්තිය මේ නිමේෂයේදීත් තිබෙනවා. පිංවත් ඔබ තවමත් වාසනාවන්තයි. අනුවණ අනුනගේ අවාසනාවට, ඔබට පයින් ගහන්න දෙන්න එපා. පිංවත් ඔබට පොළොව ඇද වගේ පෙනෙනවා නම් ඒ දැනීම විඤ්ඤාණය නැමති වදකයා වශයෙන්ම දකිමින්, තවමත් සද්ධර්මය ජීවමාන "නොඇද'' පොළවේ, උතුම් චතුරාර්ය සත්‍යය ජීවත්කරවන්න. ජීවත් කිරීම් අතරින් උතුම්ම ජීවත්කරවීම චතුරාර්ය සත්‍යය ජීවත් කිරීමයි. චතුරාර්ය සත්‍යය ජීවත්කළොත් පමණක්මයි, ජීවත්වන අපි, ජීවත් වන මළකඳන් බවට පත්නොවන්නේ.

පිංවත සිනාවෙලා ඉන්න. අපි නිත්‍ය යැයි, සිතන ලෝකය කැඩෙනවා, බිඳෙනවා, විසිරෙනවා. අපි සද්ධර්මයේ හැසිරෙනවාය කියන්නේ, ඒ කැඩෙන, බිඳෙන, විසිරෙන ලෝකය දෙස ධර්මයේ උපේක්ෂාවෙන් බලාසිටීමයි. පිංවත් ඔබ මෙය සටහන් තබන භික්ෂුව දෙස බලන්නේ ධර්මයේ උපේක්ෂාවෙන්ද. එසේත් නැතිනම් ඇලීමකින් හෝ ගැටීමකින්ද. පිංවත අනුනගේ හොඳ හෝ නරක ඔබ ගන්න එපා. අනුනගේ හොඳ හෝ නරක, පිංවත් ඔබේ හොඳ සහ නරක යන දෙකේම නිරෝධය උදෙසා ධර්මයේ උපේක්ෂාවක් බවට පත්කොටගන්න. පිංවත ඔබ ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුළ අවංකව නම්, ඔබව කොතනින් ලිස්සුවත් වැටෙන්නේ, සද්ධර්මයේ උපේක්ෂාවටමයි.

අද උදෑසන කුඩා දරුවෙක්, පාත්‍රයට පිණ්ඩපාතය පූජාකරද්දී, අල හොදි ටිකක් භික්ෂුවගේ සිවුරට වැටුණා. තමා අතින් සිදුවූ වරද දැක්ක පුංචි දරුවා, බියෙන් වගේ භික්ෂුව දෙස බලාසිටියා. භික්ෂුව එම දරුවාට කිව්වා, පුංචි කාලේ මමත් ඔහොමයි කියලා. එවිට එම පුංචි මුවේ, පුංචි සිනහවක් මතුවුණා. තවත් කෙනකුට සිනහවක් දෙන්න අපිට පුළුවන් කම තිබියදී, අනේ කරුණාකර, ඒ සිතට කඳුළක් නම් දෙන්න එපා. හැබැයි ඉතිං ලෝකය තුළ මෙහෙම අර්ථයකුත් තිබෙනවා. භික්ෂුවගේ ගිහි ජීවිතයට, මගේම අකුසල් සංස්කාර නිසා කඳුළු නොදුන්නා නම්, ලෝකය ගැන කල නොකිරෙන්නත් ඉඩ තිබුණාද? පිංවත මේ අවුල පිටිපස්සේ, ඵස්සය තුළ බැසගත්ත පටිච්චසමුප්පන්න විඤ්ඤාණය නැමති මැජික්කරුවායි සිටින්නේ. මොහු පෝෂණය වෙන්නේ අතීත සංස්කාරයන්ගෙන්. අවිද්‍යාවේ අඩු සහ වැඩි භාවයන් මත සංස්කාරයෝ සුළඟ වගේ වෙනස් වෙනවා. ඒ නිසාම බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, කර්මය විපාකදෙන හැටි සිතන්න එපාය කියලා. පිංවත බුදුරජාණන් වහන්සේ අපිට එපා කියලා පනවපු දේවල් කරන්නට එපා.

අසත්පුරුෂ ආශ්‍රය, අසද්ධර්ම ශ්‍රවණය, අනුවණින් මෙනෙහි කිරීම බුදුරජාණන් වහන්සේ අපිට එපා කියපු දෙයක්. මිච්චා ආර්ය අෂ්ඨාංගික මාර්ගය බුදුරජාණන් වහන්සේ අපිට එපා කියපු දෙයක්. මිච්චා ප්‍රඥාව, මිච්චා ඥාණදර්ශන, මිච්චා විමුක්තිය, බුදුරජාණන් වහන්සේ අපිට එපා කියපු දෙයක්. පිංවත බුදුරජාණන් වහන්සේ එපා කියපු දේවල්, වැඩි දෙයක් අපි කරලා වර්තමානයේ අපිට අපිවත්, එපාවෙලා නේද. පිංවත කරුණාකර කර්මය විපාකදෙන හැටි සිතන්න එපා. අවිද්‍යාවේ අවුල තවත් වැඩිවේවි.

පූජ්‍ය රාජගිරියේ

**●අරියඥාන ස්වාමින්වහන්සේ**



# නවතින්න... තිස්ස

නවතින්න තිස්ස ඇයි මේ - නුදුවන් මුවාගෙ පස්සේ //
කිව් මිහිඳු රහත් සමිඳා - ඒ මිහින්තලා කන්දේ //

නවතින්න තිස්ස ......

මගෙ නාමේ කියා මෙලසේ - කවුදෝ මට අමතන්නේ //
ඒ තිස්ස නිරිඳු රොස් වී - බැලුවා මහ ගල මුදුණේ
දුටුවා මහින්ද හිමිඳා - වැන්දා දයාව පාලා
දුනු හා හී බිම දාලා - වැන්දා රජ බැති පාලා නවතින්න තිස්ස .....

දෙසුවා බුදුන්ගෙ ධර්මේ - ඇති සේ තතු පහදාලා//
තුන් සරණෙ පිහිට සෙව්වා - රජිඳා පහන්ව සීලේ

දම් සිහිලෙ සුවය එකදා - ලක් මවට තුරුලු වුවා
මෙත් අරුණ සමග සීලෙන් - සිංහලය මිහිරි වූවා

නවතින්න තිස්ස ......

**හිස පාපිස්නක් කරලා - පුදමී අනු බුදු සමිඳා**
**මේ පොසොන් පෝය දිනයේ - ඔබ ගුණ කඳ සිහි කරලා**
**කළ ගුණය අපට සැමදා - අමතකව නොයේ සමිඳේ**
**ඔබ නිසයි සමිඳ හෙළයේ - මල් පිපුණෙ පැරණි කාලේ**

**වෙසක් සඳ බැස පොසොන් සඳ නැගෙන විට අපේ හදට දනෙන සැදැහැ මුසු ජාතික හැඟීම වචනයකින් කියනවාටත් වඩා හොඳින් ගීතයකින් ඔබට කියන්නට පුළුවන්නම් එම ගීතය 'නවතින්න තිස්ස' ගීතයයි. ගීතයක මිහිරත් එහි පසුබිම් කථාව පිළිබඳවත් ඔබ වෙත ගෙන ඒමේ කුළුඳුල් උත්සාහයයි මේ.**

අදින් වසර 2324කට පෙර පොසොන් පෝය දින මිහින්තලා කන්දේ දී වූ ඒ ආශ්චර්යවත් සිද්ධිය සමග සමාජ පරිවර්තනය එක් ගී පදයකින් කියනවා නම් 'දම් සිහිලෙ සුවය එකදා - ලක් මවට තුරුලු වූවා, මෙත් අරුණ සමග සීලෙන් - සිංහලය මිහිරි වුවා' යන්නයි. මෙවන් ගීයක් පද බඳිනු ලැබුවේ සරත් විමලවීරයන් වන අතර මෙම ගීතයේ සංගීතය එම්.කේ. වින්සන්ට් මහතාගෙනි. ගීතයට ගායනයේ ජීවය දෙනු ලැබුවේ ග්‍රැමෆෝන් යුගයේ සිට බෞද්ධ ගීත සාහිත්‍යයට විශිෂ්ට දායකත්වයක් ලබා දුන්, පසුගිය අප්‍රේල් 2 වන දින අභාවප්‍රාප්ත වූ විවියන් ද සිල්වා බොරලැස්ස මහත්මියයි. ඇ බෞද්ධ ගීත විශාල සංඛ්‍යාවක් ගායනා කර ඇති අතර, අනුරාධපුරය - පොසොන් මහෝත්සවය පිළිබඳ වැඩිම ගීත සංඛ්‍යාවක් ගායනා කිරීමේ ගෞරවය ද ඇයට හිමි වෙයි.

මෙම ගීතයේ තනුව 1951 දී තිරගත වූ ඉන්දීය සිනමා කෘතියක් වූ නාසීන් නම් චිත්‍රපටයේ ලතා මංගේස්කාර් නම් සුප්‍රකට ගායිකාව විසින් ගායනා කරන ලද 'ඕ සින්දගී කේ මාලික් තෙරා හි ආස්රා හේ'' නම් ගීතයයි. 'නවතින්න තිස්ස' ගීතය එකල ලංකාවේ ගීත රසිකයන්ට වඩාත් සමීප වූයේ මෙහි සංගිතය මෙන්ම පද බැඳුමේ සරල බව මෙන්ම විවියන් බොරලැස්ස ගායිකාවගේ මියුරු හඬ ගැළපීම නිසාය.

ගීතයේ පසුබිම දිගහරින විට දිග්විජය අතහැරි චණ්ඩාශෝක අධිරාජයා බුදු දහමින් ශික්ෂිතව, ධර්මාශෝක රජු ලෙස යුද්ධයෙන් රාජ්‍ය දිනීම අතහැර ධර්මයෙන් රාජ්‍ය දිනීමේ අවිහිංසාවාදී ප්‍රතිපත්තියට පිළිපන්ව ධර්මවිජයෙන් තමන් අත්විඳි ඒ දහම් සුවය තමන් පමණක් නොව තම රාජ්‍යයේ ප්‍රත්‍යන්ත ප්‍රදේශ දහතුනකටත් විදෙස් රාජ්‍ය පහකටත් ලබාදීමට තරම් එතුමන් කාරුණික විය. ලෝකයේ මහා නරපතීන් අතර ඉදිරියෙන්ම සිටින මහා අශෝක අධිරාජයා ධර්මවිජය තුළින් තවත් රටක් යටත් කරගැනීම වෙනුවට තමන් ලබා ගත් ශාන්තිය ලෝකයේ සියලුදෙනා අතර බෙදා ගැනීමේ නිමල චේතානාවෙන්ම කටයුතු කිරීම බලලෝභී පාලකයන්ට වටහාගන්නට කදිම ආදර්ශකි. එතුමන්ගේ අවිහිංසාවාදී ප්‍රතිපත්තිය මිනිසුන්ගේ පමණක් නොව සතා සිව්පාවා පවා දක්වා පැතිර ගිය විසල් කාරුණාවක් විය. සියලු ආගම් කෙරෙහි සහනශීලී ප්‍රතිපත්තියක් දක්වීය. එහෙත් ම්ලේච්ඡයන් බෞද්ධ ධර්මදූතයන්ට හිරිහැර කරනු ලැබූ විට තම බලය පිළිබඳව සඳහන් කර තදින් අවවාද කර සිටි බව අශෝක ලිපිවල සඳහන්ව තිබීම පිළිබඳව ද සැලකිය යුතුව තිබේ. ධර්මාශෝක අධිරාජයා තම ධර්ම ප්‍රචාරක කටයුතු සැලසුම් සහගතව කළ බව පිළිබිඹු වන්නේ තම දූත සේවාවන් ආරම්භ කරන කාලයේ ශ්‍රී ලංකාවේ එවකට රජු වූ මුටසීව රජු මහලුව සිටි බැවින් තිස්ස කුමරු රාජ්‍යත්වයට පත්වන තෙක් ධර්මදූත සේවාව කල් දැමීම තුළිනි. මුටසීව රජුගේ ඇවෑමෙන් පසු රජ වූ දේවානම්පියතිස්ස රජුට මිහින්තලයේ දී මිහිඳු හිමියන් තමන් වහන්සේ ඇතුළු පිරිස හඳුන්වා දුන්නේ 'සමනා මයං මහා රාජ ....' ආදී ගාථාවෙන් තමන් රජු කෙරෙහි අනුකම්පාවෙන්ම පැමිණි බවයි. ධර්මාශෝක අධිරාජයාට තම්බපණ්ණිය හෙවත් ශ්‍රී ලංකාව විශේෂ වූ බවට ප්‍රකට කරවන කාරණාව වන්නේ තම පුත් මහා මහින්ද මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකාවේ ධර්මදූත කාර්යය සඳහා යොමු කිරීමයි. එදා ධර්මාශෝක රජු දවස ද ශ්‍රී ලංකාව කොපමණ භාරතයට (ඉන්දියාවට) වැදගත් වූ බව තවදුරටත් සහතික වන්නේ තම දියණිය වූ සංඝමිත්තාවන් ද බුදුරජාණන් වහන්සේ පිටදී වදාළ උතුම් මහා බෝධියේ දක්ෂිණ ශාඛාව සමඟ ලංකාවට වැඩම කරවීමට ඉඩ සලසා දීම තුළිනි.

මිහිඳු මහ රහත් හිමියන් අඹරුක් සහ නෑ-නොනෑයන් පිළිබඳ බුද්ධි පරීක්ෂණයක් මගින් රජුගේ දක්ෂකම හඳුනාගෙන රට තුළ සදහම් බීජය රෝපණය සඳහා ඇති අවකාශ තහවුරු කරගනු ලැබුවේ පාලකයා අදක්ෂයකු වුවහොත් තම ව්‍යායාමයේ ප්‍රතිඵල සාර්ථක නොවිය හැකි බවට වූ අවබෝධය නිසා ය. මෙසේ මිහිඳු මහ රහතන් වහන්සේගේ අනුශාසකත්වයෙන්, දේවනම්පියතිස්ස රජුගේ අනුග්‍රහයෙන් ලක්දිව බුදු සසුන ස්ථාපිත විය. බුදු දහමත් සමඟ අපට ආධ්‍යාත්මක වශයෙන් නොව විවිධ කර්මාන්ත, කලා ශිල්ප ආදිය අපේ සංස්කෘතිය තවත් ඔප්නංවන්නට දායක වීම අපට අමතක කළ නොහැක. ගීතයේ 'මෙත් අරුණ සමග සීලෙන් - සිංහලය මිහිරි වුවා' යැයි සියල්ල කැටි කර දක්වයි.

දේවානම්පියතිස්ස රජු දවස සිට අපේ නරපතියන්ගේ වගකීම වූයේ රාජ්‍යය දැහැමෙන් සෙමෙන් බෞද්ධ ප්‍රතිපත්ති අනුව රජ කරවීමයි. එසේ නොවුණ අවස්ථා මෙන්ම ආක්‍රමණිකයන්ගේ බලපෑමෙන් රාජ්‍ය පාලනයේ අවුල් වියවුල් ඇති වූ බව ඉතිහාසයේ සඳහන් වුවද ඒ සෑම අවස්ථාවකදීම අධර්මයට අයුක්තියට එරෙහිව රට ඉදිරියටම ගෙන යෑමට යුගපුරුෂයන් පහළවීම රටේ වාසනාවකි. ඒ පිළිබඳ අපේ විශිෂ්ටම සලකුණ වනුයේ ගැමුණු කුමරුන් පැවසූ ''මේ මාගේ ව්‍යායාමය හුදෙක් රජ සැප පිණිස නොව සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහායි'' යන්නයි. සෑම රජකුම බෝධිසත්ත්වයකු බව ජනතාවගේ මතයක් විය.

බුදුරජාණන් වහන්සේගේ නිර්මල ධර්මය වන ථෙරවාද සම්ප්‍රදායේ මූලස්ථානය වන ශ්‍රී ලංකාව එදා අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේගෙන් අපට ලැබුණ දායාදය රැක ගනිමින් එය එදා ධර්මාශෝක අධිරාජයා මෙන් ලෝකයේ යහපත පිණිස ව්‍යාප්ත කිරීමේ වගකීම පැවරී ඇත්තේ අප රටටය.

එය අප අනුබුදු මිහිඳු හිමියන්ට කෘතවේදීත්වය දැක්වීමට මගක් වනවා නොඅනුමානය. එයටත් පෙර අපේ රට තුළ සම්බුද්ධ ශාසනය පෝෂණය කර සුරක්ෂිත කිරීම තහවුරු කිරීමට අදිටන් කළ යුතුව ඇත්තේ දැනට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හිමි බුද්ධාගමට ඇති ප්‍රමුඛස්ථානය, එම තත්ත්වයෙන් වෙනස් කිරීමට විවිධ යෝජනා ද විකල්ප ද මේ වනවිට ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවලට ඉදිරිපත්ව ඇති බැවිනි.

**●පානි වෑවල**

# බම්බලපිටිය සිරි වජිරාරාමයේ පොසොන් පුන් පෝදා ශීල සමාදානය 14දා

පෙ.ව. 06.00 - 07.15 : සිල් සමාදන් කරවීම අනුශාසනාව සහ බුද්ධ පූජාව රාජකීය අග්ග්‍රමහ පණ්ඩිත ශාස්ත්‍රපති පූජ්‍යපාද තිරිකුණාමලේ ආනන්ද මහානායක හිමිපාණෝ, පෙ.ව. 08.00 - 09.00 : ධර්මානුශාසනාව - කොළඹ කඩවත් සතර ප්‍රධාන සංඝනායක රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති පූජ්‍යපාද කරපුටුගල රේවත හිමිපාණෝ, පෙ.ව. 09.00 - 10.00 : ධර්මානුශාසනාව - ආචාර්ය රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති පූජ්‍යපාද මඩිහේ සුගතසිරි හිමිපාණෝ, පෙ.ව. 10.00 - 11.15 : භාවනාව, අනුශාසනාව හා බුද්ධ පූජාව ජර්මනියේ හැම්බර්ග් සිරි වජිරඤාණ විහාරාධිපති රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති පූජ්‍යපාද තල්පාවිල කුසලඤාණ හිමිපාණෝ, ප.ව. 12.30 - 01.15 : සතිපට්ඨාන සූත්‍ර දේශනාව - සිරි වජිරාරාමාධිකාරි සිරි වජිරාරාම දහම්පාසල් අධ්‍යක්ෂක පූජ්‍යපාද කඹුරුගමුවේ මහානාග හිමිපාණෝ, ප.ව. 01.15 - 02.30 : ධර්ම සාකච්ඡාව - සිරි වජිරාරාම දහම් පාසල් ප්‍රධානාචාර්ය ගෞරව ශාස්ත්‍රවේදී පූජ්‍යපාද මීගොඩ සුඛිත හිමිපාණෝ, ප.ව. 03.00 - 04.00 : භාවනාව සහ අනුශාසනාව - සිරි වජිරාරාමවාසී විනයාචාර්ය පූජ්‍යපාද පිටිපන සාසනරතන හිමිපාණෝ, ප.ව. 04.00 - 5.00 : ධර්මානුශාසනාව - රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති පූජ්‍යපාද කිරම රාහුල හිමිපාණෝ, ප.ව. 05.00 - 06.00 : ධර්මානුශාසනාව - ත්‍රිපිටකාචාර්ය රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති පූජ්‍යපාද කිරම අරියදේව හිමිපාණෝ, ප.ව. 06.00 - 06.30 : අටවිසි බුද්ධ වන්දනාව හා සිල් අලුත් කිරීම සිරි වජිරාරාමවාසී ස්වාමීන්වහන්සේ.

### 2022 පොසොන් පුර පසළොස්වක පොහෝ දින ළමා සීල සමාදානය

සිරි වජිරාරාමය - බම්බලපිටිය පෙ.ව. 8.00 - 8.30 සීල සමාදානය සහ අනුශාසනාව පූජ්‍ය නාවල ඤාණරතන හිමිපාණෝ, පෙ.ව. 8.30 - 9.15 භාවනාව සහ අනුශාසනාව පූජ්‍ය රාජාංගණයේ සීලවිමල හිමිපාණෝ, පෙ.ව. 9.15 - 10.00 ධර්මානුශාසනාව පූජ්‍ය සිරි වජිරාරාමාධිකාරී කඹුරුගමුවේ මහානාග හිමිපාණෝ, පෙ.ව. 10.00 - 10.15 ගිලන්පස විවේකය, පෙ.ව. 10.15 - 11.00 ගිහි දේශනය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉතිහාසය සහ පුරාවිද්‍යා අධ්‍යයන අංශයේ කථිකාචාර්ය ආචාර්ය දමිත් රණගල මහත්මා, පෙ.ව. 11.00 - 11.15 සම්බුද්ධ පූජාව සිරි වජිරාරාම දහම් පාසලේ ප්‍රධානාචාර්ය පූජ්‍ය මීගොඩ සුඛිත හිමිපාණෝ, ප.ව. 11.15 - 12.30 දහවල දානය සහ විවේකය, ප.ව. 12.30 - 1.00 සෙත් පිරිත් සජ්ඣායනාව සිරි වජිරාරාමවාසී පූජ්‍ය පැනසිහගම ඛේම හිමිපාණෝ, ප.ව. 1.00 - 2.00 ධර්මානුශාසනාව මහරගම සිරි වජිරඤාණ ධර්මායතනවාසී පූජ්‍ය ගබ්බෙල වජිර හිමිපාණෝ, ප.ව. 2.00 - 2.30 ගිලන් පස විවේකය, ප.ව. 2.30 - 4.00 දහම් පිළිසඳර සිරි වජිරාරාම දහම් පාසලේ ප්‍රධානාචාර්ය පූජ්‍ය මීගොඩ සුඛිත හිමිපාණෝ, සිරි වජිරාරාම දහම් පාසලේ නියෝජ්‍ය ප්‍රධානාචාර්ය ප්‍රියන්ත මායාදුන්නෙ මහත්මා.

**සෞඛ්‍ය පිළිවෙත් අනුගමනය කරමින් සහභාගි වන ලෙස සියලු සැදැහැවතුන්ට ශාසනාලයෙන් ආරාධනය කරමු.**

## පස්යොදුන්රට මිහිඳු මහා බත් දන්සල

පොසොන් පොහොය නිමිත්තෙන් මීගහතැන්න මද්දෙගම පස්යොදුන්රට මිහිඳු දාන සමිතිය විසින් වාර්ෂිකව සංවිධානය කරන දිවා රාත්‍රි බත් දන්සල මෙවරත් 14 දා ඓතිහාසික මිහින්තලා පුදබිමේදී පැවැත්වීමට නියමිතය.

කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් ඉකුත් වසර දෙක තුළ එම දන්සල නොපැවැත්වීමට සංවිධායකවරුන් තීරණය කර තිබූ අතර මෙවර රට තුළ පවතින දැඩි ආර්ථික අර්බුදය හමුවේ වුවද පස්යොදුන්රට මිහිඳු මහ බත් දන්සල පැවැත්වීමට තම සාමාජිකයන් තීරණය කළ බව එහි වත්මන් සභාපති පියල් කුලරත්න මහතා සඳහන් කර සිටී.

සාහිත බිමේ ඇවිද යන්න එන්න

# අකුරැදිගේ



**ප්‍රේමකීර්ති ද අල්විස් සුලවතානන් පිළිබඳ ලියැවුණු අගනාම ලිපි දෙකක් මෙවර 'අකුරු දිගේ' තීරයට අපි තෝරා ගත්තෙමු. මෙයින් ජැක්සන් ඇන්තනී විසින් ලියන ලද ලිපියෙහි ප්‍රේමකීර්ති පිළිබඳව ලියැවුණු දේ හැරුණු විට, සමහර කොටස් සංස්කරණය කර එම ලිපිය සකස් කර ඇත. එහෙත් එම සටහනෙහි රසවත් බවට කිසිදු හානියක් සිදුව නැති බව සහතික වෙමු. 1947 ජුනි 03 වැනිදාවක උපත ලද ප්‍රේමකීර්ති ද අල්විස් 1989 ජුලි 31 අවාසනාවන්ත ලෙස දිවියෙන් සමුගත්තේය. මේ අතර මැදි කාලයක මෙම සටහන් අප පළ කරන්නේ එකී ගුණානුස්මරණ සහ ජන්මෝත්සවය වෙනුවෙනි.**

# මාධ්‍ය ඉස්කෝලේ ගෝලයින් නැති ගුරුතුමා

ප්‍රේමකීර්ති ද අල්විස් පිළිබඳව කෙසේ ලිවිය යුතුද? මා මේ ලිපියේ සිරස්තලය යොදන්නට සිටියේ වෙනත් අග්‍රයකිනි.

''ප්‍රේමකීර්ති ද අල්විස්ගේ මාධ්‍ය භාවිතාව පිළිබඳ ශාස්ත්‍රීය විමර්ශනයක්''

තවමත් කිසිවකුත් මේ ශාස්ත්‍රීය විමර්ශනය සිදුකොට නැත. මේ සමීක්ෂණය සඳහා යොදාගත යුතු නියැදි පරිශ්‍රය කෙමෙන් වෙනස් වෙමින් පවතියි. වර්තමානිකයන්ගේ මාධ්‍ය භාවිතය තුළ ප්‍රේමකීර්ති ලකුණ දිය වී වාෂ්පවී පවතියි. ඒ වාෂ්පයෙන් හුස්ම ගන්නා බොහෝ නිවේදකයෝ නැහැපුඩුව ගැන උදම් අනමින් පෙණහලු අමතක කර දමති.

මෙරට මාධ්‍ය ප්‍රජාව බිහි වුණේ එක්කෝ අහම්බයකිනි. නැත්නම් වැරැද්දකිනි. නිවැරදි විද්‍යාත්මක පරිවාසයකින් පුහුණුව ලබා වෘත්තීයතාවක් ගොඩනගා ගන්නට අධ්‍යයන පහසුකමක් ලබාගත්තවුන් අතරින් මාධ්‍ය භාවිතයට ඉතිරි වුණේ කොළඹගේ, තේවිස් ගුරුගේ, එච්. එම්. ගුණසේකර, කරුණාරත්න අබේසේකර වැනි පුරෝගාමීන් සුළුතරයක් පමණි. තවත් පිරිසක් ප්‍රායෝගික මාධ්‍ය භාවිතාවක මාධ්‍යකරුවන් නොවී අධ්‍යාපන වපසරියක මාධ්‍යවේදීන් වූහ. මේ වචන දෙක ද අද අපි පටලවාගෙන සිටිමු. නඩුකාරයාට කාරයා කෑල්ල අගෞරවයක් නොවුණාට කලාකාරයාට එය ගෞරවයක් වුණාට පොලිස්කාරයාට මාළුකාරයට සහ රස්තියාදුකාරයාට එය මදිකමක් සේ දැනෙන්නේ ලු. එසේ හෙයින් මාධ්‍යකාරයාට කාරයා යැයි කීම අගෞරවයක් සේ සිතූ වර්තමානය ඔහුට අලුත් කෑල්ලක් බවුතීස්ම කළේය. ඒ මාධ්‍යවේදියා යන ගෞරව ආරූඪයයි. වේදියා යනු වේදය හෙවත් විද්‍යාව දරන්නෙකි. මාධ්‍ය ලෝකයේ ද මාධ්‍ය නමැති විද්‍යාව දරන, එය අධ්‍යාපනය කරවන වියත් මඬුල්ලක් වෙසෙත්, ඔවුහු විශ්වවිද්‍යාලවල සහ වෙනත් අධ්‍යාපන ආයතනවල මාධ්‍ය නමැති විද්‍යාව උගන්වමින් එය පර්යේෂණය කරමින්, මාධ්‍ය විච්ඡේදනය කරමින් පසුවෙති. එහෙත් අද මාධ්‍ය වේදය පිළිබඳ අබ ඇටයක දැනුමක් නැති පත්තරයක කුඩා තීරුවකට ප්‍රාදේශීය වාර්තාවක් ලියන මාධ්‍යකාරයා ද මාධ්‍යවේදියකු ලෙස හැඳින්වේ. එහි ගෞරවයක් තිබිය හැකිය. එහෙත් වචනය වැරදිය වෛද්‍යවරයා සහ වෛද්‍යවේදියා යනු දෙදෙනෙකි. සමහරවිට මේ දෙදෙනා ම එක් අයෙකු ද විය හැක. මහාචාර්ය කාලෝ ෆොන්සේකා වෛද්‍යවේදියෙකි. ඔහුට අවශ්‍ය හැම විටකම වෛද්‍යවරයකු ද විය හැක. එහෙත් හැම වෛද්‍යවරයකුම වෛද්‍යවේදියෙක් විය නොහැක. මාධ්‍යකරුවන් ද එලෙසම ය. ඔවුන් අතර මාධ්‍යවේදීන් සිටියි. එහෙත් අද අප භාවිත කරන පරිදි හැම මාධ්‍යකාරයෙක්ම මාධ්‍යවේදියෙක් නොවන්නේය. මේ රටේ අනාගතයේදී වත් නිවැරදි මාධ්‍යවේදයක් සකස් වී සියලු මාධ්‍යකරුවන් එකී මාධ්‍යවේදය හදාළා අයවලුන් වූ දවසක මාධ්‍යකාරයාට තම කාරයා කෑල්ල ද අගෞරවයක් නොවනු ඇත. එවිට මාධ්‍යකරුවන් මාධ්‍යවේදීන්ට ගෞරව කරමින් තමන් ද ගෞරවනීය වන්නේය.

අධිරාජ්‍යවාදීන්ගේ පුද්ගලික විනෝදය සඳහා අටවාගත් රේඩියෝ සිලෝන් එක ජාතික අවශ්‍යතාවක් වෙත කර තබා යන්නට ලංකාවේ පුරෝගාමී සුළුතරය දැඩි වෙහෙසක් අත් වින්දහ. ඔවුහු ජාත්‍යන්තර මාධ්‍ය වියරණය සිය බී බී සී අධ්‍යයනයන්ගෙන් ලබාගෙන තිබූ අතර මෙරටේ ජාතික සිතුවිල්ල තම උපන් ගමෙන් රැගෙන අවුත් සිටියහ.

හැත්තෑව දශකයේ දී ප්‍රේමකීර්තිලා විවරණ ලබන්නේ මේ දේශීය බුද්ධිමතුන්ගේ සෙවණ ලබමිනි. අමරබන්ධු රූපසිංහ, බණ්ඩාර කේ විජේතුංග, ලූෂන් බුලත්සිංහල, කේ. ඩී. කේ. ධර්මවර්ධන, ධර්ම ශ්‍රී වික්‍රමසිංහ සහ ප්‍රේමකීර්ති ද අල්විස් බඳු ගුවන් විදුලි තරුණයන් ශ්‍රී ලංකා ගුවන් විදුලියේ කුළු ගැන්වීම සටහන් කළ තාරකා නිවේදකයන් බවට පත් වූහ. ඔවුන් සතුව තිබූ මහා පරිමාණ සංස්කෘතික සහ ජාතික කුශලතාවන් හේතුවත් පෙර පරම්පරාවේ නිවැරදි මඟ පෙන්වීමත් මේ ජාතික පෞරුෂ ගොඩනැංවීමට හේතු විය.

ප්‍රේමකීර්ති රූපවාහිනී සජීවී පූරකවරයට බසින්නේ 80 දශකයේ මුල් කාර්තුවේදීය. නැත්නම් ලාංකීය රූපවාහිනී නිවේදන ඉතිහාසයේ මුල් අවස්ථාවේම ය.

Announcer and presenter කියා පැහැදිලි දෙදෙනෙක් ඉංග්‍රීසි භාෂාවේ සිටිය ද සිංහලයේ ඉන්නේ 'නිවේදක' කියා එක් කෙනෙකි. Announcer ගේ සහ presenter ගේ භූමිකාව පැහැදිලිව ම දෙ ආකාරයි. Announcer යනු කෙළින්ම නිවේදකයායි. ඔහු ඉතාම වගකීමකින් යුතුව යමක් නිවේදනය කරයි. මේ නිවේදනය ඔහුගේ හෝ වෙනත් අයකුගේ හෝ විය හැකියි. මේ නිවේදනය නැත්නම් සංදේශය (පණිවිඩය) ග්‍රාහකයන් වෙත බාධාවකින් තොරව ගෙන යෑම සඳහා නාලිකා භාවිත කිරීම ඔහුගේ වගකීමයි. මේ ක්‍රමවේදය බොහෝදුරට ව්‍යාකරණානුකූල වේ. (මේ ව්‍යාකරණය යනු භාෂාත්මක ව්‍යාකරණය පමණක් නොවේ.) එහෙත් presenter ඊට වඩා වෙනස් මාධ්‍යකරුවෙකි. ඔහු ගේ සංදේශය ඔහු සතු වෙයි. **'අප වැඩසටහන් ඉදිරිපත් කරන්නා'** යන වාක්‍යයෙන් හඳුනාගන්නේ මේ presenter යන තනි වචනයයි. ඔහු මේ විස්තරයේ නැත්නම් වැඩසටහනේ අයිතිකාරයා බඳුය. අනුන්ගේ නිවේදනයක් කියවන්නාට නැති වගකීමක් මේ ඉදිරිපත් කරන්නා සතුවේ. නාට්‍යයක පොතේ ගුරා නැත්නම් පූරක සතු වන්නේත් මේ වගකීම ම යි. නාට්‍යයකට කතුවරයෙක් නිෂ්පාදකවරයෙක් සිටිය ද ප්‍රේක්ෂකයන් ඉදිරිපිට මේ කථා පුවතේ අධිකාරීත්වය දරන්නේ පූරකවරයා ය. ඔහු මුළු කථාව ම හොඳින් දනී. කථාවේ ඒ ඒ අවස්ථාවන් නූලකින් මෙන් අමුණමින් (සූත්‍රධාරී) හැකිතාක් පැහැදිලිව මේ පුවත ප්‍රේක්ෂකයන්ට සන්නිවේදනය කිරීමේ වගකීම දරන්නේ ඔහුයි. එහෙයින් සන්නිවේදනයේ හමුවන presenter යන වචනයට ගැළපෙන සිංහල වචනය පූරකවරයා යැයි මීට ඉහතදී අප විසින් යෝජනා කෙරුණි.

ප්‍රේමකීර්ති හොඳ පූරකවරයෙකි. මෙරට රූපවාහිනී පූරකවරයෙක් ආදීකර්තෘ ඔහු යැයි රූපවාහිනී ඉතිහාසයේ ලියැවී තිබිය යුතු ය. පූරකවරයකුට අවශ්‍ය බොහෝ හුරුබුහුටිකම් ඔහු සතුව පැවතුණි. පූරකරවරයා නිවේදකවරයා තරම් සිද්ධාන්තගත නොවූ නිදහස් ආරක් නිසාය. එය නිර්මාණශීලී භාවිතාවකි. ප්‍රේමකීර්ති ගේ නිර්මාණශීලීත්වය එයට පොහොර සැපයීය. පූරකවරයා භාෂා වාදකයකු විය යුතුය. ඔහු සතුව මනා වාග් කෝෂයක් තිබිය යුතුවා මෙන්ම එය වාදනය කිරීමේ ශිල්පය ද ඔහු ප්‍රගුණ කරගෙන සිටිය යුතුයි. පූරකවරයකුට අවශ්‍ය ජනශ්‍රැතික සාධක බොහෝමයක් අපේ සංස්කෘතිය විසින් අපට දිනා දී තිබුණේය. වාචාලයා සහ මුබරීයා අතර වෙනස අපට අපේ ජනශ්‍රැතියෙන් ම තෝරා වෙන් කොට දී තිබිණි. වාචාලයා යනු කටකමසරියාවක් නැතිව දොඩවන අප්‍රබුද්ධ සන්නිවේදකයෙකි. මුබරීයාගේ කථා විලාසය ගඟ ගලනවා වගේය. වාචාලයා දොඩවන්නේ තල් අත්තට බොරලු ගහනවා වගේය. මුබරියා ප්‍රබුද්ධයෙකි. ඔහුට බොහෝ ඇසූ පිරූ තැන් ඇත. ඔහු සිය ජීවිතය විශ්වවිද්‍යාලයක් කරගත් ප්‍රායෝගික උගතෙකි. පූරකවරයාට අත්‍යවශ්‍ය වූ මේ මුබරිකම ප්‍රේමකීර්තිට තරම් පිහිටි තවත් මාධ්‍යකරුවෙක් මේ කෙටි මාධ්‍ය ඉතිහාසය තුළ අපට හමු වී නැත. අද තරුණ පූරකවරුන්ට වාචාලාය සහ මුබරියා වෙන්කොට ගත නොහැකි වී ඇත.

ප්‍රේමකීර්තිගේ මුබරිකම භාෂා වාදකයකු ලෙසින් ප්‍රේක්ෂකයන් වෙත ගලා ආ නිසා ඔහු ප්‍රසන්න මිනිසෙක් වී සිටී. ඔහුගේ දැනුම් පථය තම වාග් කෝෂය හරහා වාදනය වන්නේ අතිශය ළෙන්ගතු හඬකිනි.

පූරකවරයකුගේ දැනුමේ ගවේෂණ ක්‍රමවේදය පිළිබඳ අගනා පාඩමක් වරක් මම ප්‍රේමකීර්ති නම් මාධ්‍ය ගුරුවරයාගෙන් ලබා තිබුණෙමි. එය වනාහී ජාත්‍යන්තර පූරක න්‍යාය සිද්ධාන්තයක ඇතුළු කළ යුතු විෂය කාරණාවකි. ප්‍රේමකීර්ති ද අල්විස් නම් ලාංකීය රූපවාහිනී පූරකවරයේ ආදීකර්තෘ සමග හරි හරියට හිඳ ජාතික රූපවාහිනියේ ආයුබෝවන් වැඩසටහන මෙහෙයවන්නට මට මගේ ආරම්භක කාලයේදී වාසනාව පෑදුනි. එවකට මම කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශයේ ගෞරව උපාධියක් හදාරණ තරුණ ශිෂ්‍යයෙක්මි. කියවීම අධ්‍යයන කාර්යකට වඩා විනෝදාංශයක් කරගෙන සිටි මම පුස්තකාල භාවිතාවට හුරු වී සිටියෙමි. එහෙයින් ආයුබෝවන් පීඨිකාවේ කථා කිරීමට අවශ්‍ය තොරතුරු සොයා මම පුස්තකාලය පීරුවෙමි. මට බොහෝ තොරතුරු ලැබෙයි. එහෙත් කථා කිරීමට දිගු කාලයක් නොලැබෙයි. වැඩසටහන වෙනුවෙන් ම බොහෝ අමාරුවෙන් සොයා ගත් තොරතුරු කෙසේ හෝ මේ කෙටි කාලය තුළ කියා ගැන්මට ගොස් මට වේගයෙන් කියවා යෑමට සිදුවිය. අස්වැසිල්ලක් නැත. සොයා ගෙන ආ කරුණු ද පැටෙලයි. ප්‍රේක්ෂකයන්ට මා කියන දෑ නො පැහැදිලි වෙයි. මම පූරක අර්බුදයක පැටලී සිටියෙමි. මා වැටී ඇති අමාරුව වටහාගත් ප්‍රේම් අයියා වරක් මා පසෙකට කැඳවා අපූරු උපදේශයක් දුන්නේය.

**මල්ලි මෙහෙ වරෙන්**
**අද පටලවාගත්තා නේද**
**එක නේන්නම්. කියන්න හිතං හිටපු දේ කියැවුණේ නෑ යි මම කීවෙමි.**
**උඹ ඊයේ ලයිබ්‍රරියේ ද හිටියේ**
**ඔව් සෑහෙණ්ඩ කරුණු හොයා ගත්තා**

මෙකයි.,ප්‍රෝගෑම් එකක් වෙනුවෙන් කියලා පොත් කියවන්න එපා. ජීවිතය වෙනුවෙන් කියවපං. අපි දැනුම රැස් කරන්න ඕනේ ජීවිතයටයි. ඒ දැනුම කවදාහරි ප්‍රෝගෑම් එකකට ගන්න පුළුවන් වෙයි.

මේ ළෙන්ගතු උපදේශයේ තිබූ ශාස්ත්‍රීය වටිනාකම මට එකෙනෙහිම වැටුහුණි. ප්‍රේමකීර්තිගේ ගීතවල කවිවල ඇත්තේ ද ජීවිතය පිළිබඳ එබඳු ලෙංගතු එහෙත් ශාස්ත්‍රීය උපදේශයන්ය.

ඒ ළෙන්ගතු භාෂා වාදනය සඳහා ඔහු පුහුණුව ලැබුවේ ගුවන් විදුලියෙන්ය. නිවැරදි උච්චාරණය පිළිබඳ සියලු ශිල්ප ප්‍රාගුණ්‍යය ප්‍රේමකීර්ති දරා තිබිණි.

ප්‍රේමකීර්තිගේ කවි සිත මෙන්ම ක්ෂණිකකම ද මේ පූරකවරයට තවත් ශබ්‍යතාවක් ගෙන ආවේය. ප්‍රේමකීර්ති බස්ටෑන්ඩ් එකකදී සිගරට් කොළයක් අහුලා ඒ මත ප්‍රබුද්ධ ගීත ලියූ ගීත රචකයෙකි. මහ මැඳුරුගත සම්භාව්‍ය ජීවිත පැවැත්මක් නොවූ නිසාදෝ අප රටේ සමහර විචාරකයන් ප්‍රේමකීර්තිගේ කවිකම අගය කරන්නේ ඔහු ජන කවියෙකි. කියන ආදර නාමයෙනි. ඒ ආදරයත් එක්කම ජන කවියාට විශ්වවිද්‍යාලයක් නැත. යන හීන්සැරයක් ඇති යැයි අපට සිතේ. ප්‍රේමකීර්තිගේ ශාස්ත්‍රීය දැනුම් සම්භාරය විභාගයක පෙනේරයකින් හැලිය නොහැක. ප්‍රේමකීර්ති මේ රටේ පළමුවැනි ආදරණීය රූපවාහිනී පූරකවරයා යන තානාන්තරය දැරුවේ මේ බුද්ධියේ බලමහිමයෙනි. ප්‍රේමකීර්ති තම හාත්පස ලෝකය අල්ලා ගත්තේ අතැඹුලක් සේ ය. ජීවිතය සැහැල්ලුවෙන් සහ සංක්ෂිප්තයෙන් දකින්නට ඔහුට හැකි වූයේ ඔහු සතු වූ මේ 'හයිකු' කම නිසාවෙනි. සෙන් බුද්ධාගමේ හයිකු කවියක ඇති ගැඹුරු දාර්ශනික අර්ථයෙන් නම් ප්‍රේමකීර්ති ජන කවියෙකි. අලියාගේ නැට්ටේ එල්ලී දිවිය ලෝකේ ගිය ගමරාලව ප්‍රංශ චිත්‍රපටකාරයකුට නම් ෆැන්ටසි මූලාශ්‍රයකි. අපේ හාංසි පුටු විචාරකයකුට නම් මෝඩ ගැමිකමකි.

ප්‍රේමකීර්තිගේ පූරක ප්‍රවීණත්වයේ හේතුවෙන් ඔහු අප රටේ පුරවැසියන් තුළ තානාන්තර දෙකක් භජනය කළේය. මේ තත්ත්වද්වය වනාහී පූරකවරයකු තුළ නිධිගතව තිබිය යුතු අනිවාර්ය කොන්දේසි දෙක වන්නේය.

1. ඔහු දන උගත් මිතුරෙකි.
2. ඔහු නැතිවම බැරි මිනිසෙකි.

පූරකවරයා යනු දන උගත් මිතුරෙකි. දන උගත් ගුරුවරයා යනු පූරකවරයෙක් නොවෙයි. ගුරුවරයාට වඩා මිතුරා අපට ළෙන්ගතු ය. මිතුරා යනු අපේ පිළේ මිනිසෙකි. මේ පිල යනු හැමටම පොදු පිලකි. මේ රටේ බාල මහලු හැම කෙනකුට ම ප්‍රේමකීර්ති තම තමන්ගේ පිළේ, තමන්ගේ වයසේ, තමන්ගේ තරාතිරමේ මිතුරෙකි. එහෙත් මේ මිතුරා සෙසු මිතුරන්ට වඩා වෙනස් වන්නේ ඔහු 'දන උගත්' මිතුරෙක් වන නිසා ය. දන උගත් විද්‍යාර්ථියකු හෝ දන උගත් ප්‍රබුද්ධයකු වෙත අපට මිතුරුකමක් ඇති නොවෙයි.

දන උගත් 'මිතුරා' ජීවිතයට උපදෙස් දෙන්නේ ආගමික නායකයකු උපදෙස් දෙන විදිහට නොවෙයි. පූරකවරයාගේ ඊළඟ ලක්ෂණය එයයි. එහෙයින් ඔහු 'නැතිවම බැරි මිනිසෙක් බවට පත් වෙයි. මේ නැතිවම බැරි මිනිසා' හමු වනතුරු සතියක් කල් ගෙවන්නටත් ග්‍රාහකයන්ට බැරිය. හැම උදයකම ඔහු දකින්නට ඇත්නම් යෙහෙකැයි ග්‍රාහකයෝ සිතති. ප්‍රේමකීර්ති මිය ගියදා කිසි දවසකවත් ඔහුව හැබැහින් නොදැක සිටි මේ රටේ කුඩා දරුවන් පවා හඬා වැටුණේ ඔහු නැතිවම බැරි මිනිසෙක් බවට පත්ව තිබූ නිසාවෙනි.

මේ නැතිවම බැරි මිනිසා 'ඇතිවම බැරි මිනිසෙක්' ලෙස තෝරා ගත් අධම හෙළයන් සොච්චමක් අපේ පුරෝග ාමී පූරකවරයා අපට අහිමි කළේය. ඔවුන් කරගත් මහා පාපකර්මයේ කාලකන්නි ශාපය ඔවුන් මත පරාජය ම වපුරන බව මෑත දේශපාලන ඉතිහාසය පුරා අපි හොඳින් අත් වින්දෙමු.


අද නවක මාධ්‍යකරුවන්ට සන්නිවේදනයේ සිද්ධාන්ත කියා දීමට විශ්වවිද්‍යාල මට්ටමින් ගුරුවරු සිටිති. එහෙත් පූජකවරයේ අත්‍යවශ්‍ය ප්‍රායෝගික අභ්‍යාස කියාදීමට ගුරුවරු නැත. ප්‍රේමකීර්තිට සිද්ධාන්තයක් තිබුණි. එය ලියා තැබීමට හෝ කියාදීමට දිසාපාමොක් කමක්වත් තක්ෂිලාවක්වත් ඔහුට නොතිබුණි. එහෙත් ප්‍රේමකීර්ති දෙස බලාසිට බොහෝ දේ ඉගෙනගත් බොහෝ දෙනා සමහරවිට එය නොදැන සිටිනවා විය හැකිය. සමහරවිට එය දැන නොකියනවා විය හැක. ප්‍රේමකීර්ති මේ මාධ්‍ය සංස්කෘතියට වාෂ්ප කළ දැනුමෙන් හුස්ම ගන්නා බොහෝ දෙනා නැහැපුඬුව ගැන කතා කරනවා විනා පෙණහලු ගැන කතා නොකරන බව අප කීවේ ඒ හේතුවෙනි.

මම නාට්‍යකරුවකු වූ පිනෙන් ශිෂ්‍යයෙක්ව සිටි අවධියේදී ම රූපවාහිනී සංස්ථාවෙන් ආරාධනාවක් ලැබුවෙමි. කොළඹ විශ්වවිද්‍යාලයේ ජනමාධ්‍ය සිද්ධාන්ත ඉගෙන ගන්නා අවධියේ දීම කිසිවෙකුටත් නොලැබුණු පූරකවරයේ ප්‍රායෝගික පාඩම් මම ඉගෙන ගත්තේ ලූෂන් බුලත්සිංහලගෙන් සහ ප්‍රේමකීර්ති ද අල්විස්ගෙනි. ප්‍රේමකීර්ති ද අල්විස් විසින් මට කියා දෙවුණු පූරකවරයේ ප්‍රායෝගික පාඩම් ජනමාධ්‍ය පිළිබඳ ආචාර්ය උපාධියකට වුව ද භාවිත කළ හැකි. එහෙයින් මට නම් ප්‍රේමකීර්ති ජන කවියකු, මහා කවියකු, චින්තකයකු දාර්ශනිකයකු භාෂා වාදකයකු නොහොත් පූරකවරයකු වෙනවා පමණක් නොව ප්‍රායෝගික ජනමාධ්‍යකරණය පිළිබඳ මහාචාර්යවරයකු ද වන්නේය.



● **ජැක්සන් ඇන්තනි**

# සුලවත් සබඳිනි



එකල ප්‍රේම්, වික්ටර් සහ අමරදේව

**මගේ මතකය අවදිවන්නේ 1989 ජූලි මාසයටයි. ගුවන් විදුලිය හා රූපවාහිනී ප්‍රචාර මගින් ආණ්ඩුව පනවන හදිසි නීතිය හා ඇඳිරි නීතියට අමතරව ජවිපෙ දේශප්‍රේමීන්'' ද ඇඳිරි නීතිය පනවනු ලබන්නේ තුණ්ඩු කෑලි මගින් හා කට වහරින්ය.**

තැනෙක තරුණයකුගේ දැවෙන සිරුරකි. තව තැනෙක තම නිවස ඉදිරිපිට දීම ඝාතනයට ලක්වූ වැඩිමහල්ලෙකි. අප නිවසට යාබඳව ඇත්තේ බේකරියකි. එහි හිමිකරුගේ නිවස ඒ පිටුපසින් වෙයි. දිනක් උදයෙන්ම අප නිවසට පැමිණි බේකරිය හිමි හිතවතා පෙරදා රාත්‍රියේදී දේශප්‍රේමීන් පැමිණ තම බේකරියේ වැඩකරන සේවකයන්ගේත් නිවැසියන්ගේත් ජාතික හැඳුනුම්පත් සියල්ලත් තම පියා සතු ලයිසන් තුවක්කුවත් රැගෙනක ගිය බව කියා සිටියේ මහත් වූ සිත් තැවුලෙනි. රජයෙන් පැනවූ ඇඳිරි නීතිය අනුව තම ගේ ඇතුළේ විදුලි පහන් දැල්විය හැකි වුවද ඊනියා දේශප්‍රේමීන්ගේ නියෝග අනුව ලාම්පු කුප්පියක් තබා බුදුන් වෙනුවෙන් දල්වන මැටිපහන දැල්වීම ද කළ නොහැකි විය.

මේ අතර ම ඇතැම් පුද්ගලයන්ට ලිපි හා දුරකථන පණිවිඩු මගින් කරන ලද මරණ තර්ජන එල්ල වූ අතර එසේ ගණන් නොගන්නා පුද්ගලයන් අතිශය කෲර අන්දමින් ඝතනයට ලක්වූ ආකාරය ද සුලබව දකින්නට ලැබුණු සිද්ධියක් විය. ඇතැම් රාජ්‍ය ආයතන සහ පෞද්ගලික ආයතන ප්‍රධානීන්ට ද දිනය වේලාව ස්ථානය සහිතව මරණ වරෙන්තුව නිකුත් කළ ආකාරය අපට අත්දකින්නට සිදුවිය.

මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යවේදීන් බහුතරයකට ද ''දේශප්‍රේමී'' තර්ජනාංගුළිය එල්ල වූයේ එවකට පැවැති රජයට පක්ෂව රාජකාරි කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි. මේ නිසා ම අද අප සිහිපත් කරන ප්‍රේමකීර්ති සහෘදයාට ද එම තර්ජනය පොදු එකක් විය.

එදා ජූලි 30 වැනිදා රාත්‍රියයි. මැදියම් රෑ පසුවී තිබිණි. අප නිවසේ දුරකථනය නාද වන්නට විය. මගේ බිරිඳ චිත්‍රා දුරකථ නය වෙත යන අඩි ශබ්දය මට ඇසිණි. සැනෙකින් මා වෙත පැමිණි ඇය හෝමාගම පොලිස් ස්ථානාධිපති මා අමතන බව කියා සිටියා ය. විගස රිසීවරය වෙත පියනැගූ මා හලෝ මම වික්ටර් මොකද මේ මහ රෑ කියා ඇසුවෙමි.

රත්නායක මහත්තයා කලබලවෙන්න එපා. ඔබට මේ ආරංචිය දෙන්නේ ඉතාම කනගාටුවෙන්. ඔබේ හිතවත් ප්‍රේමකීර්තිට වෙඩි තියල මරා දමලා (තත්ත්පර කිහිපයක නිහැඬියාවකින් පසු)

එතුමාගේ බිරිඳත් පුතාත් අප සමග ඉන්නවා. ඔබට දැන් හෝමාගම පොලිසියට එන්න පුළුවන්ද?

මම හෝමාගම එච්. කියු අයි. සුනිල් කණ්ඩම්බි

මේ වදන් මා සවන් වැකුණේ යාන්තමිනි.

මේ ඇඳිරි නීතිය වෙලාවේ මං එන්නේ කොහොම දැයි මගේ මුවින් නිතැතින්ම ගිලිහෙද්දී

සොරි මට ඒ බව අමතක වුණා. මේ ආරංචිය ඉස්සෙල්ලම ඔබතුමාට දෙන්න කීවේ ප්‍රේමකීර්ති මහත්මියයි. දරුවා සමග මේ දැන් ඔහේ එන්න ඕනෑ බව කියනවා.

මගේ ඉල්ලීම අනුව කණ්ඩම්බි මහතා ප්‍රේම්ගේ බිරිඳ නිර්මලා සහ සිඟිති පුතු සම්පත් ජීප් රියක නංවා අප නිවසට එවනවිට 31 වැනිදාට එළිවන පාන්දර 3.00 පමණ ඇත. ප්‍රේම්ව රැගෙන යෑමට රාත්‍රියේ පිරිසක් ආ හැටිත් ඔවුන් සියලු දෙනා කළු මුඛවාඩම් බැඳ ගිනි අවි දරා සිටි බවත්, ඇය හා දරු පැටියා විලාප දෙමින් හඬද්දීත් ඒ රුදුරු පිරිස් ගිනි අවි දිගුකොට බියවද්දා ප්‍රේම්ව රැගෙන ගිය හැටිත් කඳුළු සලමින් විස්තර කරද්දී එතෙක් අවදියෙන් සිටි මගේ පුතුන් දෙදෙනා හා දියණියන් දෙදෙනා දෑස් කඳුළු පිය දමමින් හෙම්හිට ඉකි ගසනවා මම දුටුයෙමි. එම ඝාතකයන්ගේ විධානයත් එවකට රජයූ කැලෑ නීතිය නිසාත් අසල කිසිවෙක් උදව්වට නොපැමිණි අතර මඳ වේලාවකින් ඇසුණු වෙඩි හඬ නිසා කිසියම් අනපේක්ෂිත කම්පනයකින් තැතිගත් නිර්මලා පස් මස් වියැති සිඟිති පුතු ද තුරුලු කරගෙන නිවසින් බැහැරවී අන්ධකාරයේම ප්‍රේම් සොයමින් පැමිණ හෝඩුවාවක් නොලත් තැන හෝමාගම පොලිස් ස්ථානයට සේන්දු වූවාය.

ඉතින් සබඳිනි එවකට සතළිස් සත්විය සපුරා සිටි මා දිවි මගෙහි ගතින් හා සිතින් විඳ දැරිය නොහැකි වූ ශෝකය හා වියෝ දුක මේ සංසිද්ධියයි. 1989 ජූලි මස 31 දා වූ මේ සිදුවීම මා කෙතරම් සලිත කළා ද යත් එම සාහසිකයනට සාප කළේ සියලු දෙවි දේවතාවුන් යදිමින්ය.

එනමුත් එවක් සිට තවත් විසි වසරකින් වියපත්ව මුහුකුරා ගොස් ඇති මා බෞද්ධ චින්තනය අනුව බොදුනුවකු වශයෙන් සිතන්නේ අකුසලයට අකුසල කර්මානුරූපව පව් ඵලදෙන න්‍යායත් කුසල කර්මානුරූපව පිං ඵලදෙන හේතු ඵලවාදයත් පමණි. නිවන් අවබෝධ ලැබ භව මතක සහ ජාති ස්මරණ ඥානය පහළ කැරගන්නා තුරු අප අපව හඳුනානොගන්නවා ඇති. මගේ ළබැඳි මිතුරා පැවසූ පරිද්දෙන්ම

**ඊළඟ භවයේ හමුවන්නේ අපි**
**කොහොමද කොතැනද කවුරු ලෙසේ**
**හඳුනා ගන්නේ කෙලෙස ද අපි**
**අප සතුරන් මිතුරන් නැදෑයෝ**

● **සංගීතවේදී වික්ටර් රත්නායක**

*ගීතනාත් කුඩලිගම මහතා විසින් සංස්කරණය කළ 'ප්‍රේමකීර්ති 20 වසරක මතක සුවඳ' පොතෙන් උපුටා ගන්නා ලද ලිපියකි.*

# කවි මුතු

සංස්කරණය - රුවන් ජයවර්ධන

## හිමි සඳ සිහනාද

නසා කෙලෙස් සිත ගති ඇති උන්මාද
නගා ගයා හිස හිමි සඳ සිහනාද
කළා අහස් කුස දම් කඳ නින්නාද
පුදා වැතිර නමදිමු එදහම් නාද

පාවෙන වලාකුළු මෙන් හිස් අහස් කුස
යාවෙන බැඳෙන කිසිවක තිර නොමැත රස
නෙත සිත ගැටෙන හැම තැන වියොවක්ම මිස
ජීවිතයකට සතුටක් නැත දුකක් මිස

දුක මැද තවත් භවයක කිම පානු රඟ
අද හෙට මතු ද නිම් නැත දුක සසර මඟ
අත් හැර එදුක මතු මෙත් බුදු මහිමි ළඟ
නිවනෙන් නිවෙමු ගෙන හිමිගත් දහම් මඟ

• චූලා දමයන්ති හේමමාලා

## මිස්සකතලාව

පුණු සඳ පොසොන් නුඹ දිදුලන අසම සම
අනු දැන වදාළ වූ දම්කඳ ගලන අම
අනු බුදු මිහිඳු හිමි වැඩි, රත්තරන් බිම
මනු සිත් කැළැඹිලා අසරණ වුණේ කිම

අවි හිංසාව මුල් බැසගත් පළමු දිනේ
අවි බිම තබා පැතිස් රජු පෙරටු වුණේ
නිවි නිවි සිහළ බිම සිවුදෙස එළිය වුණේ
මවි තය කිමැයි අද රටකට මෙහෙම වුණේ

පන්සල් අසපු සෙනසුන් පිරි හෙළ පොළො වේ
පින් කළ දනෝ නැතිලෙද නොවැ ලොවදුටු වේ
අන්කිසිදිනෙක නොවූ ''මඩ ගොහොරක්'' මතුවේ
සන් සුන් වෙන්න කාලය ඇත ඔබ හමු වේ

සඳ දිය පෙරි පෙරී මිස්සක තලාවේ
මද දිය ගලයි අරුණෙහි හුදෙ කලාවේ
හදවත් මෙත් සිතින් පුරවා දයාවේ
රොද බැඳ යමු ඉතින් නොවැටී මුලාවේ

• කලාභූෂණ කිවිපති ඩබ්ලිව්. කේ. සරත් විමලසිරි

## අනුබුදු මිහිඳු හිමියනි

පිපුන අඹමල් සුවඳ පතුරයි
මිහින්තල ගල අවට පෙදෙසේ
සකුණ කැළ ගී ගයති ඉමිහිරි
විලස ලැග තුරු වදුළු සිරසේ
දිළෙන සඳ සොමි කිරණ විහිදා
පොසොන් පුන් සඳ මඬල අහසේ
එදින අනුබුදු මිහිඳු හිමි වැඩි
දසුන මෙදිනද මැවෙයි මනසේ

කැළුම් විහිදා රුවින් සුදිළී
සියල් නෙත්වල වෙමින් රසඳුන්
සියුම් දැනුමෙන් දහම් සැරියෙහි
යෙදුණු අනුබුදු මිහිඳු සමිඳුන්
උතුම් සදහම දෙසා මෙරටෙහි
දනට නිසි පිළිසරණ ලැබදුන්
වැණුම් කරමුද කෙලෙස ඔබ ගුණ
සමිඳ අපි වැනි පිරිස පුහුදුන්

• දළුපත පිලීෂියන්

## මුළාව



පණ සම පෙමක පැහැ විනිවිදිමින් නොදැක
සැතපී, විතක රස විඳ - රත් වුණු ළැමක
මත් වී විකල සිහියෙන් ගොස් බොහො දුරක
වියොවින් තැවෙමි අද - සිහිකර ඒ මතක

ඉසිමින් විලඳ වටකොට පිවිතුරු සුවඳ
ඔවදන් මුහු වදන් වැලකින් බැඳ - වැළඳ
අකපට ප්‍රේමයක අබිමන වී නිබඳ
ඔබ සිටි මල් යහන මට නොපෙනුනෙ මන්ද

ඉඟි - රඟ - මදන වෙස්ගත් සිත් නුරාවේ
හුස්මින් දැවෙන සඳ පළඟැටි මුළාවේ
ඔබ ඈතකට වී වැළපුන වෙලාවේ
හිරු මඬල ය වැසුනෙ දිවි මං තලාවේ

රැහැනින් මිදෙන කොට සිතිවිලි - විළිබරව
ඇහි තටු අතර කඳුළින් දුටුවෙමි ඔබව
පැටළුණු හැඟුම් වෙත එනු හැකි නම් යුහුව
ඇවිදින් බිඳිනු මැන, දුස් සප්නය දුටුව

• ශාන්ත කටුකුරුන්ද

## යළි ඉපදියන් දුවේ

*(විද්‍යා, සේයා, අයිෂා ඇතුළු මගේ කාලයේ පරව ගිය සියලු දූවරුන් උදෙසාය...)*

ගෙමිදුලේ පැණි දොඩම් ගසට හෙණ වැදුනි
දුවේ නුඹ නැති ගෙබිම වැලි රටා මැවුනි
කුරාණයෙ ඉරුණු පිටු රතු ලෙයින් පෙඟුණි
මගෙ පපුව මැද්දටම ගලක් අත හැරුණි...

ඉඟි පපා ඉගිළ ගිය සමනලිය සොය සොයා
මගෙ දුවේ මල් හඬයි පෙති හැලෙයි දුක කියා
ඇළ අසල දංකුඩට පොර පලක් නෑ කියා
කුඩ මස්සු නොකියාම දුරක යන්නට ගියා

ඉර තිබුණෙ අවරකද එළිය නොතිබුණ පැයේ
සඳ වුණත් පායන්ට කිමද නොහිතා ගියේ
තරු අතර උණුසුම් ද දැනෙනව ද මව් ළයේ
නුඹ උන්නු තැන තවම සුසුම් උණුසුම තියේ

මල් කැකුළකට වුණත් දුකක් මේ රට දුවේ
ඉපදෙන්න එපා යළි රුඳෙන් නුඹ දෙව් ලොවේ
දිනක් ආවොත් ලෙහෙන වැසුන ඇස් නීතියේ
උන්ට දඬුවම් අරන් ඉපදියන් මගෙ දුවේ

• අනෝමජී රාජපක්ෂ

## අපිත් යමු කුරුලු මේසෙට

අප සිරකොට කවයක
උන් ගිය දුර
සොයාගත නොහැකිද
දේවිය

සල්පිලත්
විශ්‍රාමික නෝට්ටු පිරි බැංකුවත්
එළවළු කඩ බක්කියත්
සූරන ලොතරැයි මණ්ඩපයත්
ස්ථානගත වුණිද
කවය අතරෙම

සාලිය ක්‍රිෂ්ණජිනා
අත වනාගෙන ගිය විට
ඇයි මේ කඳුළු දේවිය
උන් දුවන්නෙත්
අපේ උන් ගිය
දුයිෂෙන් පාසලට

ආ.... ඒකද හේතුව

විදුලි පංකා දැලකින්
තැනුණු මංගල මේසය
කුරුලු කිචි බිචි හඬ කියයි
ඔබේ මසවුළු රඟ

ඇ මැණිකෙ...
කොහොමද පිහිටියේ
කුරුලු මේසය
අර කවයෙන් පිට !

• මලිත් තුසිත ගුණරත්න

## නූතන ගුත්තිල වත

ගුත්තිල ලෙසින් සපැමිණි
මූසිල තොපට මම
සියලු දේ දන් දුනිමි
ළඟට ගෙන හිස සිඹ
නිරතුරුව දී ඔවා මිණි
දුර ඈත තරුවල පවා
මිහිර විඳිනට ඉගැන්වූයෙමි

බසවක්කුලම වැව මැද
මගෙ ඔරුව පෙරළුණි
පිහිනන වරල් සලමින
අනේ මූසිල මම නොදත්තෙමි

උණු තාර හඩමින් වැගිරුණි
පතුල් බත් කෙඩි වන විණි
මානව හිමිකම් කොමිසමේ
දින ගණන් දුක් වින්දෙමි

දරුවන් මගේ බිරිඳගෙ
නොදැන ඇකයෙන් පෙරළුණි
සෝෂල් මීඩියා කෙවිටෙන්
හිස මතට බෝ බැටදුනි

සොච්චම් වැටුප මට හිනැහුණි
කුමට මෙතරම් වද වුණි
වේවැල් කෝටු නාරං
තහනම් බව නොදැන උන්නෙමි
මූසිලයෝ වෙති බෝ වෙනස්
ඔච්චම් වලින් සලකත්
වෙයි බෝ ඇනුම් පද බැණුම්
ශිල්ප හැර මම එය නොදත්

මූසිල ඉතින් තත් සිඳ
ගොළ කල මගේ වෙන නද
මේ තක්සලාවේ කිසි දින
යළිත් ඔබ හට ඇසෙනු නැත

• පී.එච්. මධුරි ප්‍රියන්ති

## අර්ගලය

අඬන දොඬන දුක නාසන
නොගෙන හැඟීමක් ඒ ගැන
තළන පෙලන මිස නැවෙන
අසන දකින කිසිවකු වන

රජුන්ය දෙසවන් සිරවුණ
මුවින්ද වදනක් නොනගන
යොදුන් දුරට පෙළහරයෙන
දනන් වෙතේ සය මුරදෙන

විඩා දැනෙන විමතිය ලෙස
වඩා සඟවමින් සැම දොස
කඩා ඉතිරිවා සිදුගොස
හඬා වැටේ මුවදොර ඇස

• පොඩිරත්න අඟමලේ

## ගුත්තිල ගීතය

නැණහිස් පොවා සරසා දරු මල් පොකුරු
තරුනෙත් වීසි කොට කළු අහසට අඳුරු
ණය වෙන්නැතුව ලෝකෙට සමයක රුදුරු
තවමත් කුලීගෙයි මේ ගුත්තිල ඇදුරු

දිය කොට දිවිය මූසිලයන් පිණිස නෙක
වෙණතත් හඬා වැළපෙන රෑ දවල් දෙක
කාටත් වඩා ගැඹුරින් ජීවිතය දැක
විඳ දිවි ගෙවන හැටි පැණි රහ නැතත් දුක

අහසින් උඩින් යන තම අතවැසි පිරිස
සැලියුට් ගසති මඟතොට ඔහු දුටු විගස
සතුටින් අතගගා ඒ අයගෙත් සිරස
මොහු බුදු පදවි පැතුවේ නැහැ මතු දවස

• කේ. කේ. ඩබ්. ප්‍රියන්ත ජයලත්

ඇය
හිතින් පුරවාලන
වතුර බඳුන්
සිහිල....

• එන්. ඩබ්. පී. ලාල්

## කඳුළු සිනාවට

සිනාසී නැත
සිනාව කඳුළට
සිනා සේ!

• පිටිපන මා. ජයවීර

## මගෙ අම්මා

අප්පුගෙ රබර් වත්තෙ
කිරිකපා - උදෑහැනැක්කෙ
පුවක් ගොල්ලෙ
පුවක් වල්ලකට
කෙකගා - බැරිගානෙ
බස් සීසන් එකට
ටියුෂන් පන්තියට
නිති මුදල දුන් ලබැඳි
මගෙ අම්ම......
බොහෝ දේ පවසා
එපමණට විමසා
දිනෙක මට නොපවසා
හිස් අතින් කොහෙ ගියේ?
කොහේ - කොතැනකද ඔබ
සැඟවුණේ විශ්වයේ?

• ලාල් කළුතරගේ



# තවු ලැබෙන්න කලින් පියාඹන්නට ගිය තැන...

කුමුදුනි ගේත් සංඛගේත් ආදරකතාව පටන් ගත්තේ ඉස්කෝලේ 8 වසර විතර කාලයේදී. ඩිංග ඩිංග මෝරා ගිය මේ ආදරය ගලාගෙන ගියේ ඔවුන්ගේ දෙමාපියන්ට හොරා. සතියේ දිනවලත් සති අන්ත දිනවලත් පන්ති යන ඔවුන් දෙදෙනා ඉඳහිට පන්ති ගමන නවත්වා ඔවුන් දෙදෙනාගේම ලෝකවල තනි වෙන්න පුළුවන් තැන්වලටත් යන්න හුරුවෙලා හිටියා.

කාට කාටත් හොරා ප්‍රේම කතාව දලු ලා ගෙන එනකොට හදිසියේම කුමුදුනි අසනීප වුණා. තමන්ගේ පොඩිදුව ව ඉක්මණට ඉස්පිරිතාලේට රැගෙන ගිය ඇගේ මවට දොස්තර මහත්තයා දුන්න උත්තරයෙන් කුමුදුනිගේ මව අන්දමන්ද වුණා. මේ ළමයා පුංචි වුණාට මෙයාට දරුවෙක් ලැබෙන්න ඉන්නවා. ඔහු කුමුදුනි දිහා ඔලොක්කුවට බලමින් වගේ කිව්වා.

කුමුදුනි ගොඩාක් ඇඬුවා. මුළු ලෝකයම එයාගේ දෙපාමුල වැටුණා වගේ එයාට දැනුණා. එයාගේ ඉස්කෝලේ ගමනත් මේ එක්කම නැවතුණා. පණවගේ කුමුදුනීට ආදරය කරපු සංඛ ආගිය අතක් නැති වුණා. කාලය ඩිංග ඩිංග ගතවෙලා ගියා. අන්ත අසරණ වුණ කුමුදුනීට දැන් අවුරුදු එකහමාරක දරුපැටියෙක් ඉන්නවා.

ලංකාවේ ලිංගික අධ්‍යාපනය පිළිබඳ සංවාදය දිගින් දිගට ම ගලායන මාතෘකාවක් බවට පත්වෙමින් තිබේ. අප ඉහතින් සඳහන් කළ කතාවේ කුමුදුනීට අත් වූ සාහසික ඉරණම සහ ඛේදවාචක කතා පුපත්වලට ඕනෑ තරම් උදාහරණ අනුරාධපුරයෙන් මොනරාගලින් මෙන්ම උතුරු නැඟෙනහිර වතුකරය මෙන්ම කොළඹ දිස්ත්‍රික්කයෙන් ද ගත හැකිය. මේ දැරියන්ට මේ සාහසික අපරාධයට ගොදුරු වීමට සිදු වූයේ ඇයි? ඒ සඳහා බොහෝ සමාජීය, ආර්ථික කාරණාවන් බලපෑම් කළත් අඩුම තරමින් කුමුදුනිගේ ප්‍රේමවන්තයා ඇය සමග එක්වන්නට පෙරාතුවා උපත් පාලන ක්‍රමයක් ගැන දැන සිටියා නම්...!

උපත්පාලන ක්‍රමවේද පිළිබඳවත් තරුණයන්ගේ ලිංගික චර්යාවන් හි සොබාවය ගැනත් බරපතළ සංවාද ඉස්මතුවෙමින් පවතී. බොහෝ දෙනා සිතන්නේ මෙබඳු දේ ගැන වටහා ගෙන තිබීම ඉගෙනගෙන තිබීම ප්‍රයෝග සම්පන්න බවය.

තරුණ පරපුරේ ලිංගික චර්යාවන් හි ගති සොබාවන් පිළිබඳ ඉතා ගැඹුරු විග්‍රහයක් laurence steinberg විසින් රචනා කරන ලද Adolescence හෙළිදරව් කරයි. ඇමෙරිකාවේ සිදුකළ ලිංගික චර්යාවන් පිළිබඳ පර්යේෂණයකින් හෙළිදරව් වී ඇත්තේ තරුණ කතුන්ගෙන් හරි අඩක්ම තමන්ගේ දිවියේ ප්‍රථම ලිංගික හැසිරීමේදී උපත් පාලන ක්‍රම භාවිත කර තිබෙන බවය.

එහෙත් ලිංගික වශයෙන් ඉහළ ක්‍රියාකාරීත්ව වසර වන අවුරුදු 15 - 19ත් අතර වයසේ පසුවන තැනැත්තියන්ගෙන් 1/6ක් කිසිදු ආකාරයක උපත් පාලන ක්‍රමයක් ප්‍රථම ලිංගික එක්වීමේදී භාවිත කර නොතිබුණි.

ප්‍රථම ප්‍රේමය ශෝකාලාපයක් හෝ ඛේදවාචකයක් වීමට තරම් ඇතැම්විට ප්‍රථම ලිංගික හමුව පාදක විය හැක්කේය. ප්‍රේමවන්තයාගේ බලවත් පෙරත්තුව මත ඔහු සමගින් හුදකලාවන තරුණියන් ඔහුගේ ඉල්ලීමට අවනත වනු ඇත. එහෙත් ලංකාවේ ප්‍රේමවන්තියන් තම ප්‍රේමවන්තයා හමුවේදී ඇගේ ආරක්ෂාව ගැන කල්පනා කරන්නේද...? නැතහොත් තම ප්‍රේමවන්තයා ගැනම පමණක් උපරිම විශ්වාසය තබා හැසිරෙන්නේද...?

එහෙත් ඇමෙරිකාවේ තරුණයන්ගේ ලිංගික චර්යාව පිළිබඳ සුපතළ අධ්‍යයනයක් කළ C.Hayes නම් විද්වතා විසින් රචනා කළ Adolecent Sexuality කෘතිය ලොමු දැහැන්වෙන වාර්තා ඉදිරිපත්කොට ඇත. ඔහුට අනුව නූතන ඇමෙරිකානු තරුණ තරුණියන් අතර වඩාත්ම ජනප්‍රිය උපත් පාලන ක්‍රමවේදය වන්නේ උපත් පාලන පෙතිය.( birth control pill ) ලිංගික පරිණතියට පත් ඇමෙරිකානු තරුණියන් 60%කට මේ ක්‍රමය අනුගමනය කරති. තරුණ වයසේ පසුවන තවත් තැනැත්තියන් ප්‍රකාශ කර තිබුණේ එබඳු ලිංගික එක්වීමකදී තමන් වඩාත්ම බහුලව යොමුවන උපත් පාලන උපක්‍රමයක් වන්නේ ලිංගික එක්වීමකදී තමන්ගේ සහකරුට උපත් පාලන උපක්‍රමයක් භාවිත කිරීමට යොමු කරන වගය. තවත් 5%ක පමණ ප්‍රමාණයක් Diaphram නම් ක්‍රමවේදය අනුගමනය කොට තිබිණි. ඉතා අවදානම් සහගත උපත් පාලන ක්‍රමයක් ලෙසට සලකනු ලබන ශුක්‍රමෝචනයට පෙර ඉවතට ගැනීමේ ක්‍රමවේදය withdrawal ලෙසටත් සලකනු ලබයි.

ඇමෙරිකාවේ 5%ක් මෙම ක්‍රමවේදයට අප්‍රවේසම්කාරි ලිංගික චර්යාවකට ගොදුරු වුවත් ලංකාවේ තරුණ තරුණින් ප්‍රථමවරට ලිංගික ඇසුරු කිරීමේදී මෙම ක්‍රමවේදය බහුලව භාවිත කරති. ලෝකයේම පිළිගැනීම්වලට අනුව මෙම ක්‍රමවේදය බරපතළ ගැටලුකාරී දරු උපත් වළකාලන්නට අවම හැකියාවක් සහිත උපත් පාලන ක්‍රමවේදයක් ලෙසට සැලකේ. ආරක්ෂා සහිතව ලිංගික හැසිරීම් පිළිබඳව( safe sex ) අපේ රටේ තරුණ දූ දරුවන්ගේ දැනුම ඉතා අල්පය. මේ අල්ප දැනුම නිසාම මිතුරන් ගෙන් දැනගත් පරිදි අසා දැනගත් පරිදි තමන්ගේ පෙම්වතිය සමගින් අනාරක්ෂිතව ලිංගිකව එක්වන ඇතැම් තරුණ ප්‍රේමවන්තයන් ඔහුගේත් තම ප්‍රේමවන්තියගේත් දිවි විනාශ කර ගනිති. අවසානයේදී දැරියට සිදුන්නේ ළමා වියේදීම මවක් බවට පත්වීමටය. මේවා හුදු ප්‍රලාප බවට නොයෙක් දෙනාට තර්ක කළ හැකිය. එහෙත් යථාර්ථය සොයන්නට නම් ඈත එපිට ගම්දනව් සිසාරා පරීක්ෂා කළ හැකිය. එවිට තත්ත්වය මනාසේ අවබෝධ කරගත හැකිවනු ඇත.

ඇමෙරිකාවේ තරුණ තරුණියන්ගේ ලිංගික චර්යාව පිළිබඳ ඇග සීතල වන කාරණාවන් සමාජ පර්යේෂණ HAYES සොයා ගත්තේය. ඔහුගේ අනාවරණය කිරීම්වලට අනුව ගැටවර වියේ පසුවන ඇමෙරිකානු යුවතියන් 15%ක් ද තරුණ ගැටවරයන් 25%ක් පමණ ද ඔවුන්ගේ ප්‍රථම ලිංගික හැසිරීම්වලදී උපත් පාලන උපකරණ භාවිත නොකර ඇත. මේ දශකය අපේ රටේ තරුණ දූ දරුවන් කෙරෙහි ආදේශ කළහොත් ඉස්මතු වන දත්ත සිතා ගැනීමට අසීරු වනු ඇත. නොකා නොබී අනේක දුක් විඳ මලක් සේ තම දූ දරුවන් රැකබලා ගන්නා දෙමාපියන්ට හොරා දියණියගේ සිත හොරා ගන්නා ඇතැම් කොණ්ඩ කුරුල්ලන් තරුණියගේ දිවිය මිහිමත අපායක් කොට නිදි පැදුරුටත් නොකියා පලායති. ආදරණීය මවට තමන්ට සිදු වූ විපත්තිය දියණිය පවසනවිට සිදුවිය යුත්තේ සිදු වී හමාරය.

ලංකාවේ මෙසේ ලිංගිකත්වය පිළිබඳව ගැටලු ප්‍රශ්න තරුණ දූ දරුවන්ට කතා කරගත හැකි විමංසනය කරගත හැකි තැනක් නැත. දෙමාපියන් සමගින් තමන්ගේ අතිශය පුද්ගලික කරුණු කතා කරන්නට ද තරුණ තරුණියන් කැමැත්තක් නො දක්වති. තමන්ගේ සමාජ ජීවිතය සකස් කර ගන්නට උදව් දෙන ගුරුවරියන් සමීප වැඩිහිටියන් වෙතින් ද මෙම ගැටලුවලට උත්තර සොයන්නට ඔවුන් උත්සාහ නොගත්තේ සමාජ සම්මතයට මෙම කාරණාවන් එකල නොමැති වීම නිසාය.

වත්මන් ඇමෙරිකානු තරුණ දරුවන් ගේ ලිංගික චර්යාවන් පිළිබඳ trussell ද අපූර්වතම පිරියෙදුම් සිදුකර ඇත. ඔහුට අනුව ඇමෙරිකාවේ තරුණ තරුණියන්ට ලිංගික චර්යාවන් ලිංගික ක්‍රියාදාමයන් පිළිබඳවත් උපත් පාලන උපකරණ ගර්භිණීභාවය පිළිබඳව ඇත්තේ ඉතා අඩු දැනුම් මට්ටමකි. Zelnick සහ kantner මේ පර්යේෂණවලින් මෙම ක්‍රියාදාමයේ අඩුපාඩුවල ප්‍රතිඵල පැහැදිලිකරයි. ඇතැම් තරුණයන්ට මෙන්ම තරුණියන්ටත් යෞවනියන්ගේ ඔසප් චක්‍රය පිළිබඳව හෝ අල්ප මාත්‍ර දැනුමක් නොමැත. බොහෝ තරුණ තරුණියන් තම ප්‍රථම ලිංගික එක්වීමේදී උපත් පාලන උපකරණ භාවිත නොකරන්නේ මෙම උපකරණ භාවිතය පිළිබඳ කිසිදු අවබෝධයක් ඔවුන් සතුව නොමැති වීම නිසාය. ඔවුන් මෙම ලිංගික සතුට උපරිම ලබාගන්නේ වාසනාව විශ්වාස කොට ගෙනය Just trust to luck එහෙත් නිතරම වාසනාව දොර හැර බලන්නේ ද නැත.

ඇමෙරිකාවේ එහෙම වුණාට ලංකාවේ එහෙම නැතැයි යමෙකුට සිතන්නට පිළිවන. වැඩිහිටි පිරිමින් තමන් ගේ බිරිඳව අනවශ්‍ය දරු උපතකින් ගලවා ගැනීමට සමත් උපත් පාලන උපකරණයක් නිසිලෙසට භාවිත කරන්නට දැන උගෙන සිටීත් ද? ඔවුන්ට මෙම ආරක්ෂිත ලිංගික හැසිරීම් කියා දෙන්නට තරම් යාන්ත්‍රණයක් තියේද? පාසල් ප්‍රේමයට අනතුරුව තරුණ තරුණියන් තනිවෙන ස්ථානවලදී ඔවුන්ට තම අනාගතයට ව්‍යසනයක් නොවන්නට තරම්වත් දැනුම ලබාදෙන ක්‍රමවේදයක් අපේ අධ්‍යාපනයේ තිබේද? සංවාද මතවාද විතරක් සහ විවේචන පමණක් මේ ගැටලුව ඉදිරියේ තවමත් තිබේ.

ප්‍රතිඵලය කුමක් විය හැකිද? මේ පිළිබඳව පර්යේෂණ විශාල ගණනක් සිදුකර ඇති ඇමෙරිකාවෙන්ම මේ සඳහා උදාහරණ ගත හැකිය. Gale zucker ගේ පර්යේෂණයකට අනුව ඇමෙරිකාවේ තරුණියන් ගෙන් 1/4ක් තමන්ගේ 18 වැනි උපන්දිනයට පෙරාතුව ගර්භිණීභාවයට පත්වෙති. මෙම ගර්භිණීභාවය බොහෝ ඇමෙරිකානු සමාජ විද්‍යාඥයන් හඳුන්වන්නේ යොවුන් වියේ ගැබ්ගැනීම් teen age pregnancy ලෙසටය. ලෝකයේ බොහෝ රටවල ළාබාල තරුණියන්ට මෙම විපත්තිකර සමාජ ප්‍රශ්නයට මුහුණ දීමට සිදුවෙයි.

නිරතුරුව කාම ගින්න අවුළුවන සමාජ වටපිටාවක් සහිත පරිසරයක වෙසෙන අපේ තරුණ දරුවන්ට අනාගත දිවියට අත්‍යවශ්‍ය වන ලිංගික විද්‍යාත්මක කාරණා උගැන්වීම වාඩාත් සබුද්ධිකව විමසා බැලීම වටී. ලංකාවේ ප්‍රමුඛපෙළේ සෞඛ්‍ය විද්‍යාත්මක සහ වෛද්‍ය විද්‍යාත්මක පර්යේෂණ කිහිපයක්ම ළමා මවුවරු පිළිබඳ ව සිදුකොට ඇත. මේ දත්තයන් සමාලෝචනය කොට වඩාත් හිතකර වැදගත් සහ අපේ සංස්කෘතියට සදාචාරයට ගැළපෙන ලෙස මෙම අනාගත අභියෝගයට අදාළව දැනවත් කිරීම අත්‍යවශ්‍යව ඇත.

• ඩබ්ලිව්. ඒ. සරත්චන්ද්‍ර
හිටපු කථිකාචාර්ය සමාජ විද්‍යා සහ
අපරාධ විද්‍යාව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

උපාලි නිව්ස්පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් 2022 ජුනි මස 12 වැනිදා ඉරිදා හෝමාගම පිහිටි උපාලි යන්ත්‍රාලයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.